කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

# Ministry of Industry and Entrepreneurship Develpoment





# ප්‍රගති වාර්තාව
## முன்னேற்ற அறிக்கை
## Progress Report

# 2024

# ප්‍රගති වාර්තාව - 2024

**මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.**

# නායකත්වය සහ මග පෙන්වීම



**ගරු. සුනිල් හඳුන්නෙත්ති**
**අමාත්‍ය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**



**ගරු. චතුරංග අබේසිංහ**
**නියෝජ්‍ය අමාත්‍ය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**



**ජේ.එම්. තිලකා ජයසුන්දර**
**ලේකම්, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**

# දැක්ම

“තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන වර්ධනයක් උදෙසා වන ගෝලීය තරඟකාරී ජාතික කර්මාන්ත පදනමක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම”

# මෙහෙවර

"තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුළින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව්‍ය කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය, ඉහළ වෙළඳපල ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් සඳහා දිරිගැන්වීම"

# අරමුණු

- 2023 වසරේ 16.2% ක්වූ දළ දේශීය නිෂ්පාදිතය සඳහා නිෂ්පාදන කර්මාන්ත අංශයේ දායකත්වය 2030 වසර වන විට 20% දක්වා වැඩි කිරීම.

- 2023 වසරේ 3.2% ක්වූ ජාතික ආර්ථිකයට ව්‍යවසායකත්ව දායකත්වය 2030 වසර වන විට 10% දක්වා ඉහළ නැංවීම.

- 2030 වසර වන විට දළ දේශීය නිෂ්පාදිතයෙහි කාර්මික (වෙළඳ භාණ්ඩ) අපනයන කොටස 20.5% සිට 25% දක්වා වැඩි කිරීම (2023 දී ඇ.ඩො. බිලියන 84 ක සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් ඇ.ඩො. බිලියන 17.5) (2030 වන විට දී ඇ.ඩො. බිලියන 28)

- 2023 වසරේ 0.01% ක්වූ කර්මාන්ත කටයුතු සඳහා වෙන් කල ඉඩම් ප්‍රමාණය 2030 වසර වන විට 1% දක්වා වැඩි කිරීම. (ජාත්‍යන්තර සම්මතය 3%).

## අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශ

1. ප්‍රතිපත්ති සංවර්ධන අංශය
2. කර්මාන්ත සංවර්ධන අංශය
3. ආංශික සංවර්ධන අංශය
   - 3.1 සංවර්ධන අංශ 1
   - 3.2 සංවර්ධන අංශ 2
   - 3.3 සංවර්ධන අංශ 3
4. කර්මාන්ත ලියාපදිංචි අංශය
5. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
6. පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය
7. ව්‍යවසායකත්ව සංවර්ධන අංශය
8. සැලසුම් අංශය
9. පාලන අංශය
10. ගිණුම් හා ප්‍රසම්පාදන අංශය

## අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා

1. පේෂකර්ම දෙපාර්තමේන්තුව (DTI)
2. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)
3. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)
4. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)
5. ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය) (CCC)
6. ලංකා ඛනිජ වැලි සමාගම (LMSL)
7. සී/ස ජාතික කඩදාසි සංස්ථාව (NPCL)
8. ලංකා ලේලන්ඩ් සමාගම (LLL)
9. සී/ ස ලංකා ෆොස්පේට් සමාගම (LPL)
10. ජාතික ලුණු සමාගම (NSL)
11. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව (SLCC)
12. පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ් (PCCL)
13. සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම (BCC)
14. ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)
15. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA)
16. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) (SLHB)
17. ජාතික ශිල්ප සභාව (NCC)
18. සිමාසහිත ලංකා සළුසල (LSL)
19. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA)
20. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)
21. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
22. උක් පර්යේෂණ ආයතනය (SCRI)
23. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (NPS)
24. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB)
25. කන්තලේ සීනි සමාගම (KSCL)
26. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
27. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

# පටුන


| | |
|---|---|
| පෙරවදන | xiii |
| අමාත්‍යාංශයේ දිශානතිය | 01 |
| **ප්‍රධාන අංශ** | |
| ප්‍රතිපත්ති සංවර්ධන අංශය | 11 |
| කර්මාන්ත සංවර්ධන අංශය | 18 |
| ආංශික සංවර්ධන අංශය | |
| සංවර්ධන අංශ 1 | 24 |
| සංවර්ධන අංශ 2 | 28 |
| සංවර්ධන අංශ 3 | 33 |
| කර්මාන්ත ලියාපදිංචි අංශය | 37 |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 40 |
| පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය | 43 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය | 46 |
| ප්‍රාථමික කර්මාන්ත අංශය | 51 |
| සැලසුම් අංශය | 55 |
| පාලන අංශය | 57 |
| ගිණුම් හා ප්‍රසම්පාදන අංශය | 59 |

# පටුන


| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | |
|---|---|
| පේෂකර්ම දෙපාර්තමේන්තුව (DTI) | 63 |
| ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) | 67 |
| ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) | 73 |
| කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL) | 77 |
| ජාතික කඩදාසි සමාගම (NPC) | 82 |
| ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් (LMSL) | 85 |
| ලංකා පිගන් සංස්ථාව (CCC) | 88 |
| සී/ ස ලංකා ෆොස්පේට් සමාගම (LPL) | 92 |
| සී/ ස බී.සී.සී. ලංකා සමාගම (BCC) | 95 |
| සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම (PCCL) | 98 |
| ජාතික ලුණු සමාගම (NSL) | 102 |
| ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව (SLCC) | 105 |
| ලංකා ලේලන්ඩ් සමාගම (LLL) | 108 |
| ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA) | 109 |
| ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC) | 113 |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) (SLHB) | 119 |
| ජාතික ශිල්ප සභාව (NCC) | 121 |
| සී/ ස ලංකා සළුසල (LSL) | 126 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) | 129 |
| මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI) | 133 |
| සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම | 138 |
| කන්තලේ සීනි සමාගම (KSCL) | 141 |
| ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | 143 |
| උක් පර්යේෂණ ආයතනය (SCRI) | 147 |
| ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) | 152 |
| ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (NPS) | 157 |
| කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය | 162 |
| **මූල්‍ය ප්‍රගතිය** | |
| කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | 167 |

# පෙරවදන

ශ්‍රී ලංකාවේ දේශීය නිෂ්පාදන ශක්තිමත් කරමින් අපනයන නිෂ්පාදන දිරිමත් කරන ආර්ථිකයක් පවත්වා ගැනීමට යෝග්‍ය කර්මාන්ත පරිසරයක් ව්‍යවසායකයින් සඳහා උදාකරලීමට උපකාරී වන කර්මාන්ත සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පහසුකම් සැපයීම කර්මාන්ත අමාත්‍යාංශයේ මූලික කාර්යයභාරයයි.

බිඳවැටී ඇති දේශීය නිෂ්පාදන කර්මාන්ත නැවත පනගැන්වීම සඳහා අවශ්‍ය මූල්‍ය සහන ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මෙන්ම නව කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ආයෝජනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට මූල්‍ය ආයතන (බැංකු) සහ මුදල් අමාත්‍යාංශය සමග ඒකාබද්ධව මේ වසර තුලදී ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත.

තිරසර කර්මාන්ත සංවර්ධනයක් උදෙසා ඉවහල් වන ජාතික ප්‍රතිපත්තියක් සහ පස් අවුරුදු උපාය මාර්ගික ක්‍රියාකාරි සැලැස්ම (2023 - 2027) අමාත්‍යාංශය විසින් සකස් කර ඇති අතර වේගවත් කර්මාන්ත සංවර්ධනයක් සඳහා අදාල වන පරිදි කර්මාන්ත සංවර්ධන පනත සංශෝධනය කිරීමේ කටයුතුද මූලික වශයෙන් නිමකොට ඇත.

සංවර්ධිත ප්‍රදේශවලට පමණක් කේන්ද්‍රගත වී ඇති කර්මාන්ත සංවර්ධනය ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රාදේශීය වශයෙන් ආයෝජන දිරි ගැන්වීමට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම සඳහා වූ වැඩසටහන් ගණනාවක් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර ඇත.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් හා ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, මූල්‍ය පහසුකම් සැපයීම මෙන්ම උපාධිධාරී ව්‍යවසායකයින් ක්ෂේත්‍රයට හඳුන්වා දීම ආදී වැඩසටහන් රාශියක් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මගින් පවත්වා ඇත.

කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන එළිදැක්වීම, ප්‍රවර්ධනය මෙන්ම විවිධ රටවල ජාත්‍යන්තර අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු කර ඇත.

ඛනිජ සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතය, අගය එකතු කිරීම මෙන්ම අලාභ ලබන රාජ්‍ය ව්‍යවසායයන් ලාභ ලබන සහ වානිජමය ශක්‍යතාවයකින් හෙබි ව්‍යවසායයන් ලෙස ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර රාශියක් ද අමාත්‍යාංශය මඟින් හඳුන්වා දී ඇත.

# අමාත්‍යාංශයේ දිශානතිය
## (2024 ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා)

## 1. නිෂ්පාදන කර්මාන්ත සඳහා හිතකර පරිසරයක් සැකසීම

### 1.1 ජාතික කර්මාන්ත ප්‍රතිපත්තිය

- නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා උපකාරී වන, ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනය සඳහා දැඩි අවශ්‍යතාවයක්ව පැවති ජාතික කර්මාන්ත ප්‍රතිපත්තිය (NaPID) සකස් කර ඇති අතර එය නව රජයේ "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන පරිදි සකස් කරමින් පවතී.

- කර්මාන්ත ප්‍රතිපත්තියට අදාල 2023 - 2027 දක්වා කාලය සඳහා වන පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම ද (Strategic Plan) සකස් කර ඇති අතර එය අදියරෙන් අදියර ක්‍රියාත්මක කිරීමේ කටයුතු අමාත්‍යාංශය දැනටමත් ආරම්භ කර සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතී.

### 1.2 කර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම.

- 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත වත්මන් හා අනාගත අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීමේ කටයුතු මේ වන විට අවසන් කර මූලික කෙටුම්පත සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා දී ඇති අතර අවසන් කෙටුම්පත සඳහා නව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු කඩිනමින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ.

### 1.2 විද්‍යුත් වාහන නිෂ්පාදනය සහ එකලස් කිරීම සඳහා මාර්ගෝපදේශ සැකසීම.

- **මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීම**

  මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තියේ අවසන් කෙටුම්පත සකස් කිරීම අවසන් කර ඇති අතර සවිස්තරාත්මක උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරමින් පවතී. මෙම උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම එකී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ලෙස ක්‍රියා කරයි.

- **සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) යාවත්කාලීන කිරීම.**

  වාහන එකලස් කිරීමේදී භාවිතා කරන දේශීයව නිෂ්පාදනය කරන ලද සංරචකවල මිල ගණන් ඇගයීම් කටයුතු සහ මෝටර් රථ නිෂ්පාදනය හා එකලස් කිරීමට අදාල ජාතික ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු මේ වන විට 75% ක් පමණ අවසන් කර ඇති අතර සම්මත මෙහෙයුම් පටිපාටියේ (SOP) දෙවන සංස්කරණය එළිදැක්වීමට කටයුතු කරමින් පවතී.

- **මෝටර් රථ එකලස් කිරීම සහ මෝටර් රථ උපාංග නිෂ්පාදනයට අදාල නව ආයතනයන් සඳහා අනුමැතිය ලබාදීම.**

2024 දෙසැම්බර් 31 වන විට, රට තුළ නව වාහන මාදිලි අසූ එකක් (81) එකලස් කිරීමට මෝටර් රථ එකලස් කිරීමේ ආයතන තිස් හයක් (36) වෙත අනුමැතිය ලබා දී ඇත. වාහන එකලස් කිරීමේ කර්මාන්තයේ අඛණ්ඩ ව්‍යාප්තිය සහ විවිධාංගීකරණය පිළිබිඹු කරමින් 2024 වර්ෂය තුළ පමණක් මෙම ආයතනවලින් ආයතන තුනකට (03) සහ නව වාහන මාදිලි දහයකට (10) අනුමැතිය ලැබී ඇත.

සම්මත මෙහෙයුම් පටිපාටිය ක්‍රියාත්මක කිරීමෙන් පසු, එකලස් කරන ලද මුළු මෝටර් රථ සංඛ්‍යාව 94,138 කි. 2024 වර්ෂය තුල එකලස් කරන ලද මුළු වාහන සංඛ්‍යාව 63,331ක් වන අතර එයට සිව් රෝද රථ 2,010 ක්, විදුලි ත්‍රිරෝද රථ 30 ක් සහ බයිසිකල් 61,291 ක් ඇතුළත් වේ.

- **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සහ පරිසර අමාත්‍යාංශය එකාබද්ධව ඉලෙක්ට්‍රික් වාහන සඳහා අදාල වන මාර්ගෝපදේශ සැකසීම.**

විද්‍යුත් වාහන සඳහා මාර්ගෝපදේශ (E-Vehicle Guideline) පිළිබඳව පළමුවන කෙටුම්පතෙහි කරුණු පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා පත්කරන ලද කමිටු මඟින් යෝජනා ඇතුලත් වාර්තා ලබා දී ඇත. මේ වන විට එම වාර්තාවේ කටයුතු 90%ක් පමණ අවසන් කර ඇති අතර 2025 වසර මුල් කාර්තුව අවසානයේදී එළිදැක්වීමට කටයුතු කරමින් පවතී.

## 2. නිෂ්පාදන කර්මාන්ත නඟා සිටුවීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය

### 2.1 කර්මාන්තපුර සංවර්ධනය

- අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්ත කලාප/කර්මාන්තපුර ස්ථාපනය කිරීමේ විශේෂ ජාතික වැඩසටහන යටතේ ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් හඳුනාගත් කඩිනමින් නිම කල හැකි අක්කර 1073.8 කින් යුත් කර්මාන්තපුරවල මූලික සංවර්ධන කටයුතු සිදු කරනු ලබයි. මේ යටතේ පවතින කර්මාන්තපුර 34ක සහ නව කර්මාන්තපුර 6ක (අළුතැපොල, දඹුල්ල, සඳමල්ගම, සූරියවැව, නොච්චියාගම සහ වැල්ලවාය) සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වේ. මීට අමතරව කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) යටතේ පවතින සහ නව කර්මාන්ත උද්‍යාන වලද සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වේ.

- මාර්ග සංවර්ධනය සඳහා රු.මි.253.81ක්ද සමඟ සූරියවැව කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු අවසන් වන අතර එහි ඉඩම් ආයෝජකයින් අතර බෙදාදිය හැක.

## 3. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම

### 3.1 කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි ව්‍යවසායකයින් සඳහා ණය පහසුකම් සැපයීම

- කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III- (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය) යටතේ 2024 වර්ෂය සඳහා රු. මි. 2700 ක් වෙන් කරමින් සහභාගිත්ව ණය දෙන ආයතන (බැංකු) 10 ක් හරහා ව්‍යාපෘතින් 360ක් සඳහා රු. මි. 2684 ක ණය මුදල් ලබා දී ඇත.
- පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II (E –Friend) යටතේ 2024 වර්ෂය සඳහා රු. මි. 800 ක් වෙන් කරමින් සහභාගිත්ව ණය දෙන ආයතන (බැංකු) 11 ක් හරහා ව්‍යාපෘතින් 44 ක් සඳහා රු. මි. 668 ක ණය මුදල් ලබා දී ඇත.

### 3.2 අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP)

- තීරුබදු රහිතව අමුද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම (අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP)) මගින් කර්මාන්තවල අපනයන දිරිගන්වනු ලැබේ. මේ වන විට ඇසුරුම් අංශය, සැකසූ ආහාර, කුළුබඩු අංශය, කොහු ආශ්‍රිත නිෂ්පාදන අංශය, තේ අංශය, මැණික් හා ස්වර්ණාභරණ අංශය හා කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන අංශය වැනි නිෂ්පාදන වල අගය එකතු කිරීමේ නියුක්ත වෙමින් ඍජු හා වක්‍ර වශයෙන් 2024 දෙසැම්බර් දක්වා අපනයනයට සම්බන්ධ කර්මාන්ත සඳහා TIEP පහසුකම් ලබා දී ඇති අතර ලිපි 683 සඳහා නිර්දේශ ලබා දී ඇත.

### 3.3 නිපුණතා සංවර්ධන වැඩසටහන්

- නිපුණතා සංවර්ධන වැඩසටහන් යටතේ ඇසුරුම්කරණ තාක්ෂණය ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන සති අන්ත දින 14 කාල සීමාව තුළ සහතිකපත් පාඨමාලාවක් වශයෙන් පැවැත්වීමට සැලසුම් කරන ලදී. අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය සමඟ එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර ඇසුරුම් කර්මාන්තයේ නියැළී සිටින තාක්ෂණික ශිල්පීන් 28 දෙනෙකුට පුහුණුවීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

### 3.4 "උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය" වැඩසටහන

- උපාධිධාරීන් ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ කරගැනීමේ අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විශ්ව විද්‍යාල හා එක්ව ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා "උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය" වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.
- 2024 වර්ෂයේදී කොළඹ, යාපනය, කැලණිය, ඌව වෙල්ලස්ස, මොරටුව, රුහුණ, පේරාදෙණිය, ජයවර්ධනපුර, රජරට, සබරගමුව, වයඹ සහ සෞන්දර්ය විශ්වවිද්‍යාලය යන විශ්ව විද්‍යාලවල විද්‍යාර්ථයින් 367 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබාදී ඇති අතර 31 දෙනකු ව්‍යවසායකයින් බවට සංවර්ධනය කරන ලදී.

## 3.5 නිෂ්පාදන කර්මාන්තවල තත්ත්වය හා ගුණාත්මකභාවය ඉහල නැංවීමේ වැඩසටහන්

- කර්මාන්ත සඳහා තත්ත්ව සහතික, සුරක්ෂිතතා සහ ක්‍රමවේද සම්බන්ධව සහතික ලබා ගැනීම සඳහා (ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001) අමාත්‍යාංශය විසින් තත්ත්ව හා ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

- මෙම වැඩසටහන සැකසූ ආහාර කර්මාන්ත අංශය සඳහා සහ ඇසුරුම්කරණ කර්මාන්ත, අගය එකතු කළ තේ කර්මාන්ත, අගය එකතුකළ කුළුබඩු සහ කොහු කර්මාන්ත යන අනෙකුත් කර්මාන්ත අංශ නියෝජනය වන පරිදි 2024 වර්ෂය සඳහා කර්මාන්ත 71 ක් වෙනුවෙන් පහසුකම් ලබා දීමට අවස්ථාව සලසා ඇත.
  2024 වර්ෂයේදී ISO සහතිකකරණය සාර්ථකව නිමකරන කර්මාන්ත 38 සඳහා මූල්‍යමය පහසුකම් සැපයීම සිදු කර ඇත.

- අමාත්‍යාංශය විසින් ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යහපත් නිපැයුම් පරිචයන් (GMP) පිළිබඳ සහතිකපත් වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. තෝරාගත් කර්මාන්ත සඳහා GMP සහතිකයන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා INDExpo ආයතනයන් ගෙන් ලබා ගැනීමේ දී ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාදේ. මෙම වැඩසටහන සඳහා කර්මාන්ත 35ක් 2024 වර්ෂයේදී තෝරා ගන්නා ලදී. මෙම වර්ෂයේදී ISO සහතිකකරණය සාර්ථකව නිමකරන කර්මාන්ත 12 සඳහා මූල්‍යමය පහසුකම් සැපයීම සිදු කර ඇත.

- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රෙය් නිරත වන කාර්මික ශිල්පීන්ගේ කුසලතා හා තාක්ෂණික දැනුම වර්ධනය කිරීමේ ව්‍යපෘතිය අමාත්‍යාංශය හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක වන අතර මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත වන කාර්මික ශිල්පීන්ගේ කුසලතා හා තාක්ෂණික දැනුම වර්ධනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම ව්‍යපෘතිය මධ්‍යස්ථාන 15 ක් යටතේ කාර්මික ශිල්පීන් පුහුණු කිරීමට අපේක්ෂා කරයි .2024 දෙසැම්බර් මස වන විට මැණික් කැපීම හා ඔප දැමීම සහ ස්වර්ණාභරණ නිෂ්පාදනය යන පාඨමාලා 12ක් සාර්ථකව අවසන් කර ඇත.

# 4. නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය

## 4.1 උපදේශක කමිටු පිහිටුවීම.

- දේශීය කර්මාන්ත ශක්තිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව සපුරාලීම මත කර්මාන්ත අංශ සඳහා නව උපදේශක කමිටු 20ක් පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශයේ සහභාගීත්වය සහිතව පිහිටුවීමට කටයුතු කර ඇත. නව උපදේශක කමිටුවල ක්‍රියාකාරිත්වය හරහා ආනයනික නිෂ්පාදන අමුද්‍රව්‍ය සඳහා අයකරන තීරු බදු සඳහා සහන ලබා දීම සම්බන්ධයෙන් වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සමඟ අවශ්‍ය කටයුතු සිදු කරමින් නිෂ්පාදන ගණනාවක් සඳහා තීරු බදු සහන ලබා දී ඇත. කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කරලීම සඳහා මෙම කමිටු මේ වන විට ඉතා සාර්ථකව ක්‍රියාත්මක වේ.

## 4.2 කර්මාන්ත ප්‍රවර්ධනය හා අලෙවිකරණය.

### කර්මාන්ත ප්‍රදර්ශන

- දේශීය කර්මාන්තකරුවන් සවිබල ගැන්වීමේ අරමුණින් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ආයතන, අනෙකුත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ සහයෝගයෙන් සංවිධානය කරන ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනය “Industry EXPO 2024” ජුනි 19 සිට 23 දක්වා BMICH හිදී පවත්වන ලදී.

- 2024 වර්ෂයේ ජාතික රථ වාහන පෙළපාලිය ජූනිමස 18 වන දින සාර්ථකව පැවැත්විණි. මෙය මෝටර් රථ කර්මාන්ත ක්ෂේත්‍රයේ දේශීය ව්‍යවසායකයින් 29 දෙනෙකු සම්බන්ධ වී සංවිධානය කෙරුණු අතර මෙහිදී රථ වාහන වර්ග 150කට අධික ප්‍රමාණයක් ප්‍රදර්ශනය කෙරිණි.

- 2007 සිට වාර්ෂිකව පවත්වනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය 2024 වර්ෂයේ පෙබරවාරි මස 8, 9,10 සහ 11 යන දිනයන්හි දී බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සාර්ථකව පවත්වන ලදී. මේ සඳහා දේශිය පාවහන් හා පාවහන් ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ වෙළදකුටි 215ක් සංවිධානය කෙරිණි.

- දේශීය හා විදේශීය ප්‍රදර්ශකයින් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය සමග ඒකාබද්ධව Profoods/Propack ප්‍රදර්ශනය 2024 අගෝස්තු මස 23,24,25 යන දිනයන් වල දී බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී සාර්ථකව නිමකරන ලදී.

- ඇසුරුම් නිෂ්පාදනයේ යෙදී සිටින දේශීය කර්මාන්ත වලට විදේශීය වෙළඳපොළ අවස්ථා වැඩිකර ගැනීමට “ලංකා පැක් -2024” ප්‍රදර්ශනය 2024 ඔක්තෝබර් මාසයේ 25,26 හා 27 යන දිනයන්හි දී බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලවේදී පවත්වන ලදී.

- 2024 වර්ෂයේදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයක් සාර්ථක ලෙස පවත්වන ලද අතර, දේශීය හා විදේශීය ප්‍රදර්ශන කුටි 83 ක් සංවිධානය කර තිබුණි. මෙම ප්‍රදර්ශනය නැරඹීම සඳහා දෙස් විදෙස් පුද්ගලයින් 7000 කට වැඩි පිරිසක් පැමිණ තිබිණි.

- අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා පවතින ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම යටතේ ප්‍රමුඛතා ක්ෂේත්‍ර ලෙස හඳුනාගෙන ඇති තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ සේවා (ICT/BPM) කුළුබඩු සහ සාන්ද්‍රණ ද්‍රව්‍ය, බෝට්ටු ගොඩනැගීම, ආහාර සහ පානවර්ග, විදුලි සහ ඉලෙක්ට්‍රොනික සංරචක සහ සැපයුම් අංශ ඉලක්ක කර ගනිමින් අපනයන සංවර්ධන මණ්ඩලය ප්‍රධාන මුලපිරීම් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත.

### 4.3 Industry 4.0 සඳහා උපායමාර්ගික පරිවර්තනය

බටහිර සිඩ්නි විශ්ව විද්‍යාලයෙහි පර්යේෂක කණ්ඩායමක් විසින් ගොඩනගන ලද කර්මාන්ත සංවර්ධනයෙහි හතරවන මට්ටම (Industry 4.0) කරා ළඟා වීමෙහි සූදානම පිළිබඳව ස්වයං ඇගයීමේ වැඩසටහනක්, ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (Federation of Chambers of Commerce and Industry of Sri Lanka - FCCISL) හා ඒකාබද්ධ වී, ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් විවිධ අනුඅංශයන් නියෝජනය කරන දේශීය නිෂ්පාදන කර්මාන්ත රැසක් අරභයා පවත්වන ලදී.

- **පර්යේෂණ සහ නව නිපැයුම් දත්ත පද්ධතිය**

  පර්යේෂණ සහ නව නිපැයුම් සංවාද සම්මන්ත්‍රණය සඳහා ඉදිරිපත් වූ නව නිපැයුම් ඇතුලත් කරමින් දත්ත පද්ධතියක් සකස් කිරීම ආරම්භ කර ඇත.

## 5. ඛනිජ සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතයට ගැනීම

### 5.1 ඛනිජවැලි කර්මාන්තයේ ආර්ථික දායකත්වය

- 2024 ජනවාරි - දෙසැම්බර් දක්වා ඛනිජවැලි අලෙවිය තුළින් උපයාගෙන ඇති ආදායම ඇමරිකන් ඩොලර් **2,283,256.57**ක් (රාජ්‍ය භාගය රහිතව) වේ.

### 5.2 මැණික් අපනයන ආදායම ඉහල නැංවීම

- 2024 දෙසැම්බර් මස 31 දින වන විට මැණික්, ස්වර්ණාභරණ හා දියමන්ති නිෂ්පාදන අපනයනය කිරීම තුළින් උපයාගෙන ඇති අපනයන වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 355 ක් වේ.

### 5.3 ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව

ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් එනම් 70% ක් පමණ මැණික් නිධි පවතින බව ඇස්තමේන්තු කර ඇති අතර, මෙම සම්පත් වලින් මේ වන විට 20% ක් පමණක් මේ දක්වා ගවේෂණය කර ඇත. මෙම තත්ත්වය යටතේ නව මැණික් නිධි ගවේෂණය ප්‍රමුඛ කාර්යයක් සේ හඳුනා ගෙන ඇති අතර, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් නව තාක්ෂණය භාවිතා කරමින් නව මැණික් නිධි ගවේෂණය කිරීමට කටයුතු කරමින් පවතී.

2024 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ ඉංගිරිය, දෙහිඕවිට, අයගම හා පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මූලික මැණික් විභව සිතියම් ගත කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

# 6. කර්මාන්ත පුනර්ජීවනය

## 6.1 ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම (හිඟුරාන සීනි කර්මාන්ත සමාගම)

- ගල්ඔය වැවිලි සමාගම යනු හිඟුරාන සීනි කර්මාන්තය පුනර්ජීවනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ පෞද්ගලික අංශය අතර හවුල් ව්‍යාපාරයක් ලෙස පිහිටුවන ලද සමාගමක් වන අතර එහි අයිතියෙන් 51%ක් ශ්‍රී ලංකා රජය සතුව හා 49% ක හිමිකාරීත්වය බ්‍රවුන් සහ සමාගම හා LOLC හෝල්ඩිංස් සමාගම සතු වේ. ගල්ඔය වැවිලි සමාගමේ කළමනාකාරීත්වය ගිවිසුමක් යටතේ පෞද්ගලික අංශය වෙත ලබා දී ඇත.

- අද වන විට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින ගල්ඔය වැවිලි සමාගම ඍජු සේවකයන් 1,300 කට අධික ප්‍රමාණයකට රැකියා ලබා දී ඇති අතර හෙක්ටයාර 10,853 ක කෘෂි ඉඩම්වල ගොවීන් 11,376ක් සම්බන්ධ කර ගනිමින් උක් වගාවේ නිරත වන අතර 60,000කට අධික පිරිසක් මෙම ව්‍යාපෘතියෙන් වක්‍ර රැකියා අවස්ථා ලබා ඇත.

## 6.2 සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම

- 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසාය හෝ ඌන උපයෝගිතා වත්කම් පුනර්ජීවනය කිරීමේ පනත යටතේ එතෙක් පුද්ගලික හිමිකාරීත්වය යටතේ පැවති පැල්වත්ත සහ සෙවණගල සීනි කර්මාන්ත ශාලා රජයට පවරා ගන්නා ලද අතර සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම යටතේ සාර්ථකව ක්‍රියාත්මක වේ.

- සමාගම පිටස්තර වගාකරුවන්ගෙන් සහ තමන්ගේම වතුවලින් උක් සපයාගනී. දැනට සමාගමේ ගොවීන් 10,000ක් සහ සේවකයින් 5,367ක් පමණ සිටිති.

- 2024 වර්ෂයේ සීනි මෙ.ටො 39,720ක්, එතනෝල් ලීටර් 5,145,299ක් සහ මොලෑසස් මෙ.ටො 31,265ක් වශයෙන් නිෂ්පාදන කටයුතු සිදු කර ඇත.

## 6.3 ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්තශාලාව

ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ නැවත ආරම්භ කිරීම සඳහා අංක: අමප/22/0254/320/010 හා 2022.02.28 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර 2024.04.08 දින කොරියන් ස්පා පැකේජින් (පුද්) සමාගම විසින් සී/ස ජාතික කඩදාසි සමාගමට අයත් ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදී. මෙම කර්මාන්තශාලාව මගින් සිදු කිරීමට අපේක්ෂිත වාර්ෂික කඩදාසි නිෂ්පාදනය මෙ.ටො. 74250 කි.

# ප්‍රධාන අංශ

# 01

# ප්‍රතිපත්ති සංවර්ධන අංශය

## 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනගා ගැනීම ප්‍රමුඛතම අරමුණ කර ගනිමින්, රටේ සම්පත් භාවිතය උපරිම ලෙස යොදා ගනිමින්, කර්මාන්ත අභිමුඛ ඉලක්ක සපුරා ගැනීමට ශක්තිමත් කර්මාන්ත පදනමක අවශ්‍යතාව පැන නැඟී ඇත. විශේෂයෙන්ම නිෂ්පාදන, ඉදිකිරීම් සහ පතල් කර්මාන්ත හරහා කාර්මික අංශය තුළ දළ දේශීය නිෂ්පාදිතයට සැලකිය යුතු දායකත්වයක් සපයයි. එය නවෝත්පාදන සහ තාක්ෂණික දියුණුව පෝෂණය කිරීමට සහ රටේ ගෝලීය තරඟකාරිත්වය වැඩි දියුණු කිරීමට සහාය වේ. මීට අමතරව කර්මාන්ත ක්ෂේත්‍රය රටේ අපනයන ප්‍රවර්ධනය කිරීම , විදේශ විනිමය උත්පාදනය කිරීම සහ වෙළඳ ශේෂය වැඩි දියුණු කරයි. මෙම අංශය ශක්තිමත් කිරීම ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික තිරසාරභාවය සහ සංවර්ධනය සඳහා හේතු වේ.

කර්මාන්ත අංශය සඳහා මනාව නිර්වචනය කළ හැකි සහ ඵලදායී ප්‍රතිපත්තියක අවශ්‍යතාවය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා මාහැඟි වේ. එවැනි ප්‍රතිපත්ති වර්ධනය සඳහා පැහැදිලි මාවතක් තිබීම, දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ කාර්මික අංශයේ නවෝත්පාදන සහ තාක්ෂණික දියුණුව සඳහා හිතකර පරිසරයක් පෝෂණය කිරීම වැදගත් වේ. උපාය මාර්ගික කර්මාන්ත ප්‍රතිපත්තිය මඟින් අපනයනය ඉලක්ක කරගත් කර්මාන්ත උත්තේජනය කළ හැකි අතර යටිතල පහසුකම් අවම වීම, කුසලතා හිඟය සහ මූල්‍ය දුෂ්කරතා වැනි අභියෝග සඳහා විසඳුම් ද ලබාගත හැකිය. තවද, ජාතික සංවර්ධන ඉලක්ක සමඟ කර්මාන්ත ප්‍රතිපත්ති පෙළගැස්වීමෙන්, ශ්‍රී ලංකාවට වඩාත් ගැලපෙන සහ විවිධාංගීකරණය වූ ආර්ථිකයක් නිර්මාණය කළ හැකිය.

කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සංවර්ධන අංශය කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනයට සහ සංවර්ධනයට මඟ පෙන්වන ප්‍රතිපත්ති සැකසීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ කර්මාන්ත උත්පාදනය කිරීමෙහි නිරත වේ. මෙම අංශය මඟින් කර්මාන්ත ප්‍රතිපත්ති, ජාතික ආර්ථික ඉලක්ක සමඟ පෙළගැසී ඇති බව සහතික කරන අතර, එහි විශේෂිත අභියෝග ආමන්ත්‍රණය කරයි. කර්මාන්ත සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් නියාමන රාමුවක් නිර්මාණය කිරීමේ වගකීම ප්‍රතිපත්ති සංවර්ධන අංශය සතු වේ.

**කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

දේශීය නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි අභිවෘද්ධිය සඳහා සුදුසු උපායමාර්ගික දිශානතියක් නොමැති වීම සැලකිල්ලට ගෙන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් පුළුල් අදහස් විමසීමක් මත පදනම් වී කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය 2022 වසරෙහිදී සකස් කරන ලදී.

එකී කර්මාන්ත ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම, ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට හා එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු 17 ට අනුකූලව සකස් කරනු ලැබුවේ, පොදුවේ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා හිතකර පරිසරයක් සකස් කිරීමට මෙන්ම, ඉහළ ස්ථරවල ක්‍රියාත්මක වන කර්මාන්ත, කර්මාන්ත සංවර්ධනයේ 4.0 වන මට්ටම කරා ළඟා වීමට අවශ්‍ය පහසුකම් සැලසීමටය.

දීර්ඝ කාලීන ප්‍රතිපත්ති ලේඛණයක් වන කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය, පස් අවුරුදු උපායමාර්ගික සැලසුම් මාලාවක් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරෙන අතර 2023 සිට 2027 දක්වා අදාල වන ඉන් පළමුවැන්න මේ වන විට සකස් කර ඇත.

**ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදන / එකලස් කිරීමේ කර්මාන්තය සහ මෝටර් රථ සංරචක නිෂ්පාදන කර්මාන්තය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP)**

ප්‍රතිපත්ති සංවර්ධන අංශයේ එක් ප්‍රධාන වගකීමක් වන්නේ මෝටර් රථ කර්මාන්තයේ වර්ධනයට සහ සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දිය හැකි මෝටර් රථ අංශය සඳහා බදු සහන නිර්දේශ කිරීමයි. මේ සම්බන්ධයෙන්, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් දේශීය වාහන එකලස් කිරීම සඳහා පැහැදිලි මාර්ගෝපදේශ, රෙගුලාසි සහ ක්‍රියා පටිපාටි දක්වා ඇති පුළුල් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) සකස් කරන ලදී. SOP යනු දේශීය වාහන නිෂ්පාදන මුලපිරීම් කාර්යක්ෂමව සහ විනිවිදභාවයෙන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා නිර්මාණය කර ඇති සවිස්තරාත්මක, ස්වයං පැහැදිලි ලේඛනයකි.

දේශීයව නිෂ්පාදනය කරන ලද උපාංග භාවිතා කරමින් මෝටර් රථ දේශීයව එකලස් කිරීම දිරිමත් කිරීම සඳහා අමාත්‍යාංශය ක්‍රියාකාරීව කටයුතු කරයි. මෙම මුලපිරීම මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තයේ වර්ධනය පෝෂණය කිරීම පමණක් නොව දේශීය සංරචක නිෂ්පාදන කර්මාන්තය දිරිගැන්වීම ද අරමුණු කරයි. දේශීය එකලස්කරන්නන් සඳහා ප්‍රතිපත්තිමය ව්‍යුහාත්මක රාමුවක් ලබා දීමෙන්, ශක්තිමත් සැපයුම් දාමයක් සංවර්ධනය කිරීමට දිරිමත් කරන අතර රට පුරා නව රැකියා අවස්ථා නිර්මාණය කිරීමට සහාය වේ. මීට අමතරව, දේශීය අගය එකතු කිරීම කෙරෙහි ප්‍රතිපත්තියේ අවධානය යොමු කිරීම ශ්‍රම බලකායේ නිපුණතා සංවර්ධනය, තාක්‍ෂණික හැකියාවන් ඉහළ නැංවීම සහ අවසානයේ දේශීය මෝටර් රථ අංශය ශක්තිමත් කිරීම කෙරෙහි දායක වේ.

### මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීම

මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සැලසුම් කර ඇත්තේ ඒ සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කරමින් අංශයේ වර්ධනය වේගවත් කිරීමට ය. ප්‍රතිපත්තියේ මූලික ඉලක්ක අතරට දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම, නවෝත්පාදන දිරිගැන්වීම, තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම සහ කර්මාන්තය තුළ ආරක්ෂිත ප්‍රමිතීන් ඉහළ නැංවීම ඇතුළත් වේ. කර්මාන්තය පුරා ඉහළ ආරක්ෂිත ප්‍රමිතීන් පවත්වා ගැනීමේ වැදගත්කම ද අවධාරණය කරන අතර කාර්යක්ෂමතාව සහ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීමට ඩිජිටල් තාක්ෂණයන් අනුගමනය කිරීම සඳහා දිරිමත් කරයි.

ප්‍රතිපත්තියේ ප්‍රධාන අවධානය යොමු වන්නේ හරිත සංචලනයේ මූලධර්ම සමඟ සමපාත වන ගෝලීය වශයෙන් තරඟකාරී වාහන නිෂ්පාදනයට දිරිමත් කිරීමයි. විද්‍යුත් වාහන වැනි පරිසර හිතකාමී තාක්ෂණයන්ට ප්‍රමුඛත්වය දීම සහ නිෂ්පාදනය පුරාවට තිරසාර භාවිතයන්ට සහාය වීම මෙයට ඇතුළත් වේ. මීට අමතරව, සංවර්ධනය වෙමින් පවතින කර්මාන්තයක අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රවීණතාවයෙන් ශ්‍රම බලකාය සන්නද්ධ කිරීම අරමුණු කර ගනිමින් ප්‍රතිපත්තිය නිපුණතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරයි.

### දේශීය එකලස් කිරීම / විදුලි සහ ඉලෙක්ට්‍රොනික අයිතම නිෂ්පාදනය

දේශීය අගය එකතු කිරීමත් සමඟ විදුලි හා ඉලෙක්ට්‍රොනික භාණ්ඩ දේශීය එකලස් කිරීම / නිෂ්පාදනය කිරීම ද ප්‍රතිපත්ති සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කෙරේ. 2016.11.10 දිනැති අංක 1992/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ විශේෂයෙන් HS කේත 84 සහ 85 යටතේ වැටෙන දේශීයව එකලස් කරන ලද හෝ නිෂ්පාදනය කරන ලද විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ සඳහා තීරු බදු නිදහස් කිරීම් වසර පුරාවටම අඛණ්ඩව සිදු කරනු ලැබේ. මෙසේ නිදහස් කිරීම් දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ දේශීයව නිෂ්පාදිත විදුලි උපකරණ වෙළඳපොලේ වඩාත් තරඟකාරී කිරීම අරමුණු කර ගෙන ඇත.

දේශීය නිෂ්පාදන කර්මාන්ත අංශය තුළ වර්ධනය වන හැකියාවන්ගේ සෘජු ප්‍රතිඵලයක් ලෙස දේශීය අගය එකතු කිරීම්වල වැඩිවීම හඳුනාගත හැකිය. දේශීයව නිෂ්පාදනය කරන ලද විදුලි හා ඉලෙක්ට්‍රොනික මාදිලිවල ඉහළ යාම ආනයනික භාණ්ඩ මත යැපීම අඩු කරනවා පමණක් නොව ගුණාත්මක හා නව්‍යකරණය යන දෙඅංශයෙන්ම දේශීය කර්මාන්තවල ප්‍රගතිය පෙන්නුම් කරයි. එපමණක් නොව ආයෝජන ක්ෂේත්‍රයට මෙම වර්ධනය නිෂ්පාදන පහසුකම් පුළුල් කිරීම, නිෂ්පාදන තාක්ෂණයන් වැඩිදියුණු කිරීම සහ රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් නිර්මාණය කිරීම සඳහා උපකාරී වන සැලකිය යුතු වටිනාකමක් එක්කර ඇත.

### කර්මාන්ත අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (NDC) ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාව, පැරිස් ගිවිසුමේ පාර්ශවකරුවෙකු ලෙස, දේශගුණික ක්‍රියාමාර්ග සඳහා ප්‍රගතිශීලී සහ හැකි ඉහළම අභිලාෂය පිළිබිඹු කරමින් දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට (UNFCCC) යාවත්කාලීන කළ ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (NDCs) ඉදිරිපත් කළේය. දේශගුණික විපර්යාස නිසා ඇතිවන උවදුරුවලට වඩාත්ම අවදානමට ලක්විය හැකි රටවල් අතර ශ්‍රී ලංකාව ද ශ්‍රේණිගත කර ඇත. ඉන්දියන් සාගරයේ සර්ම කලාපීය දූපතක් වන ශ්‍රී ලංකාව ගෝලීය දේශගුණික අවදානම් දර්ශකයට අනුව ආන්තික කාලගුණික විපර්යාසවල අවදානම් සහිත පළමු රටවල් දහය අතරට නිරතුරුවම ස්ථානගත වී ඇත.

අඩු කාබන් පියසටහනක් තිබියදීත්, දේශගුණික විපර්යාසවල ඇති අවදානම සලකා, ශ්‍රී ලංකාව සිය හරිතාගාර වායු විමෝචනය අඩු කිරීමට කැපවී සිටී. මෙම NDCs තුළ, ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස අවම කිරීමේ කැපවීම් සහ අනුවර්තනය වීමේ අවශ්‍යතා, අලාභය සහ හානි සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රම පිළිබඳව අංශ අනුව සංවිධානය කරන ලද වැඩිදියුණු කළ අභිලාෂයක් රට විසින් ඉදිරිපත් කරයි.

ශ්‍රී ලංකාව කර්මාන්ත අංශයෙන් විමෝචනය 3%ක් කොන්දේසි විරහිතව සහ 7%ක් කොන්දේසි සහිතව අඩු කිරීමට ඉලක්ක කර ඇත. 2021 සිට 2030 දක්වා ක්‍රියාත්මක කාල සීමාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත අංශයට අදාළ NDC 7ක් ඇත.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම හරහා කර්මාන්ත අංශයේ NDC ක්‍රියාවට නංවයි, එසේම පුනර්ජනනීය බලශක්ති, බලශක්ති සහ සම්පත්-කාර්යක්ෂම තාක්ෂණයන් සහ හොඳම භාවිතයන් යෙදවීම වේගවත් කිරීම සඳහා නියාමන, තාක්ෂණික සහ මූල්‍ය යාන්ත්‍රණ සහ මෙවලම්. සම්පත් කාර්යක්ෂමතාව, චක්‍රීය ආර්ථිකය සහ අනෙකුත් ජාත්‍යන්තරව පිළිගත් සංකල්ප යොදා ගනිමින් සහ ඇතුළත් කර ගනිමින් මේවා අවම කිරීමේ අභිලාෂයන් වැඩි දියුණු කරනු ඇත. කාර්මික ක්‍රියාවලි සහ නිෂ්පාදන භාවිතය (IPPU) ආශ්‍රිත ක්‍රියාවන් සඳහා සීමිත මාර්ග සහ විශ්වාසනීය දත්ත මූලාශ්‍ර ඇති බැවින් මෙම NDCs සෘජුව හෝ වක්‍රව බලශක්ති පරිභෝජනය මත පදනම් වූ විමෝචන කෙරෙහි අවධානය යොමු වේ.

## 1.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

පස් අවුරුදු උපායමාර්ගික සැලසුම් වලින් පළමුවැන්න, එහි එක් එක් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති විවිධ ආයතන හා අංශ විසින් 2023 ජනවාරි මස සිට ක්‍රියාත්මක කරන ලදී.

### කර්මාන්ත සංවර්ධනයෙහි හතරවන මට්ටම (Industry 4.0) කරා ළඟා වීමේ හැකියාව පිළිබඳව ස්වයං ඇගයීම

"ඩිජිටල්කරණය සහ කාර්මික පරිණාමය තුලින් හතරවන කාර්මික විප්ලවයට" යනු කර්මාන්ත ප්‍රතිපත්තියෙහි අන්තර්ගත ප්‍රතිපත්ති මූලධර්ම දහය අතරින් එකක් වන අතර, උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මෙහි එක් පරිච්ඡේදයක් මෙම ප්‍රතිපත්ති මූලධර්මය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් වී ඇත.

බටහිර සිඩ්නි විශ්ව විද්‍යාලයෙහි පර්යේෂක කණ්ඩායමක් විසින් ගොඩනගන ලද කර්මාන්ත සංවර්ධනයෙහි හතරවන මට්ටම (Industry 4.0) කරා ළඟා වීමෙහි සූදානම පිළිබඳව ස්වයං ඇගයීමේ වැඩසටහනක්, ඉහත කී ප්‍රතිපත්ති මූලධර්මයට අනුකූලව, ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (Federation of Chambers of Commerce and Industry of Sri Lanka - FCCISL) හා ඒකාබද්ධ වී, ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් විවිධ අනුඅංශයන් නියෝජනය කරන දේශීය නිෂ්පාදන කර්මාන්ත රැසක් අරභයා පවත්වන ලදී.

මෙලෙස මාර්ගගත මෙවලමක් මගින්, නිර්ණායක අටක් ඔස්සේ, දේශීය කර්මාන්තයන්හට කර්මාන්ත සංවර්ධනයෙහි හතරවන මට්ටම කරා ළඟා වීමේ හැකියාව පිළිබඳව ස්වයං ඇගයීමක් සිදුකිරීමේ හැකියාව ලැබුණු අතර, මෙකී ඇගයීමේ ප්‍රතිඵල, තාක්ෂණය ඉහළ නැංවීම, නිපුණතා සංවර්ධනය හා පර්යේෂණ හා සංවර්ධන වැනි ක්ෂේත්‍රයන්හි ආයෝජනය කිරීම ආදී තීරණයන් ගැනීමේදී ප්‍රයෝජනවත් වනු ඇත.

### ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදන / එකලස් කිරීමේ කර්මාන්තය සහ මෝටර් රථ සංරචක නිෂ්පාදන කර්මාන්තය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP)

2021 දී මෝටර් රථ නිෂ්පාදන සහ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා මෙන්ම මෝටර් රථ උපාංග නිෂ්පාදන කර්මාන්තය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) හඳුන්වා දීමෙන් පසු, මෙම අංශය පසුගිය වසර තුන තුළ කැපී පෙනෙන වර්ධනයක් සහ ප්‍රගතියක් ලබාගෙන ඇත.

2024 දෙසැම්බර් 31 වන විට, රට තුළ නව වාහන මාදිලි අසූ එකක් (81) එකලස් කිරීමට මෝටර් රථ එකලස් කිරීමේ ආයතන තිස් හයක් (36) වෙත අනුමැතිය ලබා දී ඇත. වාහන එකලස් කිරීමේ කර්මාන්තයේ අඛණ්ඩ ව්‍යාප්තිය සහ විවිධාංගීකරණය පිළිබිඹු කරමින් 2024 වර්ෂය තුළ පමණක් මෙම ආයතනවලින් ආයතන තුනකට (03) සහ නව වාහන මාදිලි දහයකට (10) අනුමැතිය ලැබී ඇත.

සම්මත මෙහෙයුම් පටිපාටිය ක්‍රියාත්මක කිරීමෙන් පසු, එකලස් කරන ලද මුළු මෝටර් රථ සංඛ්‍යාව 94,138 කි. 2024 වර්ෂය තුල එකලස් කරන ලද මුළු වාහන සංඛ්‍යාව 63,331ක් වන අතර එයට සිව් රෝද රථ 2,010 ක්, විදුලි ත්‍රිරෝද රථ 30 ක් සහ බයිසිකල් 61,291 ක් ඇතුළත් වේ. මීට අමතරව මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය ඍජු හා වක්‍ර රැකියා අවස්ථා සැලකිය යුතු ප්‍රමාණයක් ජනනය කර ඇති අතර මෙම අංශය දැනට මෝටර් රථ එකලස් කිරීමේ ඍජු රැකියා අවස්ථා 2,632 ක් බිහිකර ඇත. එසේම, මෝටර් රථ උපාංග නිෂ්පාදන අංශය අතිරේක ඍජු රැකියා අවස්ථා 2,978 කට දායක වේ. මෙම ඍජු රැකියා අවස්ථා වලින් ඔබ්බට වක්‍ර රැකියා අවස්ථා රාශියක් ද උත්පාදනය වී ඇති අතර එමඟින් සමාජ හා ආර්ථික දියුණුව කෙරෙහි කර්මාන්තයේ බලපෑම තවදුරටත් පුළුල් වේ. මෙම රැකියා අතරට ලොජිස්ටික්ස්, බෙදාහැරීම්, නඩත්තු සේවා, පර්යේෂණ සහ සංවර්ධන, මෙන්ම සිල්ලර සහ පාරිභෝගික සේවා අංශවල රැකියා ද ඇතුළත් වේ.

### මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීම

මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තියේ අවසන් කෙටුම්පත සකස් කිරීම අවසන් කර ඇති අතර දැන් සවිස්තරාත්මක උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරමින් පවතී. මෙම උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම එකී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ලෙස ක්‍රියා කරයි. උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය පරිවර්තනය කිරීම සඳහා පැහැදිලි මැනිය හැකි අරමුණු, ක්‍රියා කළ හැකි පියවර සහ කාල නියමයන් ගෙනහැර දක්වයි. උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම අවසන් කිරීමෙන් පසු, පුළුල් පෙළගැස්මක් සහතික කිරීම සහ වටිනා අවබෝධය එක්රැස් කිරීම සඳහා මෝටර් රථ එකලස් කරන්නන්, සංරචක නිෂ්පාදකයින්, රජයේ නිලධාරීන් සහ පාරිසරික නිලධාරීන් ඇතුළු ප්‍රධාන පාර්ශවකරුවන් රාශියක් සමඟ සාකච්ඡා කිරීමට උපදේශන මාලාවක් පවත්වනු ලැබේ.

### දේශීය එකලස් කිරීම / විදුලි සහ ඉලෙක්ට්‍රොනික අයිතම නිෂ්පාදනය

2024 දී ශීතකරණ සහ රෙදි සෝදන යන්ත්‍ර ඇතුළු විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ දේශීයව එකලස් කිරීම / නිෂ්පාදනය කිරීම ද රට තුළ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත. දේශීය එකලස් කිරීම සඳහා ශීතකරණ ආකෘති 35 ක්, රෙදි සෝදන යන්ත්‍ර ආකෘති 26 ක් සහ අධිශීතකරණ මාදිලි 8 කින් සමන්විත මුළු විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ 69 ක් වෙත නිර්දේශ ලබා දී ඇත. මෙම වසරේ පමණක් මෙම අංශය විදුලි උපකරණ නව මාදිලි 18 ක් වෙතද නිර්දේශ ලබා දී ඇත.

මෙම සියලු උපකරණ, 30% ඉක්මවන සැලකිය යුතු දේශීය අගය එකතු කිරීමක් ඇත. මෙම විදුලි උපකරණ ආකෘති බොහොමයක් 60% සිට 70% දක්වා ඉහළ දේශීය අගය එකතු කිරීමකින් යුක්තය. දේශීයව නිෂ්පාදන/ එකලස් කරන ලද විදුලි උපකරණ සඳහා දේශීය වෙළඳපොළෙන් 75%ක වෙළඳපොළ කොටසක්

හිමි වී ඇත. දේශීය නිෂ්පාදනයේ මෙම සැලකිය යුතු වර්ධනය නිසා ආනයනය මත රට යැපීම අඩු වී ඇති අතර, විදේශීය නිෂ්පාදිත උපකරණ වෙළඳපොළට පැමිණීම ද අඩු වී ඇත. මෙම කර්මාන්තයේ ව්‍යාප්තිය දේශීය සැපයුම් දාම ශක්තිමත් කිරීම, නිපුණතා සංවර්ධනය සහ නව රැකියා අවස්ථා නිර්මාණය කිරීම මගින් රටේ සමස්ත සංවර්ධනයට දායක වේ.

**කර්මාන්ත අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (NDC) ක්‍රියාත්මක කිරීම**

NDC හතට අදාළ කර්මාන්තයේ යම් යම් උප ක්‍රියාකාරකම් 2023 සහ 2024 වසර පුරා ක්‍රියාත්මක කර ඇත. 2024 දී ක්‍රියාත්මක කළ වැදගත් උප ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

1. සම්පත් කාර්යක්ෂම පිවිතුරු නිෂ්පාදන (RECP) සහ බලශක්ති විගණන පැවැත්වීම
2. වැඩි දියුණු කළ සම්පත් කාර්යක්ෂමතාව සඳහා අඩු කාබන් තාක්ෂණයන් සහ ක්‍රියාවලීන් අනුගමනය කිරීම
3. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) කලාප කිහිපයක හරිත සංකල්ප පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජල භාවිතය වැඩි දියුණු කිරීම තෝරාගත් කර්මාන්ත අංශවල කාර්යක්ෂමතාව ඉහළ දැමීම.
4. චක්‍රීය ආර්ථික සංකල්පය අනුගමනය කිරීම සඳහා කර්මාන්ත ධාරිතාව ගොඩනැගීම
5. අදාළ ISO ප්‍රමිතීන් අනුගමනය කිරීමට තෝරාගත් අංශවල කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම
6. ආයෝජන සඳහා පහසුකම් සැලසීම, මූල්‍යාකරණය හරහා හිතකර ණය හරිත මූල්‍යකරණය හා සම්බන්ධ ආයතන

## 1.3 අනාගත සැලැසුම් - 2025

**කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

කර්මාන්ත අමාත්‍යාංශයේ විවිධ අංශ සහ ආයතන හැර අනෙකුත් සියලුම වගකිවයුතු බාහිර ආයතන විසින් ක්‍රමෝපායික සැලැස්ම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම මගින් කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

**ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදන / එකලස් කිරීමේ කර්මාන්තය සහ මෝටර් රථ සංරචක නිෂ්පාදන කර්මාන්තය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP)**

පසුගිය වසර තුනක කාලය තුළ දේශීය මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය මුහුණ දුන් අභියෝග සහ ප්‍රායෝගික අත්දැකීම් පිළිබඳ සවිස්තරාත්මක පරීක්ෂණයක් සමඟින් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) පළමු අනුවාදයේ සමාලෝචනය දැනට සිදු වෙමින් පවතී. මෙම සමාලෝචන ක්‍රියාවලියේ අරමුණ වන්නේ දැනට භාවිතයේ පවතින සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියෙහි සඵලතාවය තක්සේරු කිරීම, එහි පැහැදිලිභාවයට සහ අදාළත්වයට බාධාවක් වන ක්ෂේත්‍රය හඳුනා ගැනීම සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය පැහැදිලි, විස්තීර්ණ සහ ක්‍රියාකාරී මඟ පෙන්වීමක් සපයන බව සහතික කිරීමයි. මෙම සමාලෝචන ක්‍රියාවලිය 2025 මුල් භාගයේදී අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර, යාවත්කාලීන කරන ලද සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය 2025 දී දෙවන අනුවාදයේදී දියත් කිරීමට නියමිතය.

### මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීම

උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම අවසන් වූ පසු මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය 2025 දී කැබිනට් අනුමැතිය සඳහා විධිමත් ලෙස ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. කැබිනට් අනුමැතිය ලැබීමෙන් පසු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන අතර එමඟින් මෝටර් රථ නිෂ්පාදන/ එකලස් කිරීමේ කර්මාන්තයේ ධනාත්මක සහ තිරසාර පරිවර්තනයන් සඳහා පැහැදිලි අවධානයක් යොමු වේ. උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක් හරහා ආර්ථික වර්ධනයට සහ ජාතික සංවර්ධන ඉලක්කවලට දායක වෙමින් දේශීය මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තයේ සම්පූර්ණ විභවය හෙළිදරව් කිරීම ප්‍රතිපත්තිය මගින් අපේක්ෂා කෙරේ.

### දේශීය එකලස් කිරීම / විදුලි හා ඉලෙක්ට්‍රොනික අයිතම නිෂ්පාදනය

දේශීය විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ එකලස් කිරීමේ/ නිෂ්පාදනය කිරීමේ අනාගත නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීම, තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම සහ ක්ෂේත්‍රයේ සමස්ත තරඟකාරිත්වය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නවෝත්පාදනය, තිරසාරභාවය සහ දේශීය අගය එකතු කිරීම තවදුරටත් වැඩි කිරීම සහ ආනයන මත යැපීම අඩු කිරීම අවධාරණය කරමින් වඩාත් දියුණු සහ බලශක්ති කාර්යක්ෂම මාදිලි හඳුන්වා දීමට අමාත්‍යාංශය දිරිමත් කරනු ඇත.

### කර්මාන්ත අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්වය (NDC) ක්‍රියාත්මක කිරීම

ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව (NDCs) යටතේ දක්වා ඇති බොහෝ උප ක්‍රියාකාරකම් දිගුකාලීන තිරසාර අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් 2030 දක්වා දිගටම ක්‍රියාත්මක කරනු ඇත. පාරිසරික කර්මාන්ත උද්‍යාන පිහිටුවීම වැනි ප්‍රධාන ක්‍රියාකාරකම් ආරම්භ කළයුතුව ඇත. මීට අමතරව, පසුගිය වසර දෙක තුළ ආරම්භ නොකළ උප ක්‍රියාකාරකම්, අදාළ නියෝජිතායතනවල සහයෝගය සහ සහභාගීත්වය ඇතිව 2025 දී ප්‍රමුඛත්වය දී ආරම්භ කරනු ලැබේ.

# 02

# කර්මාන්ත සංවර්ධන අංශය

## 2.1 හැඳින්වීම

### ප්‍රධාන අරමුණු / පරමාර්ථ

සංවර්ධිත ප්‍රදේශවල පමණක් විසිරී ඇති කාර්මික අංශය, ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධනය කර ජාතික ආදායමට කාර්මික අංශයේ දායකත්වය ඉහළ නැංවීම කර්මාන්ත අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන අංශයේ කාර්ය භාරය වේ. නව කර්මාන්තපුර පිහිටුවීමෙන් සහ පවතින කර්මාන්තපුර සංවර්ධනය කිරීම තුළින් ප්‍රාදේශීය මට්ටමින් නව රැකියා අවස්ථා ඇති කිරීමෙන් මෙය සාක්ෂාත් කරගත හැකිය. ප්‍රාදේශීය මට්ටමින් කාර්මික අංශයේ ආයෝජන අවස්ථා සඳහා උනන්දු කිරීම, නව ආයෝජන අවස්ථා නිර්මාණය කිරීම, යටිතල පහසුකම් සැපයීම, ආයෝජකයන් සඳහා තාක්ෂණික සහාය සහ උපදේශන වැනි සේවා සැපයීම තුළින් කර්මාන්ත සංවර්ධන අංශය විසින් කාර්මික අංශයේ ප්‍රවර්ධනය සඳහා සිය ප්‍රයත්නය දරමින් සිටී.

### නව කර්මාන්තපුර පිහිටුවීම සහ පවතින කර්මාන්තපුරවල යටිතල පහසුකම් සංවර්ධනය

කර්මාන්ත සංවර්ධන අංශය මගින් ඉහත විස්තර කර ඇති කර්මාන්තපුරවල සංවර්ධන කටයුතු සිදු කරමින් ආයෝජකයන්ට ආයෝජන අවස්ථා ලබා දීම, රැකියා උත්පාදනය, අපනයන අගය එකතු කිරීම සහ ආනයන

ආදේශන ප්‍රවර්ධනය කිරීම සිදු කරයි. 2024 ජනවාරි සිට 2024 දෙසැම්බර් දක්වා කාලය සඳහා රුපියල් මිලියන 1000 ක මුදලක් යටිතල පහසුකම් ක්‍රියාකාරකම් සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සඳහා වෙන් කරන ලදී.

2024 වර්ෂය තුළ යටිතල පහසුකම් සංවර්ධන/වැඩිදියුණු කිරීමේ කාර්යන් 14ක් සිදු කිරීමට නියමිතව තිබූ අතර එම සංවර්ධන කාර්යයන්ගෙන් 04ක් මේ වන විට අවසන් කර ඇත. ඉතිරි සංවර්ධන කාර්යයන් 7ක් සක්‍රියව සිදුකරමින් පවතින අතර 2024 වසර අවසන් වන විට ඒවා නිම කිරීමට අපේක්ෂා කෙරේ. නව කර්මාන්තපුර 7ක් ස්ථාපනය කිරීම ආරම්භ කර ඇති අතර 2025 වසර අවසන් වන විට කර්මාන්තපුර 3ක කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර, ඉතිරි කර්මාන්තපුර 4(හතර) 2026 අවසන් වන විට අවසන් කෙරේ.

## 2.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

අමාත්‍යාංශය විසින් අක්කර 1073.8ක වපසරියක කර්මාන්තපුර 34ක් විදුලිය, ජලය සහ ප්‍රවේශ මාර්ග වැනි යටිතල පහසුකම්වලින් සමන්විතව සංවර්ධනය කර ඇත. කර්මාන්තපුර 34ක මෙම සංවර්ධන කටයුතු සඳහා රජය විසින් රුපියල් මිලියන 4,947.19කට ආසන්න මුදලක් ආයෝජනය කර ඇත. මීට අමතරව, පුද්ගලික අංශය විසින් කර්මාන්තපුරවල තම කර්මාන්ත ඒකක පිහිටුවීම සඳහා රු. මිලියන 76,724.45ක් පමණ ආයෝජනය කර ඇත.

**සමස්ත සාරාංශය - කර්මාන්තපුර**

**(අ) පවතින කර්මාන්තපුර**

| 2024 සැප්තැම්බර් මසට සමුච්චිත ප්‍රගතිය | |
|---|---|
| කර්මාන්තපුර සංඛ්‍යාව | 34 |
| සංවර්ධිත භූමි ප්‍රමාණය (අක්කර) (එනම් විදුලිය, ජලය සහ මාර්ග පද්ධතිය) | 1073.8 |
| මුළු ආයෝජනය (ආසන්න වශයෙන්) (රු.මි.) | 81,671.94 |
| රජයේ ආයෝජනය(ආසන්න වශයෙන්) (රු.මි.) | 4,947.19 |
| පුද්ගලික ආයෝජනය(ආසන්න වශයෙන්) (රු.මි.) | 76,724.45 |
| වාණිජ නිෂ්පාදන කර්මාන්ත සංඛ්‍යාව | 382 |
| ඉදි කිරීම් අවස්ථාවේ ඇති කර්මාන්ත සංඛ්‍යාව | 19 |
| රැකියා අවස්ථා | 23,537 |
| කර්මාන්තපුරවල පවත්වනු ලැබූ ජංගම සේවා සංඛ්‍යාව | 2 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

**(ආ) දැනට ක්‍රියාත්මක නව කර්මාන්තපුර**

| 2024 දෙසැම්බර් 31වැනි දිනට සමුච්චිත ප්‍රගතිය | |
|---|---|
| කර්මාන්තපුර සංඛ්‍යාව | 7 |
| සංවර්ධනය වෙමින් පවතින භූමි ප්‍රමාණය (අක්කර) | 267.15 |
| රජයේ ආයෝජන (ආසන්න වශයෙන්) (රු.මි.) | 387.19 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

**කර්මාන්ත සංවර්ධන වැඩසටහන**

**(1) නව කර්මාන්ත සඳහා ඉඩම් වෙන් කිරීම**

| | |
|---|---|
| ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව විසින් අනුමත කර ඇති නව ව්‍යාපෘති යෝජනා ගණන | 30 |
| අමාත්‍යාංශ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද නව ව්‍යාපෘති යෝජනා ගණන | 24 |
| ව්‍යාපාර නම වෙනස් කර ඇති කර්මාන්ත ගණන | 7 |
| නිෂ්පාදන වෙනස් කර ඇති කර්මාන්ත ගණන. | 3 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

## (2) 2024 වර්ෂය සඳහා නව ව්‍යාපෘති/ යටිතල පහසුකම් ක්‍රියාකාරකම් සඳහා නිකුත් කරන ලද මුදල්

කර්මාන්තකරුවන් හට ආයෝජන අවස්ථා වැඩි දියුණු කරමින් කර්මාන්ත සංවර්ධන අංශය විසින් පහත සඳහන් කර්මාන්තපුරවල (IEs) යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සාර්ථකව සිදු කරයි. මේ සඳහා 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රුපියල් මිලියන 628.63ක් වෙන් කර ඇත.

### (අ) පවතින කර්මාන්තපුර සඳහා ආයෝජන

| කර්මාන්තපුරය | සංවර්ධනය කාර්යය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) |
|---|---|---|
| දංකොටුව | වැසි ජල කාණු පද්ධතිය ඉදිකිරීම | 20.30 |
| දංකොටුව | පරිපාලන ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කිරීම | 7.76 |
| නවගම්පුර | වැට අලුත්වැඩියා කිරීම | 2.65 |
| කරන්දෙණිය | ඇතුල්වීමේ දොරටුව, ආරක්ෂක කුටිය සහ නාම පුවරුව ඉදිකිරීම | 12.82 |
| කරන්දෙණිය | නල ළිඳ ඉදිකිරීම සඳහා භූ විද්‍යා විමර්ශනය | 0.70 |
| උණවටුන, ගාල්ල | ප්ලාසා සහ කෞතුකාගාර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | 65.00 |
| උලපනේ | අතුරු මාර්ග 7ක් සංවර්ධනය කිරීම | 1.33 |
| මතුගම | ආරක්ෂක වැට ප්‍රතිසංස්කරණය කිරීම | 0.27 |
| කරන්දෙණිය | ප්‍රධාන විදුලි කේබලය ප්‍රතිස්ථාපනය කිරීම | 0.72 |
| කරන්දෙණිය | ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 65.988 |
| බටඅත | තාර පැවියක් සවි කිරීම | 7.56 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

### *මතුගම කර්මාන්තපුරය*

රුපියල් මිලියන **0.27** ක වියදමින් ආරක්ෂක වැට ප්‍රතිසංස්කරණය **99%** ක් අවසන් කරන ලදී.

**ආරක්ෂක වැට ප්‍රතිසංස්කරණය - මතුගම කර්මාන්තපුරය**



### *කරන්දෙණිය කර්මාන්තපුරය*

රුපියල් මිලියන 12.82 ක වියදමින් ඇතුල්වීමේ දොරටුව, ආරක්ෂිත කුටිය සහ නාමපුවරුව ඉදිකිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.



### (ආ) දැනට ඉදිවන නව කර්මාන්තපුර

#### *සූරියවැව කර්මාන්තපුරය*

මාර්ග සංවර්ධනය සඳහා රුපියල් මිලියන 253.81ක්ද සමඟ සූරියවැව කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු අවසන් වන අතර එහි ඉඩම් ආයෝජකයින් අතර බෙදාදිය හැක.

**මාර්ග සංවර්ධනය - සූරියවැව කර්මාන්තපුරය**




#### *රයිගම - මිල්ලනිය කර්මාන්තපුරය*

අභ්‍යන්තර මාර්ග සංවර්ධනය, මූලික වැඩ, වෙනත්, IE වෙත පිවිසීම, වැසිකිලි, වැට, ගේට්ටුව සහ භූමි අලංකරණ කටයුතු සිදු වෙමින් පවතී.

**අභ්‍යන්තර මාර්ග සංවර්ධනය රයිගම - මිල්ලනිය කර්මාන්තපුරය**




## 2.3 අනාගත සැලැසුම් - 2025

**නව කර්මාන්තපුර සංවර්ධනය**

වසර 2025 අවසන් වන විට දැනට ක්‍රියාත්මක වෙමින් පවතින නව කර්මාන්තපුර (අළුතැපොල, දඹුල්ල, සඳමල්ගම, කටුනායක, රයිගම සහ වැල්ලවාය) නිම කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම නව අංශ පදනම් කරගත් විශේෂිත කර්මාන්තපුරයන් ලෙස ඉංගිරිය, රයිගම මිල්ලනිය (අදියර II), වාලච්චේන, පරන්තන්, පුලියන්කුලම, ආරච්චිකට්ටුව, තිහගොඩ, මාවතගම, ඇළයාපත්තුව සහ බිංගිරිය යන ප්‍රදේශවල අක්කර 470ක භූමි ප්‍රමාණයකින් යුතුව 2025 වර්ෂයේ දී සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

කාර්මික අංශයේ උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා ඉදිරි වසර තුළ අවම වශයෙන් ආයෝජකයින් 50 දෙනෙකු වෙත කර්මාන්තපුරවල ඉඩම් කට්ටි වෙන් කිරීමට අපේක්ෂා කෙරේ.

## පවතින කර්මාන්තපුරයන්හි සංවර්ධන තොරතුරු 2024 දෙසැම්බර් මස 31 දක්වා (සමුච්චිත)

| කර්මාන්තපුරයේ නම | ඉඩම් ප්‍රමාණය | 2024 දෙසැම්බර් මස 31 වන දිනට ව්‍යවසාය ගණන | මුළු සේවක සංඛ්‍යාව | මුළු පිරිවැටුම (රු. මිලියන) | රජයේ සමුච්චිත ආයෝජනය (රු. මිලියන) | පෞද්ගලික සමුච්චිත ආයෝජනය (රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| කළුතර | 55 | 33 | 1040 | 4951.08 | 126.04 | 4459.8 |
| කොළොන්නාව | 7 | 14 | 405 | 2532.48 | 36.17 | 630.3 |
| මහර | 3 | 7 | 172 | 2107.2 | 14.05 | 324.2 |
| මතුගම | 50 | 11 | 557 | 17142.48 | 174.698 | 6351.88 |
| මිල්ලෑව | 11 | 13 | 383 | 8009.76 | 97.054 | 604.38 |
| මිනුවන්ගොඩ | 15 | 13 | 600 | 4369.824 | 44.12 | 3474.866 |
| රත්මලාන | 17 | 19 | 1,188 | 8442.072 | 89.78 | 4543.14 |
| ටෙම්පල්බර්ග් | 48 | 39 | 1,715 | 9140.28 | 180.58 | 5148 |
| මිල්ලනිය | 24 | 0 | - | 0 | 876.701 | 0 |
| බුත්තල | 18.35 | 8 | 785 | 2580 | 118.76 | 2521 |
| ඌව පරණගම | 3.3 | 1 | 12 | 44.4 | 0.81 | 2 |
| බටඅත | 105 | 9 | 264 | 947.28 | 327.636 | 4186.682 |
| කරන්දෙණිය | 40 | 15 | 418 | 958.044 | 154.399 | 1021.72 |
| උඩුකාව | 21.138 | 3 | 1,291 | 7608 | 50.93 | 861.8 |
| ඇඹිලිපිටිය | 22.86 | 4 | 195 | 963.12 | 98.98 | 238 |
| ගලිගමුව | 23.57 | 8 | 342 | 1972.8 | 184.69 | 812 |
| නාලන්ද එල්ලාවල -1 | 36.38 | 22 | 353 | 635.76 | 80.345 | 1593.65 |
| නාලන්ද එල්ලාවල -2 | 45 | 27 | 483 | 1065 | 126.017 | 1197.85 |
| දංකොටුව | 52.07 | 33 | 1,835 | 18927.96 | 137.798 | 4879.6 |
| දඹදෙණිය | 10.15 | 3 | 809 | 4648.8 | 38.36 | 3250 |
| මාකඳුර නැගෙනහිර | 27.19 | 2 | 692 | 12795 | 35.79 | 9899 |
| මාකඳුර බටහිර | 84.23 | 16 | 1,073 | 21180.96 | 143.58 | 4224.9 |
| නිකවැරටිය | 2.56 | 1 | 987 | 1152.24 | 6.12 | 1044.28 |
| නුරානි | 15.84 | 5 | 509 | 2389.2 | 12.579 | 757.72 |
| පුත්තලම | 40 | 9 | 179 | 546 | 246.4 | 823.9 |
| ලක්ෂ උයන | 70.94 | 17 | 1,152 | 10689 | 176.04 | 3612.5 |
| නාලන්දා (මාතලේ) | 25 | 15 | 1,299 | 6250.44 | 81.26 | 2252.29 |
| උලපනේ | 25 | 17 | 845 | 25001.712 | 139.882 | 4399.5 |
| ත්‍රිකුණාමලය | 50 | 7 | 1,795 | 1691.64 | 511.07 | 1892.3 |
| අම්පාර (නවගම්පුර) | 20 | 7 | 40 | 109.8 | 48.48 | 216.5 |
| මඩකලපුව | 24.03 | 0 | - | 0 | 8.35 | 0 |
| මන්නාරම | 24 | 1 | 1,234 | 19991.64 | 351.775 | 1052.38 |
| වැලිඔය | 40 | 3 | 885 | 3267.6 | 206.41 | 448.31 |
| මහව (රිදිබැදිඇල්ල) | 17.21 | 0 | 0 | 0 | 21.54 | 0 |
| එකතුව | **1,073.82** | **382** | **23,537.00** | **202,111.57** | **4,947.19** | **76,724.45** |

***මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය***

## නව කර්මාන්තපුරයන්හි තොරතුරු 2024 දෙසැම්බර් මස 31 දක්වා (සමුච්චිත)

| දිස්ත්‍රික්කය | කර්මාන්තපුර | ඉඩම් ප්‍රමාණය (අක්කර) | මුළු රාජ්‍ය ආයෝජනය (රු. මිලියන) |
|---|---|---|---|
| ගම්පහ | අළුත්පොල | 7.90 | 50.28 |
| | කටුනායක | 100.00 | 4.71 |
| මාතලේ | දඹුල්ල (I අදියර) | 24.00 | 31.01 |
| | දඹුල්ල (අදියර ii) | 40.00 | 14.96 |
| අනුරාධපුර | සඳමල්ගම | 16.00 | 15.86 |
| හම්බන්තොට | සූරියවැව | 20.00 | 261.50 |
| මොනරාගල | වැල්ලවාය | 9.25 | 8.38 |
| පොලොන්නරුව | නොච්චියාගම | 50.00 | 0.48 |
| | **එකතුව** | **267.15** | **387.19** |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

# 03

# ආංශික සංවර්ධන අංශය

# සංවර්ධන අංශ 01

## 3.1 හැඳින්වීම

අමාත්‍යාංශය යටතේ සේවා පහසුකම් සපයන ප්‍රධාන නිෂ්පාදන අංශ 21 අතරින් කෘෂිකාර්මික කර්මාන්ත සංවර්ධන කටයුතු සංවර්ධන අංශ 1 යටතේ පවතී. මෙම අංශය යටතේ සැකසූ ආහාර, තේ, කුළුබඩු, කොහු ආශ්‍රිත නිෂ්පාදන, ඇසුරුම් කර්මාන්ත, කිරි හා කිරි ආශ්‍රිත කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

### ප්‍රධාන අරමුණු

1. ජාත්‍යන්තර වෙළඳපොලේ තරඟකාරිත්වයට මුහුණදිය හැකි ගුණාත්මක තත්වයෙන් යුත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා දේශිය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
2. දේශිය වෙළඳපොලෙහි අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීම.

### ක්‍රියාකාරකම්

- ඉදිරි වර්ෂයන් සඳහා සැලසුම්කර ඇති සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ දැක්වෙන අදාල ක්ෂේත්‍රයන් සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පෞද්ගලික අංශයේ කර්මාන්තකරුවන්, අපනයනකරුවන් සහ විද්වත් මණ්ඩල වලින් සැදුම්ලත් උපදේශක කමිටුවල උපදේශකත්වයෙන් සංවර්ධන සැලසුම් හා උපාය මාර්ග පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- අදාළ අංශයන්හි නිෂ්පාදන හා අලෙවිය ආශ්‍රිත ගෝලීය ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ ඒවායෙහි උපයෝගීත්වයෙන් සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.

- කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු පිළිබඳ සාකච්ඡා කර එම ගැටළු විසඳා ගැනීම සඳහා උපදේශක කමිටු හා අදාල ආයතනවල උපදේශකත්වය ලබා ගැනීම.

- රේඛීය අමාත්‍යාංශ, මහා භාණ්ඩාගාරය, වෙළඳ මණ්ඩල, අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර සම්බන්ධීකරණය සිදුකිරීම හා එමගින් කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම.

- දේශීය සහ විදේශීය කාර්මික ආයතන මඟින් කර්මාන්ත සඳහා අවශ්‍ය නවීන තාක්ෂණ පුහුණුව සහ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.

- කර්මාන්තකරුවන් හා විශ්ව විද්‍යාල / පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය තුළින් නව තාක්ෂණික දැනුම හුවමාරු කිරීම සහ ඒ තුළින් භාණ්ඩ විවිධාංගීකරණය සඳහා පහසුකම් සැලසීම.

- දේශිය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම තුළින් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වාදීම සහ එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ සකස්කර ගැනීමට සහය වීම.

- භාණ්ඩ අපනයනය දිරිමත් කිරීමේ අරමුණින් අපනයන භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තීරුබදු රහිතව ආනයනය කිරීම සඳහා පහසුකම් සැපයීම.

- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය තත්ත්ව සහතික, කර්මාන්ත සඳහා හඳුන්වාදීම හා ඒවා ලබාගැනීමට උපකාර කිරීම.

## 3.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

**<u>ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන්</u>**

- තීරුබදු රහිතව අමුද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම (අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP)) මගින් කර්මාන්තවල අපනයන දිරිගන්වනු ලැබේ. මේ වන විට ඇසුරුම් අංශය, සැකසූ ආහාර, කුළුබඩු අංශය, කොහු ආශ්‍රිත නිෂ්පාදන අංශය, තේ අංශය, මැණික් හා ස්වර්ණාභරණ අංශය හා කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන අංශය වැනි නිෂ්පාදන වල අගය එකතු කිරීමේ නියුක්ත වෙමින් ඍජු හා වක්‍ර වශයෙන් 2024 දෙසැම්බර් දක්වා අපනයනයට සම්බන්ධ කර්මාන්ත සඳහා TIEP පහසුකම් ලබා දී ඇති අතර ලිපි 683 සඳහා නිර්දේශ ලබා දී ඇත.

- ඒ අනුව කර්මාන්ත අංශයේ අගය එකතු කිරීම ඉහළ නැංවීම පිණිස භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී තීරුබදු සහන සැපයීම සඳහා අමාත්‍යාංශය සහය ලබාදෙනු ලැබේ. මෙමගින් අපනයනය කරනු ලබන නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොල තුළ තරඟකාරීත්වය වැඩි කිරීම මෙයින් සිදු කරයි.

**තත්ත්වය/ ගුණත්වය ඉහල නැංවීමේ වැඩසටහන්**

- කර්මාන්ත සඳහා තත්ත්ව සහතික, සුරක්ෂිතතා සහ ක්‍රමවේද සම්බන්ධව සහතික ලබා ගැනීම සඳහා (ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001) අමාත්‍යාංශය විසින් තත්ත්ව හා ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන සාර්ථකව නිම කරන කර්මාන්ත වෙනුවෙන් අදාල සහතික පත්‍ර සහ ගෙවීම් බිල්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව රු.300,000/- (උපදේශන ගාස්තු ද ඇතුළුව) උපරිමයකට යටත්ව අදාල සහතික පත්‍ර

ගාස්තු ප්‍රතිපූර්ණය කරනු ලබයි. මෙම වැඩසටහන සැකසූ ආහාර කර්මාන්ත අංශය සඳහා සහ ඇසුරුම්කරණ කර්මාන්ත, අගය එකතු කළ තේ කර්මාන්ත, අගය එකතුකළ කුළුබඩු සහ කොහු කර්මාන්ත යන අනෙකුත් කර්මාන්ත අංශ නියෝජනය වන පරිදි 2024 වර්ෂය සඳහා කර්මාන්ත 71 ක් වෙනුවෙන් පහසුකම් ලබා දීමට අවස්ථාව සලසා ඇත.

2024 වර්ෂයේදී ISO සහතිකකරණය සාර්ථකව නිමකරන කර්මාන්ත 38 සඳහා මූල්‍යමය පහසුකම් සැපයීම සිදු කර ඇත.

- අමාත්‍යාංශය විසින් ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යහපත් නිපැයුම් පරිචයන් (GMP) පිළිබඳ සහතිකපත් වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. තෝරාගත් කර්මාන්ත සඳහා GMP සහතිකයන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා INDExpo ආයතනයන් ගෙන් ලබා ගැනීමේ දී ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාදේ. මෙම වැඩසටහන සඳහා කර්මාන්ත 35ක් 2024 වර්ෂයේදී තෝරා ගන්නා ලදී. මෙම වර්ෂයේදී ISO සහතිකකරණය සාර්ථකව නිමකරන කර්මාන්ත 12 සඳහා මූල්‍යමය පහසුකම් සැපයීම සිදු කර ඇත.

- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත වන කාර්මික ශිල්පීන්ගේ කුසලතා හා තාක්ෂණික දැනුම වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අමාත්‍යාංශය හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක වන අතර මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත වන කාර්මික ශිල්පීන්ගේ කුසලතා හා තාක්ෂණික දැනුම වර්ධනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම ව්‍යාපෘතිය මධ්‍යස්ථාන 15 ක් යටතේ කාර්මික ශිල්පීන් පුහුණු කිරීමට අපේක්ෂා කරයි .2024 දෙසැම්බර් මස වන විට මැණික් කැපීම හා ඔප දැමීම සහ ස්වර්ණාභරණ නිෂ්පාදනය යන පාඨමාලා 12ක් සාර්ථකව අවසන් කර ඇත.

## නිපුණතා සංවර්ධන වැඩසටහන්

- ඇසුරුම්කරණ තාක්ෂණය ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන සති අන්ත දින 14 කාල සීමාව තුළ සහතිකපත් පාඨමාලාවක් වශයෙන් පැවැත්වීමට සැලසුම් කරන ලදී.
- මෙම වැඩසටහනේ අරමුණ වන්නේ ඇසුරුම් කර්මාන්තයේ කාලීන අවශ්‍යතාවයක් වන තාක්ෂණික ශිල්පීන්ගේ දැණුම හා කුසලතා වැඩිදියුණු කිරීමයි. අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය සමඟ එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සඳහා ඇසුරුම් කර්මාන්තයේ නියැළී සිටින තාක්ෂණික ශිල්පීන් 28 දෙනෙකුට පුහුණුවීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

**ඇසුරුම්කරණ තාක්ෂණය ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන**



## අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

- දේශීය හා විදේශීය ප්‍රදර්ශකයින් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය සමග ඒකාබද්ධව Profoods/Propack ප්‍රදර්ශනය 2024 අගෝස්තු මස 23,24,25 යන දිනයන් වල දී බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී සාර්ථකව පවත්වන ලදී.

**Profoods/Propack ප්‍රදර්ශනය**



- මෙම ප්‍රදර්ශනය තුළින් අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද තෝරාගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත 15 සඳහා වෙන් කරන ලද විශේෂිත ප්‍රදර්ශන මණ්ඩපය මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා විශේෂ සහන මත ප්‍රදර්ශන කුටි ලබාදීමට කටයුතු කරන ලදී.

- එසේම, මෙම ප්‍රදර්ශනයේ දී විශ්ව විද්‍යාල සහ කර්මාන්ත අතර සම්බන්ධතා ඇති කිරීමට සහ ඔවුන්ගේ පර්යේෂණ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබාදීමේ අභිප්‍රායෙන් අමාත්‍යාංශය විසින් විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන් සහභාගි කරවීමට ද කටයුතු කරන ලදී.

- ඇසුරුම් නිෂ්පාදනයේ යෙදී සිටින දේශීය කර්මාන්ත වලට විදේශීය වෙළඳපොළ අවස්ථා වැඩිකර ගැනීමට “ලංකා පැක් -2024” ප්‍රදර්ශනය 2024 ඔක්තෝබර් මාසයේ 25,26 හා 27 යන දිනයන්හි දී බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලවේදී පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ඇසුරුම් නිෂ්පාදන කර්මාන්ත විශාල ප්‍රමාණයක් සහභාගී වන අතර ඒ තුළින් ඔවුන්ගේ නිර්මාණශීලී නිෂ්පාදනයන් අලෙවිකර ගැනීම සඳහා නව වෙළඳ සබඳතා ඇති කර ගැනීමට අවශ්‍ය මූලික පසුබිම සැකසීම සහ නිෂ්පාදන ඇනවුම් වැඩිකර ගැනීමට හැකියාව සැලසෙනු ඇත.

- දේශීය කර්මාන්තකරුවන්ට ඇසුරුම්කරණය පිළිබඳ නව තාක්ෂණික දැනුම, අත්දැකීම් ලබාගැනීමේ අවස්ථා ඇති කිරීමත්, ශ්‍රී ලංකාවේ ඇසුරුම් කර්මාන්තය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව මෙම ප්‍රදර්ශනය පැවැත්වේ. ප්‍රදර්ශනය ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනයේ (SLIP) සහයෝගය ඇතිව අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබයි. මේ හා සමගාමීව ඇසුරුම් සම්මේලනයද පවත්වන ලදී.

## 3.3 අනාගත සැලසුම් - 2025

1. කර්මාන්ත අංශවල උපදේශක කමිටු යෝජනා හා අදහස් පදනම් කරගනිමින් ඒ ඒ අංශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
2. සැකසූ ආහාර නිෂ්පාදන කර්මාන්තයේ සහ ඇසුරුම් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලී සිටින නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අලෙවි ප්‍රදර්ශන වැඩසටහන් සහ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන වලට සහය සැපයීම.
3. සැකසූ ආහාර අංශය, ඇසුරුම් කර්මාන්ත අංශය, තේ, කොහු, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන හා කුළුබඩු කර්මාන්ත අංශයේ තත්ත්ව සහතික ලබා ගැනීම ඵලදායීතාවය සහ වෙළෙඳපොල තරඟකාරිත්වය වැඩිදියුණු කිරීමේ (ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001) වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
4. සුළු පරිමාණ කර්මාන්තවල ආහාර සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා යහපත් නිෂ්පාදන පුරුදු (GMP) වැඩසටහන ක්‍රියාවට නැංවීම.
5. අගය එකතු කරන ලද නිෂ්පාදන වල අපනයන වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
6. ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ ඇසුරුම් තාක්ෂණය ඉහළ නංවා ගැනීම සඳහා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
7. මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත වන ශිල්පීන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම හරහා ජාත්‍යන්තර වෙළඳපොල තත්ත්වයන්ට අනුකූලව දේශීය නිෂ්පාදන ගෙන ඒමට අවශ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
8. කාර්යක්ෂමතාව,අඛණ්ඩ සැපයුම්, පිරිසුදු නිෂ්පාදන තක්සේරුව,ඵලදායිතාව වර්ධනය වන ආකාරයට කර්මාන්ත කරුවන්ට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

# 04

# සංවර්ධන අංශ 02

## 4.1 හැඳින්වීම

### ප්‍රධාන අරමුණ

දේශීය කර්මාන්ත උප අංශයන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත්, එමගින් උසස් නිමැවුමෙන් හා ගුණාත්මක භාවයෙන් යුක්ත වූ භාණ්ඩ බිහිකරමින් ජාත්‍යන්තර වෙළෙඳපොල ජය ගැනීමට හැකි තත්ත්වයක් නිර්මාණය කිරීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ.

### අංශයේ වගකීම් යටතේ පවත්නා කර්මාන්ත අංශ

- රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- සෙරමික්, ටයිල්, ග්‍රැනයිට්, උළු නිෂ්පාදන කර්මාන්ත
- බෝට්ටු හා උපාංග නිෂ්පාදන කර්මාන්ත
- වාහන එකලස් කිරීම් හා වාහන උපාංග නිෂ්පාදන කර්මාන්ත
- දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- විදුලි හා විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත
- තීන්ත, මුද්‍රණ ද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්ත
- ඛණිජ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත

## කාර්යයභාරය

- කර්මාන්ත උප අංශ සංවර්ධනයට අවශ්‍ය සැලසුම් සකස් කිරිමේදී රාජ්‍ය අංශය, අධ්‍යාපනඥයින් සහ කර්මාන්තකරුවන් සමඟ ඒකාබද්ධව කටයුතු කිරිම.
- තාක්ෂණික කළමනාකරණ හා නිෂ්පාදනයට අදාල ගැටළු අවබෝධ කර ගැනිම සඳහා අවශ්‍ය උපදෙස් හා පහසුකම් සැපයීම.
- දේශිය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීමේදී දේශිය හා විදේශිය වාණිජ මණ්ඩල, රාජ්‍ය අංශයට අයත් ආයතන, සමාගම් හා කර්මාන්ත සංවර්ධනයට ආධාර ලබාදෙන වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය.
- ඵලදායිතාවය ඉහල නැංවීම හා එකතු කල අගය වැඩි කිරීම සඳහා උසස් තාක්ෂණික ක්‍රමෝපායයන් හඳුන්වා දීම සඳහා අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම.
- නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාවය වැඩි කිරිම සඳහා සේවා නියුක්තව සිටින ශ්‍රමිකයන්ගේ හැකියාවන් සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා දේශිය හා විදේශිය පුහුණුව ලබාදීමට අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය කිරිම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- විදේශ ශ්‍රමිකයන් සඳහා වීසා නිර්දේශ ලබා දීම, අමු ද්‍රව්‍ය ආනයනය කර දේශීය වටිනාකමක් එකතු කර නැවත අපනයනය කිරීම (TIEP) සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම, තාවකාලිකව ආනයනය සීමා කර ඇති, කර්මාන්ත වලට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය සඳහා නිර්දේශ ලබා දීම හා කර්මාන්ත වලට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනයේදී බදු සහන හා බදු නිදහස් කිරීම් සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබා දීම වැනි කාර්යයන් හරහා කර්මාන්ත කරුවන්ට තම කර්මාන්තයන් පවත්වාගෙන යාම සඳහා පහසුකම් සැපයීම.

මේ යටතේ 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුල TIEP නිර්දේශ 166 ක් ද, වීසා නිර්දේශ 59 ක් ද, බදු සහන හා බදු නිදහස් කිරීම් සඳහා අවශ්‍ය නිර්දේශයන් 138 ක් ද ලබා දී ඇත.

## 4.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### විදුලි හා විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත අංශය

- **විදුලි හා විද්‍යුත් කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නියැලි කර්මාන්තකරුවන් සඳහා ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාගැනීමට රජයෙන් සහන ලබා දීමේ ව්‍යාපෘතිය**

විදුලි හා විද්‍යුත් කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නියැලි සිටින කර්මාන්ත, වෙළෙඳපොල තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීමට හා විදේශීය වෙළෙඳ පොලවල් සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීමට ජාත්‍යන්තරව පිළිගත් තත්ව සහතික/රසායනාගාර වාර්තා ලබා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇති බැවින්, එවැනි තත්ව සහතික/රසායනාගාර වාර්තා ලබා ගැනීමට අපේක්ෂා කරන දැනට භාණ්ඩ අපනයනය කරන හා අපනයනය කිරීමට බලාපොරොත්තු වන කර්මාන්ත සඳහා, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සිදු වේ. මෙහිදී විදුලි හා විද්‍යුත් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නියැලි සිටින දේශීය කර්මාන්ත ආයතන 05 ක් සඳහා ඉහත වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබාදීම සිදු විය. මේ සඳහා අමාත්‍යාංශය විසින් දරන ලද වියදම රු. මිලියන 4.6 කි.

### වාහන අමතර කොටස් නිෂ්පාදන කර්මාන්ත අංශය

- **වාහන උපාංග නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි නියැලි කර්මාන්තකරුවන් සඳහා ජාත්‍යන්තරව පිළිගත් IATF 16949:2016 තත්ත්ව සහතිකය ලබාගැනීමට රජයෙන් සහන ලබා දීමේ ව්‍යාපෘතිය**

වාහන උපාංග නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි නියැලි සිටින කර්මාන්ත, වෙළෙඳපොල තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීමට හා අපනයන වෙළෙඳ පොලවල් සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීමට ජාත්‍යන්තරව පිළිගත් තත්ව සහතික ලබා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇත. ඒ අනුව, ජාත්‍යන්තරව පිළිගත් තත්ව සහතිකයක් වන IATF 16949:2016 තත්ව සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කරන දැනට භාණ්ඩ අපනයනය කරන හා අපනයනය කිරීමට බලාපොරොත්තු වන කර්මාන්ත සඳහා, අමාත්‍යාංශය මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙහිදී වාහන උපාංග නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නියැලි සිටින දේශීය කර්මාන්ත ආයතන 02 ක් සඳහා ඉහත වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබාදීම සිදු විය. මේ සඳහා අමාත්‍යාංශය විසින් දරන ලද වියදම රු. මිලියන 2.1 කි.

### බෝට්ටු හා බෝට්ටු උපාංග නිෂ්පාදන කර්මාන්ත අංශය

- **බෝට්ටු නිෂ්පාදන කර්මාන්ත සඳහා බේරුවල බෝට්ටු දියත් මගක් පිහිටුවීමේ ව්‍යාපෘතිය**

අළුතින් නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු දියත් කිරීමට අවශ්‍ය පහසුකම් සහිත බෝට්ටු දියත් මගක් බේරුවල ධීවර වරාය ආශ්‍රිත භූමියෙහි පිහිටු වීම සඳහා වූ ව්‍යාපෘතියෙහි මූලික ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර 2025 වසර තුල මෙහි ඉදිකිරීම් කටයුතු නිම කිරීමට බලාපොරොත්තු වේ. මෙහි අපේක්ෂිත වියදම වන රු. මිලියන 50 ක මුදල අමාත්‍යාංශය විසින් දැරීමට සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ වශයෙන්, බෝට්ටු නිෂ්පාදන අංශයේ අපනයන ආදායම ඉහල යාම, රැකියා අවස්ථා ඉහල යාම හා සංචාරක කර්මාන්තයේ වර්ධනයට මෙය ඉවහල් වීම දැක්විය හැකිය.

- වසර දෙකකට වරක් පවත්වන බෝට්ටු නිෂ්පාදන අංශය සඳහා වූ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශනය සහ කලාපීය සම්මන්ත්‍රණය 2023 වසරෙහි ඔක්තෝබර් මාසයේදී කොලඹ වරාය නගර පරිශ්‍රයේදී පවත්වන ලදී. මේ සඳහා අමාත්‍යාංශය විසින් රු. මිලියන 05 ක වියදමක් දරන ලදී.

  මෙම ව්‍යාපෘතිය තුලින් පහත සඳහන් ප්‍රතිලාභ අත්පත් කරගැනීමට හැකි විය.

  1. ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවේශ වන නව කර්මාන්ත සංඛ්‍යාව ඉහල නැංවීම
  2. ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන්ගේ රැස්වීම් සහ හවුල් ව්‍යාපාර අවස්ථා සඳහා ඉඩ සැලසීම
  3. නව තාක්ෂණය ලබා ගන්නා කර්මාන්ත සංඛ්‍යාව ඉහල නැංවීම
  4. අපනයන සහ නාවික සංචාරක ව්‍යාපාරයෙන් විදේශ විනිමය ඉපැයීම් වැඩිදියුණු කිරීම

### දේශීය කර්මාන්ත සඳහා සම්පත් කාර්යක්ෂම පිරිසිදු නිෂ්පාදන (RECP) ඇගයීම සහ ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන

කර්මාන්තයන්හි ද්‍රව්‍ය අපතේ යාම්, බලශක්ති අපතේ යාම් හා ජලය අපතේ යාම් අවම කරගනිමින් සම්පත් උපරිම කාර්යක්ෂමතාවකින් යුතුව ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම අරමුණු කරගනිමින් අමාත්‍යාංශය, ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය (NCPC) හා එක්ව 2023 වර්ෂයේදී තෝරාගත් කර්මාන්ත 20 ක් සඳහා සිදුකරන ලද ව්‍යාපෘතිය, 2024 වසරෙහිද විවිධ කර්මාන්ත අංශ නියෝජනය වන පරිදි තෝරාගත් කර්මාන්ත 15 ක් සඳහා ක්‍රියාත්මක කිරීම සිදුවේ. මේ සඳහා අමාත්‍යාංශය විසින් දැරීමට අපේක්ෂිත වියදම රු. මිලියන 9.75 ක් වන අතර, මේ වන විට රු. මිලියන 8.108 ක මුදලක් අමාත්‍යාංශය වියදම් කර ඇත.

**RECP ව්‍යාපෘතිය ව්‍යාපෘතිය පිළිබඳ කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන**




**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා NCPC ආයතනය සමග ගිවිසුමට අත්සන් කිරීම**




මෙම ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාභ අපේක්ෂා කරයි.

1. සම්පත් කාර්යක්ෂමතාව ඉහල යාම මගින් නිෂ්පාදන පිරිවැය අවම වීම හා එමගින් තරඟකාරීත්වය ඉහලයාම
2. නව වෙළඳපොලවල් හා ආයෝජන අවස්ථා බිහිවීම
3. කර්මාන්ත මගින් සිදුවන පරිසර දූෂණය අවම වීම
4. කර්මාන්ත ශාලා තුල යහපත් පරිසරයක් බිහිවීම මගින් සේවක සෞඛ්‍යය ඉහල යාම

**RECP ව්‍යාපෘතියට අදාලව පැවැත්වූ ධාරිතා ගොඩනැංවීමේ දෙදින පුහුණු වැඩසටහන**





## නිෂ්පාදන කර්මාන්ත සඳහා කාර්යක්ෂම සැපයුම්දාම කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදේශණ සේවා සැපයීමේ වැඩසටහන

කර්මාන්ත ආයතනයන් විසින් කාර්යක්ෂම සැපයුම්දාම කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන නොයාම හේතුවෙන් කර්මාන්ත ශාලාවන්හි අමුද්‍රව්‍ය අපතේ යාම, නිමි භාණ්ඩ කල් ඉකුත් වීම් හා අනෙකුත් සැපයුම් සේවා නිසි වේලාවට සිදුකර ගැනීමට නොහැකි වීම වර්තමානයේ කර්මාන්ත ආයතන මුහුන දෙන විශාල ගැටළුවකි. මෙයට පිලියමක් ලෙස අමාත්‍යාංශය සැපයුම් දාම හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය හා එක්ව විවිධ කර්මාන්ත අංශ නියෝජනය වන පරිදි තෝරාගත් කර්මාන්ත 30 ක් සඳහා මෙම ව්‍යාපෘතිය 2024 වසර තුල ක්‍රියාත්මක කිරීම සිදු කල අතර, මේ සඳහා අමාත්‍යාංශය විසින් දරන ලද වියදම රු. මිලියන 3.2 කි.

**කාර්යක්ෂම සැපයුම්දාම කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීමේ ව්‍යාපෘතිය යටතේ පැවැත්වූ පුහුණු වැඩසටහන්**



## 4.3 අනාගත සැලසුම් - 2025

- සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්ත සඳහා ආපදා කළමනාකරන හා නවීන කළමනාකරන විධික්‍රම හඳුන්වා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- දැව භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයේ නියුක්ත සුළු පරිමාන කර්මාන්තයන්හි තාක්ෂණික ශිල්පීන්ගේ කුසලතා නංවාලීම සඳහා දේශිය පුහුණු පාඨමාලා සඳහා තාක්ෂණික ශිල්පීන් යොමු කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති සහතික හා ISO සහතික ලබා ගැනීම සඳහා දේශිය කර්මාන්තකරුවන් උනන්දු කිරීම පිණිස එම ප්‍රමිති සහතික ලබා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- තෝරාගත් කාර්මික කලාප 5ක් සඳහා විස්තීරණ කසළ කළමනාකරණ උපාය මාර්ගයක් සහ සම්පත් කාර්යක්ෂම පිරිසිදු නිෂ්පාදන (RECP) තක්සේරු කිරීමේ වැඩසටහනක් ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යෂ්ථානය (NCPC) හා එක්ව ක්‍රියාත්මක කිරීම.

- බේරුවල ධීවර වරාය ආශ්‍රිත භූමියෙහි පිහිටුවීමට යෝජිත, අළුතින් නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු දියත් කිරීමට අවශ්‍ය පහසුකම් සහිත බෝට්ටු දියත් මගෙහි ඉදිරි කටයුතු සිදු කිරීම හා වෙරළ තීරයේ සමුද්‍ර සංවර්ධනය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම.

- ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවේශ වන නව කර්මාන්ත සංඛ්‍යාව ඉහල නැංවීම, නව තාක්ෂණය ලබා ගන්නා කර්මාන්ත සංඛ්‍යාව ඉහල නැංවීම හා අපනයන සහ නාවික සංචාරක ව්‍යාපාරයෙන් විදේශ විනිමය ඉපැයීම් වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් බෝට්ටු නිෂ්පාදන කර්මාන්ත අංශය සඳහා වූ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම.

- ප්‍රතිපත්ති තීරණ සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා, ශ්‍රී ලංකාව තුළ අපනයනය සඳහා මෝටර් රථ ඉලෙක්ට්‍රොනික උපකරණ සහ චිප් නිෂ්පාදනයේ විභවයන් හඳුනා ගැනීමට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# 05

# සංවර්ධන අංශ 03

## 5.1 හැඳින්වීම

### මූලික අරමුණු

ජාත්‍යන්තර වෙළඳපොල තරගකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක තත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදන සඳහා පහත සඳහන් කර්මාන්ත, උප අංශ ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.

- පාවහන්, සම් හා සම් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත
- ඖෂධ කර්මාන්තය
- රූපලාවන්‍ය කර්මාන්තය
- ලෝහ ආශ්‍රිත කර්මාන්තය
- ඇඟළුම් ආශ්‍රිත කර්මාන්ත

### ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශ උපදේශක සභා රැස්වීම් කැඳවීම, සංවර්ධන උපාය මාර්ග සාකච්ඡා කිරීම හා ඒවාට අවශ්‍ය උපදෙස් ලබාදීම හා ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්ත උපඅංශ සඳහා සංවර්ධන සැලසුම් සහ ව්‍යාපෘති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- රේඛීය අමාත්‍යාංශ, වෙළඳ සංගම්, සම්මේලන හා විශ්වවිද්‍යාල සම්බන්ධීකරණය කරමින් කර්මාන්ත ක්ෂේත්‍රවල උන්නතියට කටයුතු කිරීම.

- තෝරාගනු ලැබූ කර්මාන්ත අංශයන්හි කුසලතා සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම.

- නිදහස් වෙළඳ ගිවිසුම් තුළින් තම වෙළඳපොල කොටස ඉහල නංවා ගැනීමට කර්මන්තකරුවන් දැණුවත් කිරීම හා පහසුකම් සැකසීම.

- ආයෝජන ප්‍රවර්ධන හා අලෙවිකරණ කටයුතු සඳහා පහසුකම් සැපයීම.

- අපනයන දිරිගැන්වීම සඳහා තාවකාලික ආනයන, අපනයන ක්‍රියාවලිය (TIEP) මගින් පහසුකම් සැලසීම හා කර්මාන්ත සඳහා අවශ්‍ය විදේශිය විශේෂඥයින් වෙනුවෙන් වීසා නිර්දේශ කිරීම.

- උක්ත කර්මාන්ත උප අංශවල කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය විදේශිය ශ්‍රමිකයන් සඳහා වීසා නිර්දේශ ලබා දීම.

- දේශිය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනයේදී බදු සහන ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ජාත්‍යන්තර වෙළෙඳපොල තරගකාරීත්වයට මුහුණ දීම සඳහා දේශිය නිෂ්පාදන කර්මාන්ත වලට අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිති සහතික ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

- නීතිමය ලෙස අවසර ලබා දී ඇති අබලි ලෝහ අපනයනය සඳහා නිර්දේශ ලබාදීම.

- ලෝහ ආශ්‍රීත කර්මාන්තකරුවන් හට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ප්‍රතිපත්තිමය සහයෝගය ලබා දීම.


## 5.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

- 2007 සිට වාර්ෂිකව පවත්වනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය 2024 වර්ෂයේ පෙබරවාරි මස 8, 9,10 සහ 11 යන දිනයන්හි දී බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සාර්ථකව පවත්වන ලදී. මේ සඳහා දේශිය පාවහන් හා පාවහන් ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ වෙළඳකුටි 215ක් සංවිධානය කෙරිණි.

- Lean කළමනාකරණය පිලිබඳ කර්මාන්ත කරුවන් දැණුවත් කිරීමේ වැඩසටහන් 3ක් ක්‍රියාත්මක කිරීමට 2024 වර්ෂය සඳහා අනුමැතිය ලද අතර එහි පළමු වැඩසටහන 2024.03.20 දින කර්මාන්තකරුවන් 100 ක පමණ සහභාගීත්වයෙන් SLIDA ආයතනයේ දී පවත්වන ලදී. එහි දෙවන වැඩසටහන 2024.07.05 දින ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ගාල්ල දිස්ත්‍රික්කයේ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සම්බන්ධ කරගනිමින් පවත්වන ලදී. තෙවන වැඩසටහන 2024.09.05 දින ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය හා එක්ව කොළඹ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙහි පවත්වන ලදී.

- සම්පත් කාර්යක්ෂම පිරිසිදු නිෂ්පාදන තක්සේරුව පිළිබඳ ව්‍යාපෘතිය තෝරාගත් කර්මාන්ත 15ක් සමඟ ක්‍රියාත්මක කරන ලදී. 2024.05.09 දින තෝරාගත් කර්මාන්තකරුවන් , ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය හා කර්මාන්ත අමාත්‍යාංශ ව්‍යාපෘතිය සම්බන්ධ අවබෝධතා ගිවිසුම් වලට අත්සන් කරන ලදී. තෝරාගත් කර්මාන්ත සඳහා දෙදින පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මේවන විට තෝරාගත් කර්මාන්ත 15න් කර්මාන්ත 11ක කර්මාන්ත පරීක්ෂණ සිදු කර ඇත.

**සම්පත් කාර්යක්ෂම පිරිසිදු නිෂ්පාදන තක්සේරුව පිළිබඳ පුහුණු වැඩසටහන**







- සැපයුම් දාම කලමණාකරණය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 3ක් කර්මාන්තකරුවන් වෙනුවෙන් පැවැත්වීමට 2024 වර්ෂය සඳහා අනුමැතිය ලැබුනි. ඒ අනුව පළමු වැඩසටහන 2024.06.03 දින ගම්පහ දිස්ත්‍රික්කයේ නිෂ්පාදන කර්මාන්තකරුවන් වෙනුවෙන් ද දෙවන වැඩසටහන 2024.06.28 දින ගාල්ල දිස්ත්‍රික් නිෂ්පාදන කර්මාන්තකරුවන් වෙනුවෙන් ද පවත්වන ලදී. මෙම වැඩසටහන් මාලාවේ තෙවැන්න කොලඹ දිස්ත්‍රික්කයේ නිෂ්පාදන කර්මාන්තකරුවන් වෙනුවෙන් 2024.11.27 දින පවත්වන ලදී.

**සැපයුම් දාම කළමනාකරණය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**



- නිෂ්පාදන කර්මාන්ත සඳහා වන අවදානම් කළමනාකරණ සැලැස්මක් සැකසීම සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024.08.04 දින කර්මාන්තකරුවන් 60 පමණ සහභාගීත්වයෙන් පශ්චාත් උපාධි කළමනාකරණ මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

**අවදානම් කළමනාකරණ සැලැස්මක් සැකසීම සම්බන්ධ දැණුවත් කිරීමේ වැඩසටහන**



- ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමේ අවස්ථා සහ ඇඟවුම් ගවේෂණය කිරීමේ හා දැණුවත් කිරීමේ සම්මන්ත්‍රණය 2024.02.29 දින කර්මාන්ත අමාත්‍යාංශය , වාණිජ අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ දී කර්මාන්තකරුවන් 200 පමණ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

**ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමේ අවස්ථා සහ ඇඟවුම් ගවේෂණය කිරීමේ හා දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය**



- ලංකා ජාතික වාණිජ මණ්ඩලය කර්මාන්ත අමාත්‍යාංශය හා එක්ව පවත්වනු ලබන CNCI Achievers Award -2024 2024.10.15 දින පවත්වන ලදී.

- කර්මාන්තකරුවන්ට තම නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා නවෝත්පාදන වල අවශ්‍යතාවය හඳුනාගෙන එම අවශ්‍යතාවයන්ට අනුකූලව පර්යේෂණ ආයතන වලින් සහ විශ්වවිද්‍යාලවලින් කරනු ලබන පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා කර්මාන්තකරුවන් හා අදාල පර්යේෂණ ආයතන අතර සම්බන්ධතාවයක් ඇති කිරීමේ වාණිජකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට නියමිත වුවද 2024 වසර අවසාන භාගයේ පැවති මැතිවරණ හේතුවෙන් පැවැත්වීමට නොහැකි වීය.

- මෙයට අමතරව සංවර්ධන අංශ 3 මගින් කර්මාන්තකරුවන් වෙත තම නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ලබාදුන් නිර්දේශ, පවත්වන ලද කමිටු පිළිබඳ ප්‍රමාණාත්මක දත්ත පහත ඉදිරිපත් කර ඇත.

| විස්තරය | උප අංශය | ප්‍රමාණය |
|---|---|---|
| 1.Raw Hide නිර්දේශ | පාවහන් අංශය | 7 |
| 2. බදු සහන නිර්දේශ | රූපලාවණ්‍ය අංශය හා පාවහන් අංශය | 170 |
| 3. මිල කමිටු | ලෝහ අංශය | 3 |
| 4. උපදේශන කමිටු | සියලුම අංශ | 14 |
| 5. VISA කමිටු | සියලුම අංශ | 98 |
| 6. ඇගලුම් අපනයන නිර්දේශ | ඇගලුම් අංශය | 1303 |

*මූලාශ්‍රය : සංවර්ධන අංශ 03*

## 5.3 අනාගත සැලසුම් - 2025

- 2007 සිට වාර්ෂිකව පවත්වනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය 2025 වර්ෂයේ ද පැවැත්වීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය අනුග්‍රහය දැක්වීමට අපේක්ෂිතය.
- කොළඹ විශ්වවිද්‍යාලයේ රූපලාවන්‍ය නිෂ්පාදන සඳහා human repeat patch පරීක්ෂණ පැවැත්වීමේ රසායනාගාර පහසුකම ස්ථාපිත කිරීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම.
- කොළඹ විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අංශයේ ශ්‍රී ලංකා ඖෂධ රසායනාගාරය සඳහා අවබෝධතා ගිවිසුම අලුත් කිරීම හා යන්ත්‍ර සූත්‍ර ස්ථාපිත කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම.
- වාර්ෂිකව පවත්වනු ලබන INCO ප්‍රදර්ශනය සඳහා කර්මාන්ත අමාත්‍යාංශය අනුග්‍රහය දැක්වීමට නියමිතය.
- වාර්ෂිකව පවත්වනු ලබන CNCI Achievers Award සඳහා 2025 වර්ෂයේ අනුග්‍රහය දැක්වීමට නියමිතය.
- ව්‍යාපාර අඛණ්ඩ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (ආපදා කළමනාකරණ වැඩසටහන) කර්මාන්තකරුවන් වෙනුවෙන් පැවැත්වීමට නියමිතය.
- සම්පත් කාර්යක්ෂම පිරිසිදු නිෂ්පාදන තක්සේරුව පිළිබඳ ව්‍යාපෘතිය 2025 වර්ෂයේ දී ද පැවැත්වීමට කටයුතු යොදා ඇත.
- සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ දැණුවත් කිරීමේ වැඩසටහන් කර්මන්ත වෙනුවෙන් පැවැත්වීමට නියමිතය.
- කර්මාන්ත ප්‍රදර්ශනය - 2025 සඳහා අනුග්‍රහය දැක්වීමට සැලසුම් යොදා ඇත.

# 06

# කර්මාන්ත ලියාපදිංචි අංශය

## 6.1 හැඳින්වීම

1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත යටතේ ශ්‍රී ලංකාව තුල පවතින සියලුම නිෂ්පාදන කර්මාන්ත ලියාපදිංචි කිරීම කර්මාන්ත ලියාපදිංචි අංශයේ ප්‍රධානතම ඉලක්කයයි. ඒ අනුව නිෂ්පාදන කර්මාන්තයක් සිදුකරන සෑම පුද්ගලයෙකුම කර්මාන්ත අමාත්‍යාංශය යටතේ සිය කර්මාන්තශාලා ලියාපදිංචි කළ යුතු අතර අදාළ අවශ්‍යතාවයන් සපුරාලන කර්මාන්ත සඳහා අමාත්‍යාංශය විසින් සහතිකයක් නිකුත් කරනු ලබයි. එමඟින් කර්මාන්තකරුවන් විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරාලනු ඇත.


ලියාපදිංචි කර්මාන්ත පහත සඳහන් ප්‍රධාන කාණ්ඩ 09 යටතේ වර්ගීකරණය කර ඇත.

- 31-ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන
- 32-රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදන
- 33-දැව සහ දැවමය නිෂ්පාදන
- 34-කඩදාසි නිෂ්පාදන, ප්‍රකාශන සහ මුද්‍රණය කටයුතු
- 35-රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන
- 36-ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන
- 37-මූලික ලෝහ නිෂ්පාදන
- 38-පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ
- 39-අනෙකුත් නිෂ්පාදන

අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වීමෙන් සිය කර්මාන්ත සඳහා විධිමත් රාමුවක් සංවර්ධනය කර ගැනීමට කර්මාන්තකරුවන්ට අවස්ථාව හිමි වේ.එසේම අනාගතයේ දී කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ නව උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට අදාලව නිවැරදි ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීම සඳහා කර්මාන්ත පිළිබඳ සවිස්තරාත්මක දත්ත සමුදායක් පවත්වා ගැනීමට ප්‍රතිපත්ති සම්පාදකයින් හට මනා පිටුවහලක් වනු ඇත.


## 6.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ 2024 **දෙසැම්බර් 31** දක්වා නිෂ්පාදන කර්මාන්ත **3989** ක් ලියාපදිං වි කර ඇත.




*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි අංශය*

**කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ 2024 දෙසැම්බර් 31 දක්වා ලියාපදිංචි කර ඇති කර්මාන්ත පිළිබඳ තොරතුරු**




*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි අංශය*

- මෙම වසර වන විට Manual ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීම මාර්ගගත පද්ධතියක් බවට පරිවර්තනය කර ඇත. එම ක්‍රියාවලිය 2024 මැයි මාසයේදී එළිදක්වන ලදී.

- පසුව ක්‍රියාත්මක කිරීමේදි පැන නැඟුණු ගැටළු හේතුවෙන් තව දුරටත් එහි සංවර්ධන කටයුතු කිරීම සිදු කරමින් පවති.

- 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනතේ සංශෝධන තුළ කාර්යක්ෂම කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සහතික කිරීම සඳහා ශක්තිමත් නීතිමය ප්‍රතිපාදන එකතු කර ඇත.

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 වන දින දක්වා මෙම අමාත්‍යාංශය වෙත අයදුම්පත් **231** ක් ලැබී ඇති අතර, ඒ අතරින් කර්මාන්ත **203** ක් මෙම අමාත්‍යාංශයට අදාල අංශයන් 09 යටතේ ලියාපදිංචි කර ඇත.


| **මාසය** | **ලද අයදුම්පත්** | **නිකුත් කල සහතිකපත්** |
|---|---|---|
| ජනවාරි | 23 | 23 |
| පෙබරවාරි | 25 | 30 |
| මාර්තු | 49 | 28 |
| අප්‍රේල් | 25 | 19 |
| මැයි | 23 | 27 |
| ජුනි | 11 | 16 |
| ජුලි | 10 | 15 |
| අගෝස්තු | 11 | 20 |
| සැප්තැම්බර් | 11 | 07 |
| ඔක්තෝබර් | 13 | 11 |
| නොවැද්බර් | 10 | 5 |
| දෙසැම්බර් | 20 | 0 |
| **මුළු එකතුව** | **231** | **203** |

*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි අංශය*

| **අංශයන්** | **කර්මාන්ත සංඛ්‍යාව** |
|---|---|
| 31-ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන | 84 |
| 32-රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදන | 36 |
| 33-දැව සහ දැවමය නිෂ්පාදන | 4 |
| 34-කඩදාසි නිෂ්පාදන, ප්‍රකාශන සහ මුද්‍රණය කටයුතු | 10 |
| 35-රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 26 |
| 36-ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන | 8 |
| 37-මූලික ලෝහ නිෂ්පාදන | 2 |
| 38-පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදන යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ | 21 |
| 39-අනෙකුත් නිෂ්පාදන | 12 |
| **එකතුව** | **203** |

*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි අංශය*

ලියාපදිංචි කර්මාන්ත සංඛ්‍යාව වැඩි වී ඇතත්, 2023 වසරට සාපේක්ෂව 2024 දෙසැම්බර් 31 දක්වා කර්මාන්ත ලියාපදිංචිය අඩු වී ඇති බව පෙන්නුම් කරයි.




*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි අංශය*

## 6.3 අනාගත සැලසුම් - 2025

- අමාත්‍යාංශයේ සමස්ථ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා මාර්ගගත ලියාපදිංචි කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීම.

# 07

# ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## 7.1 හැඳින්වීම

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III- චක්‍රීය අරමුදල් සහ පරිසර හිතකාමී II- චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය නමින් ණය යෝජනා ක්‍රම දෙකක් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබයි.

### 1. කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය

SMILE III චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය මඟින් නව ව්‍යාපාර ආරම්භ කිරීම හෝ පවතින ව්‍යාපාර වල ඵලදායිතාවය වර්ධනය කිරීම හෝ එකී ආයතනවල ක්‍රියාකාරිත්වය සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අඩු පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් සපයනු ලැබේ. එසේම, සුළු හා කුඩා පරිමාණ ව්‍යාපාරවල ආයතන ධාරිතාවය සහ නිෂ්පාදනවල වර්ධනයක් ඇති කිරීමටත් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදෙනු ලැබේ.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය මත 2012 මැයි මස 01 වන දින සිට කර්මාන්ත අමාත්‍යාංශය විසින් මෙම ණය යෝජනා ක්‍රමය පහත සඳහන් අරමුණු යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

**අරමුණු**

- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල මූල්‍ය කටයුතුවලට සහයෝගය දක්වමින් නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමෙන් එකී ව්‍යාපාර ආර්ථිකමය හා මූල්‍යමය වශයෙන් ශක්තිමත් ව්‍යාපෘතීන් බවට පත් කිරීම.
- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල කළමනාකරණ හැකියාවන්, ගිණුම්කරණ සහ තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම.
- අන්තර් මූල්‍ය ආයතනවල මූල්‍ය හැකියාවන් ශක්තිමත් කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන 10 ක් හරහා ණය ලබා දෙනු ලැබේ. එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, සණස සංවර්ධන බැංකුව සහ ඩී එෆ් සි සී බැංකුව.

**2. පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II**

කාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය තුලින් සිදුවන පරිසර දූෂණය සහ අපද්‍රව්‍ය අවම කිරීම, සම්පත් ප්‍රතිසාධනය සහ සුරැකීම, පරිසර දූෂණය පාලනය සහ අවම කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින්ට සහන පොළී අනුපාතයක් යටතේ ණය මුදල් නිකුත් කරනු ලැබේ, එමෙන්ම ජාතික පරිසර පනතේ දැක්වෙන ප්‍රමිතීන්ට අනුකූලවීම සඳහා අවශ්‍ය මූලික ක්‍රමෝපායයන් ආරම්භ කිරීම සඳහා ද මෙම ණය යෝජනා ක්‍රමය මඟින් මූල්‍ය සහාය ලබා දෙනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය සහභාගිත්ව ණය දෙන ආයතන 11 ක් හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, ඩී එෆ් සි සී බැංකුව, ලංකා ඔරික්ස් ලීසිං සමාගම සහ පීපල්ස් ලීසි සමාගම වේ. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය මත 2018 වර්ෂයේ සිට මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 7.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

**(1) කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)**

2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 2700 ක් වෙන් කර ඇත. සමාලෝචනයට භාජනය වන කාලසීමාවේ දී උප ව්‍යාපෘතීන් 360 ක් සඳහා රුපියල් මිලියන 2684 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිදහස් කර ඇති අතර මුළු ප්‍රතිපාදන වටිනාකමට මුදල් වෙන් කිරීම සිදු කර ඇත.

**(1) පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II**

මෙම වර්ෂය සඳහා රුපියල් මිලියන 800 ක් වෙන් කර දී ඇති අතර, සමාලෝචනයට භාජනය වන කාලසීමාවේ දී උප ව්‍යාපෘතීන් 44 ක් සඳහා රුපියල් මිලියන 668 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිදහස් කර ඇති අතර ඉතිරි මුදල් මෙම වසර තුළ දී නිදහස් කිරීමට අපේක්ෂිතයි.

## 7.3 අනාගත සැලසුම් - 2025

**(2) කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)**

2025 වර්ෂය සඳහා රු. මි. 3500.00 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති අතර මෙම මුදල දළ වශයෙන් උප ව්‍යාපෘතීන් 375 ක් සඳහා ලබා දීමටත් එමගින් නව රැකියා අවස්ථා 2,300 ක් පමණ ජනිත කිරීමටත් අපේක්ෂා කරයි.

**(3) පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II**

2025 වර්ෂය සඳහා රු. මි. 1500 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති අතර මෙම මුදල දළ වශයෙන් ව්‍යාපෘති 110 ක් සඳහා ලබා දීමට බලාපොරොත්තු වේ. එමඟින් සම්පත් ඉතිරි කිරීම, සම්පත් ප්‍රතිසාධනය, වෙනත් කර්මාන්ත සඳහා අපද්‍රව්‍ය නැවත භාවිතා කිරීම, අප ජලය පිරිපහදු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ බලශක්ති ඉතිරි කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය මඟින් මුල්‍ය සහාය ලබා දීම තුලින් පරිසර හිතකාමී කාර්මික පරිසරයක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ.

# 08

# පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යූහගතකරණ අංශය

## පොදු ව්‍යාපාර අංශය

කර්මාන්ත අමාත්‍යාංශයේ පොදු ව්‍යාපාර අංශය මඟින් මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන සියළුම සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වඩාත් ශක්‍ය හා තිරසර ආයතන බවට පත්කිරීමට අවශ්‍ය සහාය ලබාදෙනු ලැබේ. එකී අරමුණු ඉටුකර ගැනීම සඳහා, සියළුම වත්කම්වල ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම තුලින් ආදායම උපරිම කිරීම සහ නවීන ව්‍යාපාරික උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම තුලින් ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. මීට අමතරව, මෙකී ව්‍යවස්ථාපිත ආයතනවල දෛනික ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලැබේ.

## පොදු ව්‍යාපාර අංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන

සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය යටතට ගැනෙන රාජ්‍ය ව්‍යාපාර ආයතන පහත පරිදි වේ.

- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
- කාර්මික සංවර්ධන මණ්ඩලය
- ලංකා පිඟන් සංස්ථාව
- සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම
- සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
- කන්තලේ සීනි සමාගම
- ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
- උක් පර්යේෂණ ආයතනය

තරුණ හා කාන්තා ව්‍යවසායකයින් අපනයන වෙළඳපොල සඳහා යොමුකිරීම ඉලක්ක කරමින් "තරුණ ව්‍යවසායකයින් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන" ආරම්භ කළ අතර, එහි නියමු ව්‍යාපෘතිය ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර ඇති අතර ඉදිරි වර්ෂයේ දී ගාල්ල සහ කැගල්ල දිස්ත්‍රික්ක තුළ ආරම්භ කිරීමට නියමිතව ඇත. මෙම වැඩ සටහන සඳහා දැනට තෝරා ගෙන ඇති කර්මාන්ත සංඛ්‍යාව 100 ක් වන අතර වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතී.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය නැවත බල ගැන්වීම සඳහා උත්තේජක පැකේජය - රජයේ අරමුදල් සහිත ණය යෝජනා ක්‍රමය යටතේ ආයෝජන කාණ්ඩයේ සහ කාරක ප්‍රාග්ධන කාණ්ඩයේ ණය යෝජනා ක්‍රම දෙකක් මුදල් අමාත්‍යාංශය සහ කර්මාන්ත අමාත්‍යාංශය එක්ව තෝරා ගත් බැංකු 16ක් හරහා ක්‍රියාත්මක කරනු ලැබේ.

## ප්‍රතිව්‍යුහගතකරණ අංශය

ප්‍රතිව්‍යුහගතකරණ අංශය මඟින් පහත සඳහන් රාජ්‍ය ව්‍යාපාර තිරසාර පැවැත්මක් සහිත පෙරට වඩා ලාභ ලබන ආයතන බවට පත් කිරීමටත් එම ආයතනවල කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය තව දුරටත් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමටත් අදාළ කාර්යයන් සිදු කරනු ලබයි.

### ප්‍රතිව්‍යුහගතකරණ අංශය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යාපාර

- ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්
- සී/ස ජාතික කඩදාසි සමාගම
- කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්
- ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
- ජාතික ලුණු සමාගම
- පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ්
- ලංකා ලේලන්ඩ් ලිමිටඩ්
- සී/ස ලංකා සිමෙන්ති සමාගම

### අරමුණු

- ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට විභවතාව පවතින දැනට ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති රාජ්‍ය ව්‍යවසාය නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම.
- දැනට පාඩු ලබන සහ ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට විභවතාව නොමැති රාජ්‍ය ව්‍යවසාය ඈවර කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- රාජ්‍ය ව්‍යවසායවල නිෂ්පාදන කටයුතු සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම, නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සහ අගය එකතු කිරීම තුළින් නිෂ්පාදන ප්‍රමාණය සහ ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම හරහා ලාභය උපරිම කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ රාජ්‍ය ව්‍යවසායන්හි සංවර්ධන කටයුතු සඳහා දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයින්ගේ දායකත්වය ලබා ගැනීම.
- දළ දේශීය නිෂ්පාදනයට උපරිම දායකත්වය ලබා දීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් මෙහෙයවීම.
- රාජ්‍ය ව්‍යවසායයන්හි භෞතික හා මානව සම්පත ඵලදායී ලෙස මෙහෙයවීමට අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම.

## ප්‍රධාන කාර්යයන්

- අංශය යටතේ පවතින ව්‍යවසායන්ට අදාල පරිපාලන සහ සංවර්ධන කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම.
- රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීම.
- මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති වලට අදාල කටයුතු සිදු කිරීම.

## 8.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

**ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්තශාලාව රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ නැවත ආරම්භ කිරීම**



ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ නැවත ආරම්භ කිරීම සඳහා අංක: අමප/22/0254/320/010 හා 2022.02.28 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර 2024.04.08 දින කොරියන් ස්පා පැකේජින් (පුද්) සමාගම විසින් සී/ස ජාතික කඩදාසි සමාගමට අයත් ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදී. මෙම කර්මාන්තශාලාව මගින් සිදු කිරීමට අපේක්ෂිත වාර්ෂික කඩදාසි නිෂ්පාදනය මෙ.ටො. 74250 කි.

## ඛනිජවැලි කර්මාන්තයේ ආර්ථික දායකත්වය

2024 ජනවාරි - දෙසැම්බර් දක්වා ඛනිජවැලි අලෙවිය තුළින් උපයාගෙන ඇති ආදායම ඇමරිකන් ඩොලර් **2,283,256.57ක්** (රාජ්‍ය භාගය රහිතව) වේ.

## 8.3 අනාගත සැලසුම් - 2025

- කහටගහ පතලෙහි පවතින මිනිරන් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය අනුව ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය.

- ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි කැණීම් කරනු ලබන ඛනිජවැලි සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය.

# 09

# කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය

## 9.1 හැඳින්වීම

බතික්, අත්යන්ත්‍ර රෙදිපිළි හා දේශීය ඇඟළුම් නිෂ්පාදනය ප්‍රවර්ධන කිරීම හා වේවැල්,පිත්තල, මැටි, ලී බඩු ඇතුළු ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය ක්‍රියාත්මක වේ.

මෙම අංශය විසින් 2024 වසරේදී පහත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන (රු.මි. 100)
- අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන (රු.මි. 80)
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නිරත කාන්තාවන් හා තරුණ ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම (රු.මි. 300)

## 9.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### I. සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන (රු.මි. 100)

### ❖ ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වගාකිරිමේ වැඩසටහන

ජාතික ශිල්ප සභාව මඟින් ක්‍රියාත්මක කරන ලද පාරම්පරික හස්ත කර්මාන්ත සඳහා උපයෝගිකොට ගන්නා අමුද්‍රව්‍ය ශාක වගා කිරීමේ වැඩසටහන මඟින් 2024 වසර තුළදී අක්කර 17 පර්චස් 90 ක පන් පැළ 517,500 වගා කිරීමට පියවර ගෙන ඇත.

වියදම - රු.මි. 6.36 කි.

**කලපුගම ශිල්ප සමිතිය සඳහා පන් පැළ ලබා දීම - 2024.09.27**



❖ **දැව මෝස්තර හා නිර්මාණ නවෝත්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම**

දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ ප්‍රමිතිගත ශිල්පීන් බිහි කිරීම හා ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය නවීන තාක්ෂණය, නව මෝස්තර, පර්යේෂණ හා නවෝත්පාදන යන අංශවල වැඩිදියුණුව අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන මඟින් 2024 වසරේ දී කටුබැද්ද යාන්ත්‍රික වඩු කර්මාන්ත මධ්‍යස්ථානයට අයත් ගොඩනැඟිල්ල හා යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කොට භාවිතයට ගැනීමට කටයුතු කර ඇත.

මෙහි දී පළාත් මට්ටමින් ක්‍රියාත්මක ප්‍රාථමික වඩු පුහුණු පාසල් වලින් තෝරාගත් ශිල්පීන්ගේ උසස් පුහුණු පාඨමාලා 2024 සැප්තැම්බර් 02 දින සිට එහි පළමු අදියර ලෙස ආරම්භ කරන ලදී. වියදම - රු.මි. 6.9 කි.

**කටුබැද්ද යාන්ත්‍රික වඩු කර්මාන්ත මධ්‍යස්ථානයේ පාඨමාලා ආරම්භක අවස්ථාව**



❖ **ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන**

* 37th session of the FAO Regional Conference සමගාමීව හිල්ටන් හෝටලයේදී ලක් ශිල්ප නිර්මාණ ඇතුළත් අලෙවි කුටියක් පවත්වාගෙන යන ලදී.

* මාර්තු 28 සිට 30 දක්වා බදුල්ලේ පැවති හස්ත කර්මාන්ත හා ආහාර අලෙවි සල්පිල සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව -30

* පෙබරවාරි මස 23,24,25 දිනවලදී BMICH පරිශ්‍රයේ "ARCHITECH 2024" ගෘහ නිර්මාණ ප්‍රදර්ශනය සඳහා ලක් ශිල්ප නිර්මාණ ඇතුළත් අලෙවි කුටියක් පවත්වාගෙන යන ලදී.

* 2024 මාර්තු 23 හා 24 කොළඹ One Galle Face පරිශ්‍රයේදී "Women Plus Bazzar" අලෙවි පල සඳහා ලක් ශිල්ප නිර්මාණ ඇතුළත් අලෙවි කුටියක් පවත්වාගෙන යන ලදී.

* 2024.03.10 දින කොළඹ Galle Face Green "IORA DAY 2024" (Indian Ocean Rim Association) ප්‍රදර්ශනය සඳහා ලක් ශිල්ප නිර්මාණ ඇතුළත් අලෙවි කුටියක් පවත්වාගෙන යන ලදී.

ඉහත සියළු වැඩසටහන් ජාතික ශිල්ප සභාවේ මැදිහත්වීම මත එහි ලියාපදිංචි ශිල්පීන්ගේ සහභාගිත්වයෙන් සිදුකර ඇති අතර, ඒ සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය මූල්‍ය දායකත්වය සපයා ඇත.

සපයන ලද මූල්‍ය දායකත්වය - රු.මි. 0.8

❖ **ශිල්ප අභිමානී ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත සම්මාන ප්‍රදානය**

ජාතික ශිල්ප සභාව මඟින් පවත්වනු ලබන ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත තරඟය සහ ප්‍රදර්ශනය "ශිල්ප අභිමානී - 2024" හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදෙමින් මූලික හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර 31 ක් යටතේ වූ ශිල්පීන් දිරිමත් කිරීම හා අගය කිරීම සඳහා දායකත්වය ලබාදෙන ලදී.
වියදම - රු.මි. 15.5

## II. අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය ප්‍රවර්ධනය වැඩසටහන (රු.මි. 80)

❖ **අත්යන්ත්‍ර, බතික් සහ රෙදිපිළි කර්මාන්ත සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

ඌව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් යොමු කරන ලද පහත සංවර්ධන ව්‍යාපෘති වැඩ අවසන් කර ඇත.

* වර්ණ සංයෝජන රසායනාගාරයක්
* අමුද්‍රව්‍ය ගබඩාවක් ඉදි කිරීම
  වියදම - රු.මි. 1.8

කුරුණෑගල ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද බතික් හා ආශ්‍රිත නිෂ්පාදන පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස නිම කර ඇත.

* සහභාගීවූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 26 කි.
* වියදම - රු.මි. 0.33

❖ **නව මෝස්තර, ක්‍රියාවලි සහ නිෂ්පාදන සංවර්ධනය තුළින් බතික්, අත්යන්ත්‍ර සහ රෙදිපිළි කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම.**

ඉහත වැඩසටහන යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධව 2024 වසරතුළ දී පුහුණු වැඩසටහන් 12 ක් පවත්වා ඇත. වියදම - රු.මි. 2.88.

❖ **ශිල්ප අභිමානී ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත සම්මාන ප්‍රදානය**

ජාතික ශිල්ප සභාව මඟින් පවත්වනු ලබන ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත තරඟය සහ ප්‍රදර්ශනය "ශිල්ප අභිමානී - 2023" සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදෙමින් එහි උපචිත වියදම් පියවීම සඳහා දායකත්වය ලබාදෙන ලදී.
වියදම - රු.මි. 7.0

**බතික් , අත්යන්ත්‍ර හා රෙදිපිළි කර්මාන්තවල නිෂ්පාදන සංවර්ධනය සහ විවිධාංගිකරණය තුළින් ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන**

බතික් නිෂ්පාදනකරුවන් හා අත් යන්ත්‍ර රෙදි පිළි කර්මාන්තයේ නිෂ්පාදන කර්මාන්තකරුවන් 400ක් නව්‍ය හා විවිධාංගිකරණය වූ නිෂ්පාදන බිහිකළ හැකි වන පරිදි ඉහත වැඩසටහන යටතේ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය සමග ඒකාබද්ධව ව්‍යවසායකයින් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 20 ක් පවත්වා ඇත.
වියදම - රු.මි. 10.62

## III. අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නිරත කාන්තාවන් හා තරුණ ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම (රු.මි. 300)

2024 අයවැය කතාව මඟින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්වූ ප්‍රතිපාදන මත පහත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නිරත කාන්තාවන් හා තරුණ ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම**

පේෂකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයේ සහභාගිත්වය ඇතිව දැනට අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයේ නියැලී සිටින කර්මාන්තකරුවන් 496 දෙනෙකු සඳහා පෙර ඉගෙනුම් පදනම් කරගනිමින් ජාතික වෘත්තීය සහතික පත්‍ර ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. එහිදී ප්‍රතිලාභියාගේ ධාරිතාවය මත පදනම්ව ජාතික වෘත්තීය සුදුසුකම් අදියර III හෝ IV මට්ටමේ සහතික අදාළ ප්‍රතිලාභීන් වෙත ලබාදීමට අදාල කටයුතු සිදු කරන ලදී.
වියදම - රු.මි. 5.0

**නිෂ්පාදන විවිධාංගීකරණය, නව මෝස්තර, නව තාක්ෂණ භාවිතය හා ව්‍යවසායකත්ව කුසලතා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මෙහෙයවීම හා මෙම අංශයේ ප්‍රතිපාදන මත "Brain into Business" වැඩසටහන මඟින් අත්යන්ත්‍ර රෙදිපිළි හා ඇඟළුම් ක්ෂේත්‍රයේ නිරත උපාධිධාරීන් 10 දෙනෙකු ව්‍යවසායකත්ව කුසලතා වැඩිදියුණු කරගනිමින් රැකියා වෙළඳපොල තුළ රැකියා සොයන්නන් ලෙස නොව රැකියා උත්පාදනය කරන්නන් ලෙස ජාතික ආර්ථික ප්‍රවාහයට ඒකාබද්ධ කිරීම මෙම වැඩසටහන යටතේ සිදුකරන ලදී.
වියදම - රු.මි. 3.55

**"Brain into Business" වැඩසටහන**




**අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය සඳහා පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාදාමය සිදුකිරීම**

බතික් සහ අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය සඳහා දේශීය අමුද්‍රව්‍ය උපයෝගිකොට ගනිමින් ස්වභාවික වර්ණක හඳුන්වා දීම මෙම වැඩසටහන මඟින් සිදුකරන ලද අතර, ඒ සඳහා වූ පර්යේෂණ සහ තාක්ෂණ දායකත්වය SLINTEC ආයතනය මඟින්
සපයා ගන්නා ලදී. එහි දී හඳුනාගත් ස්වභාවික වර්ණක ප්‍රශස්ත කිරීමේ ක්‍රියාවලියට අදාළ පරීක්ෂණ තවදුරටත් ක්‍රියාත්මක මට්ටමේ පවතී. වියදම -රු.මි.1.66

**දේශීය අත්යන්ත්‍ර රෙදිපිළි හා බතික් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම**

ඉහත වැඩසටහන යටතේ පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද "ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනය අලෙවි සල්පිල හා සම්මාන ප්‍රදානෝත්සවයේ" විද්‍යුත් මාධ්‍ය වෙළඳ ප්‍රචාරණ කටයුතු සිදුකරන ලදී.
වියදම - රු.මි. 7.54

## 9.3 අනාගත සැලැසුම් - 2025

**I. දැව නිෂ්පාදන ආශ්‍රිත නිර්මාණ හා මෝස්තර මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු පුළුල් කිරීම**

දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නවීන තාක්ෂණය, නව මෝස්තර, පර්යේෂණ හා නවෝත්පාදන යන අංශවල වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් 2021 වසරේ ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිය 2025 වසරේ දී ද තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එහිදී පළාත් මට්ටමෙන් හඳුනාගන්නා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නිරත වෘත්තිකයින්ගේ හා ආධුනිකයන්ගේ (වසරකට ආසන්න වශයෙන් 40 පමණ) උසස් වෘත්තීය පුහුණු අවශ්‍යතාවන් මෙමඟින් සපුරාලීමට අපේක්ෂා කෙරේ.

**II. ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොල ප්‍රවර්ධන වැඩසටහන**

ශ්‍රී ලාංකේය කුඩා හා මධ්‍ය පරිමාණ ග්‍රාමීය කර්මාන්තකරුවන් මුහුණදෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් වෙළඳපොල පහසුකම් නොමැතිවීමයි. ඔවුන්ගේ නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළඳපොල අවස්ථා උදාකර දීම අරමුණු කරගනිමින් 2025 වසරේදී ද අඛණ්ඩව ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එහිදී දේශීය නිෂ්පාදන සම්බන්ධයෙන් පාරිභෝගිකයන් අතර දැනුවත්භාවය ඉහළ නැංවීම, නව නිෂ්පාදන, නව මෝස්තර සහ තාක්ෂණය සම්බන්ධ දැනුම හුවමාරු කර ගැනීම සඳහා අවස්ථා උදාකර දීම හා දේශීය විදේශීය අලෙවි අවස්ථාවන් උදාකර දීම තුළින් ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ ආදායම් ඉහළ නැංවීමට හා ඔවුන්ගේ ජීවන තත්වය නඟාසිටුවීමට අපේක්ෂා කරයි.

**III. ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වගාකිරීමේ වැඩසටහන**

සම්ප්‍රදායික ග්‍රාමීය කර්මාන්ත නියෝජනය කරන පාරම්පරික හස්ත කර්මාන්තයන් හි නිරත වන කර්මාන්තකරුවන් භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන අමුද්‍රව්‍ය අතර දේශීය වශයෙන් සපයාගත හැකි ඛණිජ ද්‍රව්‍ය හා වේවැල්, හණ, උන වැනි ශාක වර්ග ප්‍රධාන වේ.

ඉහත කී අමුද්‍රව්‍ය ශාක වසර පුරා ප්‍රමාණවත් පරිදි දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම පහසුවෙන් සපයාගත නොහැකි වීම ගැටළුකාරී වන හෙයින් හස්ත කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ශාක වගා කිරීමේ වැඩසටහන 2025 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**IV. බතික් සහ අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්ත සඳහා පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

දේශීය විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සමඟ ඒකාබද්ධව පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාදාමය සිදුකිරීම තුළින් බතික් සහ අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය සඳහා යොදාගැනීමට ස්වභාවික වර්ණක හා පරිසර හිතකාමී අමුද්‍රව්‍ය හඳුනාගැනීමට හා වාණිජකරණය කිරීමට මෙම ව්‍යාපෘතිය මඟින් කටයුතු සැලසුම් කර ඇත.

**V. බතික්, අත්යන්ත්‍ර සහ ඇඟලුම් නිෂ්පාදන ප්‍රවර්ධන/ වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

බතික්, අත්යන්ත්‍ර රෙදිපිළි හා දේශීය ඇඟළුම් ප්‍රචලිත කිරීම සඳහා විලාසිතා නිර්මාණ තරඟ, විලාසිතා දැක්ම, ප්‍රදර්ශන හා පුහුණු වැඩසටහන් මේ යටතේ සිදුකිරීමට සැලසුම් කර ඇත.

**VI. බතික්, අත්යන්ත්‍ර සහ ඇඟලුම් කර්මාන්ත සඳහා යටිතල පහසුකම් සංවර්ධනය.**

පළාත් කර්මාන්ත අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තු සතු පුහුණු මධ්‍යස්ථාන හා නිෂ්පාදන මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙහිදී සිදුකිරීමට අපේක්ෂිතය.

**VII. අපනයනය ඉලක්ක කරගත් නිෂ්පාදන දිරිගැන්වීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ඇඟළුම් නිෂ්පාදනයේ නිරත මැහුම්කරුවන්ගේ කුසලතා තක්සේරු කරමින් ඔවුන් සඳහා වෘත්තීය සහතික පත් ලබාදීම හා ගෝලීය වෙළෙඳපොළට හඳුන්වා දීම මෙම වැඩසටහන මඟින් සිදුකෙරේ.

# 10

# ප්‍රාථමික කර්මාන්ත අංශය

## 10.1 හැඳින්වීම

අප රට සතු මැණික් සම්පත, පරිසරයද උපරිම ආරක්ෂා කරගනිමින් නවීන තාක්ෂණය ද මුසු කරගනිමින් සුරක්ෂිතව ගොඩගෙන පුද්ගලික අංශය ද එක්කර ගනිමින් අගය වැඩිකිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කරමින් මෙන්ම ස්වර්ණාභරණ කර්මාන්තය ද ප්‍රවර්ධන කරමින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ තිරසර සංවර්ධනය වෙනුවෙන් අප පෙරමුණ ගෙන සිටී.

ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන වටිනාකමින් 3% කට ආසන්න ප්‍රමාණයකට දායකත්වයක් දක්වන මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදී සිටින කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය බදු සහනයන්, තාක්ෂණික සහායයන් ඇතුලු අවශ්‍ය සියලුම පහසුකම් ලබාදීමට කටයුතු කරමින් පවතින අතර ඒ තුළින් ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීම අරමුණ වේ.

සංචාරක කර්මාන්තය සමඟද අත්වැල් බැඳ ගනිමින් ලොව අංක එකේ මැණික් ගැනුම්කරුවන් ගේ ගමනාන්තය බවට අප රට පත් කිරීම මෙන්ම දේශීයව හා විදේශීය ඉල්ලුමට සරිලන නවීන තාක්ෂණයෙන්,ගුණාත්මකභාවයෙන් හා මනා නිමාවකින් යුතු ස්වර්ණාභරණ නිෂ්පාදනය කරන කර්මාන්තයක් බිහි කිරීම අපගේ තිර අධිෂ්ඨානයයි.

## 10.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

- **මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ආර්ථික දායකත්වය**

2024 දෙසැම්බර් මස 31 දින වන විට මැණික්, ස්වර්ණාභරණ හා දියමන්ති නිෂ්පාදන අපනයනය කිරීම තුළින් උපයාගෙන ඇති අපනයන වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 355 ක් වන අතර, එය 2023 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන විට උපයා ගෙන ඇති අපනයන වටිනාකම වන ඇමරිකන් ඩොලර් මිලියන 477 කට සාපේක්ෂව පසුබෑමක් පෙන්නුම් කරයි. එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ බදු ප්‍රතිශතයන් ඉහළ යාම වන අතර, මෙම අපගමනය අවම කර ගැනීමේ අරමුණින් බදු සහනයක් ලබා ගැනීම සම්බන්ධයෙන් අදාල අංශ සමඟ සාකච්ඡා කරමින් පවතී.

| අපනයන වටිනාකම - 2024 දෙසැ. 31 දිනට | | |
|---|---|---|
| අපනයන නිෂ්පාදනය | අපනයන වටිනාකම (ඇ.ඩො. මිලියන) | % |
| **මැණික්** | **148.52** | **42** |
| **ස්වර්ණාභරණ** | **11.08** | **3** |
| **දියමන්ති** | **194.95** | **55** |
| **මුලු වටිනාකම** | **354.55** | **100** |

*මූලාශ්‍රය :ප්‍රාථමික කර්මාන්ත අංශය*

- **ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව**

ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් එනම් 70% ක් පමණ මැණික් නිධි පවතින බව ඇස්තමේන්තු කර ඇති අතර, මෙම සම්පත් වලින් මේ වන විට 20% ක් පමණක් මේ දක්වා ගවේෂණය කර ඇත.

මෙම තත්ත්වය යටතේ නව මැණික් නිධි ගවේෂණය ප්‍රමුඛ කාර්යයක් සේ හඳුනා ගෙන ඇති අතර, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් නව තාක්ෂණය භාවිතා කරමින් නව මැණික් නිධි ගවේෂණය කිරීමට කටයුතු කරමින් පවතී.

2024 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ ඉංගිරිය, දෙහිඕවිට, අයගම හා පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මූලික මැණික් විභව සිතියම් ගත කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

ශ්‍රී ලංකාව මුහුණ පා ඇති ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීම සඳහා ශ්‍රී ලංකාවේ මැණික් සම්පත කාර්යක්ෂමව භාවිතා කිරීමේ ඉහළ විභවතාවයක් පවතින බැවින්, මෙතෙක් ප්‍රයෝජනයට නොගත් දිවයින පුරා පැතිර පවතින මැණික් සම්පත ප්‍රයෝජනවත් ලෙස වෙළඳපොළට එක් කිරීම සඳහා ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව, ආර්ථික අර්බුදයේ බලපෑම සටහන් කිරීම පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවධානය යොමු කරන ලදුව, දැනට රටතුළ පවතින වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් සිදී ඇති වැව් ආශ්‍රිතව පවතින මැණික් සම්පත පරිසර හිතකාමී, ආරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින්, විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ නෙළා ගැනීමේ ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කර ඇත. එහි පළමු අදියර යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි සමනළ වැව ජලාශය ආශ්‍රිත ප්‍රදේශයේ හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි මාළුස්සා කැළේ හා කාසල්රී ජලාශ ආශ්‍රිත ප්‍රදේශයේ මැණික් සම්පත නෙළා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් කමිටු පත් කොට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

- **මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ වෘත්තීය නිපුනතාවය ඉහළ නැංවීම**

2024 වර්ෂය සඳහා ඉලක්ක ගත සිසුන් සංඛ්‍යාව 1276 ක් වූ අතර, 2024 දෙසැම්බර් මස 31 වන විට සිසුන් 1335 දෙනෙකු බඳවා ගෙන ඇත. මෙම වර්ෂයේදී පාඨමාලා නිම කළ සිසුන් ප්‍රමාණය 507 ක් වන අතර සිසුන් 746 දෙනෙකු තවදුරටත් පාඨමාලාව හදාරමින් සිටී.

දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 15 කදී මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ විවිධ පුහුණු පාඨමාලා 20 ක් පමණ පවත්වමින් කර්මාන්තයට අවශ්‍ය නිපුණ ශ්‍රමය සැපයීමට කටයුතු කරමින් සිටී.

- ඉහත කුඩා ප්‍රමාණයේ මැණික් කැපීමේ තාක්ෂණය ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත කිරීමේ අරමුණින් ඒ සඳහා වන පුහුණු ඒකකයක් ස්ථාපනය කිරීම සඳහා රුපියල් මිලියන 50.0 ක ප්‍රතිපාදන වෙන් වී ඇත. මෙම පුහුණු ඒකකය මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ රත්නපුර පුහුණු මධ්‍යස්ථානයේ ස්ථාපනය කිරිම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

- **මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් මුහුණ දී ඇති ගැටලු සාකච්ඡා කර විසඳුම් ලබා දිම සඳහා පියවර ගැනිම.**
  මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් මුහුණ දී සිටින ගැටලු හා ඔවුන්ගේ යෝජනා සඳහා විසඳුම් ලබා දීම සඳහා නිරන්තරයෙන් ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට පියවර ගෙන ඇත.

- **ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.**
  අදාල පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ඇතුලත් කරමින් සංශෝධිත පනත් කෙටුම්පත් සකස් කර ඇති අතර, එය තවදුරටත් අධ්‍යයනය කර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

- **මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල මහජන පැමිණිලි විමර්ශනය කිරීම.**
  මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාලව 2024 වර්ෂයේ ලැබුණු පැමිණිලි 60 න් 24 ක් සඳහා පිලිතුරු සපයා ඇති අතර ඉතිරි පැමිණිලි

  සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. මහජන පැමිණිලි විමර්ශනය වඩා කාර්යක්ෂම කිරීම සඳහා නව ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.

- 2024 වර්ෂයේදී මේ වන විට මැණික් කැණීම් සම්බන්ධයෙන් අභියාචනා 23 ක් ලැබී ඇති අතර, ඉන් 06 ක් විභාග කර අවසන් කර ඇත. ඉතිරි අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

- විදේශිකයින් විසින් අනවසරයෙන් සිදු කරන මැණික් වෙළඳාම පාලනය කිරීමේ අරමුණින් ඒ සඳහා වන යාන්ත්‍රණයක් සකස් කර ඇති අතර, එකී ක්‍රමවේදය 2025 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- 2024 ජනවාරි මස ශ්‍රී ලංකාවේදී ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීමට කටයුතු කරන ලද අතර, විදේශීය රටවල පැවැත්වෙන වෙළඳ ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ මණ්ඩප සඳහා ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින් යොමු කිරීමට පියවර ගෙන ඇත.

- ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට නිපුණ ශ්‍රමය සහ නව තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා තායිලන්තයේ මැණික් හා ස්වර්ණාභරණ සංගමය හා ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති අතර, එහි කටයුතු සිදු කෙරෙමින් පවතී.

## 10.3 අනාගත සැලසුම් - 2025

- මැණික් හා ස්වර්ණාභරණ අපනයන ආදායම් 2024 වර්ෂයට සාපේක්ෂව දෙගුණයකින් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ජාත්‍යන්තර මට්ටමේ මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකාවේදී පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම.
- ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම.
- ශ්‍රී ලංකාව කලාපීය මැණික් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා ලංකාවේ හමු නොවන මැණික් වර්ගද සමඟින් මැණික් සංචිතය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- මැණික් තාපකරණය, අගය වැඩි කිරිම හා රසායනාගාර පහසුකම් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම සඳහා පසුබිම සකස් කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් බිහි කිරීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ප්‍රවණතාවයන්ට සරිලන පරිදි වෘත්තීය පුහුණු පාඨමාලා සංවර්ධනය කිරීම හා බඳවාගන්නා පුහුණුලාභීන් ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කිරීම හා අවශ්‍යතාවය පරිදි නව පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත පුද්ගලික හා රාජ්‍ය ආයතන සමග විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රනයක් ඇති කිරීම.
- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි අණ පනත් හා ගැසට්, කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කිරීම.
- මැණික් අපනයනය සඳහා නව වෙළඳපොළවල් හඳුනාගැනීම හා එම වෙළඳපොළවල් සමග ගිවිසුම් ගතවීම.
- කර්මාන්තය නියාමනය හා සංවර්ධනය කිරිම සඳහා සුදුසු සංශෝධන සිදු කිරීම.

# 11

# සැලසුම් අංශය

## 11.1 හැඳින්වීම

කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රගමණය සඳහා ඉවහල් වන සංවර්ධන ව්‍යාපෘතීන්, සැලසුම් කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම, ප්‍රගති සමාලෝචනය සහ සුපරීක්ෂණය මඟින් ඵලදායී ව්‍යාපෘති හඳුනා ගැනීමට සහය ලබා දීම සැලසුම් අංශයේ ප්‍රමුඛතම කාර්යභාරය වේ.

වාර්ෂිකව අනුමත අයවැය ප්‍රතිපාදනවලට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඒ අනුව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සොයාබැලීම, අදාළ ප්‍රගති වාර්තා සකස් කිරීම සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමත් අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ රාජ්‍ය ව්‍යවසයන්හි ප්‍රගතිය හා සම්බන්ධ සියලුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමත් සැලසුම් අංශය මඟින් සිදු කරනු ලැබේ.

## 11.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2024 වර්ෂය සඳහාද සකස් කරන ලදී.
- ප්‍රගති සමාලෝචන/නියාමන සැලැස්ම 2024 සකස් කරන ලදී.
- අමාත්‍යාංශයේ ප්‍රාග්ධන අයවැය 2025 සකස් කිරීම (රු.මි. 10ට අඩු ව්‍යාපෘති තක්සේරු කිරීම ඇතුළුව).
- උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමේ ගමන් මඟ (Strategic Implementation Road Map 2023-2027) ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම (මාර්ගෝපදේශ, ආකෘතිපත්‍ර සකස් කිරීම ආදිය).

- ජනාධිපති ලේකම් කාර්යාලයේ මඟ පෙන්වීම යටතේ අමාත්‍යාංශය යටතේ පවතින සියළුම අංශ සහ ආයතනවලට කාර්ය සාධන දර්ශක (KPI) සහ ආයතන සභාපතිවරුන් සමඟ කාර්යසාධන ගිවිසුම් අත්සන් කොට ඒවා කාර්තුමය වශයෙන් පසුවිපරම් කිරීමේ ක්‍රියාදාමයක්ද ක්‍රියාත්මක කරනු ලබයි.

- තිරසර සංවර්ධන ඉලක්ක (SDG) අංක 9 සඳහා මෙහෙයුම් කමිටුව ආයතන 21 කට වැඩි ගණනක සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කර ඇති අතර කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් SDG – 9 සඳහා වන උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරමින් පවතින අතර එය කඩිනමින් නිම කිරීමට සැලසුම් කර ඇත.

- ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම - සංවර්ධන අංශ, සංස්ථා, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ව්‍යවසායයන් ඇතුලත්ව සැලසුම් කරන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සැලසුම් කල පරිදි පවත්වා ඇත.

- කර්මාන්ත ක්ෂේත්‍රයේ තීරණ ගැනීමට අවශ්‍ය දත්ත නොමැතිවීමේ ගැටළුවට විසඳුමක් ලෙස සංඛ්‍යා ලේඛන දත්ත අත්පොත වාර්ෂිකව පිළියෙළ කර ප්‍රකාශයට පත් කිරීමට අමාත්‍යාංශය මඟින් 2022 වර්ෂයේදී පියවර ගන්නා ලදී. ඒ අනුව 2022 වර්ෂයේ දත්ත අත්පොත, 2023 වර්ෂයේ මුල් භාගයේ ප්‍රකාශයට පත් කරන ලදී. අත්පොත සඳහා අමාත්‍යාංශයේ කර්මාන්ත වර්ගීකරණය අනුව උප අංශ 20 පදනම් කර ගනිමින් දත්ත ඒකරාශී කිරීම සිදු වේ. ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රේගුව සහ මහ බැංකුව වැනි ආයතන මූලාශ්‍ර කරගනිමින් හඳුනා ගනු ලබන දත්ත, වර්ෂ කිහිපයක දත්ත සමඟ සංසන්දනාත්මකව ගැලපීමද සිදු කෙරේ. 2023 වර්ෂය පදනම් කරගත් දත්ත අත්පොත මේ වන විට පිළියෙළ කරමින් පවතින අතර එය කඩිනමින් ප්‍රකාශයට පත් කර ඇත.

- රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්යය සමාලෝචන විශ්ලේෂණ වාර්තා අමාත්‍යාංශයේ වෙබ් පිටුවේ පල කර ඇත.

- 2023 වාර්ෂික කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත 2024.06.10 දින ඉදිරිපත් කරන ලදී.

- 2024 වර්ෂය සඳහා වූ ප්‍රගති වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ සියලු කටයුතු අවසන් කර ඇත. (අයවැය කාරක සභා අවස්ථාව සඳහා)

- දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන් පවත්වන ලදී.

- අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු පිලිබඳ ප්‍රගති වාර්තා සහ වෙනත් වාර්තා මාසිකව, කාර්තුමය මෙන්ම විශේෂ අවස්ථා පදනම් කරගෙන විවිධ ආයතන වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කර ඇත.

## 11.3 අනාගත සැලැසුම් - 2025

- උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමේ ගමන් මඟට (Strategic Implementation Road Map 2023-2027) අනුකූලව අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.

- ප්‍රගති සමාලෝචන/නියාමන සැලැස්ම වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම.

- අමාත්‍යාංශය යටතේ පවත්නා සමාගම්,දෙපාර්තමේන්තු හා රාජ්‍ය ව්‍යවසායන් සඳහා 2025-2030 දක්වා සංයුක්ත සැලැස්ම සකස් කිරීම. (Strategic Plan)

# 12

# පාලන අංශය

## 12.1 හැඳින්වීම

අමාත්‍යාංශයේ ප්‍රධානතම අංශයක් ලෙස ක්‍රියාත්මක වන පාලන අංශය, සෑම වර්ෂයක් ආරම්භයේදීම අමාත්‍යාංශයේ සමස්ත අරමුණු හා පරමාර්ථවලට අනුරූපීව පාලන අංශය සඳහා සකස් කර ගන්නා ලද අරමුණු හා පරමාර්ථ අනුව වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම පිළියෙල කරයි.

ඒ අනුව මෙම වර්ෂය තුලදී පාලන අංශය විසින් ප්‍රමුඛතාවය ලබාදිය යුතු විශේෂිත වූ අංශ කිහිපයක් හඳුනා ගන්නා ලදි. ඒ අනුව ඉටුකරනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

1) නිසි පුහුණු අවශ්‍යතා සපුරාලීම තුලින් කාර්යමණ්ඩලය බලගැන්වීම හා නීතිමය ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම තුලින් අවශ්‍ය අවස්ථාවලදී අමාත්‍යාංශයට හා ආයතනවලට අවශ්‍ය නීතිමය උපදෙස් ලබා දීම.

2) නඩත්තු අංශයේ හා ප්‍රවාහන අංශයේ ක්‍රියාවලිය මනා ලෙස පවත්වාගෙන යාම තුලින් අමාත්‍යාංශයේ සමස්ත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සහය වීම.

3) කාර්යමණ්ඩලයේ මානසික හා චිත්තවේගී යහපැවැත්ම වැඩිදියුණු කිරීම උදෙසා වැඩසටහන් සංවිධානය කිරීම.

4) දෛනික තැපැල බෙදාහැරීම විධිමත්ව කළමනාකරණය කිරීම තුලින් රාජකාරි කටයුතු ඵලදායී කිරීම.

5) නවීන හා බලශක්තිය ඉතිරි කරන භෞතික පහසුකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ ඒවාට අනුගත වීම.

6) අමාත්‍යාංශයේ විදුලිය, ජලය වැනි වියදම් අඩු කර ගැනීමට පියවර ගැනීම.

7) ක්‍රියාවලි විශ්ලේෂණය තුලින් හා මානව ප්‍රාග්ධනය ඉහල නැංවීම තුලින් සමස්ත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

## 12.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

පාලන අංශය මඟින් සිදුවන ප්‍රධාන කාර්යයක් ලෙස කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනිම හා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අවශ්‍යතා සලසා දිම ගෙනහැර දැක්විය හැකිය. අමාත්‍යාංශයේ සියලු ශ්‍රේණිවල නිලධාරීන් ආවරණය වන පරිදි මෙම වර්ෂය තුලත් දේශීය පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.

පසුගිය කාලපරිච්ඡේදවල පැවති කෝවිඩ් තත්ත්වය හා අනෙකුත් හේතුමත විදේශ පුහුණු අවස්ථා මෙම අමාත්‍යාංශය වෙත නොලැබුණු නමුත් මෙම වර්ෂය තුලදී එයද සාමාන්‍යකරණය වී විදේශ පුහුණු වැඩසටහන් ද අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත ලැබුණි.ඒ අනුව ඒවාට සහභාගීවන නිලධාරීන් වෙනුවෙන් ද පාලන අංශය මඟින් අවශ්‍ය පහසුකම් හා මගපෙන්වීම ලබා දෙන ලදී.

අමාත්‍යාංශයේ නඩත්තු හා ප්‍රවාහන ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා එම විෂයන්වල ගැටළු සහගතතැන් හඳුනා ගෙන ඒවා නිවැරදි කර ඵලදායීතාවය ඉහල නැංවීමට අදාල කළමණාකරණ පද්ධතියක් පිහිටුවීමට හැකිවිය.

## 12.3 අනාගත සැලැසුම් - 2025

2024.11.25 දිනැති අංක 2412/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශයේ විෂය පථය සඳහා නව ආයතන ප්‍රමාණයක් ඇතුලත් වී ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍යයන් පුළුල්වීමත් සමඟ සමස්ත රාජකාරී කටයුතු වඩාත් ඵලදායීව ඉටු කිරීම සඳහා පාලන අංශයෙන් ඉටුවිය යුතු රාජකාරී කටයුතු ඉටු කිරීමට 2025 වර්ෂයේදීද සැලසුම් කර ඇත.

අමාත්‍යාංශයේ ප්‍රධාන ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භෞතික හා මානව සම්පත්, ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඵලදායී ලෙස උපයෝජනය කර ගැනීම පාලන අංශයේ මූලික පරමාර්ථය වේ.

# 13

# ගිණුම් හා ප්‍රසම්පාදන අංශය

## 13.1 හැඳින්වීම

තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම්වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව්‍ය කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී සුපිළිපන් ක්‍රමවේදයන් භාවිතය දිරිගැන්වීම, ඉහල වෙළෙඳපළ ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාබ ලැබෙන කාර්මික සංවර්ධනයක් තහවුරු කර ගැනීම යන අමාත්‍යාංශයේ මෙහෙවර ලගා කර ගැනීමට අදාලව අවශ්‍ය මූල්‍යමය සහයෝගය මුදල් අමාත්‍යාංශය හා අනෙකුතක් ආයතන හා සම්බන්ධවී අඛණ්ඩව ලබා දීම අරමුණු කරගත් මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩල සැකැස්ම හා ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

### ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශයට ලැබෙන සියලුම පුනරාවර්තන හා ප්‍රාග්ධන වවුචර් පත් ITMIS පරිගණක පද්ධතියට ඇතුලත් කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම හා එම වවුචර්පත් සඳහා මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය, චක්‍රලේඛ වලට අනුව ගෙවීම් කිරීම.

- GPS පරිගණක පද්ධතිය මඟින් අමාත්‍යාංහයේ නිළධාරීන්ගේ වැටුප් හා දීමනා ගෙවීමට කටයුතු කිරීම හා රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ නිළධාරීන්ට ආපදා ණය, විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් ලබා දීමට කටයුතු කිරීම

- මු.රෙ 135 ප්‍රකාරව මූල්‍ය පාලනය පිළිබඳ වාර්ෂිකව බලතල පැවරීම සකස් කිරීම.
- අමාත්‍යාංශයට ලැබෙන සියලුම විගණන විමසුම් හා වාර්තා විගණන විමසුම් ලේඛණයට ඇතුලත් කර අදාල තොරතුරු විගණකාධිපතිට හා පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම.
- අමාත්‍යාංශයේ සියලුම පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සහ වත්කම් මිලදි ගැනීම වැය විෂයන්ට අදාල වාර්ෂික අයවැය සකස් කිරීම.
- ප්‍රාදේශිය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන වල සියලුම මූල්‍ය පාලන කටයුතු සිදු කිරීම.
- දෛනික ලැබීම් හා ගෙවීම් CIGAS පරිගණක පද්ධතියෙහි යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම හා මාසික ගිණුම් සාරාංශය ඇතුළු සියලුම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන භාණ්ඩාගාරයට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- CIGAS පරිගණක පද්ධතිය හරහා ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.
- අමාත්‍යාංශයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කිරීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීම හා ඒ සම්බන්ධ වාර්තා විගණකාධිපති වෙත යැවීම.
- ප්‍රසම්පාදනයට අදාළ පහත කාර්යන් ඉටු කිරීම
- E-Promise පද්ධතිය හරහා වෙළෙඳපළ මිල සැඳහුම් ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශයට අවශ්‍ය සියළුම කාර්යාල ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ මිලදී ගැනීම සම්බන්ධ කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය කිරීම.
- ජාතික ප්‍රසම්පාදන කොමිෂමට අවශ්‍ය වාර්තා නිසි පරිදි සකස් කර යැවීම
- අමාත්‍යාංශ ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම
- ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථානයන්හි ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය කිරීම.

## 13.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

2024 වර්ෂය තුල ලංකා පිඟන් සංස්ථාවේ ඔඩ්ඩුසුඩාන් කම්හල නැවත යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියා කර ක්‍රියාත්මක මට්ටමට ගැනීම සඳහා රු.මි. 15ක මුදලක් අමාත්‍යාංශය මඟින් ලබා දෙන ලදී.

ඒ තුලින් ආයතනයේ ගඩොල් හා උළු නිෂ්පාදනය කර ප්‍රාදේශීයව පවතින ඉල්ලීමට සරිලන සැපයුමක් ලබා දීම තුලින් ආයතනයේ මෙහෙයුම් ලාභ වැඩි කර ගැනීමට අපේක්ෂා කරයි. ඒ මඟින් ආයතනයේ මෙහෙයුම් වියදම් ආවරණය කර ලාභ ඉපයීමේ අවස්ථා ඇති වනු ඇත.

ජාතික කඩදාසි සමාගමේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා යන්ත්‍රාගාරයේ අත්‍යාවශ්‍යයෙන්ම සිදු කල යුතුව තිබූ අලුත්වැඩියාවක් සඳහා රු.මි. 30ක් හා රු.මි. 04ක් ලෙස අමාත්‍යාංශය වෙත ජාතික අයවැය මඟින් වෙන්කර දෙන ලද ප්‍රතිපාදන වලින් ලබා දෙන ලදී. මේ තුලින් යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට හැකිවන අතර ඒ තුලින් සේවක වැටුප් හා දීමනා සහ අනෙකුත් මෙහෙයුම් ආවරණය කර ගැනීමට අවස්ථාව උදා වනු ඇත.

# දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා

# 14

# පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව (DTI)

## 14.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය දැනුම හා නිපුණතාවයෙන් යුතු මානව සම්පත බිහිකිරීම ඇතුළුව එම ක්ෂේත්‍රයෙහි කටයුතු විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය සිදු කිරීම පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති පේෂ කර්මාන්ත පුහුණු ආයතන සහ මෝස්තර පුහුණු ආයතන මගින් ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබේ.

01. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා තොරතුරු සම්බන්ධීකරණය ඇතුළුව දායකත්වය ලබාදීම.

02. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයෙහි සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත පුහුණු කිරීම.

- රාජ්‍ය අංශය (පළාත් සභා)
- සමූපකාර අංශය
- පෞද්ගලික අංශය

03. නිෂ්පාදන සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සකස් කිරීම.

- අගය එකතු කල නිෂ්පාදන
- නිෂ්පාදන විවිධාංගීකරණය

04. අලෙවි ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

05. අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම හා ප්‍රවර්ධනය අරමුණු කරගත් ව්‍යාපෘති, ස්වයං රැකියා වැඩසටහන් සහ උපකාරක සේවා වැඩසටහන් සංවිධානය කිරීම.

- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
- මෝස්තර සම්පාදන වැඩසටහන්
- පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්
- පේෂ කර්මාන්ත විවීම් විෂය ක්ෂේත්‍රය ආශ්‍රිත පුහුණු කිරීමේ වැඩසටහන්
- පේෂ කර්මාන්ත පුහුණු ආයතන වල පුහුණුලාභීන් ඉලක්ක කරගත් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ලබාදීමේ වැඩසටහන්

06. අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ නව ප්‍රවණතා සහ ගුණාත්මක නිෂ්පාදන සංවර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන පැවැත්වීම.

07. ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත තරඟාවලිය පැවැත්වීම තුළින් ක්ෂේත්‍රයේ නිර්මාණ ශිල්පීන් ඇගයීම.

08. අත්යන්ත්‍ර පේෂකර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු.

09. ක්ෂේත්‍රයට අදාල සංරක්ෂණ කටයුතු

උක්ත අරමුණු ඉටුකරගැනීම සඳහා පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

- පර්යේෂණ, පුහුණු, මෝස්තර හා සේවා ආයතනය - කටුබැද්ද
- පේෂකර්මාන්ත කෞතුකාගාරය - කටුබැද්ද
- පේෂකර්මාන්ත පුහුණු ආයතන
- මෝස්තර පුහුණු ආයතන
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ව්‍යාපෘති

සියළු පරිපාලන කටයුතු පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය මඟින් සිදුවන අතර එය පාලන අංශය, ගිණුම් අංශය හා පුහුණු හා සංවර්ධන අංශය වශයෙන් අංශ 03 කින් සමන්විතය.

## 14.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

**භෞතික ප්‍රගතිය**

දෙපාර්තමේන්තුව යටතේ සිදු කරනු ලබන සමස්ත සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස 75%කි.

- ජාතික අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත සහතික පත්‍ර එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාවෙහි 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා පුහුණුලාභීන් 80ක් බඳවා ගන්නා ලද අතර මේ වන විට අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇත. 2023/2024 අධ්‍යයන වර්ෂයේ එම පාඨමාලාව හැදැරූ සිසුන් 85 ක් පමණ මේ වන විට ක්ෂේත්‍රයෙහි රැඳී සිටියි.
- සේවාස්ථ පුහුණු පාඨමාලා යටතේ අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත මෝස්තර පුහුණු වැඩමුළු 17ක් පවත්වා ඇත. එමඟින් ක්ෂේත්‍රයේ නිරත ශිල්පීන් සහ උපදේශකවරුන් 280 ක් පුහුණු කර ඇත.

- අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ පුහුණු වැඩ සටහන් 02 ක් පවත්වා පුහුණුලාභීන් 14 ක් පුහුණු කර ඇත.
- ග්‍රාමීය ප්‍රදේශ වල අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නියැලෙන්නන් ඉලක්ක කර ගනිමින් පුහුණු පාඨමාලා 22 ක් පවත්වා පුහුණුලාභීන් 395 ක් පුහුණු කරඇත.
- ග්‍රාමීය අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘති 6ක් මගින් ප්‍රතිලාභීන් 65ක් පුහුණුව ලබයි. මාස 6ක පූර්ණකාලීන පාඨමාලාවක් ඇතුළත් වන මෙම ව්‍යාපෘති වැඩසටහන්, ගල්ගමුව, මහව, මල්ලවපිටිය, හතරලියද්ද, අත්තනගල්ල, මහර යන ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වේ.
- කටුබැද්ද පර්යේෂණ, මෝස්තර, පුහුණු හා සේවා ආයතනයේ අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නව ව්‍යවසායකයින් ලෙස පුහුණුලාභීන් 20 දෙනෙකු සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේ.
- අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත ශිල්පීන් හට RPL ක්‍රමවේදය ඔස්සේ ජාතික වෘත්තිය මට්ටමේ කුසලතා (NVQ) සහතික පිරිනැමීම සඳහා පූර්ව ඇගයීම් වැඩසටහන් 04ක් දකුණු පළාත, මධ්‍යම හා ඌව පළාත තුල පේෂකර්ම උපදේශක නිළධරයන් සහ ක්ෂේත්‍රයේ නියැලෙන්නන් සඳහා පවත්වන ලදි. ප්‍රතිලාභීන් 496 දෙනෙකු සඳහා ඇගයීම් පරීක්ෂණ පවත්වා ඇත.
- ජාතික අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනයට සමගාමීව පවත්වනු ලබන පළාත් අත්‍යන්ත්‍ර රෙදිපිළි තරඟය පවත්වා අවසන් කර ඇත. ජාතික තරඟයේ විනිශ්චය කටයුතුද අවසන් කර ඇත. ජාතික අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ප්‍රදර්ශනය, සම්මාන ප්‍රදානෝත්සවය සහ අලෙවි සල්පිල 2024 දෙසැම්බර් මාසයේදී 6,7,8 යන දින වලදී පවත්වන ලදි.
- නව පර්යේෂණ යටතේ විවිධ අමුද්‍රව්‍ය යොදා ගනිමින් නිෂ්පාදන සාම්පල් සකස් කර ඇත.
- බෝයගනේ පේෂකර්මාන්ත පුහුණු ආයතනයේ වහලේ අළුත්වැඩියා කටයුතු නිමකර ඇත.කටුබැද්ද පේෂ කර්මාන්ත පුහුණු ආයතනයේ වහලය හා සිවිළිම අළුත්වැඩියාව කොටසක් නිම කර ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

2024 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මඟින් වෙන් කරන ලද පුනරාවර්තන වියදම් රු.මි. 329.5 ක් වන අතර 2024 දෙසැම්බර් 31 දිනට වියදම රු.මි. 267.9 කි. එය සමස්ත වියදමේ ප්‍රතිශතයක් ලෙස 81% කි. තවද, වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම් රු.මි. 78.9 වන අතර 2024 දෙසැම්බර් 31 දිනට වියදම රු.මි. 44.5 කි. එය සමස්ත ප්‍රාග්ධන වියදමේ ප්‍රතිශතයක් ලෙස 56.5%කි.

## 14.3 අනාගත සැලැසුම් - 2025

**අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති**

01. ග්‍රාමීය මට්ටමෙන් අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘති 15 ක් ආරම්භ කිරීම.
02. උක්ත ව්‍යාපෘති මඟින් පේෂ කර්මාන්තයේ සක්‍රීයව නියැලී සිටින ශිල්පීන් 150 ක් බිහිකිරීම.
03. අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තිය සුදුසුකම් ලබා ගැනීම සඳහා ශිල්පීන් යොමු කිරීමේ වැඩසටහන්.

**අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන්.**

01. පේෂකර්මාන්ත පුහුණු ආයතන මඟින් පේෂකර්මාන්තයේ සක්‍රීයව නියැලී සිටින ශිල්පීන් 100 ක් පුහුණු කිරීම.

02. නව පාඨමාලා හඳුන්වා දීම.

03. පේෂකර්මාන්ත පුහුණු ආයතනවල විෂය මාලා ජාතික වෘත්තීය සුදුසුකම් තත්වයන්ට සමපාත වන ලෙස සංවර්ධනය කිරීම.

04. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

05. සේවාස්ථ පුහුණු වැඩසටහන් හා මෝස්තර පාඨමාලා 25 ක් පැවැත්වීම මඟින් පේෂකාර්මිකයින් 400 ක් පුහුණු කිරීම.

06. නිෂ්පාදන විවිධාංගීකරණ පාඨමාලා හඳුන්වාදීම

07. අත්‍යන්ත්‍ර නිෂ්පාදන සඳහා අගය එකතුකල නිෂ්පාදන පාඨමාලා හඳුන්වා දීම.

08. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නව ව්‍යවසායකයින් ලෙස 20 දෙනෙකු සංවර්ධනය කිරීම.

09. පේෂ කර්මාන්ත පුහුණු ආයතන සහ මෝස්තර පුහුණු ආයතනවල සිසුන් සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

10. RPL/CBT යටතේ ප්‍රතිලාභීන් 100 දෙනෙකු සඳහා NVQ 3/4 ලබාදීම.

11. අත්‍යන්ත්‍ර මෝස්තර සඳහා පාදක වන මෝස්තර ග්‍රන්ථය සම්පාදනය කිරීම.

12. ග්‍රාමීය ප්‍රදේශවල අත්‍යන්ත්‍ර කර්මාන්තයේ නියුතුවූවන් සඳහා මෝස්තර වැඩමුළු පැවැත්වීම.

13. පළාත් රාජ්‍ය, සමුපකාර හා පෞද්ගලික අංශයේ පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු උපදේශකවරුන් හා නිෂ්පාදකයන් සඳහා අවශ්‍ය වන කෙටිකාලීන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම.

**පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්**

01. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත උපකරණ සහ උපාංග වැඩිදියුණු කිරීම.
02. ස්වාභාවික වර්ණ උපයෝගි කරගත් අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හඳුන්වාදීම සඳහා වැඩසටහන් පුළුල් කිරීම.
03. විවිධ අමුද්‍රව්‍ය භාවිතයෙන් වන රෙදි නිෂ්පාදන පාඨමාලා දියත්කිරීම.

**අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ප්‍රවර්ධන වැඩසටහන්.**

01. ජාතික අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ප්‍රදර්ශනය සහ සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම.

02. අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අලෙවි සල්පිල් දෙකක් වර්ෂය තුළ පැවැත්වීම.

**පේෂකර්මාන්ත ගොඩනැගිලි සංවර්ධනය**

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් පුහුණු මධ්‍යස්ථානවල හඳුනාගත් අළුත්වැඩියාවන් සිදු කිරීම.

01. කිරම, බෝයගනේ, බණ්ඩාරවෙල, කටුබැද්ද යන පේෂකර්මාන්ත පුහුණු ආයතන වල අළුත්වැඩියා කටයුතු.

# 15

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)

## 15.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව පුරා සිටින සිය කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවන් ලබා දීමට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සහතික වේ. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1969 අංක 36 දරණ කර්මාන්ත සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලදී. මෙම පනත ප්‍රකාරව කාර්මික සංවර්ධන මණ්ඩලයට ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී තිබේ.

### මණ්ඩලයේ අරමුණු

1969 අංක 36 දරණ කර්මාන්ත සංවර්ධන පනත මගින් නියම කර ඇති පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම.
- මෙරට ආර්ථිකයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්ට අයත් සියලුම කාර්මික ව්‍යාපාරයන්හි නිසි සම්බන්ධීකරණය සහ එකිනෙකට සබැඳි වර්ධනය සඳහා සහායවීම.

- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම, කර්මාන්තවලදී භාවිතා කරනු ලබන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා යෝග්‍ය තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම සහ නිෂ්පාදන අපද්‍රව්‍ය වඩා යහපත් ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රියාවලින් සහ ක්‍රමවේදයන් සකස් කිරීම යන අරමුණු ඇතිව කර්මාන්ත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය වන හෝ හිතකර වන පරිදි අන්තර්ජාතික වෙළඳාම සහ කලාපීය සහයෝගීතාවය යන ක්ෂේත්‍රවලදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහාය දීම.
- ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ, සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් සපයා දීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම කාර්මික ව්‍යාපාරයක් හෝ කාර්මික ආයතනකට හෝ ඒ අදාළව අවශ්‍ය කරන සෑම ආකාරයකම පහසුකම් සහ සේවා සැපයීම.

### ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් හා කාර්යයන්

- කළමනාකරණ සහ තාක්ෂණික පුහුණු වැඩසටහන් සහ උපදේශන සේවා සැපයීම.
- දේශීය කර්මාන්ත සඳහා ඉංජිනේරු සේවා, වැඩමුළු සහ වාත්තු පහසුකම් සැපයීම.
- ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා සේවා සැපයීම සහ දැනට ආරම්භකර ඇති ව්‍යාපාර සඳහා ප්‍රතිපත්ති සම්පාදනයට සහය වීම.
- කාර්මිකයන්, සේවාදායකයින් සහ කාර්යය මණ්ඩලය සඳහා කාර්මික තොරතුරු බෙදාහැරීම.
- දේශීය නිෂ්පාදනයෙන් හටගන්නා අබලි ලෝහ ද්‍රව්‍ය අපනයනය සඳහා නිර්දේශ ලබා දීම.
- දේශීය නිෂ්පාදනය වර්ධනය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය සහ සංයෝග මෙන්ම කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම සැපයීම.
- කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශන සේවා සැපයීම.
- දේශීය වාත්තු කර්මාන්තය දියුණු කිරීමට පහසුකම් සැලසීම සහ අගය එකතු කළ ලෝහ නිෂ්පාදන අපනයනය සඳහා නිර්දේශ සහ සම්බන්ධීකරණය සැපයීම.

## 15.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### වාර්ෂික පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය

මෙරට සම්භාණ්ඩ ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයට දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ලබාදීමේ අරමුණින් පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය දාහතර වැනි වරටත් මෙවර සංවිධානය කරනු ලැබීය. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළුව කර්මාන්ත අමාත්‍යාංශය සහ අනෙකුත් පාර්ශවකරුවන් එක්ව මෙම ප්‍රදර්ශනය සංවිධානය කරනු ලැබීය.

### "Industry EXPO 2024" ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනය

දේශීය කර්මාන්තකරුවන් සවිබල ගැන්වීමේ අරමුණින් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ආයතන, අනෙකුත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ සහයෝගයෙන් සංවිධානය කරන ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනය "Industry EXPO 2024" ජුනි 19 සිට 23 දක්වා BMICH හිදී පවත්වන ලදී.

"කර්මාන්ත 2024" ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය




## Connect Sri Lanka රූපවාහිනී වැඩසටහන

විදේශ කටයුතු අමාත්‍යාංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ සහයෝගීතා වැඩසටහනකි. විභව නිෂ්පාදන සමඟ විදේශීය වෙළෙඳපොළ අවස්ථා හඳුන්වාදීම මෙහි අරමුණයි.

## "පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව" පදක්කම් ප්‍රධාන උත්සවය

කර්මාන්ත අමාත්‍යාංශය , අධ්‍යාපන අමාත්‍යාංශය සහ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය එක්ව දීපව්‍යාප්තව කරන ලද "පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව" වැඩසටහනෙහි පාසල් කර්මාන්ත ව්‍යවසායක පදක්කම් ප්‍රදානය 2024.03.22 දින නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්විණි.

## ශ්‍රී ලංකා කර්මාන්ත වෘත්තිකයන්ගේ ආයතනය (SLIIP)

ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය දියුණු කිරීමේ අරමුණින් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) විසින් ශ්‍රී ලංකා කර්මාන්ත වෘත්තිකයන්ගේ ආයතනය (SLIIP) ආරම්භ කරන ලදී. මෙම ආයතනය කර්මාන්තය නඟා සිටුවීමට අවශ්‍ය දැනුම, පළපුරුද්ද සහ කුසලතා වැඩි දියුණු කරමින් ශ්‍රී ලංකාවේ වෘත්තියභාවය ඉහළ නැංවීමේ අරමුණින් කර්මාන්ත වෘත්තිකයන් සඳහා පිහිටුවා ඇති වෘත්තීය ආයතනයකි.

ශ්‍රී ලංකා කර්මාන්ත වෘත්තිකයන්ගේ ආයතනය (SLIIP) ආරම්භ කිරීම



## Industry Ceylon සඟරාව

Industry Ceylon සඟරාව යනු කාර්තුමය වශයෙන් ප්‍රකාශිත සඟරාවකි. මෙම සඟරාවේ අරමුණ පාර්ශවකරුවන්ට වටිනා දැණුමක් සහ කර්මාන්ත යාවත්කාලීන කිරීම් පිලිබඳව දැක්මක් ලබා දීමයි. එය ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය, නවෝත්පාදන සහ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමේ වේදිකාවක් ලෙස ක්‍රියාත්මක වෙනු ඇත.

## SEDA Start-up Scale-up - තිරසර ව්‍යවසායකත්ව සංවර්ධන ප්‍රවේශය ක්‍රියාවට නැංවීම

ශ්‍රී ලංකාව තුළ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ව්‍යවසායකයෙකු විසින් ඉටු කරගත යුතු සැලසුම් ක්‍රමවේදයට ප්‍රායෝගික ප්‍රවේශයක් සහ පවතින කර්මාන්ත සඳහා උපාය මාර්ගීක ප්‍රවේශයක් තුළින් ව්‍යාපාරය පුලුල් කර ගැනීමේ සැලසුම් ක්‍රමවේදය මෙම පුහුණු මොඩියුල දෙක හරහා සුලු සහ මධ්‍ය පරිමාණ කර්මාන්තවලට ලබා දෙනු ලැබේ.

මේ යටතේ කර්මාන්තකරුවන් 200ක් 2024 වර්ෂයේදී පුහුණු කරනු ලැබූ අතර අභ්‍යන්තර හා බාහිර වශයෙන් පුහුණුකරුවන් 100ක් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන (TOT) මගින් ධාරිතා සංවර්ධනය කරන ලදී.

### භෞතික ප්‍රගතිය


| ක්‍රියාකාරකම | 2024/12/31 දිනට ප්‍රගතිය |
|---|---|
| තාක්ෂණ වැඩිදියුණුව සහ නව තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය | 3,182 |
| කළමණාකරණ කුසලතා වැඩි දියුණු කිරීම | 1,665 |
| කර්මාන්ත වල ණය සුදුසුකම් සහතිකකරණය | 397 |
| දේශීය නිෂ්පාදිත භාණ්ඩ සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ ප්‍රවේශය පුලුල් කිරීම | දේශීය 674<br>විදේශීය 65 |
| කර්මාන්ත ගොඩනැගීමට සහ වර්ධනයට හිතකර නීතිමය සහ නියාමන පරිසරයක් ඇති කිරීම | 423 |
| ව්‍යාපාර වල කාර්යක්ෂමතාව සඳහා යටිතල පහසුකම් සැපයීම | 41 |
| වගවන ව්‍යවසායකයින් ප්‍රවර්ධනය | 106 |

*මූලාශ්‍රය : IDB ප්‍රගති වාර්තාව – 2024*

### පුහුණු වැඩසටහන්

| විස්තර | 2024/12/31 දිනට ප්‍රගතිය | |
|---|---|---|
| | වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
| තාක්ෂණික පුහුණු වැඩසටහන් | 690 | 11,509 |
| කළමනාකරණ ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීමේ වැඩසටහන් (අලෙවිකරණය, මූල්‍යකරණය, මානව සම්පත් කළමණාකරණය, ධාරිතාවය ගොඩනැගීම සහ අදාළ තාක්ෂණික නොවන පුහුණු) | 133 | 3,284 |
| එකතුව | 823 | 14,793 |

*මූලාශ්‍රය : IDB ප්‍රගති වාර්තාව – 2024*




*මූලාශ්‍රය : IDB ප්‍රගති වාර්තාව – 2024*

## මූල්‍ය ප්‍රගතිය

- පුනරාවර්තන සහ අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා **2024** වර්ෂයේ වෙන් කර ඇති මුළු මුදල පිළිවෙලින් රු.මි. **450** සහ රු.මි. **50,** වේ. අදාල වෙන්කිරීම තුලින් **2024** දෙසැම්බර් 31 වන විට පුනරාවර්තන වියදම් සඳහා **100%**ක් සහ අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා **100%**ක් වශයෙනුත් දරා ඇත.

- සංවර්ධන කටයුතු සඳහා වර්ෂයේ ප්‍රතිපාදන රු.මි. **11.3** ක් වන අතර මේ වන විට එමගින් 100% කට ආසන්න මුදලක් වැය කර ඇත.

- රු.මි. **88.7** ක මුදලක් **2024** වසර සඳහා ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා වෙන් කර ඇති අතර, ඉන් **100%** ප්‍රාග්ධන අයවැය හරහා වියදම් කර ඇත.

- දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා මුළු ප්‍රතිපාදන රු.මි.**100**ක් වන අතර, **2024** දෙසැම්බර් **31** වන විට ව්‍යාපෘති සඳහා 100%ක් වියදම් කර ඇති අතර ඒ සඳහා ගෙවීමට ඇති මුදල රු.මි. 41ක් පමණ වේ.

## 15.3 අනාගත සැලසුම් - 2025

### 1) නව ව්‍යාපෘති

- Ceylon Plaza නමින් අලෙවි මධ්‍යස්ථානයක් උණවටුන ප්‍රදේශයේ පිහිටුවීම සහ Ceylon Plaza නමින් online අලෙවි පහසුකම් ලබාදීම.
- මෝටර් රථ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම.

### 2) අඛණ්ඩව ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පීඩන යන්ත්‍ර සහ බොයිලේරු සංවර්ධනය සඳහා පරීක්ෂණ, සංවර්ධන සහ පුහුණු පහසුකම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- ප්‍රධාන සහ කුඩා කාර්මික ජනපද වැඩිදියුණු කිරීම.
- ආහාර පර්යේෂණ රසායනාගාරය පිළිගත් රසායනාගාරයක් බවට පත් කිරීම.
- වාලච්චේන සම් ආශ්‍රිත කර්මාන්ත සඳහා කාර්මික උද්‍යානයක් පිහිටුවීම.
- ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම.

## 2024 දෙසැම්බර් 31 වන දිනට කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි කාර්මික ජනපද වල සාරාංශය

| අංකය | කාර්මික ජනපදය | දිස්ත්‍රික්කය | මුළු බිම් කොටස් ගණන | යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය (රු. මි.) | මෙහෙයුම් කර්මාන්ත | පුද්ගලික ආයෝජන (රු. මි.) | වාර්ෂික පිරිවැටුම (රු. මි.) | රැකියා ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ඒකල | ගම්පහ | 92 | 118.7 | 60 | 36669.5 | 25779 | 2305 |
| 2 | පල්ලෙකැලේ | මහනුවර | 111 | 108.33 | 55 | 14520.53 | 16500 | 1224 |
| 3 | පානළුව | කොළඹ | 38 | 69.91 | 23 | 1091.65 | 1965.4 | 377 |
| 4 | හොරණ | කළුතර | 66 | 17.71 | 14 | 998.51 | 4295.8 | 1469 |
| 5 | වවුලුගල | කළුතර | 14 | 19.9 | 13 | 261.1 | 459 | 195 |
| 6 | පුස්සැල්ල | රත්නපුරය | 29 | 15.21 | 8 | 198 | 179 | 59 |
| 7 | ගලිගමුව | කෑගල්ල | 12 | 15.33 | 8 | 214 | 250 | 84 |
| 8 | බුත්තල | මොනරාගල | 22 | 20.1 | 10 | 295 | 1325 | 450 |
| 9 | කොටගල | නුවරඑළිය | 60 | 9.79 | 8 | 287.66 | 593.69 | 152 |
| 10 | කළුදේවල | මාතලේ | 43 | 53.8 | 13 | 583 | 542 | 215 |
| 11 | මිහින්තලේ | අනුරාධපුර | 42 | 5.04 | 7 | 33 | 43.54 | 20 |
| 12 | නාගම්පහ | අනුරාධපුර | 44 | 24 | 1 | 10 | 4 | 3 |
| 13 | පන්නල - පළමු අදියර | කුරුණෑගල | 34 | 84.75 | 17 | 801 | 1314 | 212 |
| | පන්නල - 2 වන අදියර | | 11 | | 1 | 333 | 20 | 10 |
| 14 | ලුණුවිල | පුත්තලම | 17 | 4.9 | 12 | 83.9 | 175 | 220 |
| 15 | පුන්තෝඩම් | වවුනියාව | 64 | 30.57 | 12 | 127.5 | 142.66 | 114 |
| 16 | අච්චුවේලි - 1 වන අදියර | යාපනය | 23 | 192 | 6 | 417.4 | 275 | 238 |
| | අච්චුවේලි - 2 වන අදියර | | 25 | 41.57 | 2 | 120 | 96 | 44 |
| සමස්ත එකතුව | | | **747** | **831.61** | **270** | **57044.75** | **53959.09** | **7391** |
| 17 | ඇල්පිටිය නව කාර්මික ජනපදය - අදියර B | ගාල්ල | 15 | 39.53 | 11(Allocated) | 0 | 0 | 0 |
| | ඇල්පිටිය නව කාර්මික ජනපදය - අදියර A & C | ගාල්ල | 43 | 19.53 | 09(Allocated) | 0 | 0 | 0 |
| එකතුව | | | 58 | 59.06 | 20 | 0 | 0 | 0 |

*මූලාශ්‍රය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය*

# 16

# ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)

## 16.1 හැඳින්වීම

මෙරට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) අංශයට විශේෂ අවධානයක් යොමු කරමින්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) ශ්‍රී ලංකාව තුළ ව්‍යවසාය සංවර්ධනය සඳහා ප්‍රවර්ධනය, දිරිගැන්වීම සහ පහසුකම් සැලසීම සිදු කරයි. එමගින් ව්‍යවසායකයින්ට සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ට ව්‍යවසායකත්ව සංවර්ධනය, මූල්‍ය පහසුකම් සැපයීම, අලෙවිකරණ සම්බන්ධතා, පර්යේෂණ සහ සංවර්ධන සහ යටිතල පහසුකම් සංවර්ධනය වැනි සේවාවන් සපයනු ලබයි. තව ද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ව්‍යවසායකයින්ට ව්‍යවසායකත්වය, අලෙවිකරණය, ව්‍යාපාර සැලසුම්කරණය, ගිණුම්කරණය, වාර්තා තබා ගැනීම සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම යනාදි ධාරිතා සංවර්ධන පුහුණු අවස්ථාද ලබාදෙයි.

**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරී පනතට අනුකූල වන්නා වූ අරමුණු :**

- ශ්‍රී ලංකාව තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ උන්නතිය, ව්‍යාප්තිය සහ සංවර්ධනය උත්තේජනය කිරීම.
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරී පනතේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා විදේශීය වෙළඳපොළ ජයගැනීමේ හැකියාව ඇති දේශීය ව්‍යවසායයන් ජාත්‍යන්තරකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම උත්තේජනය කිරීම සහ දිරිගැන්වීම.

- ප්‍රතිපත්ති, සැලසුම්, උසස් කිරීම් දිරිගැන්වීම නිසි ලෙස සැලසුම් කිරීම සහ ඵලදායී ලෙස කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ අළෙවිය සහ සංවර්ධනය සඳහා සහාය වීම සහ ප්‍රවර්ධනය කිරීම.
- ව්‍යවසාය සංවර්ධනයේ අනිවාර්ය අංගයක් ලෙස තාක්ෂණික කුසලතාවයෙන් යුත් මානව ප්‍රාග්ධන සම්පතක් වශයෙන් පුද්ගලයින් සවිබල ගැන්වීම.
- සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සඳහා ප්‍රවේශයට ව්‍යවසායකයින් වෙත පහසුකම් සැළසීම.
- නිෂ්පාදන සංවර්ධනය, තාක්ෂණික ප්‍රවර්ධනය සහ වාණිජමය බලපත්‍ර සම්බන්ධයෙන් වන පර්යේෂණ ප්‍රවර්ධනය හා සංවර්ධනය උදෙසා තාක්ෂණික සංවර්ධන අරමුදලක් ස්ථාපිත කිරීම.
- ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට පහසුකම් සැළසීම.

## 16.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### 1. "උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය" වැඩසටහන ("ව්‍යාපාරයට බුද්ධිය")

උපාධිධාරීන් ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ කරගැනීමේ අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විශ්ව විද්‍යාල හා එක්ව ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනක් ආරම්භ කරන ලද අතර එය "උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය" වශයෙන් නම් කරන ලදි. උපාධිධාරීන් ව්‍යාපාර ලෝකයට අවතීර්ණ වීම දිරිගැන්වීම හා ඔවුන් සාර්ථක ව්‍යාපාරිකයින් වශයෙන් ඉදිරියට ගෙන ඒම මෙම වැඩසටහනේ අරමුණයි. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2024 වර්ෂයේදී කොළඹ, යාපනය, කැලණිය, ඌව වෙල්ලස්ස, මොරටුව, රුහුණ, පේරාදෙණිය, ජයවර්ධනපුර, රජරට, සබරගමුව, වයඹ සහ සෞන්දර්ය විශ්වවිද්‍යාලය යන විශ්ව විද්‍යාලවල විද්‍යාර්ථයින් 367 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබාදී ඇති අතර 31 දෙනකු ව්‍යවසායකයින් බවට සංවර්ධනය කරන ලදී (14 දෙනකු සඳහා මූල්‍ය පහසුකම් ලබා දෙන ලදී).

### 2. ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට විශිෂ්ට දායකත්වයක් සපයා ඇති ව්‍යවසායකයින්ට පිලිගැනීමක් ලබාදීම, ඇගයීම හා දිරිමත් කිරීමේ අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පළාත් ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව පවත්වනු ලැබේ. 2024 වර්ෂය තුළ සම්මාන ප්‍රදානෝත්සව හතරක් පැවැත්වීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම් කල අතර ඒ අනුව බස්නාහිර, උතුරු මැද, වයඹ සහ සබරගමුව යන පළාත්වල සම්මාන උළෙලයන් පවත්වන ලදී (සම්මාන 145 ක් ප්‍රදානය කිරීම සිදු විය).

### ව්‍යාපාර පර්ෂද/ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් (MSMEs) ශ්‍රී ලංකා ආර්ථික වර්ධනයේ හා විවිධාංගීකරණයේ පෙර ගමන්කරුවන් වශයෙන් සැලකිය හැක. කෙසේ වුව ද, ශ්‍රී ලංකාවේ. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හුදෙකලා තත්වයකට පත්ව ඇති අතර අගය දාමය තුළ ස්වාධීනව කටයුතු කිරීමට ඔවුන්ට සිදුව ඇත. තරඟකාරීත්ව පීඩනයට අඛණ්ඩව මුහුණ දීම සඳහා සිය ධාරිතාව වර්ධනය කරගැනීම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට දුෂ්කර කාර්යයකි. මෙම ගැටළුවට පිලියමක් වශයෙන්, පර්ෂද ප්‍රවේශය මත පදනම්ව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය කිරීම ක්‍රියාවට නංවා ඇති අතර, මෙම පර්ෂද පදනම් ප්‍රවේශය තුළ ව්‍යවසායකයින්ට විවිධ වාසි සලසා ඇත. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පර්ෂදවලට පුහුණු අවස්ථා ලබාදීම, තාක්ෂණික නවෝත්පාදන සඳහා සහාය, මූල්‍ය සඳහා පහසු ප්‍රවේශය මෙන්ම ආයතනික සහාය ලබාගැනීමේ අවස්ථා සලසා තිබීම ඒ අතරින් කිහිපයකි. තව ද, එක් එක් ප්‍රදේශයන්හි පවත්වාගෙන යනු ලබන තනි පුද්ගල ව්‍යාපාරයන්ට ව්‍යාපාර සංවර්ධන සේවා (BDS) සැපයීමේදී දැරීමට සිදුවන වියදමට වඩා අඩු වියදමකින් මෙම ව්‍යාපාර

පර්ෂදයන්ට ව්‍යාපාර සංවර්ධන සේවා සැපයීමට රාජ්‍ය ආයතනවලට හා අනෙකුත් සහයෝගීතා ආයතනයන්ට අවස්ථාව සැලසී ඇත.

2024 වර්ෂයේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය මගින් ව්‍යාපාර පර්ෂද 67 ක් ගොඩනගන ලදී. එමගින් ව්‍යවසායන් 555 ක් සංවර්ධනය කරන ලදී.

## 3. “මේඩ් ඉන් ශ්‍රී ලංකා” වෙළඳ ප්‍රදර්ශන

ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ඉහල අගය එකතු කිරීමකින් යුත් අව්‍යාජ ශ්‍රී ලාංකේය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ හා සංවර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් “මේඩ් ඉන් ශ්‍රී ලංකා” ලාංඡනය එළිදක්වන ලදි. ඊට සමගාමීව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ශ්‍රී ලාංකීය නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළට හඳුන්වාදීම සඳහා මේඩ් ඉන් ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම සැළසුම් කර ඇත. 2024 වර්ෂය තුළ දී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් කෑගල්ල, කැලණිය, බදුල්ල, ත්‍රිකුණාමලය, මඩකලපුව, හම්බන්තොට සහ කළුතර යන දිස්ත්‍රික්කයන්හි වෙළඳ ප්‍රදර්ශන පවත්තන ලදී (වෙළඳ කුටි 274ක් ව්‍යවසායකයින් 410 ක් සඳහා). ඊට අමතරව ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් ප්‍රාදේශීය මට්ටමින් සුළු පරිමාණ ව්‍යවසායක වෙළඳ ප්‍රදර්ශන 571 ක් පවත්වා ඇති අතර ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායකයින් 5196 ක් සඳහා වෙළඳ කුටි 3378ක් ලබා දී ඇත.

## 4. “මේඩ් ඉන් ශ්‍රී ලංකා” ලාංඡනය පිරිනැමීම සහ ප්‍රවර්ධනය

දේශීය සම්පත් යොදා ගනිමින් දේශීයව සිදුකරන ව්‍යාපාර කෙතරම් තිබුණද ආනයනික නිෂ්පාදන හා සසඳන විට දේශීය නිෂ්පාදන සඳහා නිසි පිළිගැනීමක් නොතිබුණු බැවින් ආනයනය කරන ලද නිෂ්පාදන සඳහා පාරිභෝගිකයින් ප්‍රමුඛත්වය ලබා දී තිබිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය නිෂ්පාදනයන්ට වඩා ආනයනික නිෂ්පාදන ගුණාත්මකභාවයෙන් ඉහල බවට පිලිගැනීමක් පාරිභෝගිකයින් තුළ ඇති වූ අතර, දේශීය නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ක්‍රමයෙන් පහත වැටිණි. එබැවින්, දේශීය නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය නිරූපණය කිරීම උදෙසා ලාංඡනයක් ප්‍රවර්ධනය කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පියවර ගන්නා ලදි. වාර්ෂිකව අවම වශයෙන් ව්‍යවසායකයින් 50 දෙනෙකු සඳහා ලාංඡනය පිරිනැමීම මෙහි ඉලක්කය වන අතර, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් 2024 වර්ෂය සඳහා ව්‍යවසායකයින් 31 දෙනෙකුට ලාංඡනය පිරිනමා ඇත ( නිෂ්පාදන 105 ක් සඳහා).

## 5. ව්‍යවසායකත්ව සංසද ක්‍රියාත්මක කිරීම

ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසද තුළ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය සේවා සපයන ආයතනයන්හි නියෝජිතයින් එක්ව කටයුතු කරන අතර, දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසදයේ සභාපතිත්වය දිස්ත්‍රික් ලේකම් විසින් දරනු ලබයි. තව ද, ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසදයේ සභාපතිත්වය ප්‍රාදේශීය ලේකම් විසින් දරනු ලබන අතර, ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රධාන ව්‍යවසායකයින් සහ සියලු ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවර්ධන සේවා සපයනු ලබන්නන් ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසදය නියෝජනය කරයි. එලෙසම දිස්ත්‍රික් මට්ටමේ නියෝජිතයින් දිස්ත්‍රික් සංසදය නියෝජනය කරනු ලබයි. තව ද, ජාතික මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් උපාය මාර්ගිකව ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම උදෙසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව උපදේශන සභාව ස්ථාපිත කිරීමට කටයුතු සිදු කරමින් පවතී. එමෙන්ම, අදාල අමාත්‍යාංශ නියෝජනයන් සහ රාජ්‍ය ආයතන නියෝජිතයන් ඇතුළු පෞද්ගලික අංශය නියෝජනය කරන්නාවූ කිහිපදෙනෙකු ද ඇතුලත්ව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පහසුකරණ සංසදයක් ස්ථාපිත කිරීමට යෝජනා ඉදිරිපත් කොට ඇත.

**6. ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන**

ප්‍රාදේශීය ව්‍යවසායකයින්ට ව්‍යවසායකත්වය, අලෙවිකරණය, තාක්ෂණය හා මූල්‍ය කළමනාකරණය යනාදිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිවීමේ ව්‍යාපාරික ගැටලු පවතින බව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇත. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමින් කටයුතු කරන අතර, ඔවුන් එවැනි ගැටලුවට මුහුන පාන ව්‍යවසායකයින් හඳුනාගනිමින් ඔවුන්ගේ ගැටලුවලට අදාළ විසඳුම් සෙවීමට කටයුතු කරනු ලබයි. 2024 වර්ෂය තුළ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යවසායකයින් 48677 දෙනෙකු පුහුණු කර ඇති අතර, අවශ්‍යතා අනුව අනෙකුත් සහයෝගයන් ලබා දී ඇත (මේ තුලින් නව ව්‍යාපාර 1304 ක් ගොඩනගන ලද අතර ව්‍යාපාර 1737ක් පුළුල් කරන ලදී).

**7. වෘත්තීය පුහුණු ලාභීන් සඳහා වන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන.**

තරුණ ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධන වැඩසටහන, වෘත්තීය පුහුණු ආයතන (Univotec, VTA, German TEC, Korean TEC, NAITA, etc) සමඟ එක්ව, ආර්ථික වර්ධනයට පමණක් නොව සමාජයට උත්ප්‍රේරකයක් ලෙස ද ක්‍රියා කරමින් ද්විත්ව අරමුණු මුලපිරීමක් ලෙස ක්‍රියා කරයි. වෘත්තීය පුහුණුලාභීන් රැකියා සොයන්නන් වෙනුවට ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය කිරීම වැඩසටහනේ අරමුණයි. 2024 වර්ෂයේ වෘත්තීය පුහුණු ලාභීන් 144 දෙනකු සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබා දෙනලදී ( Univotec - රත්මලාන, විශ්ව විද්‍යාල කොලේජ් - මාතර සහ තාක්ෂණ විද්‍යාලය - රත්නපුර). ඊට අමතරව ප්‍රාදේශීය නිලධාරීන් හරහා වෘත්තීය පුහුණුලාභීන් 1693 දෙනකු පුහුණුකර ඇත.

**මූල්‍ය ප්‍රගතිය - 2024**

- මුළු ප්‍රතිපාදන: රු. මි. 40.0
- දෙසැම්බර් දක්වා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්: රු. මි. 34.91.
- 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය : රු. මි. 33.42.

## 16.3 අනාගත සැලසුම් - 2025

**නව වැඩසටහන්:**

1. ශ්‍රී ලාංකික ගොවීන් අතර තිරසාර නවීන කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම
2. ග්‍රාමීය ව්‍යවසායකයින් සඳහා අන්තර්ජාල අලෙවිකරණය.
3. ජාත්‍යන්තර වෙළඳපල සබඳතා පිහිටුවීමට පහසුකම් සැලසීම.
4. සේවක ධාරිතා සංවර්ධන වැඩසටහන
5. කුසලතා වැඩිදියුණු කිරීම සහ තරුණයින් සවිබල ගැන්වීම: රූපලාවන්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන
6. දේශීය හා විදේශීය වෙළඳපල අවස්ථා නිර්මාණය කිරීම සඳහා ව්‍යවසායකයින් 500 දෙනෙකුගෙන් යුත් සන්නාම සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රියාත්මක වැඩසටහන්:**

1. උපාධිධාරී ව්‍යවසායක උදානය" වැඩසටහන
2. වෘත්තීය පුහුණු ආයතන සමඟ තරුණ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන
3. ව්‍යාපාර පර්ෂද සංවර්ධන වැඩසටහන
4. MSMEs සඳහා "මේඩ් ඉන් ශ්‍රී ලංකා " වෙළඳ ප්‍රදර්ශන
5. ප්‍රාදේශීය ව්‍යවසායක සම්මාන උළෙල
6. ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන
7. "මේඩ් ඉන් ශ්‍රී ලංකා" ලාංඡන පිරිනැමීම
8. දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ව්‍යවසායක සංසදය
9. පෙර වැඩුම මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම සහ පුනර්ජීවනය කිරීම.

# 17

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)

## 17.1 හැඳින්වීම

### කහටගහ මිනිරන් පතල

කහටගහ මිනිරන් පතල වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ මදුරාගොඩ පිහිටා ඇති අතර එය කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් මඟින් කළමනාකරණය කරනු ලැබේ. එය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිහිටුවන ලද පොදු සීමිත සමාගමක් වන අතර එහි හිමිකාරිත්වය සම්පූර්ණයෙන්ම රජය සතුවේ.

කහටගහ පතල සතු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් අක්කර 102 කි.

### කහටගහ අනන්‍ය වූ නිෂ්පාදන

ඉහල කාබන් ප්‍රතිශතයක් සහිත ස්ඵටිකරූපී ඉල්ලම් මිනිරන් වාණිජ මට්ටමෙන් සපයන ලෝකයේ එකම රට ශ්‍රී ලංකාව වන අතර විශේෂයෙන්ම කහටගහ පතල සම්පූර්ණ ස්ඵටික වශයෙන් පවතින 99%කට වඩා වැඩි කාබන් ප්‍රතිශතයක් සහිත ඉතා පිරිසිදු ස්වභාවික ඉල්ලම් මිනිරන් සැපයීමට සමත්ය. එම මිනිරන් කූරු, කැට, පොකුරු සහ පතුරු ආදී වශයෙන් කැණීම් කරනු ලැබේ. ඉහල කාබන් ප්‍රතිශයක් සහ අඩු හෂ්ම ප්‍රතිශතයක් ඇති ඉල්ලම් මිනිරන් සඳහා ලෝක වෙළඳපොලේ සුවිශේෂී පිළිගැනීමක් පවතී.

### මිනිරන් අපනයනය


කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම යනු අපනයන ඉලක්ක කරගත් සමාගමක් වන අතර වර්ෂ 2024/25 දී එහි ප්‍රධාන අපනයන රට වූයේ ජපානයයි.

### අරමුණු

"මිනිරන් කැණීම, ශුද්ධ කිරීම, නිර්යාත කිරීම, මිනිරන් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු මිනිරන් කර්මාන්තය වැඩි දියුණු කිරීම හා එහි උපරිම අගය වැඩි කිරීම."

## 17.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

**නිෂ්පාදනය 2008-2024**




*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

2024/25, මූල්‍ය වර්ෂය අප්‍රේල් 1 සිට 2024 දෙසැම්බර් 31 දක්වා මුළු ග්‍රැෆයිට් (කැණීම් කළ ප්‍රමාණය) නිෂ්පාදනය 205.2 M/T වේ. එසේම, 2024/25, 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා, මුළු මිනිරන් නිෂ්පාදනය 339.51 M/T වේ

මූල්‍ය වර්ෂය සඳහා සාමාන්‍ය නිෂ්පාදන ඉලක්කය මසකට 65 - 70 M/T විය. ඉලක්කය රඳා පවතින්නේ එම අවස්ථාවේ විවෘතව පවතින ඉල්ලම් වල සරුබව, ඒවා පිහිටා ඇති මට්ටම් (ගැඹුර), මිහිතුළ කම්කරුවන්ගේ සංඛ්‍යාව, පතල තුළ භාවිතා කරන යන්ත්‍ර සූත්‍ර වල කාර්යක්ෂමතාව සහ පතලේ අනෙකුත් සංවර්ධන කටයුතු යන කරුණු මතය.


වර්තමානය වනවිට ලෝකයේ පතල් ක්ෂේත්‍රයේ භාවිතා වන නවතම තාක්ෂණික ක්‍රමෝපායන් හා මෙවලම් ආදේශ කරගැනීමට නොහැකියාව , මිනිරන් නිස්සාරණයට අමතරව එම මිනිරන් මිහිපිටට ප්‍රවාහනය සඳහා විශාල ශ්‍රමයක් යෙදවීමට සිදුවීම, මිහිතුළින් නිස්සාරණය කෙරෙන කාර්යයයේදී අතුරු ඵලයක් ලෙස කැඩෙන කළුගල් මිහිපිටට ප්‍රවාහනය සඳහා විශාල ශ්‍රමයක් යෙදවීමට සිදුවීම, මේ වනවිටත් පතල තුළ භාවිතා කරන යල්පැනගිය යන්ත්‍ර සූත්‍ර වල අකාර්යක්ෂමතාව , මිහිතුළ ද්‍රෝණා සහ නව මිනිරන් ඉල්ලම් ගවේෂණය කිරීමේ සංවර්ධන කටයුතු, දෛනික ශ්‍රමිකයින්ගෙන් සැලකියයුතු සංඛ්‍යාවක් නොපැමිණීම මෙන්ම සේවකයන්ගේ විශ්‍රාම ගැනීම, මිනිරන් අලෙවිය අඩුවීම නිසාවෙන් උපයන අඩු ආදායම් තත්ත්වය මත ස්ථාවර මුදල් ප්‍රවාහයක් පවත්වාගෙන යාමට නොහැකි වීමත් වැනි කරුණු හේතුවෙන් අපට නියමිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.

### අලෙවිය

KGLL විසින් 2024/25 මූල්‍ය වර්ෂය 2024 අප්‍රේල් 1 සිට දෙසැම්බර් 31 දක්වා **223.32** M/T අපනයනය කරන ලදී. එසේම, 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා 286.35 M/T අපනයනය කරන ලදී.


ජාත්‍යන්තර මිනිරන් වෙළඳපොලේ ස්වභාවය නිසා විකුණුම් නිතර උච්චාවචනය වේ. එසේම, කෘත්‍රිම මිනිරන් ආදේශක වෙළඳපොලට ඇතුල්වීම, ලෝක වෙළෙඳපොළට අඩු නිෂ්පාදිත වියදමකින් හා අඩු විකිණුම් මිලක් සහිතව මිනිරන් ඇතැම් රටවලින් ලෝක වෙළෙඳපොළට ප්‍රවිෂ්ඨ වීම, ලෝක වෙළෙඳපොලේ අවශ්‍යතාව සපුරාලීමට තරමේ මිනිරන් ඉතාමත් ඉහල නිෂ්පාදනයක් නොමැතිවීම වැනි කරුණු හේතු නිසා මෙරට ස්වභාවික මිනිරන් අලෙවිය විශාල ලෙස පහත වැටීමට පටන් ගෙන ඇත.

## අලෙවිය 2008-2024




*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

## ආදායම





*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

KGLL විසින් 2024/25 මූල්‍ය වර්ෂය 2024 අප්‍රේල් 1 සිට දෙසැම්බර් 31 දක්වා මිනිරන් අලෙවි කිරීමෙන් රු. මිලියන **105.97** ක ආදායමක් ලබාගෙන තිබේ. එසේම, 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා මිනිරන් අලවියෙන් රු.මිලියන 138.51 ආදායමක් ලබාගෙන ඇත. විකිණුම් අඩුවීමත්, රුපියලට සාපේක්ෂව ඩොලරයේ අගය අඩුවීමත් නිසා සාපේක්ෂව විකිණුම් ආදායම අඩුවී ඇත.

## ලාභය

2024/25 වත්මන් මූල්‍ය වර්ෂය තුළ, 2024 අප්‍රේල් 1 සිට දෙසැම්බර් 31 දක්වා, ශුද්ධ බදු පෙර ලාභය රු. මිලියන. **14.38**කි. විකිණුම් ආදායම අඩුවීමත්, රුපියලට සාපේක්ෂව ඩොලරයේ අගය අඩුවීමත් නිසා සාපේක්ෂව බදු පෙර ලාභය අඩුවී ඇත.




*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

## තොගය

මුදල් සහ බැංකු ශේෂය හැරුණු විට, 2024 දෙසැම්බර් 31 වන දිනට දැනට පවතින තොග මෙ.ටොන් 1153.26 ට අදාළව වෙළඳපල කොටස්වල වටිනාකම රුපියල් මිලියන 608.01 කි.

## ශ්‍රම බලකාය

පුහුණු පතල් කම්කරුවන් 52 සහ වෙනත් අදාල තාක්ෂණික කාර්යය මණ්ඩලය ඇතුළුව මුළු ශ්‍රම බලකාය 105 ක් වේ.

## නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග

- නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින් පතල් කැණීමේ හෝ තාක්ෂණික ප්‍රමිතීන්ගෙන් බැහැරව යම් යම් භූගත මට්ටම්වලින් මිනිරන් කැණීම තුළින් පතලේ ආයුකාලයට මෙන්ම ආරක්ෂාවට අහිතකර අතුරු බලපෑම් ඇති කරන ලෙස පතල් කැණීම් සිදු කල ස්ථාන හඳුනාගෙන සුදුසු කැණීම් ක්‍රමයන් සමඟ ඒවායේ අවදානම් තත්ත්වය කළමනාකරණය කර මිනිරන් නිස්සාරණය කළ හැකි වන පරිදි නැවත සකස් කිරීමට සහ ස්ථාවර කිරීමට කටයුතු කිරීම.

- පුරප්පාඩු වූ පතල් ඉංජිනේරු තනතුර සඳහා සුදුසුකම් ලත් පතල් කැණීම් ඉංජිනේරුවරයෙකු බඳවා ගැනීම.

- භූගත හා යාන්ත්‍රික අංශයේ නිසි සංවිධානාත්මක ධූරාවලියක් නොමැති වීම නිසා ආරම්භයේ දී මෙහෙයුම් කටයුතු කළමනාකරණය සහ මාසික නිෂ්පාදන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට අපහසුව පැවති තත්ත්වයට පිළියමක් ලෙස බාස් වරු සහ පතල් අධීක්ෂකවරුන් තෝරා ගැනීම සඳහා අභ්‍යන්තර සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් ඔවුන්ගේ කාර්ය සාධනය සහ අනෙකුත් සුදුසුකම් මත පදනම්ව සියලුම භූගත හා යාන්ත්‍රික අංශ අධීක්ෂණ කණ්ඩායමක් සමඟ නැවත ප්‍රති-සංවිධානය කරන ලදී.

- භූගත ජලය පොම්ප කිරීම සඳහා එක් පොම්පයක් ස්වයංක්‍රීයව ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම මගින් පිරිවැය අවම කිරීමට කටයුතු කිරීම. අදියරෙන් අදියර සියලු භූගත පොම්ප ස්වයංක්‍රීයව කිරීමට කටයුතු කිරීම.

- භූගත පතල් ඵලදායිතාව මාසිකව ගණනය කිරීම සඳහා කටයුතු කිරීම තුළින් මාසික ඵලදායිතාව ඉහළ නැංවීම.

- කොලොන්ගහ පතල තුළට ජලය කාන්දුවීම පාලනය කිරීමට පියවර ගැනීම තුළින් විදුලි ගාස්තු සහ අතිකාල වියදම අවම කිරීමට කටයුතු කිරීම.කොලෙන්ගහ පතල තුළට ජලාපවාහන දිගේ කොන්ක්‍රීට් අර්ධ සිලින්ඩර අතුරා එක් ප්‍රධාන ජල කාන්දු කලාපයක් තුළ ජලාපවාහන මාර්ගයක් මුද්‍රා තැබීම මගින් මෙමෙ ජල කාන්දු වීම පාලනය කළ එක් ව්‍යාපෘතියකි.

**2024 වර්ෂයේ කර්මාන්ත අමාත්‍යාංශයේ විමධ්‍යගත අරමුදලෙන් නිම වූ ව්‍යාපෘතිය**

කර්මාන්ත අමාත්‍යාංශයේ විමධ්‍යගත අරමුදලින් කහටගහ පතලේ පිවිසුම් මාර්ගය හා අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම.

පලමු අදියර - 7,334,377.65
දෙවෙනි අදියර - 530,200.98
තෙවනි අදියර - 10,079,867.04
**මුළු මුදල - 17,944,445.67**

## වර්තමාන සහ අනාගත සංවර්ධන ක්‍රියාකාරකම්

### පතල් කැණීම සහ මිහිතුළ සංවර්ධනය

### ගවේෂණය

පතල් කර්මාන්තය තුළ ඉල්ලම් සම්පත් තිබීම සහ ආර්ථික වශයෙන් ඵලදායී ලෙස ඒවා ලබා ගැනීම තහවුරු කිරීම සඳහා ගවේෂණය අත්‍යවශ්‍ය අංගයක් වන අතර, ඒ අනුව නව ඉල්ලම් සොයා ගැනීම සඳහා ඉල්ලම් ගවේෂණ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරනු අතර අඩි 2080 මට්ටමින් නව ගවේෂණ ව්‍යාපෘතියක් සිදු කෙරෙමින් පවතී . එම තලය තුළම සිරස් ගවේෂණ කටයුතු වැඩිදුරටත් සිදු කරනු ලබන්නේ එම මිනිරන් ඉල්ලම් සංචිත වල ප්‍රමාණයන් නිශ්චය කිරීම සඳහාය. මෙය පතලේ ඉදිරි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමට ද, ආයෝජන තීරණයන් ගැනීමට ද උපකාරී වේ.

### දෙවැනි ආවාටය කැණීම (2nd Shaft sinking) හෝ විකල්ප ප්‍රවාහන මාධ්‍යයක් යාවත්කාලීන කිරීම

අඩි 1132 මට්ටමේ සිට අඩි 2000 මට්ටම තෙක් ප්‍රවිෂ්ට වීමට යෝජිත දෙවන ආවාටයේ කැණීම් අඩි 1132 මට්ටමේ සිට අඩි 240 ක් පමණ මේ වන විට කැණීම් කොට නතර කර ඇති බැවින් දෙවන ආවාටයේ සංවර්ධන වැඩ නැවත ආරම්භ කිරීම සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ වියදම රුපියල් මිලියන 219 ක් පමණ වේ. නමුදු 1998 වර්ෂයෙන් අනතුරුව

කහටගහ පතලේ පවතින මිනිරන් සංචිත ඇස්තමේන්තුවක් (Ore Reserve Estimation) සිදු කර නොමැති බැවින් මෙවැනි විශාල ආයෝජනයක් කිරීමෙන් ඊට අනුරූපව අනාගතයේ අපේක්ෂිත ප්‍රතිලාභ ලැබේද යන්න අදායම් විශ්ලේෂණයක් කිරීම සඳහා දෙවන ආවාටයේ කැණීම්
යළි ආරම්භ කිරීමට පෙර පවතින මිනිරන් සංචිත ඇස්තමේන්තුවක් කිරීම වඩාත් යෝග්‍ය වේ.

එසේම මිහිතුළට ප්‍රවිෂ්ය වීමට මෙන්ම මිනිරන්, ගල්, හා අනෙකුත් දෑ ප්‍රවාහනය සඳහා පතලේ ප්‍රධාන ආවාටය ඔස්සේ ස්ථාපිත සෝපාන 2ක් මගින් අඩි 1132 මට්ටම දක්වා පමණක් පවතින අතර අඩි 1132 මට්ටමේ සිට අඩි 2080 තෙක් පවතින අනෙකුත් මට්ටම් වලට මිනිසුන්, මිනිරන්, ගල් ඇතුළු අනෙකුත් දෑ ප්‍රවාහනය කිරීම සඳහා පවතිනුයේ සම්පිඩක වායු මගින් ක්‍රියා කෙරෙන ඔසවන යන්ත්‍රයකට සම්බන්ධ කර ඇති වින්ච් පෙට්ටි ලෙස හඳුන්වන දැව පෙට්ටියක ආධාරයෙන් ඉහල පහල ගමන් කෙරෙන ප්‍රවාහන මාධ්‍යයකි (Winch Hoisting System). මෙම යල්පැනගිය පැරණි ප්‍රවාහන මාධ්‍ය වර්තමානයට ගැලපෙන ලෙස යාවත්කාලින කර වැඩි කාර්යක්ෂමතාවකින් යුතුව පවතින winzes භාවිතා කරමින් විකල්ප ප්‍රවාහන මාධ්‍යයක් ස්ථාපිත කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇත. මෙමගින් පතල් සේවකයන්ගේ ආරක්ෂාව වැඩි දියුණු වීමත්, අඩු ශ්‍රම පිරිවැයකින් වැඩි මිනිරන් නිෂ්පාදන ධාරිතාවක් ලබාගැනීමටත් හැකිවේ.

එසේම දෙවන ආවාටය කැණීම සඳහා දැරිය යුතු පිරිවැය, ශ්‍රම දායකත්වය, ව්‍යාපෘතිය අවසන් කිරීමට ගතවන කාලය වැනි නිර්ණායක සමග සසඳන විය ඊට සාපේක්ෂව ඉතාමත්ම අඩු පිරිවැයකින්, අඩු ශ්‍රමයකින් හා අඩු කාලයකදී මෙම ව්‍යාපෘතිය අවසන් කර එමගින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත හැකිය.

**පතල් උපකරණ**

කැප් ලාම්පු, විදුම් කටු වැනි පතල් කැණීමේ උපකරණ ලබාදීමට අවශ්‍ය පියවර ගෙන ඇත. වින්ච් සඳහා භාවිතා කරන කේබල, Jack Hammer විදුම් යන්ත්‍ර සහ අමතර කොටස් ආදිය ද ඉහළ සම්පීඩිත වායු ඉල්ලුමක් සැපයීම සඳහා අතිරේකව 1000 CFM නව වායු සම්පීඩක යන්ත්‍රයක් මෙතෙක් පවතින වායු සැපයීමේ පද්ධතියට සම්බන්ධ කිරීම මඟින් සම්පීඩක වායු පද්ධතිය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. නව විදුලි පංකා ස්ථාපනය කිරීම වාතාශ්‍රය සමීක්ෂණය (Ventilation Survey) ආරම්භ කිරීමෙන් පසුව සිදු කළ යුතු අතර, පැරණි විබාදනයට ලක් වූ වායු බට ප්‍රතිෂ්ඨාපනය කිරීම, හානි වූ යකඩ රැහැන් හා දිරාපත් වූ දැව/වානේ ආධාරක ආදේශ කිරීම සිදු කළ යුතුය.

**මිහිතුල මිනිරන් නිස්සරණ වැඩබිම්**

අඩි 1,132 මට්ටමේ සිට අඩි 2,080 මට්ටමත් අතර මිනිරන් නිෂ්කාශණය කිරීමේ වැඩපලවල් 11ක් මේ වනවිට ක්‍රියාත්මක වේ. එසේම සිරස් ධාවකය (Horizontal Drive) අඩි 2080 මට්ටමින් සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත.

## 17.3 අනාගත සැලැසුම් - 2025

- වර්තමාන සාමාන්‍ය මාසික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 50-55 ක් පමණ අගයක් අතර විචලා වේ. එය මසකට ටොන් 75-80 දක්වා ගෙන ඒමට තවදුරටත් සැලසුම් කර ඇත.
- මේ වන විට ගෝලීය වෙළෙඳපොළේ ස්වභාවික මිනිරන් සඳහා ඇති ඉල්ලුම අඩු වී ඇත. ඒ නිසා මිනිරන් අලෙවිය විශාල ලෙස අඩු වී ඇත. නව ගැනුම්කරුවන් සොයා බලා අපේක්ෂිත ආදායම වැඩිකර ගැනීමට කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

# 18

# ජාතික කඩදාසි සමාගම (NPCL)

## 18.1 හැඳින්වීම

ආරම්භයේ දී පැවති ජාතික කඩදාසි සංස්ථාව පසුව 1982 අංක: 17 දරණ සමාගම් පනතේ විධිවිධාන අනුව සී/ස ජාතික කඩදාසි සමාගම වශයෙන් සංස්ථාපනය වී ඇති අතර, මේ වන විට 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන අනුව පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ.

වාලච්චේන කඩදාසි කම්හල හා ඇඹිලිපිටිය කඩදාසි කම්හල සී/ස ජාතික කඩදාසි සමාගම යටතේ පවතී.

### කාර්ය සාධනය

- 2014 දෙසැම්බර් මස සිට නවතා තිබූ වාලච්චේන කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු අංක: අමප/20/0561/224/015 හා 2020.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබා දී ඇති අනුමැතිය පරිදි 2020 ජූලි මස සිට සී/ස ජාතික කඩදාසි සමාගම විසින් නැවත ආරම්භ කර ඇත.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඇඹිලිපිටිය කඩදාසි කම්හල පිහිටි ඉඩම (අක්කර 111 රූඩ් 02 පර්චස් 33ක) දීර්ඝ කාලීන බදු පදනම මත වසර 30ක කාල සීමාවක් සඳහා සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලබා දීමට අංක:

අමප/21/1015/320/032 සහ 2021.07.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2021.10.13 දින සිට වසර 30ක කාල සීමාවක් සඳහා ඇඹිලිපිටිය කඩදාසි කම්හල පිහිටි ඉඩම් කොටසට අදාළව දීර්ඝ කාලීන බදු ඔප්පු සකස්කර සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලබා දී ඇත.

- 2012 වර්ෂයේ සිට නවතා දමා තිබූ ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ නැවත ආරම්භ කිරීම සඳහා අංක: අමප/22/0254/320/010 හා 2022.02.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව සී/ස ජාතික කඩදාසි සමාගම හා ආයෝජක සමාගම වන KSPA Embilipitiya Paper Mills (Pvt) Ltd අතරඉහතව්‍යාපෘතියවෙනුවෙන්වසර 30ක කාල සීමාවකට අදාළ ගිවිසුම 2022.03.09 දින අත්සන් කර ඇත.කම්හලෙහි විසන්ධි කර ඇති විදුලි සැපයුම නැවත ලබා දීමෙන් පසුව නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිතය.

- වර්තමානයේ සී/සජාතික කඩදාසි සමාගම Craft Paper, Manila Papers, Cover Paper සහ Writing Paper නිෂ්පාදනය කරමින් වඩා හොඳ කාර්ය සාධනයක් සිදු කරයි. තවද ඇසුරුම් කර්මාන්ත සඳහා මුද්‍රණ කඩදාසි සහ එතීමේ කඩදාසි (55gsm - 100gsm) නිෂ්පාදනය කරනු ලබයි.

**සම නිෂ්පාදන අලුතින් හඳුන්වා දෙන ලදී.**

- අභ්‍යාසපොත්
- CR පොත්
- Foolscap
- Ruled Sheets

## 18.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

**2024 වර්ෂයේ වාලච්චේන කඩදාසි කම්හලෙහි කඩදාසි නිෂ්පාදනයෙන් උපයන ලද ආදායම**

| මාසය | නිෂ්පාදනය (මෙ.ටො.) | ආදායම (රු.මි.) |
|---|---|---|
| ජනවාරි | 154.54 | 36.62 |
| පෙබරවාරි | 87.81 | 22.43 |
| මාර්තු | 140.95 | 26.58 |
| අප්‍රේල් | 135.92 | 20.44 |
| මැයි | 144.14 | 27.25 |
| ජූනි | 154.57 | 22.97 |
| ජූලි | 128.50 | 22.73 |
| අගෝස්තු | 115.4 | 18.08 |
| සැප්තැම්බර් | 98.19 | 16.11 |
| ඔක්තෝබර් | 145.90 | 22.71 |
| නොවැම්බර් | 49.67 | 11.10 |
| **එකතුව** | **1355.59** | **247.02** |

*මූලාශ්‍රය : ජාතික කඩදාසි සමාගම*

**ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම මගින් ලැබෙන ප්‍රතිලාභ**

- ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල : රු. බිලියන 3.5කි.
- සිදු කිරීමට අපේක්ෂිත දෛනික කඩදාසි නිෂ්පාදනය (පල්ප් මත පදනම් වූ කඩදාසි) : මෙ.ටොන් 250 කි.
- සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලැබෙන වාර්ෂික පිරිවැටුම (Annual Turnover) පහත පරිදි ගණනය කරනු ලබයි.

  වාර්ෂිකව සිදු කරන නිෂ්පාදන X 3%

  (Transfer Price X 3%)

- සී/ස ජාතික කඩදාසි සමාගමේ ප්‍රධාන කාර්යාලය සහ වාලච්චේන කඩදාසි කම්හලෙහි කාර්යාලයේ යටිතල පහසුකම් වැඩිකිරීම.

## 18.3 අනාගත සැලැසුම් - 2025

- වාලච්චේන කඩදාසි කම්හලෙහි කඩදාසි නිෂ්පාදන යන්ත්‍ර (Paper Machine & Board Machine) අළුත්වැඩියා කර මාසික කඩදාසි නිෂ්පාදනය වැඩි කිරීම.
- වාලච්චේන කඩදාසි කම්හලෙහි වහලය මත සූර්ය පැනල පද්ධතියක් (Solar Power System) ස්ථාපිතකිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ වාලච්චේන කඩදාසි කම්හල් පරිශ්‍රයෙහි විවිධාංගීකරණ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ සහ වාලච්චේන කඩදාසි කම්හලේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- ණයගැතියන් සහ වගකීම් නිරවුල් කිරීමට කටයුතු කිරීම

# 19

# ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් (LMSL)

## 19.1 හැඳින්වීම

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික ආඥාපනත යටතේ ස්ථාපිත කර ඇති අතර 1992 වර්ෂයේ දි පූර්ණ රජය සතු සමාගමක් බවට පත්කර ඇත. 2007 අංක07 දරන නව සමාගම් පනත අනුව අංක. පී.බී.587 යටතේ 2008.09.16 වන දින පූර්ණ රජය සතු සමාගමක් ලෙස නැවත ලියාපදිංචිකර ඇත. ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන කාර්යාලය රාජගිරිය ප්‍රදේශයේ පිහිටා ඇති අතර, නිෂ්පාදන කර්මාන්තශාලාව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පුල්මුඩේ ප්‍රදේශයේ ස්ථාපිතකර ඇත.

### කාර්යභාරය

- දළ වැලි කැණීම, පිරිසැකසීම සහ භෞතික ගුණත්වයන් අනුව ඉල්මනයිට් රුටයිල්, සර්කෝන්, ගානට්, මොනසයිට්, හයි ටයි ඉල්මනයිට් යනාදී වශයෙන් බර ඛනිජ වැලි වෙන් කිරීම.
- ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීම් මඟින් බර ඛනිජ වැලි අපනයනය කිරීම.
- නව බර ඛනිජ වැලි නිධි හඳුනා ගැනීම සහ ගවේෂණය කිරීම.

- එම නිධි වල පවතින බර ඛනිජ වැලි ඉවත්කර ගැනීම සඳහා වන මූලික පාරිසරික අධ්‍යයනයන් හෝ පාරිසරික බලපෑම අධ්‍යයනයක් සිදු කිරීම.

- එසේ හඳුනාගන්නා බර ඛනිජ වැලි නිධි වල ආර්ථිකමය ශක්‍යතාවය අධ්‍යයනය කිරීම.

- ආයතනය සතු බර ඛනිජ වැලි නිධි ප්‍රමාණය පුලුල් කරගැනීමට කටයුතු කිරීම.

**පුල්මුඩේ කැණීම් සහ පසු පිරවීම් කටයුතු සිදුකර ඇති ආකාරය**

**කැණීම්**



**පසු පිරවීම්**




## 19.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

**අලෙවිය - 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා**

| මාසය | අලෙවි ආදායම (රු.මි.) |
|---|---|
| ජනවාරි | 0 |
| පෙබරවාරි | 0 |
| මාර්තු | 0 |
| අප්‍රේල් | 0 |
| මැයි | 2 |
| ජුනි | 0 |
| ජූලි | 53 |
| අගෝස්තු | 617 |
| සැප්තැම්බර් | 0 |
| ඔක්තොම්බර් | 0 |
| නොවැම්බර් | 0 |
| දෙසැම්බර් | 0 |
| **එකතුව** | **672** |

*මූලාශ්‍රය: ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්*





*මූලාශ්‍රය: ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්*

**නිෂ්පාදනය**

| මාසය | නිෂ්පාදනය (මෙ.ටො.) | | | |
|---|---|---|---|---|
| | ඉල්මනයිට් | රුටයිල් | සර්කෝන් | හයි-ටයි ඉල්මනයිට් |
| ජනවාරි | 2817 | 45 | 15.04 | 56 |
| පෙබරවාරි | 2814 | 65 | 25.28 | 70 |
| මාර්තු | 3226 | 102.5 | 31.04 | 107.5 |
| අප්‍රේල් | 1227 | 55.5 | 16.9 | 66 |
| මැයි | 2818 | 52.25 | 26.32 | 71 |
| ජුනි | 2800 | 51.5 | 15.5 | 65 |
| ජූලි | 2853.50 | 67 | 11.76 | 75.5 |
| අගෝස්තු | 2803 | 93 | 19.28 | 99 |
| සැප්තැම්බර් | 2818 | 80.5 | 13.48 | 76 |
| ඔක්තොම්බර් | 1004 | 15 | 19.20 | 14 |
| නොවැම්බර් | 0 | 15 | 0 | 20 |
| දෙසැම්බර් | 0 | 0 | 0 | 0 |
| එකතුව | 25180.5 | 642.25 | 193.8 | 720 |

*මූලාශ්‍රය: ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්*




*මූලාශ්‍රය: ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්*

## 19.3 අනාගත සැලැසුම් - 2025

- කෝකිලායි යන්ත්‍රාගාරයේ ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම.
- ජංගම යන්ත්‍රාගාරය පොදුවකට්ටු ප්‍රදේශයේ ස්ථාපිත කිරීම.
- ඛනිජ වැලි කැණීම් ව්‍යාප්ත කිරීමට අදාළව පොඩවකට්ටු කැණීම් බලපත්‍රය සඳහා EIA වාර්තා ලබා ගැනීම
- ඛනිජ වැලි අගය එකතුකිරීමේ නිෂ්පාදන කර්මාන්තය ස්ථාපිත කිරීම පියවර 2ක් ඔස්සේ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.
- ආයතනය මඟින් හඳුනාගත් නිෂ්පාදනයන් කිහිපයන් සඳහා අගය එකතු කිරීමේ නිෂ්පාදනයට යොමු වීම.
- කර්මාන්ත අමාත්‍යාංශය මඟින් යෝජිත අගය වැඩි කිරීමේ වැඩපිළිවෙල අනුව සුදුසු ආයෝජකයෙකු සමඟ ඉල්මනයිට් ආශ්‍රිත අගය වැඩි කිරීමේ නිෂ්පාදන කර්මාන්තය සඳහා යොමු වීම
- නිෂ්පාදනවල ගුණාත්මක තත්වය වැඩි කිරීම
- ඛනිජ වැලි තොග අලෙවි කිරීම සඳහා නව ගැනුම්කරුවන් ආකර්ෂණය කර ගැනීම
- EMS සහතිකය ලබා ගැනීම
- පවතින පරිගණක මෘදුකාංග සංවර්ධනය කිරීම
- රසායනාගාරය අන්තර්ජාතික මට්ටමට දියුණු කිරීම

# 20

# ලංකා පිඟන් සංස්ථාව (CCC)

## 20.1. හැඳින්වීම

ජාතික කුඩා කර්මාන්ත සංස්ථාව ගඩොල් සහ ටයිල් ඒකකය 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ ස්ථාපිත කරන ලදී.

රාජ්‍ය කාර්මික සංස්ථාවේ ගඩොල් සහ ටයිල් ඒකකය 1972 දී ලංකා පිඟන් සංස්ථාවට ස්ථාපිත විය.

1990 ජනවාරි මාසයේ දී සංස්ථාවේ පිඟන් භාණ්ඩ අංශය පෞද්ගලීකරණය කරන ලද අතර සංස්ථාවේ ගඩොල් සහ උළු ඒකකය ''ලංකා පිඟන් සංස්ථාව'' නමින් දිගටම පවත්වාගෙන ගියේය.

එරගම කර්මාන්ත ශාලාව ලාභදායිත්වය මත පවත්වාගෙන යන අතර, මහියංගන කම්හල 2023 වසරේ සිට පටන් ගන්නා ලදී. මේ වන විට ඔඩ්ඩුසුඩාන් කම්හලද නිෂ්පාදන කටයුතු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් පවත්වාගෙන යනු ලබයි. මෙහි ප්‍රධාන වශයෙන් පැතලි උළු, මුදුන් උළු,සෙවන විශේෂ,මිලිමීටර් ගඩොල්,3x9x16 ගඩොල් නිෂ්පාදනය කරනු ලබයි.

## ගඩොල් හා උළු කර්මාන්තශාලාවන්හි පිහිටීම හා ධාරිතාවය

| කර්මාන්තශාලාව | ස්ථානය | දේපළ (අක්කර) | තත්වය |
|---|---|---|---|
| එරගම | අම්පාර | 232 | නිෂ්පාදන කටයුතු සිදු වේ. |
| මහියංගණය | මහියංගණය | 94 | නිෂ්පාදන කටයුතු සිදු වේ. |
| උස්වැව | ඇඹිලිපිටිය | 19 | 2025 වර්ෂයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. |
| යටියන | මාතර | 06 | යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාකොට 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. කම්කරු හිඟය ගැටලුවක් වන අතර අඩු කම්කරුවන් ප්‍රමාණයකින් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිතයි. |
| බිංගිරිය | බිංගිරිය | 03 | කම්හලේ යන්ත්‍ර සූත්‍ර ගඩොල් නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට හැකියාව ඇත. |
| වැළඩ | කුරුණෑගල | 09 | කම්හලේ යන්ත්‍ර සූත්‍ර අනෙකුත් කර්මාන්තශාලා වලට මාරු කර යවා ඇත. |
| ඇලයාපත්තුව | අනුරාධපුරය | 33 | ගඩොල් නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට හැකියාව ඇත. |
| ඔඩ්ඩුසුඩාන් | මුලතිව් | 13 | කම්හලේ යන්ත්‍ර අලුත්වැඩියාව 90% කින් පමණ අවසන් කර ඇති අතර ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු 60% කින් පමණ අවසන් කර ඇත. 2025 වර්ෂයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. |
| බංගදෙණිය | බංගදෙණිය | 07 | ඉඩම පමණි. |
| එකතුව | | 416 | |

*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*


## 20.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### නිෂ්පාදනය


2023 ජනවාරි මාසයේ සිට නිෂ්පාදන කටයුතු ක්‍රියාත්මක වන්නේ මහියංගනය සහ එරගම කර්මාන්තශාලා පමණි.

| මාසය | එරගම නිෂ්පාදන ඒකක ගණන 2024 | මහියනංගණය නිෂ්පාදන ඒකක ගණන 2024 |
|---|---|---|
| ජනවාරි | 70734 | 17098 |
| පෙබරවාරි | 99787 | 14953 |
| මාර්තු | 62968 | 28523 |
| අප්‍රේල් | 22162 | |
| මැයි | 57403 | 9677 |
| ජූනි | 64475 | 12833 |
| ජූලි | 81415 | - |
| අගෝස්තු | 89550 | - |
| සැප්තැම්බර් | 68029 | - |
| ඔක්තොම්බර් | 82766 | - |
| නොවැම්බර් | 118205 | - |
| **දෙසැම්බර්** | 116608 | - |
| **එකතුව** | **934102** | **83084** |

***මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව***




ගඩොල් හා උළු නිෂ්පාදනය





***මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව***

එරගම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනයේ මුළු ඒකක ගණන 699289 කි. ජනවාරි පෙබරවාරි මාසයන්හි ඉහළ නිෂ්පානයක් සිදු වූ අතර එයට සාපේක්ෂව අප්‍රේල් සිට ජුනි දක්වා නිෂ්පාදනය අඩු විය.ජූලි සිට දෙසැම්බර් මාසය දක්වා නැවතත් නිෂ්පාදන ප්‍රමාණයේ ක්‍රමික ඉහළ යෑමක් දක්නට ලැබේ.


මහියංගන කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනයේ මුළු ඒකක ගණන 83084 කි. ජනවාරි මාසයට සාපේක්ෂව පෙබරවාරි මාසයේ නිෂ්පාදනයේ අඩු වීමක් පෙන්නුම් කරන අතර,මාර්තු මාසයේ නිෂ්පාදනයේ වැඩි වීමක් සිදු විය. අප්‍රේල් මාසයේ නිෂ්පාදන කටයුතු සිදු නොවිය. නැවත මැයි, ජුනි නිෂ්පාදන කටයුතු සිදු වුවද ජූලි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා නිෂ්පාදනයක් සිදු නොවිනි.

| එරගම හා මහියංගනය - නිෂ්පාදන වටිනාකම (රුපියල්) | | |
|---|---|---|
| මාසය | එරගම | මහියංගනය |
| ජනවාරි | 5,092,844.65 | 2,398,601.74 |
| පෙබරවාරි | 6,941,578.03 | 2,250,773.76 |
| මාර්තු | 4,301,032.52 | 4,038,493.13 |
| අප්‍රේල් | 1,514,100.51 | - |
| මැයි | 3,957,031.44 | 2,078,455.43 |
| ජුනි | 4,763,792.68 | 1,730,793.32 |
| ජූලි | 6,108,347.70 | - |
| අගෝස්තු | 6,384,461.52 | - |
| සැප්තැම්බර් | 4,870,463.84 | - |
| ඔක්තොම්බර් | 5,645,498.36 | - |
| නොවැම්බර් | 8,106,370.84 | - |
| දෙසැම්බර් | 8,044,391.89 | - |
| **එකතුව** | **65,729,913.98** | **12,497,117.38** |

*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*




*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*




*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*

## එරගම හා මහියංගන කර්මාන්ත ශාලාවන්හි නිෂ්පාදන පිරිවැය

| මාසය | නිෂ්පාදන පිරිවැය රු. 2024 එරගම | නිෂ්පාදන පිරිවැය රු. 2024 මහියංගනය |
|---|---|---|
| ජනවාරි | 5,211,118.00 | 2,368,365.00 |
| පෙබරවාරි | 4,503,681.00 | 2,615,371.63 |
| මාර්තු | 3,787,961.00 | 2,235,533.45 |
| අප්‍රේල් | 1,655,155.00 | - |
| මැයි | 2,515,012.00 | 621,893.89 |
| ජුනි | 4,074,785.00 | 624,720.21 |
| ජූලි | 4,782,444.00 | - |
| අගෝස්තු | 3,363,658.00 | - |
| සැප්තැම්බර් | 3,359,921.00 | - |
| ඔක්තොම්බර් | 4,312,032.00 | - |
| නොවැම්බර් | 5,403,793.00 | - |
| දෙසැම්බර් | 5,034,202.00 | - |
| **එකතුව** | **48,003,762.00** | **8,465,884.18** |

*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*

එරගම කම්හලේ මුල් මාස 03 හි ඉහළ නිෂ්පාදන පිරිවැයක් පෙන්නුම් කරන අතර, අප්‍රේල් මාසයේ නිෂ්පාදන පිරිවැයේ අඩුවීමක් දක්නට ලැබේ. මැයි මාසයේ සිට ජූලි මාසය දක්වා නිෂ්පාදන පිරිවැයේ ඉහළ යාමක් සිදු වුවද අගෝස්තු,සැප්තැම්බර් මාසයන්හි නිෂ්පාදන පිරිවැයේ සුළු අඩුවීමක් පෙන්නුම් කරයි.ඔක්තොම්බර් මාසයේ සිට දෙසැම්බර් දක්වා නිෂ්පාදන පිරිවැයේ වැඩි වීමක් සිදු වී ඇත.


මහියංගන කම්හලේ ජනවාරි මාසයේ සිට මාර්තු මාසය දක්වා ඉහළ නිෂ්පාදන පිරිවැයක් දක්නට ලැබුණද අප්‍රේල් මාසයේ නිෂ්පාදන පිරිවැයක් නොමැති අතර,මැයි,ජුනි මාසයන් වල නිෂ්පාදන පිරිවැය පෙර මාසවලට සාපේක්ෂව අඩු වීමක් පෙන්නුම් කරයි. ජූලි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා නිෂ්පාදනයක් සිදු නොවු නිසා එම මාසයන්හි නිෂ්පාදන පිරිවැයක් නොමැත.

**එරගම,මහියංගනය,උස්වැව,යටියන කර්මාන්තශාලාවල - විකුණුම් වටිනාකම (රුපියල්)**

| මාසය | එරගම | මහියංගනය | උස්වැව | යටියන |
|---|---|---|---|---|
| ජනවාරි | 4,506,831.10 | 1,300,391.62 | 124,593.16 | 34,674.00 |
| පෙබරවාරි | 5,084,021.39 | 1,071,536.66 | 2,124,010.08 | 43,283.50 |
| මාර්තු | 4,851,030.10 | 459,188.68 | 789,726.72 | 41,525.00 |
| අප්‍රේල් | 3,697,637.35 | 513,004.00 | 161,832.63 | 71,880.00 |
| මැයි | 4,327,613.69 | 507,807.30 | 594,283.20 | 29,547.50 |
| ජූනි | 6,137,133.12 | 1,901,802.08 | 66,924.74 | 20,837.50 |
| ජූලි | 5,761,513.69 | 1,008,381.70 | 26,348.94 | 43,500.00 |
| අගෝස්තු | 8,304,935.06 | 432,601.57 | 107,325.09 | 45,950.00 |
| සැප්තැම්බර් | 6,272,177.20 | 145,622.45 | 70,368.48 | 34,151.00 |
| ඔක්තොම්බර් | 7,602,344.06 | 569,698.69 | 55,606.54 | 11,725.00 |
| නොවැම්බර් | 6,734,146.63 | 2,016,753.64 | 127,080.80 | 37,089.49 |
| දෙසැම්බර් | 5,610,915.51 | 1,244,297.16 | 75,497.50 | 10,670.00 |
| **එකතුව** | **68,890,298.90** | **11,171,085.55** | **4,323,597.88** | **424,832.99** |

*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*

**මූල්‍ය තත්ත්වය**




*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*

**සංස්ථාවේ කාර්යසාධනය**

කාර්යසාධන දර්ශකය: සංස්ථාවට අයත් අම්පාර එරගම කම්හල ලාභදායී තත්වයෙන් පවත්වාගෙන යන අතර, මෙම කම්හලේ දෛනිකව පැතලි උළු,මුදුන් උළු,3x9x16 ගඩොල්,සෙවණ විශේෂ ගඩොල් හා මිලිමීටර් ගඩොල් නිෂ්පාදනය කරනු ලබයි.එම නිෂ්පාදනය කරනු ලබන සියළුම නිමි භාණ්ඩ අලෙවි කිරීම සිදු කරන අතර එම ලැබෙන ආදායමෙන් අනෙකුත් කම්හල් වල වැටුප් හා අනෙකුත් වියදම් සිදු කරනු ලබයි.

ඔඩ්ඩුසුඩාන් කම්හලේ අළුත්වැඩියා කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන හා උපදෙස් ලබා දී ඇති අතර, මේ සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවේද සහයෝගය ලබා ගෙන ඇත.

## 20.3 අනාගත සැලසුම් - 2025

- නව නිෂ්පාදන වෙලඳපොළට හඳුන්වා දීම. (Interlock Brics)
- අම්පාර,මහියංගනය කර්මාන්තශාලා සඳහා සූර්ය බලශක්ති ව්‍යාපෘති හඳුන්වා දීම.
- අලෙවිකරණ කටයුතු ආරම්භ කිරීම.
- මානව සම්පත වැඩි දියුණු කිරීමේ වැඩසටහන් මඟින් පරිපාලන කටයුතු විධිමත් කිරීම.
- නිෂ්පදන වල ප්‍රමිතිය වැඩි දියුණු කිරීම.
- ඔඩ්ඩුසුඩාන් කම්හල ප්‍රතිසංස්කරණය කර නැවත නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.

# 21

# සී/ස ලංකා පොස්පේට් සමාගම (LPL)

## 21.1 හැඳින්වීම

එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ථ ලෙස භාවිතා කරමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සපුරාලන අතර තුර අපනයනය සඳහා යොමු වෙමින් විදේශ විනිමය උපයාගැනීමට ලංකා පොස්පේට් සමාගම ක්‍රියාකරනු ලැබේ.

**මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය:**

බහු වාර්ෂික කෘෂිකාර්මික බෝග සඳහා පොහොර ලෙස භාවිතා කිරීම සඳහා රොක් පොස්පේට්, කැණීම් කිරීම, සැකසීම සහ විකිණීමේ ක්‍රියාවලිය සිදුකිරීම ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම වේ.

## 21.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

| | සත්‍ය අගය | අයවැයගත අගය | විචලනය | % |
|---|---|---|---|---|
| විකුණුම් (මෙ.ටොන්) | 43,067 | 49,500 | (6,433) | 87.0% |
| නිෂ්පාදනය (මෙ.ටොන්) | 41,023 | 46,800 | (5,777) | 87.6% |
| ආදායම (රු. මි.) | 983.52 | 1,081.64 | (98.12) | 90.9% |
| මෙහෙයුම් ලාභය - 30.11.24 දිනට (රු.මි.) | 298.34 | 244.76 | 53.58 | 121.9% |
| PBT - 30.11.24 දිනට (රු. මි.) | 368.47 | 291.10 | 77.37 | 126.58% |
| | | | | |

| | |
|---|---|
| **30.11.2024** දිනට | |
| ජංගම වත්කම් | 1,268.71 |
| මුළු වත්කම් | 1,510.23 |
| වගකීම | 271.02 |
| ශුද්ධ වත්කම් (කොටස් හිමියන්ගේ අරමුදල ) | 1,239.21 |
| සේවා නියුක්තිකයින් ගණන | **296 (288 ස්ථිර )** |

*මූලාශ්‍රය: ලංකා පොස්පේට් සමාගම*

බොහෝ සීමාවන් මධ්‍යයේ වුවද එම කාලය තුළ රටට විදේශ විනිමය උපයා ගැනීම සඳහා, විදේශ වෙළෙඳපොළ සමඟ ගණුදෙනු කරනු ලබන දේශීය සමාගම් 03 ක් සඳහා රොක් පොස්පේට් මෙට්‍රික් ටොන් 16,859 ක් අලෙවි කිරීමට ආයතනියේ කළමනාකාරිත්වවට හැකි විය. එමගින් ඉපැයූ මුළු ආදායම රු. මිලියන 417.0 ක් වේ.



වගකිවයුතු රාජ්‍ය සංවිධානයක් ලෙස, කෙටුම්පත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව, 2023/2024 වසර සඳහා අතුරු ලාභාංශ ලෙස ඒකාබද්ධ අරමුදලට සඳහා රුපියල් මිලියන 75.0ක් ගෙවා ඇත. තවත් රු. මි. 25 ක් ගෙවීඹට සැළසුම් කර ඇත. තවද, රාජ්‍ය ආයතන වෙත අනෙකුත් ගෙවීම් ලෙස, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත රාජ්‍ය භාගය ලෙස රු. මි. 67.0 ක් ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට CIT/VAT ලෙස රු. මි. 136.22 ක් සහ ඉඩම් පරිහරණ ගාස්තු ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ මහවැලි අධිකාරියට රුපියල් මිලියන 49.2 ක් ද ගෙවා ඇත.

ප්‍රමිතිගත රසායනාගාර පහසුකම් හඳුන්වා දීමෙන් නිෂ්පාදනවල සහ තත්ව පරීක්ෂණ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට කටයුතු කර ඇත.

**නිෂ්පාදනවල සහ තත්ව පරීක්ෂණ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම**



සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා එප්පාවල ගොඩනැගිලිවල වහලය කුලියට දී තිබූ අතර, එමගින් ඉපැයිය හැකි මාසික ආදායම ආසන්න මිලියන 1.0 ක් පමණ වේ.

යන්ත්‍ර අමතර කොටස් දේශීයව මිලදී ගැනීමට සහ අභ්‍යන්තරිකව නිෂ්පාදනය කිරීම තුලින්, මුදල් ඉතිරි කර ගැනීමටත්, එමගින් විදේශ විනිමය ඉතිරි කර ගැනීමටත් පියවර ගෙන ඇත.

**යන්ත්‍රසූත්‍ර සහ අමතර කොටස් දේශීයව හා අභ්‍යන්තරව නිෂ්පාදනය කිරීම**



## 21.3 අනාගත සැලසුම් - 2025

**එප්පාවල ව්‍යාපෘති පරිශ්‍රය තුල යටිතල පහසුකම් සංවර්ධනය සහ ගෙවීම් සඳහා වූ බැදීම්**

| ක්‍රියාමාර්ගය / ස්ථානය | ඇස්තමේන්තුගත මුදල (රු. මිලියන) | අදහස් |
|---|---|---|
| **1. ගබඩා පහසුකම් පුළුල් කිරීම** <br> නිමි තොග ගබඩාව | 150,000,000.00 | ආයතනයේ දැනට පවතින නිමි ද්‍රව්‍ය ගබඩා ධාරිතාවය ප්‍රමාණවත් වන්නේ මෙට්‍රික් ටොන් 5,000ක් සඳහා පමණි. අගය එකතු කළ නිෂ්පාදන හෝ අපනයන ඇණවුම් ඉලක්ක කර ගනිමින් නිෂ්පාදන කටයුතු කිරීම සඳහා, නිමි ද්‍රව්‍ය ගබඩා ධාරිතාව මෙ. ටොන් 15,000 ක ප්‍රමාණයක් දක්වා කඩිනම්ව වැඩි කළ යුතු වේ. මෙය නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව සහ සුමටව ක්‍රියාත්මක කිරීමට උපකාරී වේ. |
| **2. ක්‍රෂර් යන්ත්‍රය නැවත එකලස් කිරීම** | 7,000,000.00 | ක්‍රෂර් යන්ත්‍රය නිෂ්පාදන ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ වන අතර, එමගින් විශාල ප්‍රමාණයේ රොක් පොස්පේට් මෝල් යන්ත්‍රවලට ඇතුළු වීමට පෙර සම්මත අංශු මට්ටමට කැඩී යයි. දැනට පවතින ක්‍රෂර් යන්ත්‍රය වසර 40ක් පමණ පැරණි වන අතර, විශාල මෙහෙයුම් කටයුතු සඳහා මෙය යොදා ගත නොහැකි අතර ඒ සඳහා යන්ත්‍ර අමතර කොටස් සොයා ගැනීමේ ගැටළුවක්ද පවතී. එබැවින්, අගය එකතු කළ නිෂ්පාදන හෝ අපනයන ඇණවුම් සඳහා අනාගත ඉල්ලුම සපුරාලීම සඳහා, සමාගමේ දැනට පවතින ක්‍රෂර් යන්ත්‍රය නැවත එකලස් කළ යුතුය. |
| **3.** ව්‍යාපෘති භූමියේ පතල් කැණීම් කටයුතු සඳහා අවශ්‍ය වාහන මිලදී ගැනීම | 66,000,000.00 | ලංකා පොස්පේට් ලිමිටඩ් විසින් වාර්ෂිකව පතල් හා කැණීම් කටයුතු සඳහා අවශ්‍ය නිෂ්පාදන වාහන කුලියට ගැනීම සිදුකරනු ලැබේ. එම මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය නිෂ්පාදන වාහන ආයතනය සතුව තිබීමේ ප්‍රතිලාභය පිළිබඳව, ඒ සඳහා පත්කරන ලද කමිටුවක් විසින් වාර්තාවක් ඉදිරිපත් කරන ලද අතර, එහි නිර්දේශ සැලකිල්ලට ගනිමින් අදාල නිෂ්පාදන වාහන ආයතනය සඳහා මිලදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත. (කැණීම් යන්ත්‍ර 01 සහ ටිපර් 02) |
| **4. නියැදි පරීක්ෂණ සහ තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලියේ සංවර්ධනය - රසායනාගාර ප්‍රතීතනය** | 3,500,000.00 | ප්‍රතීතනය කර ඇති රසායනාගාර පහසුකම් සහ තත්ත්ව පරීක්ෂණ ක්‍රියාවලීන් හඳුන්වා දීම තුලින්, ජාතික සහ ජාත්‍යන්තරව පිළිගත හැකි මට්ටමේ තත්ත්ව සහතික නිකුත් කිරීමට කටයුතු කිරීම |
| **5. නව කිරුම් යන්ත්‍රයක් (Weight Bridge) යන්ත්‍රයක් සවි කිරීම** | 11,000,000.00 | එප්පාවල ව්‍යාපෘතිය මගින් සිදුකරනු ලබන භාණ්ඩ නිෂ්කාෂණ කටයුතු කඩිනම් කිරීමට අපේක්ෂා කෙරේ. |
| **6. පවතින ගිණුම් පැකේජය වැඩිදියුණු කිරීම** | 7,200,000.00 | දැනට අප විසින් භාවිතා කරනු ලබන ගිණුම්කරණ මෘදුකාංගය 2004 වර්ෂයේදී දී මිලදී ගෙන ඇති අතර, එය වසර 20 ක් පමණ පැරණිය. මෙම පැකේජය වර්ථමානයේ මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීමේදී, තාක්ෂණික සහ යෙදුම් සඳහා බොහෝ සීමාවන් පවතින බැවින්, එය හැකි ඉක්මනින් වැඩිදියුණු කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වේ. |
| | **247,700,000.00** | |

# 22

# සී/ස බී.සී.සී. ලංකා සමාගම (BCC)

## 22.1 හැඳින්වීම

සීමාසහිත බීසීසී ලංකා ලිමිටඩ් 1988 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය සතු කොටස් 10,000,000 ක කොටස් ප්‍රාග්ධනයක් සහිත සීමිත වගකීම් සහිත පොදු සමාගමක් ලෙස සංස්ථාගත කරන ලද අතර එය 1987 අංක 23 දරන පොදු පනත යටතේ රාජ්‍ය සංස්ථාවක් සහ රජය සතු ව්‍යවසායක් බවට පරිවර්තනය කරන ලදී.

බීසීසී ලංකා යනු රජය මගින් පාලනය වන පාරිභෝගික නිෂ්පාදන සැපයුම්කරුවෙකි. සමාගමේ ප්‍රධාන ව්‍යාපාරය වන්නේ දේශීයව නිෂ්පාදනය කරන ලද ආහාරයට ගත හැකි පොල්තෙල් සහ සබන්, සේදුම්කාරක, විෂබීජ නාශක නිෂ්පාදනය, විකිණීම සහ බෙදා හැරීමයි.

### සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

- පොල්තෙල් පිරිපහදු කිරීම
- ඇඟ ගල්වන සබන් සහ , පිරිසිදු කිරීමේ සබන් නිෂ්පාදනය
- විෂබීජ නාශක සහ සේදුම්කාරක නිෂ්පාදනය
- සමාගම විසින් පත් කරන ලද නියෝජිතයින් හරහා " බීසීසී " නමින් නිෂ්පාදන දේශීය වෙළඳපොළට බෙදා හැරීම
- ගිවිසුම් සහ තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටි මගින් නවීන වෙළඳ ව්‍යාපාර වෙත සෘජු විකුණුම්
- බීසීසී ලංකා ලිමිටඩ් සතු කාර්යාල සහ ගබඩා ඉඩකඩ කුලියට දීම.


## 22.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### මූල්‍ය සහ භෞතික ඉලක්ක ඉටුකිරීම


| විස්තරය | භෞතික ප්‍රගතිය (මෙ.ටො.) | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | | | සටහන් |
|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | සත්‍ය | ඉටුකිරීම | ඉලක්කය | සත්‍ය | ඉටුකිරීම | |
| සබන් සහ වෙනත් | 292 | 98 | **34%** | 179 | 58 | **32%** | සබන් අමුද්‍රව්‍ය හිඟකම සහ ඉහළ මිල නිසා සබන් නිෂ්පාදනය සාක්ෂාත් කර ගැනීම සාපේක්ෂව අඩුවී ඇත. |
| පොල් තෙල් | 872 | 533 | **61%** | 809 | 516 | **63%** | |

*මූලාශ්‍රය: සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම*

### භෞතික ප්‍රගතිය




### මූල්‍ය ප්‍රගතිය





*මූලාශ්‍රය: සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම*

### මූල්‍ය කාර්යසාධන සැසඳුම

| | **2023** ජන. - දෙසැ (රු.මි.) | **2024** ජන. - දෙසැ (රු.මි.) | **2024, 2023 ට සාපේක්ෂව % ලෙස** |
|---|---|---|---|
| ශුද්ධ විකුණුම් | 850.17 | 827.99 | -2.60% |
| කුලී සහ වෙනත් ආදායම් | 127.36 | 108.54 | -14.77% |
| අමුද්‍රව්‍යවල පිරිවැය | 704.55 | 701.57 | -0.42% |
| දළ ලාභ ආන්තිකය | **272.98** | **234.96** | **-13.92%** |
| මුළු වියදම *( ක්ෂය පිරිවැය හැර) ක්ෂය වීම | 134.95 | 159.06 | 17.86% |
| ක්ෂය වීම | 4.44 | 6.90 | 55.40% |
| ශුද්ධ ලාභය | **133.59** | **69.00** | **-48.34%** |

*මූලාශ්‍රය: සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම*




*මූලාශ්‍රය: සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම*

**විකුණුම් සහ නිෂ්පාදන**

| | විකුණුම් වටිනාකම (රු. මි.) | | නිෂ්පාදනය ප්‍රමාණය (මෙ.ටො.) | |
|---|---|---|---|---|
| | පිරිපහදු | සබන් | පිරිපහදු | සබන් |
| ජනවාරි | 39.71 | 3.75 | 54.90 | 19.78 |
| පෙබරවාරි | 54.52 | 8.93 | 51.89 | 14.46 |
| මාර්තු | 88.72 | 8.92 | 87.01 | 20.29 |
| අප්‍රේල් | 51.63 | 5.89 | 53.94 | 5.05 |
| මැයි | 49.13 | 7.25 | 60.18 | 5.33 |
| ජූනි | 53.92 | 6.16 | 51.23 | 11.06 |
| ජූලි | 57.74 | 7.66 | 60.61 | 13.40 |
| අගෝස්තු | 60.47 | 6.18 | 47.13 | 10.17 |
| සැප්තැම්බර් | 60.70 | 2.92 | 65.72 | 5.21 |
| ඔක්තෝබර් | 69.14 | 6.83 | 58.38 | 12.7 |
| නොවැම්බර් | 75.74 | 2.91 | 74.63 | 2.56 |
| දෙසැම්බර් | 93.80 | 5.37 | 69.73 | 8.20 |
| මුළු | **755.23** | **72.76** | **735.35** | **128.21** |

*මූලාශ්‍රය: සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම*

## 22.3 අනාගත සැලසුම් - 2025

- **පොල්තෙල් නිෂ්පාදන සහ සබන් නිෂ්පාදන නිෂ්පාදනය**

  2024/25 මූල්‍ය වර්ෂය තුළ උසස් තත්ත්වයේ පොල්තෙල් මෙට්‍රික් ටොන් 1278 ක් සහ සබන් සහ සබන් ආශ්‍රිත නිෂ්පාදන මෙට්‍රික් ටොන් 569 ක් නිෂ්පාදනය කිරීමට ඉලක්ක කර ඇත.

- **නවීන තාක්ෂණයෙන් යුත් නව සබන් කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම**

  දැනට පවතින සබන් සහ ඩිටර්ජන්ට් නිෂ්පාදන යන්ත්‍රෝපකරණ වෙනුවට නවීනතම ස්වයංක්‍රීය යන්ත්‍ර සූත්‍ර සමඟින් ආකර්ෂණීය නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වා දීමට සමාගම සැලසුම් කර ඇත.

- **පවතින ගබඩා ප්‍රතිසංස්කරණය කිරීම සහ කුලියට ගත් ඉඩ ප්‍රමාණය අගය වැඩිවන ලෙස වැඩිදියුණු කිරීම**

  හවුල් ව්‍යාපාරයක් ලෙස සමාගමේ ස්ථාවර ආදායම් මාර්ග පුළුල් කිරීම සඳහා සිසිල් කාමර සහිත නවීන ගබඩා සංකීර්ණයක් සමාගම් පරිශ්‍රයේ ඉදිකිරීමට සැලසුම් කර ඇත.

# 23

# සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම (PCCL)

## 23.1 හැඳින්වීම

සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ලාභ ලබන රාජ්‍ය සමාගමකි.

රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය, ආනයනය සහ බෙදා හැරීම සම්බන්ධ වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් ව්‍යවසායයක් ලෙස, ජලය පිරිසිදු කිරීම සහ දේශීය නිෂ්පාදන කර්මාන්ත සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ලබා ගැනීමේදී සමාගම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සමාගමේ ප්‍රධාන අරමුණු වන්නේ ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න ජාතියක පැවැත්ම සහතික කිරීම සඳහා ප්‍රාථමික රසායනික අංශයේ රසායනික කර්මාන්තවල රසායනික ද්‍රව්‍ය හැසිරවීමේ හොඳම භාවිතයන් හඳුනා ගැනීමට රාජ්‍ය අංශයේ සක්‍රීය දායකත්වය ලබාදීමයි.

වර්තමානයේ පරන්තන් කෙමිකල් සමාගම දියර ක්ලෝරීන් වෙළඳපොළේ ප්‍රධාන සැපයුම්කරු වන අතර දියර ක්ලෝරීන්වල වෙළඳපල කොටසෙන් 95% ක් සහ අනෙකුත් රසායනික ද්‍රව්‍යවල සැලකිය යුතු කොටසක් ද අත්පත් කරගෙන ඇත. දේශීය ලුණු සඳහා අගය එකතුකිරීමක් සිදුකර නිෂ්පාදනය කරන කෝස්ටික් සෝඩා පතුරු, දියර ක්ලෝරීන් සහ ඒ ආශ්‍රිත වෙනත් රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ ඉතිහාසයක් ඇති සමාගමක් ලෙස ඉදිරි වසර තුන ඇතුළත කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන් ප්‍රදේශයේ පරන්තන් කර්මාන්ත ශාලාව නැවත ස්ථාපිත කිරීමට පරන්තන් කෙමිකල්ස් සමාගම අපේක්ෂා කරයි.

සමාගම ලාභ සහිතව ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන අතර වැටුප් සහ අනෙකුත් දීමනා ඇතුළු සියලු වියදම් ආයතනික අරමුදල්වලින් ගෙවන බව සඳහන් කිරීම සතුටට කරුණකි. වාර්ෂික ලාභාංශ ද මහා භාණ්ඩාගාරයට ගෙවනු ලැබේ.

## සමාගමේ ක්‍රියාකාරකම්

සී/ස පරන්තන් රසායන සමාගමෙහි ප්‍රධාන නිෂ්පාදන කම්හල 1956 සිට 1985 දක්වා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන් හි පිහිටා තිබූ අතර 1956 සිට 1985 දක්වා එහි නිෂ්පාදන ව්‍යාපාර කටයුතු සාර්ථකව ක්‍රියාත්මක විය. 1985 වර්ෂයේ පැවති යුධමය වාතාවරණය හේතුවෙන් මෙම කර්මාන්තශාලාව සම්පූර්ණයෙන්ම විනාශ වූ අතර, මේ වන විට එම කර්මාන්තශාලාව නැවත පරන්තන්හිදී ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියක සමාගම නිරතව සිටී. සමාගම විසින් කෝස්ටික් සෝඩා /ක්ලෝරීන් කර්මාන්තශාලාව නැවත ඉදි කිරීම සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇති අතර සී/ස පරන්තන් රසායන සමාගම විසින් දේශීය වෙළෙඳපොළෙහි ඉල්ලුමට සරිලන පරිදි නිෂ්පාදනයක් ලෙස පොලි ඇලුමිනියම් ක්ලෝරයිඩ් (Poly Aluminum Chloride (PAC)) සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය (Hydrochloric Acid (HCl) නිෂ්පාදන පහසුකම් එම ස්ථානයේ ස්ථාපනය කිරීමට ඉදිරි කටයුතු සැලසුම් කර ඇත.





## 23.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

**මූල්‍ය කාර්යසාධනය**

| විස්තරය | 2024<br>රු.'000 | 2023<br>රු.'000 | % |
|---|---|---|---|
| **ආදායම** | **758,436** | **770,360** | **98** |
| විකුණුම් පිරිවැය | (320,000) | (310,025) | 97 |
| දළ ලාභය | 438,436 | 460,335 | 95 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | **63,500** | **164,220** | **39** |
| **මුළු ආදායම** | **501,936** | **624,555** | **80** |
| මුළු වියදම | (148,692) | (145,295) | 102 |
| මෙහෙයුම් කටයුතුවලින් ලද ලාභය | 291,726 | 316,745 | 92 |
| අඩුකළා- මූල්‍ය පිරිවැය | - | - | |
| බදු පෙර ලාභය (ආසන්න වශයෙන්) | **163,129** | **265,024** | **62** |

*මූලාශ්‍රය: සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම*

## අනෙකුත් අංශවල කාර්යසාධනය

| විෂය | ක්‍රියාකාරකම් | ප්‍රගතිය | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| **ක්ලෝරීන් කෝස්ටික් සෝඩා කර්මාන්තශාලාව ස්ථාපිත කිරීම.** | ශක්‍යතා අධ්‍යයන වාර්තාව අවසන් කර ඇත.<br>සමෝච්ඡ සමීක්ෂණය (contour survey)සහ<br>ජල විද්‍යා සමීක්ෂණය (Hydrology survey)<br>අරමුදල් සම්පාදනය සඳහා මහා භාණ්ඩාගාරයෙන් සහ රේඛීය අමාත්‍යාංශයෙන් උපදෙස් අපේක්ෂා කරයි. | ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අරමුදල් රැස් කිරීම සඳහා භාණ්ඩාගාරයට සහ බැංකු වෙත ඉදිරිපත් කර ඇත.<br>කෙසේ වෙතත් පසුගිය රජය මෙම සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ වර්ගීකරණය කර ඇති බැවින්, මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නතර වී ඇති අතර,නැවත ආරම්භ කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ උපදෙස් අපේක්ෂා කරනු ලැබේ. | 25 |
| පාරිභෝගික වෙළඳපල සඳහා නව භාණ්ඩ හඳුන්වාදීම | පරන්තන් කෙමිකල් සමාගම පසුගිය වසර දෙක තුළ දේශීය පාරිභෝගිකයන් ඉලක්ක කර ගනිමින් නව නිෂ්පාදන නිකුත් කිරීමේ මූලික කටයුතු අවසන් කර ඇත. | ගෘහස්ත පාරිභෝගිකයන් ඉලක්ක කරගත් පහත සඳහන් නව නිෂ්පාදන හතර වෙළඳපලට නිකුත් කිරීමට කටයුතු කර ඇත.<br>1.ඩ්‍රේන් ක්ලීනර් ( Drain Cleaner) - (කාණු පද්ධති පිරිසිදු කිරීම)<br>2.ස්ටේයින් රිමූවර් (Stain Remover) - (ටයිල් හා ගුවුට් මත ඇති පැල්ලම් ඉවත් කිරීම)<br>3.ලොන්ඩ්‍රි බ්ලීච් (Laundry Bleach) - (සුදු රෙදි පිරිසිදු කිරීමට)<br>4.පෙස්ට් වයිප් අවුට් (Pest Wipe Out) - (ගෘහාශ්‍රිත හානිකර කෘමීන් පලවා හැරීමට | 75 |
| සන්නාම ප්‍රතිරූපය සහ සමාගම පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම | තරඟකාරී මාධ්‍ය හරහා ප්‍රචාරණ ව්‍යාපාරය සැකසීමට සැලසුම් කිරීම | ඩිජිටල් මාධ්‍ය සමඟ සන්නාම සක්‍රීය කිරීම සහ ප්‍රවර්ධන ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම<br>නව නිෂ්පාදන සඳහා ලේබල් සැකසීම<br>නිෂ්පාදන ලාංඡන නිර්මාණය කිරීම<br>නිෂ්පාදන විස්තර නිර්මාණය,<br>රූපවාහිනිය, ෆේස්බුක්, යූ ටියුබ් ආදි සමාජ මාධ්‍ය සඳහා වෙළඳ දැන්වීම් සකස් කිරීම | 75 |
| දැනට පවතින ද්‍රව ක්ලෝරීන් ගබඩාව සහ දියර ක්ලෝරීන් නැවත පිරවීමේ ක්‍රියාවලිය ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් ආරක්ෂිත පියවරයන් සමඟ පුළුල් කිරීම | 1.ඉදිකිරීමට අදාළ දෙවන අදියරේ කොන්ත්‍රාත්තුව පිරිනමන ලදි.<br>2.සිලින්ඩර නඩත්තු කටයුතු පුළුල් කිරීම<br>3. භූමියේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු | ගබඩා පහසුකම් සහ පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ඉදිකිරීම් කටයුතුවල II අදියර ආරම්භ කරන ලදී | 70 |

## 23.3 අනාගත සැලසුම් - 2025

| අරමුණ | කාර්යසාධන දර්ශක | 2025 දී අපේක්ෂිත ඉලක්ක |
|---|---|---|
| වැඩි ඉල්ලුමක් ඇති රසායනික නිෂ්පාදන ඉහළ ගුණාත්මක භාවයකින් සහ වැඩි ධාරිතාවකින් නිෂ්පාදනය කිරීම | පරන්තන්හි රසායනික නිෂ්පාදන කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීම | 40% |
| වෙළඳ නාමය වර්ධනය කිරීම | නවීන මාධ්‍ය ප්‍රවණතා යොදා ගනිමින් සන්නාම ප්‍රචාරණය කිරීම | 60% |
| ශ්‍රී ලංකාව තුළ ක්ලෝරීන් නියාමනය කිරීමේ බලතල සහ හැසිරවීමේ අධිකාරී බලය ලබා ගැනීම | සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම නියාමක ලෙස පත් කිරීමට කැබිනට් අනුමැතිය ලැබීම | 40% |
| රසායන වෙළඳපල කොටස් ග්‍රහණය කර ගැනීම සඳහා ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම(95%) | 1. වෙළඳපල ප්‍රමාණය (ආමන්ත්‍රණය කළ හැකි මුළු වෙළඳපොලේ ප්‍රමාණය)<br>2. වෙළඳපොල කොටස (සම්පූර්ණ වෙළඳපොලේ සමාගමේ කොටස | 30%<br><br>80% |
| උසස් තත්ත්වයේ නිෂ්පාදන ආනයනය කිරීම සඳහා ගෝලීය සහ දේශීය නියෝජිතායතන අතර සබඳතාව වැඩිදියුණු කිරීම | ශක්තිමත් සැපයුම් දාමයක් ගොඩනැගීම | 75% |
| තිරසාර බලශක්ති භාවිතයන් හඳුන්වා දීම, පරිසර සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ කාබන් ප්‍රතිශතය අඩු කිරීම. | වගවත්ත ඒකකයේ වහලය මත සූර්ය බලශක්තිය නිෂ්පාදනය කිරීම (වර්ග අඩි 4500) | 100% |
| රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය ඇතිව විශ්ලේෂණ රසායනාගාරයක් පිහිටුවීම | ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අදාළ අධිකාරිය සමඟ මූලික සාකච්ඡාව ආරම්භ කර ව්‍යාපෘති යෝජනාව අපේක්ෂා කරනු ලැබේ. | 25% |

# 24

# ජාතික ලුණු සමාගම (NSL)

## 24.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනය සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ජාතික ලුණු සමාගම සතුව ඇත. එම ආයතනය සාමාන්‍ය ලුණු, අයඩින් මිශ්‍ර ලුණු, කැට ලුණු සහ කාර්මික ලුණු නිෂ්පාදනය කරනු ලබයි. එහි ප්‍රධාන නිෂ්පාදන බිම් මන්නාරම සහ අලිමංකඩ (කිලිනොච්චි දිස්ත්‍රික්කය) යන ප්‍රදේශවල පිහිටා ඇති අතර, එහි පරිපාලන කාර්යාලය කොළඹ පිහිටා ඇත.

ලුණු දෙපාර්තමේන්තුව 1938 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර, විවිධ වූ පරිපාලන අධිකාරීන් යටතේ පැවති එය අවසානයේ දී 2001 වර්ෂයේ සිට මාන්තායි සෝල්ට් ලිමිටඩ් ලෙස නම් කරන ලදී. 2021 වර්ෂයේ ජුනි මාසයේ දී මෙම ආයතනය, ජාතික ලුණු සමාගම ලෙස නැවත නම් කරන ලද අතර, වර්තමානයේ එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ. මෙම සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන ලුණු දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලින් නෙලාගන්නා ලුණු හා සැසඳීමේ දී ගුණාත්මක බවින් ඉතාම ඉහල අගයක ඇති බව පිළිගැනේ. ( එහි 96% ක් සෝඩියම් ක්ලෝරයිඩ් වේ) . දැනට මන්නාරම ලුණු ලේවාය මඟින් වසරකට සකස් නොකළ ලුණු මෙට්‍රික් ටොන් 6,000 ක් ද, එලිෆන්ට්පාස් හී ලුණු මෙට්‍රික් ටොන් 22,000ක් ද නිෂ්පාදනය කිරීමට හැකියාව ඇත.

ජාතික ලුණු සමාගම ස්වාභාවික සම්පත් උපයෝගීතා මධ්‍යස්ථානයක් ලෙස පමණක් නොව, මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන් හි අවදානමට ලක් වූ (පීඩිත) ජනතාවන්ට රැකියා අවස්ථාවන් ද ලබා දෙන මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාත්මක වේ. අද වන විට 63 දෙනෙකුගෙන් සමන්විත වන ස්ථිර කාර්ය මණ්ඩලයක් ද 7 දෙනෙකුගෙන් සමන්විත කොන්ත්‍රාත් / අනියම් සේවක පිරිසක් ද සිටින අතර, දළ වශයෙන් පුද්ගලයින් 160 දෙනෙකුගෙන් සමන්විත වන තාවකාලික කාර්ය මණ්ඩලයක් ආයතනය විසින් සේවයේ යොදවා ඇත.

ජාතික ලුණු සමාගම, මහා භාණ්ඩාගාරයේ සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සාමාජිකයින්ගෙන් සැදුම්ලත් මණ්ඩලය විසින් පාලනය වන අතර, එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ. සමාගමේ නෛතික සහ වගකිවයුතු කාර්යයන් සම්බන්ධ අධීක්ෂණ කටයුතු සහ පහසුකම් සැපයීමේ කටයුතු අමාත්‍යාංශයේ සංස්ථාපිත අංශය විසින් සිදු කරනු ලබයි. එය රාජ්‍ය ව්‍යාපාරයක් වන බැවින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස සමාගම් නීති රීති වලට අනුකූලව ලියාපදිංචි කර ඇත. මේ අතර සමාගමේ නිෂ්පාදනයන් හී ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා මෙම ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සහතික කරනු ලැබේ. එසේම සමාගම ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරනු ලැබේ.

## 24.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### නිෂ්පාදනය

| | ලුණු තැන්පත් කරන ස්ථානය | නිෂ්පාදිත ප්‍රමාණය (මෙ.ටො.) |
|---|---|---|
| 01 | මන්නාරම ලුණු ලේවාය | 2,231 |
| 02 | අලිමංකඩ ලුණු ලේවාය | 12,850 |
| | මුළු එකතුව | 15,081 |

*මූලාශ්‍රය: ජාතික ලුණු සමාගම*

* අලිමංකඩ ලුණු ලේවායේ මේස ලුණු කර්මාන්තශාලා ව්‍යාපෘතිය 85%කින් අවසන් කර ඇත.

**මේස ලුණු කම්හල් ගොඩනැගිල්ල**



**මේස ලුණු බලාගාරය ඉදිකිරීම**



* ලුණු ලේවාය සංවර්ධනය 90%කින් අවසන් කර ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

| # | කාණ්ඩය | මුදල (රු. මි.) |
|---|---|---|
| 01 | විකුණුම් ආදායම | 387.96 |
| 02 | දළ ලාභය | 252.32 |
| 03 | ශුද්ධ ලාභය | 207.06 |

*මූලාශ්‍රය: ජාතික ලුණු සමාගම*

**වියදම් විස්තර**

| # | කාණ්ඩය | වියදම (රු. මි.) | වියදම (රු. මි.) |
|---|---|---|---|
| 01 | පුනරාවර්තන | 182.80 | 81.22% |
| 02 | ප්‍රාග්ධනය | 199.20 | 43.16% |

*මූලාශ්‍රය: ජාතික ලුණු සමාගම*

## 24.3 අනාගත සැලසුම් - 2025

- අලිමංකඩ ලුණු ලේවායේ ලුණු නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අතහැර දැමූ ප්‍රදේශය ප්‍රතිසංස්කරණය කිරීම (අක්කර 50ක් ප්‍රතිසංස්කරණය කෙරේ).

- 2027 වර්ෂයේ සිට වසරකට ලුණු මෙට්‍රික් ටොන් 25,000ක් නිෂ්පාදනය කිරීම සඳහා කුරිංචතිව් ලුණු ලේවාය නැවත ක්‍රියාත්මක කිරීමට මූලික ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- අලිමංකඩ ලුණු ලේවායේ මේස ලුණු නිෂ්පාදනාගාරය ආරම්භ කිරීම සහ මේස ලුණු නිෂ්පාදනය කිරීමත් සමඟ දිවයින පුරා විකුණුම් සහ බෙදා හැරීම පුළුල් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.

- ආයෝජන ප්‍රතිලාභය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාවලි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

# 25

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව (SLCC)

## 25.1 හැඳින්වීම

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහය ලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

ඉන්පසුව 1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01වන දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් ප්‍රතිෂ්ඨාපනය කෙරිණි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයක් මගින් එහි නම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වශයෙන් සංශෝධනය කරන ලදි.අමාත්‍යාංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක වූ මෙම සංස්ථාව මේ වන විට කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව සිමෙන්ති කර්මාන්ත ශාලා තුනක් පැවති අතර 1993 වර්ෂයේදී එම කර්මාන්ත ශාලා ජනතාකරණයට භාජනය වීමත් සමග පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාවේ සහ රුහුණු සිමෙන්ති කර්මාන්ත ශාලාවේ අයිතිය අහිමි විය.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතිනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව පමණක් වන අතර එය 1990 ජුනි මාසයේ සිට ආරක්ෂක හේතූන් සහ සිමෙන්ති කර්මාන්තශාලාවේ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ විනාශ වීම යනාදී හේතූන් මත අක්‍රියව පවතී.

## කාර්යයන්

1956.11.02 දිනැති ගැසට් පත්‍රය සහ 1964.05.11 දිනැති ගැසට් පත්‍රය මගින් පහත සඳහන් ක්‍රියාකාරකම් සංස්ථාවට පවරා ඇත.

- සිමෙන්ති නිෂ්පාදනය හා විකිණීම
- සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට් වලින් නිෂ්පාදනය කරනු ලබන දුරකථන සහ විදුලි පණිවුඩ හුවමාරු කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය ආදීය නිපදවීම හා අලෙවි කිරීම.
- ඕනෑම පුද්ගලයෙකුට විදුලි බලය තොග වශයෙන් සැපයීම
- සිමෙන්ති නිෂ්පාදනය, ආනයනය කිරීම හා විකිණීම

2016.07.31 දින ක්‍රියාත්මක වූ ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයෙන් පසු ඉදිරි කටයුතු සිදු කල යුතු ආකාරය පිළිබඳව උපදෙස් අංක MIN/R/07/06/07 හා 2016.10.27 දිනැති කර්මාන්ත අමාත්‍යාංශය විසින් සකස් කර තිබෙන ලිපියේ සඳහන් කර ඇත.එහිදි රටේ ක්ලින්කර් නිධියේ භාරකාරිත්වය සතු වන බැවින් ඊට සුදුසු ආයෝජකයින් සොයා බදු අදායම් එකතු කර මෙහෙයවීම් කටයුතු සිදු කර ඉතිරිය භාණ්ඩාගාරයට සම්ප්‍රේෂණය කිරිමට උපදෙස් ලබා දී ඇත.

2017 අප්‍රේල් මාසයෙන් පසු සිමෙන්ති ආනයනය කර නොමැත. සංස්ථාව සතු ඉඩම් වලට අදාල කුලී ආදායමෙන් නැවතත් සංස්ථාව ස්ථාවර තත්වයට නගා සිටුවීමට බලාපොරොත්තු වේ. 2016.07.31 දින ක්‍රියාත්මක වූ ස්වෙච්ඡා වන්දි යෝජනා ක්‍රමයෙන් පසු ස්ථිර සේවකයින් 14දෙනෙකු ඉතිරි වූ අතර මේ වන විට ඉන් සේවකයින් 09 දෙනෙකු සේවයේ නියුතු වේ.

## 25.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

| ප්‍රධාන ක්‍රියාකාරකම් | මූල්‍ය ප්‍රගතිය - 2024.01.01 සිට 2024.12.31 | |
|---|---|---|
| | පිරිවැටුම (රු.මි) | වියදම් (රු.මි.) |
| ඉඩම් කල්බදු දීම් හා කුලියට දීම මගින් ලැබෙන ආදායම් | 115.77 | 56.57 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව*

## 25.3 අනාගත සැලසුම් - 2025

**කන්කසන්තුරේ සිමෙන්ති නිෂ්පාදනාගාරය**

පැරණි කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව පිහිටි භූමිය පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් මේවන විට ක්‍රියාත්මක වන අතර ඉන්පසු සිමෙන්ති නිෂ්පාදනාගාරයක් හා ඇසුරුම්ගාරයක් ස්ථාපිත කිරිමට අදාළ ඇගයිම් හා අනුමැතින් ලබාගෙන සුදුසු ආයෝජකයෙකු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව තෝරා ගැනිමට කටයුතු කරනු ලැබේ.

**හුණුගල් යොදා ගනිමින් අඩු වියදම් අඩු බර ගලි නිෂ්පාදනය**

අරුවක්කාලු හුණුගල් නිධියේ සිමෙන්ති නිෂ්පාදනයට හුණුගල් භාවිතා කිරීමෙන් පසු ඉතිරි වන හුණුගල් කොටස් යොදා ගනිමින් අඩු වියදම් පරිසර හිතකාමි නිවාස ඉදිකිරීමට යෝග්‍ය සමුච්චිත ගල් නිෂ්පාදනයට අදාලව 2016 වර්ෂයේ ව්‍යාපාතියක් ඉදිරිපත් කර ඒ සම්බ්නධ සාකච්ඡා සිදු කරමින් පවතී.සමුච්චිත ගල් නිෂ්පාදනය සඳහා තාක්ෂණික දැනුම හිමි එම ආයතන විසින් ඉදිරිපත් කර තිබෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අනුමත කල යුතු ක්‍රියාපටිපාටිය පිළිබඳව අමාත්‍යාංශයේ උපදෙස් ඉල්ලා ඇත.

**කොල්ලුපිටියේ ඉඩම**

පර්චස් 87.7ක වපසරියකින් යුත් ඉහල වටිනාකමින් යුත් මෙම ඉඩමේ සුදුසු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිමට යෝජිතය.

**අරුවක්කාලු හුණුගල් සහිත ඛණිජ නිධිය**

1993 වර්ෂයෙදි මෙම හුණුගල් නිධිය මතුපිට ඛණිජ ද්‍රව්‍ය තිබෙන බව සොයා ගෙන ඇත. 2023 වර්ෂයේදී ඉල්මනයිට් නිස්සාරණය කර වටිනාකම් එකතු කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ගිවිසුම් ගතව තිබුණද,මේ සම්බන්ධයෙන් ගැටළුකාරි තත්ත්වයක් මේ වන විට උත්ගතව ඇත.

**නිවාඩු නිකේතනය නවිකරණය කිරිම**

සිමෙන්ති සංස්ථාවට අයත් පැරනි ආරක්ෂක නිවහන,නිවාඩු නිකේතනයක් ලෙස නාවික හමුදාවේ ශ්‍රම දායකත්වය සහිතව නවීකරණය කිරිමට යෝජිතය.

# 26

# ලංකා ලේලන්ඩ් සමාගම (LLL)

## 26.1 හැඳින්වීම

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) ලිමිටඩ් (සමාගම) යනු 1938 අංක 51 දරන සමාගම් ආඥාපනත යටතේ සංස්ථාපිත කර 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද සම්පූර්ණයෙන්ම රජය සතු සීමිත වගකීම් සමාගමකි.

ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් 41.77%ක් ලංකා ලේලන්ඩ් සමාගම සතු වන අතර, ලාංකීය මහජනතාව සතුව 30.38%ක ප්‍රමාණයක් ද ඉතිරි 27.85%ක කොටස් අයිතිය බද්ධ ව්‍යාපාරයේ ප්‍රධාන කාර්මික හවුල්කරුවා වන ඉන්දියානු අශෝක් ලේලන්ඩ් සමාගම සතුව ද පවතී.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම හි ප්‍රධාන පරමාර්ථය වන්නේ අවශ්‍ය උපාංග නිෂ්පාදනය කිරීමයි. එමෙන්ම ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම විසින් ශ්‍රී ලංකාව තුල තාක්ෂණික හුවමාරුව දිරිගැන්විය යුතුයි.

**ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම හි ප්‍රධාන ක්‍රියාකාරකම්**

- ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමෙහි වාහන එකලස් කිරීම සඳහා දේශීය උපාංග නිෂ්පාදනය අධීක්ෂණය කිරීම සහ පෙළඹවීම.
- භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු වල ආයෝජනය.

# 27

# ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA)

## 27.1 හැඳින්වීම

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය 2024 වසරේ දී දේශීය පේෂකර්ම, ඇඟළුම්, සම් භාණ්ඩ හා පාවහන් කර්මාන්ත වැඩි දියුණු කිරීමෙහිලා අඛණ්ඩ කැපවීමකින් යුතුව කටයුතු කළේය. නිපුණතා සංවර්ධනය, පර්යේෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍ර පුළුල් කිරීම සහ අධ්‍යාපනික වැඩසටහන් සකස් කිරීම යනාදී කාර්යයන් වලදී කර්මාන්තය තුළින් මතු වන අවශ්‍යතා සමග අනුගත වන පරිදි කටයුතු කිරීම කෙරෙහි ආයතනය අවධානය යොමු කරන ලදි. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකේය කර්මාන්තවල තරඟකාරීත්වයට දායකත්වය සපයමින් තාක්ෂණික සහාය, අධ්‍යාපනය, සහ සහතික ලබා දීමෙහිලා මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. දැනට ආයතනය විසින් මූලාරම්භ කර ඇති වැඩසටහන් මගින් දැනුම පාදක කර ගත් නිර්මාණශීලී කර්මාන්ත ක්ෂේත්‍රයක් ඇති කර දේශීය ශ්‍රම බලකායේ හැකියාව කැපී පෙනෙන ලෙස ඉහළ නංවා ඇත.

## 27.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### 1. කර්මාන්තයේ වර්ධනය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම

කර්මාන්තයේ වර්ධනයට අනුබල සැපයීමෙහිලා ගන්නා ලද සාමූහික ප්‍රයත්නයේදී, ඩිප්ලෝමා පාඨමාලාවන්හි විෂය නිර්දේශ කර්මාන්තයේ අවශ්‍යතාවලට වඩාත් හොඳින් ගැලපෙන පරිදි සකස් කිරීම පිණිස පූර්ණ සමාලෝචනයකට භාජනය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් වැඩසටහන් දෙකක කටයුතු නිම කර අතිරේක වැඩසටහන් හතරක් සඳහා ප්‍රතීතනය ලබා දෙන ලදී. පේෂකර්ම සහ ඇඟලුම් අංශය වර්ධනය කිරීමේ අරමුණෙන් යුතුව, පාසැල් හැරයන්නන්ගේ

දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සහ සේවකයන් ක්ෂේත්‍රය තුළ රැඳී සිටීම ඉහළ නැංවීම ඉලක්ක කරදැනුවත් කිරීමේ සැසි පහක් සංවිධානය කරන ලදී. ආරම්භක ඉලක්කයෙන් 70%ක් සාක්ෂාත් කර ගනිමින්, ළමා ඇඳුම් ක්ෂේත්‍රය තුළ සෞඛ්‍ය සම්පන්න බව සහ ආරක්ෂිත බව සහතික කිරීමේ කාර්යය වෙනුවෙන්ම කැප වූ නව ඒකකයක් ස්ථාපනය කර ඇත. කර්මාන්තයේ අභිවෘද්ධිය පිණිස උපදේශන සේවාවන් 2 සිදු කල අතර එය වර්ෂයේ ඉලක්කයෙන් 100% ක ප්‍රගතියකි. කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ කටයුතු 90%කින් නිම කිරීමත් රුපියල් මිලියන 1.72ක මූල්‍ය ආයෝජනයක උපකාරයෙන් කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් පවත්වා ගෙන යාමට කැප වී කටයුතු කිරීමත් සමග ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය හැකියා වර්ධනයෙහිලා කැපී පෙනෙන දියුණුවක් අත්පත් කර ගෙන ඇත. තවද, සමකාලීන කර්මාන්ත සහ අධ්‍යයන ප්‍රමිතීන් සපුරාලන අයුරින් ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතන පනත යාවත්කාලීන කිරීමේ අරමුණ ඇතිව එය සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර මූලික දත්ත එක් රැස් කිරීමේ කාර්යය ආරම්භ කර එම ක්‍රියාවලියෙන් 10%ක් නිම කර ඇත.

## 2. දැනුම පාදක කර ගත් නිර්මාණශීලී කර්මාන්තයක්

ඉතා වැදගත් පරිණාමන ක්‍රියාදාමයක අවසානයේ දැනුම පාදක කර ගත් නිර්මාණශීලී කර්මාන්තයක් පවතින අතර නව නිෂ්පාදන වාණිජ්‍යකරණය කිරීම තුළ එහි වැඩි දියුණු වීම සිදු වනු ඇත. නවෝත්පාදනයට සහ ප්‍රායෝගික ව්‍යවහාරයට උපකාරී වන ශක්තිමත් අධ්‍යාපනික රාමුවක් පිළිබඳ සංඥා කරමින් පේෂකර්ම හා ඇඟළුම් ක්ෂේත්‍රයන්හි විද්‍යාවේදී උපාධිය හා තාක්ෂණවේදී උපාධිය හා සම්බන්ධ කටයුතු 80%කින් නිම කර ඇති බැවින් මෙහි ප්‍රගතිය පැහැදිලි ය. ඊට සමගාමීව, ශක්තිමත් පර්යේෂණ සංස්කෘතියක් ස්ථාපනය කිරීමේ සාමූහික ප්‍රයත්නයක් ඇත. මෙම මූලාරම්භක වැඩසටහන විද්වත් ප්‍රජාවේ සහ පර්යේෂණ ආයතනවල උපායමාර්ගික සහයෝගිතාවය තුළින් ඉදිරි හය මාසයක කාලය තුළ වැඩි දියුණු වනු ඇත. මෙහි අරමුණ වන්නේ පේෂකර්ම හා ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ පවත්නා ලේශ මාත්‍ර අවශ්‍යතාවයන් හා සමීපව අනුගත වන පර්යේෂණවලට සහාය වීමයි. මෙම ද්විවිධ ප්‍රවේශය,ආයතනයට අධ්‍යයන ක්ෂේත්‍රය තුළ විශිෂ්ටත්වය කරා එළඹීමට පිටුබලයක් සපයනවා පමණක් නොව මෙම කර්මාන්තය, නූතන වෙළඳපොළ අභියෝගයන්ට මුහුණ දීමට සූදානමින් නවෝත්පාදන ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛ ස්ථානයේ රැඳවීමසහතික කරයි.

## 3. ජාතික කර්මාන්ත පදනම තුළ පවත්නා අවශ්‍යතා හා නිපුණතා අතර පරතරයට පිළියම් යෙදීම

ජාතික කර්මාන්ත පදනම තුළ පවත්නා අවශ්‍යතා හා නිපුණතා අතර පරතරයට පිළියම් යෙදීමේ ප්‍රයත්නයේ දී ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය මගින් අධ්‍යාපනික වැඩසටහන් මාලාවක් දියත් කරමින් පූර්ව ක්‍රියාකාරී බවකින් යුතුව කටයුතු කර ඇත. මෙම වැඩසටහන් මාලාවට කර්මාන්තය හා සම්බන්ධ නිපුණතා සංවර්ධනය කිරීම ඉලක්ක කර ගත් විවිධ ඩිප්ලෝමා වැඩසටහන්වලට අමතරව ලව්ලි ප්‍රොෆෙෂනල් විශ්ව විද්‍යාලය සමග සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලබන විලාසිතා නිර්මාණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාවක් ඇතුළත් වේ. අධ්‍යාපනික අභිවර්ධනය කෙරෙහි ආයතනය දක්වන කැපවීම පිළිබිඹු කරමින් මෙම පාඨමාලාවල විෂය නිර්දේශ සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. ඊට අමතරව, සහතිකපත්‍ර පාඨමාලා 39ක් සහ කෙටි පාඨමාලා 51ක් ඉදිරිපත් කරමින් ආයතනය වෘත්තීය සංවර්ධනය තුළ සිය අභිමතාර්ථ අභිබවා ගොස් ඇත. තවද, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය වැඩමුළු 2ක් පැවැත්වූ අතර කර්මාන්තයේ සේවකයින් ඇගයීමේ වැඩසටහන් 2ක් පවත්වා සේවකයින් 72 ක කුසලතා ඇගයීමට ලක්කරන ලදී. එසේම පාඨමාලා පුහුණුවන්නන් 2741 සඳහා වැඩසටහන් 132 ක් ද පවත්වන ලදී. මෙහිදී, ආරම්භක ඉලක්කය වූ විභාග 29,900 ට වඩා ඉතා ඉහළ මට්ටමකට ළඟා වෙමින් විභාග 27,036 ක් සාර්ථක ලෙස පවත්වා

ඇත. තවද, පෙර දැනුම ඇගයීම (RPL) තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් සහතික කිරීම වැදගත් සන්ධිස්ථානයක් වී ඇති අතර යෝග්‍ය අපේක්ෂකයින්හට දැනටමත් සහතික දහයක් ප්‍රදානය කර ඇත. මෙම බහුවිධ ප්‍රවේශ මගින් පෙන්නුම් කරනු ලබන්නේ විකසනය වෙමින් පවත්නා පේෂකර්ම හා ඇඟළුම් කර්මාන්තය තුළ සිය පෞද්ගලික දියුණුව සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ප්‍රවීණතාවලින් පුද්ගලයින් සන්නද්ධ කිරීමට ආයතනය දැක් වූ කැප වීමයි.

## 4. පේෂකර්ම, වෘත්තීය අධ්‍යාපනය හා පුහුණු අංශය සමග කර්මාන්තයේ පවත්නා සම්බන්ධය

ශ්‍රී ලංකාවේ, පේෂකර්ම, වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු අංශය, විශේෂයෙන්ම ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය හරහා, කර්මාන්ත සබඳතා ශක්තිමත් කර ගැනීමෙහිලා සැළකිය යුතු අන්දමේ ප්‍රගතියක් අත්පත් කර ගනිමින් සිටී. අධ්‍යාපනික වැඩසටහන්වල ප්‍රතිඵල කර්මාන්තයේ අවශ්‍යතා සමග මනාව ගැලපීම සඳහා ඉතා වැදගත්වන ආංශීය උපදේශන සේවා පහසුකම් ලබා දෙමින් ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය,ඇඟළුම් සහ පාවහන් උපදේශක කමිටු සමග සිය සබඳතා පවත්වා ගැනීමේ දී පූර්ව ක්‍රියාශීලී බවකින් කටයුතු කර ඇත. මෙම සහයෝගිතාව පේෂකර්ම, ඇඟළුම්, සම් භාණ්ඩ හා පාවහන් අංශවල පුහුණු මිනිස්බල සම්පත සඳහා පවතින ඉල්ලුම සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඉතාමත් තීරණාත්මක වේ. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය සිය විෂය නිර්දේශ හා පුහුණු වැඩසටහන් නිරන්තරයෙන්ම කර්මාන්තයේ මතුවන අවශ්‍යතා හා අනුගත වන අන්දමින් සකස් කිරීම මගින් ශ්‍රම බලකායට මෙම ක්ෂේත්‍ර තුළ ස්වකීය දියුණුව සලසා ගැනීමට අවශ්‍ය නිපුණතාවලින් සහ දැනුමෙන් පෝෂණය කිරීමේ කාර්යභාරය ඉටු කරයි. ආයතනය විසින් දැනට දරන ප්‍රයත්නයන් ගෙන් පිළිබිඹු වන්නේ අවසානයේ රටේ ආර්ථික වර්ධනයට සහ තාක්ෂණික දියුණුවට දායකවන අන්දමේ ශක්තිමත් සබඳතාවක් අධ්‍යාපනය සහ කර්මාන්තය අතර ඇති කිරීමට එය දක්වන කැපවීමයි.

## 5. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ප්‍රවර්ධනය කිරීම

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ප්‍රවර්ධනය කිරීම ආර්ථික වර්ධනය සඳහා තීරණාත්මක වන අතර විශේෂයෙන්ම තරුණයින් සහ කාන්තාවන් වෙනුවෙන්ම සකසන ලද නිපුණතා සංවර්ධන වැඩසටහන් මගින් එය සිදු කිරීම ඉතා වැදගත් වේ. මෙම මූලාරම්භක වැඩසටහන් පේෂකර්මාන්තය සහ පාවහන් කර්මාන්තය වැනි ප්‍රධාන අංශ තුළ ව්‍යවසායකත්වය සහ නවෝත්පාදනය දිරිමත් කිරීමෙහිලා මූලික වේ. ඉලක්කගත පුහුණු කිරීම් සහ සම්පත් සපයා දෙමින්, මෙම වැඩසටහන් මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය තුළ ස්වකීය දියුණුව සලසා ගැනීමට අවශ්‍ය නිපුණතාවලින් පුද්ගලයින්ව සවිබල ගන්වයි. මෙහිදී ඔවුන්ගේ පෞද්ගලික දියුණුව ඉහළ නැංවෙනවා පමණක් නොව කර්මාන්තයේ අභිවෘද්ධිය හා තරඟකාරිත්වය මෙහෙයවීමේ හැකියාව සහිත පුහුණු ශ්‍රම බලකායක් නිර්මාණය වීමෙන් වඩාත් පුළුල් ආර්ථික ව්‍යූහයක් නිර්මාණය කිරීමෙහිලා දායකත්වය ලබා දේ. මෙම ක්ෂේත්‍ර තුළ අත්පත් කර ගන්නා ප්‍රගතිය මගින් සනිටුහන් වන්නේ අන්තර්කරණය වූ තිරසාර ආර්ථික සංවර්ධනයක් දෙසට පවත්නා ධනාත්මක නැඹුරුවයි.

## 6. වැඩ ක්‍රියාවලි සරල කිරීම

ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීමේ ක්‍රමය සහ විද්‍යාගාර පර්යේෂණ සේවා උසස් තත්ත්වයට පත් කිරීමේ කටයුතු සරල කිරීම මෑතක දී නිම කිරීමත් සමගම ආයතනයේ වැඩ ක්‍රියාවලි සරල කිරීමේ කාර්යය කැපී පෙනෙන ලෙස ඉදිරියට ගමන් කර ඇත. මෙවැනි වැඩි දියුණු කිරීම් හේතු කොට ගෙන ලිපි කටයුතුවල කැපී පෙනෙන අඩු වීමක් සිදු වී ඇති අතර එමගින් වඩාත් කාර්යක්ෂම සහ විධිමත් සේවා සැපයීමකට මග පෑදී ඇත. ලියාපදිංචි කිරීම සඳහා නවීන ක්‍රමවේද භාවිතය හේතු කොට ගෙනසිසුන්ට දැන් වඩාත් පහසුවෙන් පාඨමාලාවලට ලියාපදිංචි වී අධ්‍යාපනික සම්පත් වෙත ප්‍රවේශ වීමේ

හැකියාව ලබා දී ඇත. මේ අතර යාවත්කාලීන කරන ලද විද්‍යාගාර පරීක්ෂණ සේවා ආධාරයෙන් පරීක්ෂණ ප්‍රතිඵල කඩිනමින් ලබාදීමේ හැකියාව මෙන්ම එම ප්‍රතිඵලවල නිරවද්‍යතාව ඉහළ නංවා ඇත. සමස්තයක් වශයෙන් ගත් කල, මෙම වැඩි දියුණු කිරීම් සිසුන්ට හා කාර්ය මණ්ඩලයට එක සේ ප්‍රතිලාභ අත්කර දෙන වඩාත් ජවසම්පන්න හා වඩාත් සංවේදී පරිපාලන වටාපිටාවක් ඇති කිරීම සඳහා දායක වී ඇත.

### 7. පුනරාවර්තන වියදම් අඩු කිරීම

හරිත ක්‍රම ක්‍රියාත්මක කිරීම, විශේෂයෙන්ම සූර්ය බලශක්තිය යොදා ගැනීම, පුනරාවර්තන වියදම් අඩු කිරීම සඳහා ගන්නා ලද පරිවර්තනීය පියවරක් වී ඇත. මෙම උපාය මාර්ගික මාරු වීම තිරසාර පරිචයන් සමග අනුගත වීමට පමණක් නොව විදුලිබල පිරිවැය 65%ක් තරම් සැහෙන ප්‍රමාණයකින් අඩු කර ගැනීමට හේතු වී ඇත. මෙයට ඌන පූරණයක් වශයෙන්, ජල සංරක්ෂණ ක්‍රම යොදා ගැනීම මගින් පිරිවැය ඉතිරිය තවදුරටත් ඉහළ නංවාගෙනඇත. මෙයින් අවධාරණය කරනු ලබන්නේ මූල්‍යමය කාර්යක්ෂමතාව සාක්ෂාත් කර ගැනීමේ දී පාරිසරික වශයෙන් සංවේදී මූලාරම්භ වැඩසටහන්වල ඵලදායීතාවයයි. සමස්තයක් වශයෙන් ගත් කල, මෙවැනි ප්‍රයත්නයන් මගින් පිළිබිඹු වන්නේ ආයතනය මෙහෙයුම් පිරිවැය කළමනාකරණය පිණිස දූරදර්ශී ලෙස කටයුතු කර ඇති බව ය. මෙහිදී හරිත තාක්ෂණය තුළ ආයෝජනය කිරීමෙන් ධනාත්මක පාරිසරික බලපෑම්වලට සමගාමීව සැළකිය යුතු ආර්ථික ප්‍රතිලාභ අත්කර ගත හැකි බව පෙන්නුම් කර ඇත.

## 27.3 අනාගත සැලැසුම් - 2025

- **විෂය නිර්දේශ පුළුල් කිරීම :** නව ඩිප්ලෝමා වැඩසටහන් ප්‍රතීතනය සඳහා ප්‍රමුඛත්වය ලබා දීම සහ කර්මාන්තයේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි විෂය නිර්දේශ යාවත්කාලීන කිරීම.
- **පර්යේෂණ සහ සංවර්ධන කටයුතු:** කර්මාන්තයට අදාළ නවෝත්පාදන දිරිමත් කිරීම සඳහා විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන සමග පවත්නා හවුල් සබඳතා ශක්තිමත් කිරීම.
- **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙත පුළුල් සහායක් දැක්වීම:** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සිටින තරුණ සහ කාන්තා ව්‍යවසායකයින්ගේ නිපුණතා සංවර්ධනය සහ වෙළඳපොළ ප්‍රවේශය සඳහා ඇති ඉඩහසර පුළුල් කිරීම පිණිස නව වැඩසටහන් දියත් කිරීම.
- **තිරසාරබවේ මූලාරම්භයන්:** පරිසර හිතකාමී හුරුපුරුදු ප්‍රවර්ධනය කිරීම පිණිස සූර්ය බලශක්තිය යොදා ගැනීම සහ ජල සංරක්ෂණ ක්‍රම භාවිතය ඉහළ දැමීම
- **පනත සංශෝධනය කිරීම:** ආයතනයේ නෛතික ව්‍යුහය යළි බලගැන්වීම මගින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ කර්මාන්තය වෙත ලබා දෙන සේවාව වැඩි දියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතන පනත සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- **විද්‍යාගාර පහසුකම් පුළුල් කිරීම:**අති නවීන පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා සහාය දැක්වීම පිණිස නූතන විද්‍යාගාර පහසුකම් ඇති කිරීම. **පෙර දැනුම ඇගයීමේ අංශයක් (RPL) ස්ථාපනය කිරීම:** විධිමත් අධ්‍යාපන ක්‍රමවේදයෙන් ඔබ්බට ගොස් අත්පත් කරගත් නිපුණතා සහ දැනුම හඳුනාගෙන සහතික කිරීම සඳහා **පෙර දැනුම ඇගයීමේ අංශයක්** (RPL) ස්ථාපනය කිරීම.
- **සෞඛ්‍ය සම්පන්න බව හා ආරක්ෂිත බව සහතික කිරීම:** නිෂ්පාදනයේ ආරක්ෂිත බව සහ පාරිභෝගික විශ්වාසය තහවුරු කිරීම පිණිස ළමා ඇඟළුම් සඳහා සෞඛ්‍ය සම්පන්න බව හා ආරක්ෂිත බව සම්බන්ධයෙන් සහතිකයක් නිකුත් කිරීම
- **යටිතලපහසුකම් සංවර්ධනය:** නවීන පුස්තකාලයක්, ශ්‍රවණාගාරයක් සහ අති නවීන විලාසිතා සැකසුම් මැදිරියක් පිහිටුවීම සඳහා නව ගොඩනැගිලි සංකීර්ණය නවීකරණය කිරීම

# 28

# ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)

## 28.1 හැඳින්වීම

ජාතික මෝස්තර මධ්‍යස්ථානය 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද, මේ වන විට කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දේශිය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය නංවාලීම තුළින් ශිල්පීන්ගේ අභිවෘද්ධිය මූලික අරමුණ කරගත් ව්‍යවස්ථාපිත ආයතනයකි.

### ප්‍රධාන වගකීම් ක්ෂේත්‍රය

හස්ත කර්මාන්ත පෝෂණය කිරීම, සංස්කරණය කිරිම හා සංවර්ධනය කිරීම

### ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ලබාදෙන සේවාවන්

- දේශීය මෙන්ම අපනයන වෙළඳපළෙහි වර්තමාන සහ අනාගත වෙළඳපළ නැම්යාවන්ට අනුව නව නිර්මාණ සැලසුම් කිරීම හා මූලාදර්ශ සකස් කිරිම හා හස්තකර්මාන්ත ශිල්පීන්ට හඳුන්වාදීම.
- දිවයින පුරා හස්තකර්මාන්ත ශිල්පීන්ට, ගුරු ශිල්පීන්ට නව නිර්මාණ හා නව තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ආයතනයේ වැඩහල සේවක පිරිස හා ඒ ආශ්‍රිත සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව යොදාගනිමින් නව නිර්මාණ හා නව තාක්ෂණික, න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීම සඳහා විධිමත් කෙටිකාලීන පුහුණු සැසි මාලාවක් ක්‍රියාත්මක කිරීම.

- පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් මෙන්ම ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන්නන් සඳහා වැඩහල පරිශ්‍රය තුළ එක්දින දැනුම්වත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති නව නිර්මාණ සකස් කර ගැනීමට අවශ්‍ය සහාය ලබාදීම.

- පොදු පහසුකම් සේවා හරහා හස්තකර්මාන්ත ශිල්පීන්ට තම නිෂ්පාදන සඳහා වැඩහළ තුළ නව තාක්ෂණික ක්‍රම හා යන්ත්‍ර භාවිතා කිරීමට පහසුකම් සැලසීම

- පුස්තකාල පහසුකම් හරහා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල පොත් හා සඟරා පරිශීලනයට අවස්ථාව ලබාදීම

- පර්යේෂණ සංවර්ධන අංශයේ රසායනික හා යාන්ත්‍රික ක්ෂේත්‍ර යටතේ ගුණාත්මක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා නිසි තාක්ෂණික හා අමුද්‍රව්‍ය සැකසීමේ ක්‍රම හඳුන්වාදීම. විශේෂයෙන් බතික් ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීම හා වඩාත් කාර්යක්ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වාදීම.

- ජාතික ශිල්ප සභාව, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය හා හස්ත කර්මාන්ත ශිල්පීන් මෙන්ම අදාළ වෙනත් ආයතන හා පුද්ගලයින්ගේ ඉල්ලීම මත අමුද්‍රව්‍ය සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම හා අමුද්‍රව්‍ය වල ගුණාත්මකභාවය සම්බන්ධ ප්‍රමිති සහතික නිකුත් කිරීම

- හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ඵලදායී වන්නා වූ මෝස්තර හා වෙළඳපොළ ප්‍රවනතා පිළිබඳ තොරතුරු බැංකුවක් පවත්වාගෙන යාම.

- නව නිර්මාණාත්මක හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වෙළඳපොළ වැඩිදියුණු කිරීම සඳහා නව නිර්මාණ ප්‍රදර්ශන, අලෙවි ප්‍රවර්ධන හා අලෙවි පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම.

- ආයතන විසින් ඉටුකරන ලද සේවාවන් සඳහා ගාස්තු අය කිරීම හා රසායනාගාර, වැඩපළවල් සහ වෙනත් ආයතන පවත්වාගෙන යාම යටතේ,

- ගෘහ අභ්‍යන්තර සැලසුම්, ග්‍රැෆික් නිර්මාණ, තේමා ව්‍යුහයන්, කුසලාන, පදක්කම් හා සමරු ඵලක සහ වෙළෙඳ හා ප්‍රදර්ශන කුටි ආදිය සඳහා රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් පරිදි මෝස්තර උපදේශන සේවා සැපයීම

- ආයතනය යටතේ පවත්නා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය හරහා නිර්මාණ ක්ෂේත්‍රය සඳහා ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණ ජාතික ඩිප්ලෝමා / උසස් ඩිප්ලෝමා හා ජීවන රටා නිමැවුම් ජාතික ඩිප්ලෝමා ආදී ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම හරහා මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වැඩිදියුණු කිරීම.

- ආයතනයේ පරමාර්ථ වලට මුළුමනින්ම හෝ අඩවශයෙන් සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශීය ආයතන සමඟ රජයේ අනුමැතිය ඇතිව එකඟතාවයන්ට එළඹීම

- 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ අනුමත වූ රු.මි. 30ක ප්‍රාග්ධන ප්‍රතිපාදන යොදාගනිමින් දේශීය හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 වන විට සැලසුම් කරන ලද සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.18.377 වියදමක් දරා ඇති අතර, එය අනුමත වූ මුලු ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් 61%කි.

## 28.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

| | ක්‍රියාකාරකම | කාර්යසාධන දර්ශකය (KPIs) | වාර්ෂික කාර්යසාධන ඉලක්ක | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| වැඩසටහන / ව්‍යාපෘතිය | | **1.නිර්මාණ සංවර්ධනය, දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම** | | |
| **1.1** | නව මෝස්තර නිර්මාණය | නව නිර්මාණ සැලසුම් සංඛ්‍යාව | 330 | 349 |
| **1.2** | නව නිර්මාණවල මූලාකෘති සාම්පල සකස් කිරීම | මූලාකෘති සාම්පල සංඛ්‍යාව | 300 | 270 |
| **1.3** | නව නිර්මාණ සහ නව තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම | පුහුණු වැඩසටහන් ගණන | 14 | 13 |
| | | ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව | 290 | 300 |
| | | හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | 110 | 108 |
| **1.4** | ආයතනයට පැමිණෙන්නන්ගේ අවශ්‍යතා මත සේවා සැපයීම | ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව | 500 | 600 |
| **මුලු වෙන් කිරීම - රු.මි. 8.885** | | | **භෞතික ප්‍රගතිය - 90%** | |
| වැඩසටහන / ව්‍යාපෘතිය | | **2.උණ බම්බු සඳහා අත්පොතක් නිර්මාණය, ප්‍රකාශ කිරීම සහ දියත් කිරීම** | | |
| **2.1** | පොත සකස් කිරීම | නිමකිරීමේ ප්‍රතිශතය | 100% | 100% |
| **2.2** | මුද්‍රණය කිරීම හා එළිදැක්වීම | මුද්‍රණය කරන පොත් සංඛ්‍යාව | 200 | 200 |
| **මුලු වෙන් කිරීම - රු.මි. 1.000** | | | **භෞතික ප්‍රගතිය - 100%** | |
| වැඩසටහන / ව්‍යාපෘතිය | | **3.හස්ත කර්මාන්ත නව සහ නවෝත්පාදන නිර්මාණ ප්‍රවර්ධනය කිරීම** | | |
| **3.1** | අලෙවි පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම | අලෙවි පර්යේෂණ වැඩසටහන් සංඛ්‍යාව | 02 | 02 |
| | *2024-කර්මාන්ත ප්‍රදර්ශනය පාදක කොට හා දකුණු කලාපයේ විදේශීය සංචාරකයින්ගේ හස්ත කර්මාන්ත නිෂ්පාදන මිලදී ගැනීමේ ප්‍රවණතා හා හැසිරීම පාදක කොට අලෙවි පර්යේෂණ වැඩසටහන් 02ක් ක්‍රියාත්මක කරන ලදි. අවසන් වාර්තා සකසමින් පවතී | | | |
| **3.2** | නිෂ්පාදන සංවර්ධන වැඩසටහන | වෙළඳපොළට හඳුන්වාදෙන නව නිර්මාණ සංඛ්‍යාව | 40 | 43 |
| | | වැඩසටහනට සම්බන්ධකරගන්නා ශිල්පීන් සංඛ්‍යාව | 20 | 15 |
| **3.3** | ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 03 | 03* |
| | * නව නිර්මාණ ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් 02ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද අතර, එක් වැඩසටහනක් සිංහල හා හින්දු අලුත් අවුරුද්ද මූලික කොට ඊට අදාලව කරන ලද නිර්මාණ එකතුව ප්‍රවර්ධනය කිරීම හා දෙවන වැඩසටහන වශයෙන් 2024 - කර්මාන්ත ප්‍රදර්ශනයේ, ජාතික මෝස්තර මධ්‍යස්ථානයට අදාල ප්‍රදර්ශන පරිශ්‍රය අළලා සිදුකරන ලද ප්‍රවර්ධන වැඩසටහන දැක්විය හැක. | | | |
| **3.4** | වෙළෙඳ පොළ පිළිබඳ ශිල්පීන්ගේ දැනුම ඉහළ නැංවීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 03 | 03 |
| **3.5** | වෙනත් ආයතන විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන්, ප්‍රදර්ශන සහ ගැණුම්කරුවන් හරහා නව නිර්මාණ ප්‍රවර්ධනය කිරීම | වැඩසටහන් සංඛ්‍යාව | 03 | 02 |
| **3.6** | වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම | නිම කිරීමේ ප්‍රතිශතය | 100% | 100% |
| **3.7** | නව නිර්මාණ ප්‍රදර්ශනය/ බතික් ආශ්‍රිත නව මෝස්තර විලාසිතා දැක්ම පැවැත්වීම | ප්‍රධාන අංග | 01 | -- |
| **මුලු වෙන් කිරීම - රු.මි. 7.550** | | | **භෞතික ප්‍රගතිය - 77.5%** | |

| | ක්‍රියාකාරකම | කාර්යසාධන දර්ශකය (KPIs) | වාර්ෂික කාර්යසාධන ඉලක්ක | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| වැඩසටහන / ව්‍යාපෘතිය | | **4.පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් පැවැත්වීම** | | |
| **4.1** | ද්‍රව්‍ය/ක්‍රියාවලි සහ යන්ත්‍ර/ක්‍රියාවලි සංවර්ධනය සඳහා පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම | දැනුම්වත්කිරීමේ වැඩසටහන් | 02 | 02 * |
| | | සංවර්ධනය කරන ද්‍රව්‍ය / යන්ත්‍රෝපකරණ / ක්‍රියාවලින් සංඛ්‍යාව | 01 | 01 |
| | * ජා.ශි.ස. වලව්වත්ත බතික් පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකල බතික් අපජලය පිරිපහදු කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කරවීම සහ ඒ පිළිබඳ දැනුම්වත් කිරීමට අත් පත්‍රිකාවක් සකස් කර දීම.<br>බතික් සඳහා GMP පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන සිදු කරමින් අදාල ආයතන සහ ශිල්පීන් දැනුම්වත් කිරීම.<br>තල්කොළ මත දිලීර වර්ධනය පාලනය කළ හැකි දිලීර නාශක දියරයක් සංවර්ධනය කිරීම.<br>එම තාක්ෂණය අත්කම් ක්ෂේත්‍රයට පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා දීම.<br>කතරගම ප්‍රාදේශීය සභාවෙන් ලද ඉල්ලීම අනුව දෙබර ඇට ආශ්‍රිත අත්කම් නිෂ්පාදනය නිරීක්ෂණය කර ඔවුන් විසින් යොමුකරන පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීමට ප්‍රශ්නාවලියක් මගින් දත්ත රැස් කිරීම. | | | |
| **4.2** | වෙනත් ආයතන සමඟ සහයෝගීව පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම | සංවර්ධනය කරන ද්‍රව්‍ය / යන්ත්‍රෝපකරණ / ක්‍රියාවලින් සංඛ්‍යාව | 01 | * |
| | | දැනුම්වත්කිරීමේ වැඩසටහන් | 01 | |
| | * සාහිත්‍යමය කරුණු අධ්‍යනය කර සංකල්ප පත්‍රිකා සැකසීම අදාල පාර්ශවයන් සමග සාකච්ඡා කිරීම, උණ ලී වතුර බෝතල් සැකසීමේදී සෞඛ්‍යාරක්ෂිත පිරියම් කිරීමේ ක්‍රමවේදයක් සෙවීමට කෙටිකාලීන පර්යේෂණ ව්‍යාපෘතියක් මොරටුව විශ්ව විද්‍යාලය සමග ක්‍රියාත්මක කිරීම, අත්කම් නිෂ්පාදන වල අගය වැඩි කිරීම සඳහා භාවිතා කල හැකි අමුද්‍රව්‍ය සොයාගැනීම පිළිබඳ ආයතන සමඟ සාකච්ඡා කිරීම සහ පර්යේෂණ සිදු කිරීම | | | |
| **මුලු වෙන් කිරීම - රු.මි. 1.700** | | | **භෞතික ප්‍රගතිය - 88%** | |
| වැඩසටහන / ව්‍යාපෘතිය | | **5.සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩල ධාරිතාව සහ පහසුකම් වැඩිදියුණු කිරීම** | | |
| **5.1** | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් | වැඩසටහන් ගණන | 11 | 11 |
| **5.2** | පවතින ගොඩනැගිලි වැඩිදියුණු කිරීම (ප්‍රධාන කාර්යාලය සහ ශාඛා කාර්යාලය) | නිමකිරීමේ ප්‍රතිශතය | 100% | 42% |
| **5.3** | එක් එක් අංශය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ, උපකරණ සහ මෙවලම් ලබාදීම | මිලදී ගැනීමේ ප්‍රතිශතය | 100% | 60%* |
| **මුලු වෙන් කිරීම - රු.මි. 7.265** | | | **භෞතික ප්‍රගතිය - 68.25%** | |
| වැඩසටහන / ව්‍යාපෘතිය | | **6.නිර්මාණකරුවන්ගේ කේන්ද්‍රයේ ක්‍රියාකාරකම් (නිර්මාණකරුවන්ගේ වේදිකාව)** | | |
| **6.1** | සංසදයේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම | උප විද්වත් රැස්වීම් සංඛ්‍යාව | 03 | 30%* |
| **6.2** | උප විද්වත් රැස්වීම ක්‍රියාත්මක කිරීම | | | |
| | කමිටුව විසින් නිති සම්පාදන වැඩමුලුවට අදාල ආකාති යෝජනාව සකස් කරඇත. රැස්වීම සැලසුම් කරඇත. | | | |
| **6.3** | සාමාජික ලියාපදිංචිය | ලියාපදිංචිය කරන සාමාජිකයින් සංඛ්‍යාව | 200 | 30 |
| **මුලු වෙන් කිරීම - රු.මි. 2.000** | | | **භෞතික ප්‍රගතිය - 27%** | |

| | ක්‍රියාකාරකම | කාර්යසාධන දර්ශකය (KPIs) | වාර්ෂික කාර්යසාධන ඉලක්ක | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| වැඩසටහන / ව්‍යාපෘතිය | | **7.මැටි නිෂ්පාදන සඳහා ජල පිරිපහදු රොන්මඩ නැවත භාවිතා කිරීම** | | |
| **7.1** | පාරිසරික අත්කම් සහ මැටි පරීක්ෂා කිරීම සඳහා රොන්මඩ නැවත භාවිතා කිරීමේ හැකියාව සොයා ගැනීම පිළිබඳ පර්යේෂණ | පරීක්ෂණ වාර්තා ගණන | 01 | 1 |
| **7.2** | මැටි ආශ්‍රිත නිෂ්පාදක ශිල්පීන් දැනුම්වත් කරන්න | දැනුම්වත් වැඩසටහන් සංඛ්‍යාව | 02 | 01 ** |
| | | නව නිර්මාණ මූලාකෘති ගණන | 02 | 02 |
| | ** මෙම මැටි විකල්ප අමුද්‍රව්‍යක් ලෙස භාවිතා කර මහායාල මැටි ගම්මානයේ ශිල්පීන් 25 දෙනෙකු සඳහා විසිතුරු ආභරණ සහ මල්පෝච්චි නිර්මාණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී | | | |
| **7.3** | මැටි නොමිලයේ ලබා ගැනීමට පහසුකම් සැපයීම හා පසුවිපරම් සිදුකිරීම | ව්‍යාපෘතියට සම්බන්ධ මැටි ගම්මාන සංඛ්‍යාව | 01 | 01 |
| | | මැටි ලබා ගැනීමට පහසුකම් සලසදෙන වාර ගණන | 10 | 04 |
| | | සේවාව ලබාගත් ශිල්පීන් සංඛ්‍යාව | 10 | 10 |
| **මුලු වෙන් කිරීම - රු.මි. 0.100 + බාහිර ප්‍රතිපාදන** | | | **භෞතික ප්‍රගතිය - 92%** | |
| වැඩසටහන / ව්‍යාපෘතිය | | **8. ශාක සාර අවශේෂ භාවිතයෙන් ස්වභාවික වර්ණක නිෂ්පාදනය කිරීම ආශ්‍රිත ව්‍යාපෘතිය (අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ)** | | |
| **8.1** | කර්මාන්ත නිරීක්ෂණය | කර්මාන්ත නිරීක්ෂණය මත සකස් කරන වාර්තා සංඛ්‍යාව | 1 | 1* |
| | *බතික් ක්‍රියාවලිය නිරීක්ෂණය සහ තොරතුරු ලබා ගැනීම සඳහා SLINTEC ආයතනයේ පර්යේෂණ කණ්ඩායම සමග ක්ෂේත්‍ර චාරිකාවක නිරත විය. කුරුඳු දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම. කුරුඳු තෙල් නිෂ්පාදන ආයතනයක් නිරීක්ෂණය සහ එහි ඇති ශාක සාර අවශේෂ සාම්පල පර්යේෂණ සඳහා ලබා දීමට කටයුතු කිරීම. අනෙකුත් අමුද්‍රව්‍ය ලබා ගැනීමට ආයතන සමග සාකච්ඡා කිරීම. | | | |
| **8.2** | SLINTEC ආයතනය .සමඟ සන්නිවේදනය කිරීම, පර්යේෂණ කටයුතු සඳහා ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීම, පර්යේෂණවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ මාසික ප්‍රගති වාර්තාව සැපයීම | ප්‍රගති වාර්තා සංඛ්‍යාව | 6 | 5** |
| | ** SLINTEC ආයතනය සමග සම්බන්ධීකරණය වෙමින් පර්යේෂණ එකඟතා ගිවිසුම සකස් කිරීම. එය SMED හි පරීක්ෂාවට යොමුකිරීම සහ නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම. පර්යේෂණ එකඟතා ගිවිසුම අත්සන් කරමින් පර්යේෂණ ආරම්භ කිරීම. මාසික ප්‍රගති රැස්වීම් දෙකක් පැවැත්වීම සහ ප්‍රගති වාර්ථා SMED වෙත යොමු කිරීම | | | |
| **8.3** | ක්ෂේත්‍ර යෙදුම පරීක්ෂා කිරීම, නිෂ්පාදන ඇගයීම සහ වාර්තා කිරීම | ක්ෂේත්‍ර වැඩමුලු සංඛ්‍යාව | 1 | 2 |
| **ඉපැයීම් සහ අවශ්‍යතා මත පදනම් වූ ව්‍යාපෘති** | | | | |
| වැඩසටහන / ව්‍යාපෘතිය | | **9. නිර්මාණ ක්ෂේත්‍රය සඳහා ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම** | | |
| **9.1** | පෙර වර්ෂයේ සිට පවත්වාගෙන යන පාඨමාලා | පාඨමාලා සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව | 106 | 102 |
| **9.2** | නවක සිසුන් බඳවා ගැනිම | සිසුන් සංඛ්‍යාව | 115 | 64 |
| **9.3** | සහතික ප්‍රදානෝත්සව පැවැත්වීම | ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව | 77 | 80 |
| **9.4** | ආයතනික ගාස්තු | වටිනාකම | රු.මි. 8.000 | රු.මි.5.950 |
| **මුලු වෙන් කිරීම - රු.මි. 5.000** | | | **භෞතික ප්‍රගතිය - 75%** | |

| | ක්‍රියාකාරකම | කාර්යසාධන දර්ශකය (KPIs) | වාර්ෂික කාර්යසාධන ඉලක්ක | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| වැඩසටහන / ව්‍යාපෘතිය | | **10.** අවශ්‍යතාවය මත කෙටි කාලීන පුහුණු සැසි සහ උපදේශන සේවා පැවැත්වීම | | |
| 10.1 | කෙටි කාලීන පුහුණු සැසි පැවැත්වීම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 100 | 70 |
| 10.2 | උපදේශන සේවා සැපයීම | සේවා සංඛ්‍යාව | 02 | 02 |
| 10.3 | ග්‍රැෆික්/අභ්‍යන්තර/3D/BOQ නිර්මාණය කිරීම | ග්‍රැෆික්/අභ්‍යන්තර/3D/ BOQ නිර්මාණ සංඛ්‍යාව | 10 | 06 |
| 10.4 | ආයතනික ගාස්තු | රු.මි. | 0.800 | 0.102 |
| මුලු වෙන් කිරීම - බාහිර ප්‍රතිපාදන | | | භෞතික ප්‍රගතිය - 67% | |

## 28.3 අනාගත සැලැසුම් - 2025

| | වැඩසටහන / ව්‍යාපෘතිය | අවශ්‍ය ප්‍රතිපාදන 2025 (රු.මි.) |
|---|---|---|
| | **නව ව්‍යාපෘති - වාර්ෂික** | |
| **1** | නිර්මාණකරුවන්ට පහසුකම් සැපයීම | 6.250 |
| 2 | නිර්මාණකරුවන්/ ශිල්පීන් සඳහා නව නිර්මාණ/තාක්ෂණ දැනුවත් කිරීම | 6.698 |
| 3 | පර්යේෂණ සහ සංවර්ධන | 2.800 |
| 4 | වෙළඳපල දැනුවත්භාවය ගොඩනැගීම හරහා හස්ත කර්මාන්ත කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | 7.000 |
| 5 | නව නිර්මාණ ප්‍රවර්ධනය හරහා නව නිර්මාණ ප්‍රදර්ශනය සහ සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම | 9.500 |
| 6 | ආයතනික සහයෝගීතාවයෙන් තිරසාර නිර්මාණ ප්‍රවර්ධන | 8.000 |
| 7 | එදිනෙදා ජීවිතයට නිර්මාණයේ බලපෑම ඉස්මතු කිරීමට මහජනතාව දැනුවත් කිරීම | 2.000 |
| 8 | අභ්‍යන්තර ධාරිතාව වැඩි දියුණු කිරීම | 7.352 |
| | **පවත්වාගෙන යන ව්‍යාපෘති** | |
| 1 | නිර්මාණකරුවන්ගේ වේදිකාවක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම | 1.000 |
| 2 | නිර්මාණ අංශය සඳහා ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම | ඉපයීම් මත |
| | **අවශ්‍ය මුළු ප්‍රතිපාදන** | **50.600** |

# 29

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)(SLHB)

## 29.1 හැඳින්වීම

ලක්සල යනුවෙන් ජනප්‍රියත්වය දිනා සිටින ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය "ස්වයං මූල්‍යය රාජ්‍ය වාණිජ ආයතනයක්" වන අතර දිවයින පුරා පිහිටා ඇති ස්වකීය ප්‍රදර්ශනාගාර එකොළහක් (11) මගින් සිය දේශීය අත්කම් නිර්මාණ අලෙවිය ප්‍රවර්ධනයෙහි නියැලී සිටියි. වසර 1964 දී ලක්සල ස්වකීය සමාරම්භයේ සිටම සාම්ප්‍රදායික අත්කම් නිර්මාණකරුවන් හට සිය නිෂ්පාදන අලෙවි කර ගැනීම පිණිස මෙම ප්‍රදර්ශනාගාර ජාලය මගින් දේශීය මෙන්ම විදේශීය අත්‍යවශ්‍ය වෙළඳපොළ සබඳතා සලසා දෙනු ලබයි. එම කාල වකවානුව තුළ බොහෝ දුරට පැවති වෙළඳපොළ ඒකාධිකාරි තත්වය හේතුවෙන් උද්ගතව තිබූ සංවෘත ආර්ථික වාතාවරණය යටතේ ලක්සල ආයතනය ලාභ ලබන ආයතනයක් ලෙස පැවතියේ ය. 1983 වසරේ දී මෙම ආයතනය "1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පිහිටුවීමේ පනත" යටතේ ක්‍රියාත්මක වේ.

ලක්සල, ශ්‍රී ලංකාව පුරා ගෘහ ආශ්‍රිත කර්මාන්ත මගින් සපයන අත්කම් නිර්මාණ අලෙවි කරන එකම රාජ්‍ය ආයතනය වේ.

## ප්‍රධාන අරමුණු/ පරමාර්ථ

- අගය නිර්මාණය කිරීම සහ ග්‍රාමීය ප්‍රජාව අතර වටිනාකම් හුවමාරු කිරීම.
- හොඳම පාරිභෝගික තේරීම සඳහා බහු විධ මුහුණුවරකින් යුත් අවස්ථාවන් සැලසීම.
- ගුණාත්මක බව, විශ්වාසදායක බව හා ගෙවන මුදලට සරිලන වටිනාකම ලබාදීම.
- සේවා විශිෂ්ටත්වය මගින් පාරිභෝගික සංතෘප්තය ඇති කිරීම.

**සාම්ප්‍රදායික අත්කම් නිර්මාණ, අත් යන්ත්‍ර රෙදිපිළි, බතික්, තේ, සම් ආශ්‍රිත නිෂ්පාදන**



## 29.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

**සංසන්දනාත්මක ප්‍රගතිය**

| විෂයාංගය | 2024 |
|---|---|
| විකුණුම් පිරිවැටුම (රු. මි.) | 905 |
| ප්‍රදර්ශනාගාර නිෂ්පාදන මිල දී ගැනීම (රු. මි.) | 464 |
| සැපයුම්කරුවන් හට ගෙවීම (රු. මි.) | 315 |
| අලුතින් ලියා පදිංචි වූ අත්කම් නිර්මාණ සපයන්නන් සංඛ්‍යාව | 296 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)*

## 29.3 අනාගත සැලැසුම් - 2025

- රජයේ වැඩපිළිවෙල යටතේ සමස්ත මෙහෙයුම් කටයුතු පෙළ ගස්වමින් රුපියල් මිලයන 1,000ක (බිලියන 01) අලෙවි පිරිවැටුමක් අත්පත් කර ගැනීම මගින් මෙරට ග්‍රාමීය සුළු හා මධ්‍ය පරිමාණ ආර්ථිකය සවිබල ගැන්වීම.

- "ජාත්‍යන්තර තෑගි හා සමරු භාණ්ඩ වෙළඳපොල" සඳහා සුදුසු හස්ත කර්මාන්ත ආශ්‍රිත නිර්මාණ සැපයිය හැකි නව නිර්මාණකරුවන් 400ක් පමණ හඳුනාගෙන ඔවුන් ලක්සල වෙත භාණ්ඩ සැපයීම සඳහා ලියාපදිංචි කිරීම මගින් ව්‍යවසායකයන් ලෙස නගා සිටුවීම.

- විදේශීය සංචාරකයින් බහුලව ගැවසීමක් සහිත "මිගමුව හා හිරිකැටිය/වැලිගම" ප්‍රදේශවල ලක්සල නව ප්‍රදර්ශනාගාර 02ක් ස්ථාපිත කිරීම මගින් ග්‍රාමීය හස්ත කර්මාන්ත නිර්මාණ ශිල්පීන් සඳහා වන ජාත්‍යන්තර වෙළඳපොල ප්‍රවේශ අවස්ථා පුලුල් කිරීම.

- මෙරට උතුරු හා නැගෙනහිර පළාත් ආශ්‍රිත සුවිශේෂී නිෂ්පාදන ගෘහ ජීවිතයට, ජීවන රටාවට අවශ්‍යය භාණ්ඩ හා ආහාරමය භාණ්ඩ යන කාණ්ඩ යටතේ ලක්සල සන්නාමය සහිතව ප්‍රවර්ධනය කිරීම මගින් රු.මි. 50ක නව වෙළඳපොල කොටසක් අත්පත් කර ගැනීම හරහා මෙරට ග්‍රාමීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම.

  උදා; තල්, කිතුල්, මී පැණි ආශ්‍රිත නිෂ්පාදන

# 30

# ජාතික ශිල්ප සභාව (NCC)

## 30.1 හැඳින්වීම

හස්ත කර්මාන්ත සංරක්ෂණය සහ සංවර්ධනය මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වයන් නංවාලීම ප්‍රධාන අරමුණ කොට 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත යටතේ ජාතික ශිල්ප සභාව ස්ථාපිත විය. පසුගිය දශක කිහිපය තුළ ජාතික ශිල්ප සභාව විසින් හස්ත කර්මාන්ත සංරක්ෂණය, සංවර්ධනය සහ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සුභ සාධනය වෙනුවෙන් විවිධ ව්‍යාපෘතීන් හා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

## අරමුණු / ඉලක්ක

1. වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් කරනු ලබන දායකත්වය 50% කින් ඉහළ නැංවීම

2. වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත ස්වයං රැකියා 4000 ක් ජනිත කිරීම

3. වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත තරුණ හා කාන්තා ව්‍යවසායකයින් 400 ක් නිර්මාණය කිරීම

4. වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙහි හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත අපනයන කොටස 50% කින් ඉහළ නැංවීම

## කාර්යභාරය

- ප්‍රාදේශීය මට්ටමින් ශිල්පීන්ගේ සමිති පිහිටුවීම තුළින් ශිල්පීන් සංවිධානය කිරීම හා ශිල්ප ගම්මාන ඇති කිරීම.
- අත්කම් ශිල්පීන් හඳුනාගෙන ජාතික මට්ටමින් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම.
- ශිල්පීන් සඳහා විරල අමුද්‍රව්‍ය සැපයීම හා එම කටයුතු සංවිධානය කිරීම.
- අත්කම් භාණ්ඩවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා වැඩමුළු පැවැත්වීම.
- ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන මඟින් පූර්ණ කාලීන හස්ත කර්මාන්ත පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම හා නිෂ්පාදන පහසුකම් ලබා දීම.
- විදේශීය වෙළඳ පොළ සඳහා අත්කම් භාණ්ඩ නිෂ්පාදනය, දිරිගැන්වීම, ප්‍රදර්ශනය කිරීම හා විදේශ ප්‍රදර්ශනවලට ශිල්පීන් ඉදිරිපත් කිරීම.
- පළාත් හා ජාතික මට්ටමින් ප්‍රදර්ශන සහ තරඟ පැවැත්වීම තුළින් ශිල්පීන් ඇගයීමට ලක් කිරීම සහ අළෙවි සල්පිල් පැවැත්වීම, ශිල්ප ගම්මාන පිහිටුවීම මඟින් ශිල්පීන්ගේ නිෂ්පාදන භාණ්ඩ අලෙවි කරගැනීම සඳහා පහසුකම් සංවිධානය කිරීම.
- ශිල්පීන් සඳහා සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශිල්පීන්ගේ සහ ඔවුන්ගේ පවුල් වල ආර්ථික හා සමාජයීය තත්ත්වය නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඉහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පළාත් සභා සහ ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය ආයතන සමඟ කටයුතු සම්බන්ධීකරණ කිරීම.

## 30.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### 1. හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සහ පරිගණක දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම

හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ කාලීන තොරතුරු විස්තරාත්මකව ලබාගෙන දත්ත පද්ධතිය යාවත්කාලීන කර ඔවුන් සඳහා ජාතික ශිල්ප සභා ලියාපදිංචිය ලබාදී නව හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මෙමගින් අපේක්ෂිතය. (වියදම රු.මි.0.09)

- මෙම වසරේ හස්ත කර්මාන්ත ශිල්පීන් 1248 දෙනෙකු ලියාපදිංචි කර නව හැඳුනුම්පත් 840ක් නිකුත් කර ඇත.
- සමස්ත ලියාපදිංචි ශිල්පීන් සංඛ්‍යාව - 20065

### 2. ශිල්ප සමාජ ස්ථාපිත කිරීම හා සම්බන්ධීකරණය

දිවයින පුරා විසිරී සිටින හස්ත කර්මාන්ත ශිල්පීන් ඒකරාශී කර ඔවුන් සංවිධාන ගත කිරීමේ අරමුණින් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමින් ශිල්ප සමාජ ස්ථාපිත කිරීම හා සම්බන්ධීකරණය කර, ප්‍රාදේශීය මට්ටමින් හස්ත කර්මාන්ත ශිල්පීන් ඒකරාශී කර ඔවුන්ගේ සංවිධානාත්මක ශක්තිය වර්ධනය කිරීමත්, ශිල්පීය කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය, අළෙවි පහසුකම්, කුසලතා ප්‍රවර්ධන සහ ව්‍යවසායකත්ව හැකියාව වර්ධනය කිරීමත් අපේක්ෂාව වේ. ඒ අනුව, 2024 වර්ෂයේ දී නව ශිල්ප සමාජ 19ක් ස්ථාපිත කර ඇති අතර සාමාජිකයින් සංඛ්‍යාව 401 කි. සමස්ත ශිල්ප සමාජ සංඛ්‍යාව 203. (වියදම රු.මි.0.15)

## 3.ශිල්ප පුහුණු මධ්‍යස්ථාන මගින් පුහුණු පහසුකම් ලබාදීම.

දිස්ත්‍රික් 19 ක් ආවරණය වන පරිදි ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 78 ක ශිල්පීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම පුහුණු මධ්‍යස්ථාන වලින් වාර්ෂිකව පූර්ණ කාලීන ලෙස පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර එය න්‍යායාත්මකව හා ප්‍රායෝගික යන අංශයන්ගෙන් සමන්විතය.තවද, ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන හරහා පුහුණුව ලැබූ ආධුනිකයින් සඳහා තම නිෂ්පාදන කටයුතු කරගෙන යාමට අවශ්‍ය පහසුකම් ද එම මධ්‍යස්ථාන තුළින්ම සැපයීම ද විශේෂත්වයකි. මෙම වසරේදී එම මධ්‍යස්ථාන හරහා පූර්ණකාලීනව ආධුනිකයින් 777ක් හා පුහුණුව ලබමින් සිටින අතර නිෂ්පාදන පහසුකම් ලබා ගන්නා ශිල්පීන් සංඛ්‍යාව 450 දෙනෙකු වේ. (වියදම රු.මි. 4.20)

## 4. ශිල්පීය පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.

ජාතික ශිල්ප සභාව මගින් පුහුණු හා නිෂ්පාදන පහසුකම් ලබා දීම සඳහා භාවිතා කරනු ලබන පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන බහුතරයක් වසර තිහකටත් වඩා පැරණි ඒවා වන බැවින් හා අදාල මධ්‍යස්ථාන වලට අත්‍යවශ්‍යම පහසුකම් වන සනීපාරක්ෂක, ජලය සහ විදුලිය මෙන්ම අත්‍යවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කිරීම මේ යටතේ සිදුකරනු ලබයි. මෙම වසර තුලදී පුහුණු මධ්‍යස්ථාන 05ක් (මඩකලපුව- තිරුපෙරුම්තුරෙයි, ත්‍රිකුණාමලය - කන්නියා, පොළොන්නරුව- කඳුරුවෙල, හම්බන්තොට - අඟුල්මඩුව, නුවර-උඩවෙල) හා නිෂ්පාදන මධ්‍යස්ථාන 04 ක් (ගම්පහ -හුණුමුල්ල, කුරුණෑගල -මාවී ඇල, ගාල්ල - දළවැල්ල, කළුතර - පන්තොට) සංවර්ධනය කරමින් පවතී. (වියදම රු.මි. 8.18)

6.

7.

**ශිල්පීය පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම**




## 5. ශිල්ප අභිමානී ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත සම්මාන ප්‍රදානය

ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත තරඟය සහ ප්‍රදර්ශනය “ශිල්ප අභිමානී - 2023” නියෝජනය කරන ලද සමස්ත නිර්මාණ සංඛ්‍යාව 1021 ක් විය. මූලික හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර 31 ක් යටතේ වර්ගීකරණය කරන ලද අත්කම් ක්ෂේත්‍ර 66 ක් නියෝජනය කරමින් පවත්වන ජාතික හස්ත කර්මාන්ත ප්‍රදර්ශනයේ දී සාම්ප්‍රදායික අංශ සහ සාම්ප්‍රදාය රැක ගනිමින් නව නිර්මාණ අංශ සඳහා මූල්‍ය තිළිණ සහ සහතික පත් පිරිනැමේ. 2024.01.03 දින ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සම්මාන ප්‍රදානය සිදුකරන ලදි. ජනාධිපති සම්මානයට ලක් වූ නිර්මාණ සංඛ්‍යාව 508 කි.

ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත තරඟය “ශිල්ප අභිමානී - 2024” නියෝජනය කරන ලද සමස්ත නිර්මාණ සංඛ්‍යාව 1027 ක් විය. 2024.12.28 දින කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සම්මාන ප්‍රදානය සිදුකරන ලදි. සම්මානයට ලක් වූ නිර්මාණ සංඛ්‍යාව 407කි. සමස්ථ වියදම රු.මි.27.6 කි.

( ජා.ශි.ස. රු.මි. 12.1 + අමාත්‍යාංශය රු.මි. 15.5)

**“ශිල්ප අභිමානී - 2024” සම්මාන ප්‍රදානය**



## 6. ශිල්පීන් සඳහා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ජාතික ශිල්ප සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අතර ශිල්ප සුභසාධන වැඩසටහන ප්‍රධානම කාර්යයක් වන අතර එමගින් ශිල්පීන් සඳහා මහඟු සේවාවක් ඉටු කරනු ලැබේ. මෙම වැඩසටහන යටතේ වයස්ගත ශිල්පීන්, ආබාධිත මට්ටමේ ශිල්පීන් සඳහා ආධාර මුදලක් ලබා දීම මෙන්ම ඒ ඒ අවස්ථාවලදී ශිල්පීන් විසින් කරනු ලබන ඉල්ලීම් සඳහා (සැත්කම්, හෘදයාබාධ, අක්ෂි රෝග හා විශේෂ සැත්කම් ආදී) ශිල්ප සුභ සාධන ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රතිචාර දැක්වීම සිදු කරනු ලබයි.

මෙම වැඩසටහන යටතේ මෙම වසරේ දී ශිල්පීන් 53දෙනෙකු සඳහා පහසුකම් සලසා දී ඇත. (මාසිකව රු.5000 බැගින් යාවජීව ශිල්පීන් - 19, මාසිකව රු.3000 බැගින් ශිල්පීන් - 34) (වියදම රු.මි.1.46)

## 7. දේශීය හා විදේශීය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන

සාම්ප්‍රදායික සහ ග්‍රාමීය කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා ඇති ඉල්ලුම හා ශ්‍රී ලාංකේය නිෂ්පාදන සම්බන්ධව දේශීය හා විදේශීය පාරිභෝගිකයන් අතර දැනුවත්භාවය ඉහළ නංවමින්, විදේශීය තරඟකාරී නිෂ්පාදන අභිබවා යන ඉහළම තලයේ දේශීය නිෂ්පාදන පාරිභෝගිකයා අතට පත් කර, නව නිෂ්පාදන මෝස්තර සහ තාක්ෂණය සම්බන්ධ දැනුම හුවමාරු කර ගැනීම හා ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ ආදායම් ඉහළ නංවා ජීවන මට්ටම ඉහළට එසවීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂිතය.

- 37th session of the FAO Regional Conference සමගාමීව හිල්ටන් හෝටලයේදී ලක් ශිල්ප නිර්මාණ ඇතුළත් අලෙවි කුටියක් පවත්වාගෙන යන ලදී.
- බදුල්ලේ පැවති හස්ත කර්මාන්ත හා ආහාර අලෙවි සල්පිල - සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව -30
- පිළියන්දල මහජන බැංකුව විසින් සංවිධානය කල ව්‍යවසායකත්ව ප්‍රදර්ශනය හා සල්පිල - සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව - 02
- නිදහස් චතුරශ්‍රයේ දී පවත්වන ලද Bharat Sri Lanka Maitri Week - සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව - 10

**අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්**



- ඉන්දියාවේ Suraj Kund Craft Mela සඳහා සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව - 08

**"Suraj Kund Craft Mela"**



- උස්බෙකිස්ථානයේ පැවැත්වූ II International Festival of Gold Embroidery and Jewellery සඳහා වූ ශිල්පීන් සංඛ්‍යාව - 04
සමස්ථ වියදම රු.මි.1.14 කි.
(ජා.ශි.ස. රු.මි. 0.34 + අමාත්‍යාංශය රු.මි. 0.8)

## 8. දැව මෝස්තර හා නිර්මාණ නවෝත්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම.

දැව ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයට අත්‍යවශ්‍යව පවතින නවීන තාක්ෂණය, නව මෝස්තර, පර්යේෂණ හා නවෝත්පාදන යන අංශවල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා වසර 10 ක් පමණ ඌණ උපයෝජිතව පැවති කටුබැද්ද යාන්ත්‍රික වඩු කර්මාන්ත මධ්‍යස්ථානය තෝරාගෙන එහි ගොඩනැඟිලි හා යන්ත්‍ර සූත්‍ර භාවිතයට ගැනීමට මූලික අළුත්වැඩියා හා වැඩ සැලැස්ම ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, එහි ඉතිරි කටයුතු සම්පූර්ණ කර මෙරට දැව කර්මාන්ත ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය ප්‍රමිතිගත ශිල්පීන් බිහි කිරීම හා ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය ඉහත සේවාවන් සැපයීම, ජාතික වෘත්තීය සුදුසුකම් සහිත පුහුණු ශ්‍රමිකයින් බිහි කිරීම, විනාශවෙමින් පවතින රාජ්‍ය සම්පත්වලින් ඵලදායි සේවාවක් ලබා ගැනීම යන ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත. 2024 සැප්තැම්බර් 02 දින සිට පුහුණු කටයුතු ආරම්භ කර ඇත.
වියදම රු.මි. 6.9 (අමාත්‍යාංශ අරමුදල්).

**9. ශ්‍රී ලංකාවේ "සාර්ක් හස්ත කර්මාන්ත සංවර්ධන මධ්‍යස්ථානය" ස්ථාපිත කිරීම.**

සාර්ක් රටවල්හි විශේෂයෙන් ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත ශිල්පීන් මුහුණදෙන නව නිර්මාණ, මෝස්තර, තාක්ෂණය, ගුණත්වය, අමුද්‍රව්‍ය ක්‍රියාවලිකරණය, නිෂ්පාදන ක්‍රියාවලිකරණය හා අලෙවිකරණය සම්බන්ධ ගැටළු සඳහා එකම ස්ථානයකින් පහසුකම් සැලසීම අරමුණු කරගෙන සාර්ක් සංවර්ධන අරමුදලේ අනුග්‍රහයෙන් මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට යෝජිතය.

සාර්ක් රටවල්හි විශේෂයෙන් ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත ශිල්පීන් මුහුණදෙන නව නිර්මාණ, මෝස්තර, තාක්ෂණය, ගුණත්වය, අමුද්‍රව්‍ය ක්‍රියාවලිකරණය, නිෂ්පාදන ක්‍රියාවලිකරණය හා අලෙවිකරණය සම්බන්ධ ගැටළු සඳහා එකම ස්ථානයකින් පහසුකම් සැලසීම අරමුණු කරගෙන සාර්ක් සංවර්ධන අරමුදලේ අනුග්‍රහයෙන් මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට යෝජිතය.

**10. අමුද්‍රව්‍ය වගා කිරීමේ වැඩසටහන**

හස්ත කර්මාන්ත නිෂ්පාදන ආශ්‍රිතව භාවිතා කරනු ලබන දුර්ලභ අමුද්‍රව්‍ය සුලභ කිරීම සඳහා රජයේ භාවිතා නොකල හා ඌණ උපයෝජිත ඉඩම් යොදාගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය හිඟය අවම කරමින් නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා දීම, අමුද්‍රව්‍ය ආනයනය අඩු කිරීම තුළින් විදේශ විනිමය ඉතිරි කිරීම, දේශීය කර්මාන්තකරුවන්ට සාධාරණ මිලකට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීමට අවස්ථාව සැලසීම හා ග්‍රාමීය කර්මාන්ත ආශ්‍රිත භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය අවම කිරීම යන මූලික අරමුණු ඇතිව මෙම වසරේ අක්කර 17 පර්. 90ක් තුල පන් පැළ 517500ක් වගා කර ඇත. (වියදම රු.මි.6.36 කි.)

## 30.3 අනාගත සැලැසුම් - 2025

**1. හස්ත කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන අපනයන ප්‍රවර්ධනය**

ශ්‍රී ලාංකීය හස්ත කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන විදේශීය රටවල්හි වෙළඳපොල තුල අලෙවි කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සියළුම තානාපති කාර්යාල නිළධාරීන් සම්බන්ධකර ගනිමින් සකස් කර එමගින් හස්ත කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන අපනයන වටිනාකම ඉහළ නංවා විදේශ විනිමය උත්පාදනය කිරීම යන මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

**2. හස්ත කර්මාන්ත ආශ්‍රිත ආනයනික භාණ්ඩ සඳහා ආදේශන නිෂ්පාදන දිරිමත් කිරීම**

මෙහිදී සියලුම හස්ත කර්මාන්ත ආශ්‍රිත ආනයනික භාණ්ඩ හඳුනා ගැනීම, ඒ සඳහා ආදේශන නිෂ්පාදන හඳුනා ගැනීම තුළින් අවශ්‍ය අමුද්‍රව්‍ය, මෝස්තර, පුහුණුව හා ක්‍රමවේදයන් හඳුන්වා දීම තුළින් අනෙකුත් සියලු පහසුකම් සපුරාලීම හරහා ශිල්පීන් ධෛර්යමත් කිරීමට අපේක්ෂිතය. තවද, තෝරා ගත් පුහුණු මධ්‍යස්ථාන නිෂ්පාදන මධ්‍යස්ථාන බවට පත් කිරීම, අළෙවි මධ්‍යස්ථාන සමග නිෂ්පාදන මධ්‍යස්ථාන ජාලගත කිරීමට අපේක්ෂිතය.

**3. පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන විධිමත් කිරීම**

තෝරා ගත් පුහුණු මධ්‍යස්ථාන නිෂ්පාදන මධ්‍යස්ථාන බවට පත් කිරීම, අළෙවි මධ්‍යස්ථාන සමඟ නිෂ්පාදන මධ්‍යස්ථාන ජාලගත කිරීම, නිෂ්පාදන මධ්‍යස්ථානයන්හි ගිණුම් හා පොත්පත් තැබීම විධිමත් කිරීම හා පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් විධිමත් පුහුණුලාභීන් බිහි කිරීම හා හස්ත කර්මාන්ත ආශ්‍රිත නිර්මාණකරුවා ධෛර්යමත් කර උපරිම නිෂ්පාදනයක් ලබා ගෙන දළ දේශීය නිෂ්පාදිතයට කරනු ලබන දායකත්වය ඉහළ නැංවීම මෙමගින් අපේක්ෂිතය.

# 31

# සීමාසහිත ලංකා සළුසල

# (LSL)

## 31.1 හැඳින්වීම

වර්ෂ 1967 ඔක්තෝම්බර් මස 01 වන දින ශ්‍රී ලංකා රජයේ වාණිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව ලෙස ස්ථාපනය වූ සළුසල ආයතනයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ දේශීය නිෂ්පාදනය නගා සිටුවීම හා දේශීය රෙදිපිළි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සැපයීමේ පුරෝගාමියා වීම සහ ශ්‍රී ලංකාව තුළ රෙදිපිළි කර්මාන්තයේ නියැළී සිටින කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් ඉහළ තලයකට පැමිණීම සඳහා පූර්ණ සහයෝගය ලබාදීමයි.

මෙහි ව්‍යාපාර කටයුතු තවදුරටත් පුළුල් කරගැනීම සඳහා 1991.11.28 වන දින සී/ස ලංකා සළුසල සමාගමක් ලෙස ස්ථාපනය කරන ලදී. 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් වෙළඳ ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත අනුව 1991.12.21 වන දින පලකරන ලද ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව වත්කම්, වගකීම් සහ ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු මෙම සමාගමට පවරන ලදි.

### අරමුණු

- නිෂ්පාදන ආශ්‍රිත යටිතල පහසුකම් සහ සැලසුම් සංවර්ධනය සඳහා පහසුකම් සපයන අග්‍රස්ථ රාජ්‍ය ආයතනය ලෙස ක්‍රියා කිරීමෙන්,දේශීය අත්යන්ත්‍ර, බතික් සහ ඇඟලුම් සඳහා වෙළෙඳපොළ අවස්ථා දියුණු කිරීම තුළින් දේශීය නිෂ්පාදකයින්ට නිෂ්පාදනය ඉහළ නැංවීමට අවස්ථාවක් උදාකර දෙන අතර, එමගින් ග්‍රාමීය ආර්ථිකයේ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ සංවර්ධනයට දායක වේ.

- පුද්ගලික අංශය සමඟ සහයෝගයෙන් කර්මාන්ත ශාලා විවෘත කිරීම මගින් මහා පරිමාණ දේශීය නිෂ්පාදන ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කිරීම මගින් නිල ඇඳුම් ආනයනය සහ අනෙකුත් ද්‍රව්‍ය අවශ්‍යතා සඳහා වැය වන රජයේ මුදල් ඉතිරි කිරීම.

- රාජ්‍ය අංශයේ සංවිධානවල (B2G) සියලුම රෙදිපිළි, රෙදිපිළි සහ අදාළ අවශ්‍යතාවල එකම සැපයුම්කරු වීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ ශිල්පීන් සඳහා නිෂ්පාදනය සඳහා සහ අනෙකුත් සැපයුම්කරුවන් සඳහාත් කර්මාන්තය තුළ නිෂ්පාදනය සඳහා ඉඩකඩ සැපයීම.

- දැරිය හැකි මිලකට ගුණාත්මක ද්‍රව්‍ය ලබා දීමෙන් දේශීය සහ විදේශීය වෙළෙඳපොළ තුළ පාරිභෝගිකයන් සඳහා වඩාත්ම විශ්වාසදායක සන්නාමය වීම.

- දේශීය සහ එතෙර වෙළඳපළ නඟා සිටුවීමට සහ නංවාලීමට රෙදිපිළි, ඇඟලුම් සහ බතික් අත්යන්ත්‍ර කර්මාන්ත නියාමනය කිරීමට පෙරමුණ ගැනීම.

- රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන වියදම් ඉවත් කිරීම මගින් JV සහ PPP වලට පිවිසීමෙන් කර්මාන්තයේ වෙනසක් ඇති කිරීම.

- අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා කලාපයේ සහ විදේශීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බතික් අත්යන්ත්‍ර සහ ඇඟලුම් ප්‍රවර්ධනය කිරීම තුළින් රටේ ඩොලර් සංචිත ඉහළ නැංවීම.

## 31.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

- සළුසල නාමය ප්‍රවර්ධනය සඳහා ආයතනයට අයත් අම්පාර ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාදීම.

- 2024 අයවැය කතාවේ දී ජනාධිපතිතුමා විසින් යෝජනා කරන ලද අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ නිරත කාන්තාවන් හා තරුණ ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා විශේෂ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන්, කර්මාන්ත අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද රු.මි. 300ක මුදලින් රු.මි.100ක චක්‍රීය අරමුදලක් ස්ථාපනය කර එමඟින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට අවශය අමුද්‍රව්‍ය ආනයණය කිරීමට කටයුතු කිරීම.

- ශුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායකයන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට සැපයුම් කරුවන් හඳුන්වා දිම වෙනුවෙන් ඉන්දියාවේ පිහිටි ශ්‍රී ලංකා මහා කොමසාරිස් ජනරාල් කාර්යාලය වෙත දන්වා ඇත.

- අත්යන්ත්‍ර නූල් හා බතික් රෙදි මිල ගණන් හි දේශීය හා විදේශීය වෙළඳපල තුල සංචරණ මිල ගණන් වල සමීක්ෂණයක් සිදු කර ආනයණික මිල ආසන්න වශයෙන් තක්සේරු කිරීම.

- චක්‍රීය අරමුදල ස්ථාපනය කිරීම වෙනුවෙන් තිඹිරිගස්යාය කොළඹ 05 පිහිටි ලංකා බැංකුව අධි ශ්‍රේණි ශාඛාවේ 93230677 අංක යටතේ ජංගම ගිණුමක් විවෘත කිරීම.

- සී/ස ලංකා සළුසල හා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාත්මක කල අමුද්‍රව්‍ය වැඩ සටහන වෙනුවෙන් 2024.07.26 දින ප්‍රතිචක්‍රීය කරන ලද නූල් ආනයණය කර ලබා දීම.

- ආයතනය ප්‍රතිසංවිධාන කිරීම යටතේ නිෂ්පාදන අංශයේ මැෂින් 20 ක් අළුත් වැඩියා කර ඇත.

- ගිණුම්කරණ මෘදුකාංගයකින් ආයතනයේ තොග පාලනය ක්‍රමවත්ව පවත්වා ගැනීම
- ටෙන්ඩර් කැඳවා දිගුකාලීන රෙදිපිළි සහ යකඩ ද්‍රව්‍ය අලෙවි කිරීම.
- මාර්තු, අප්‍රේල්, ජූලි මස ජංගම අලෙවි සැල් කිහිපයක් පැවැත්වීම.
- සළුසල ආයතනයට අයත් ඉඩම්වල සහ ගොඩනැගිලිවල කුලී එකතු කිරීම සඳහා කටයුතු කිරීම.
- පළමු කාර්තුව තුල සී/ස ලංකා සළුසල හා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය අඩු මිල ගණන් යටතේ ලබා දීම වෙනුවෙන් ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීම.
- බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ ජූනි 22, 23, 24, සහ 25 යන දිනවල පැවති ප්‍රදර්ශනයට සහභාගී වීම.

## 31.3 අනාගත සැලැසුම් - 2025

- සළුසල නිෂ්පාදන රාජ්‍ය හා පුද්ගලික ආයතන ආශ්‍රිතව අලෙවි කිරීම තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට යෝජිතයි.පෙබරවාරි මාසය වන විට අවශ්‍ය රජයේ ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් සළුසල නැවත සක්‍රිය කිරීම.
- සමාගම තුළ ඇති සියලුම මූල්‍ය ගැටලු නිරාකරණය කර සමාගමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැකසීමෙන් සළුසල පවත්වාගෙන යාමට ශක්තිමත් මූල්‍ය පසුබිමක් ඇතිකර ගැනීම.
- පසුගිය කාලයේ විවිධ ගැටලු නිසා සළුසල පිළිබඳ විශ්වාසය බිඳ වැටුණු තොග සැපයුම්කරුවන් මෙන්ම සිල්ලර සැපයුම්කරුවන්ද නැවත සක්‍රීය කිරීම.
- අත්‍යන්ත්‍ර කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීම සහ ගෘහ කර්මාන්තය මඟින් සපයන නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ශක්තිමත් අලෙවිකරණ උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම සහ නිෂ්පාදන සඳහා ඔවුන්ට සාධාරණ මිලක් ගෙවීම සහතික කිරීම.
- වසර ගණනාවක් තිස්සේ නොසලකා හැර ඇති සළුසල ඉඩම් අයිතිය ස්ථාපිත කර ගැනීම.
- සිල්ලර විකුණුම් ඉහළ නැංවීමට උපකාරී වන උපායමාර්ගික ස්ථානවල සළුසල ශාඛා නැවත විවෘත කිරීම සහ වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක නොවූ අන්තර්ජාල වෙළඳසැල නැවත සක්‍රීය කිරීම.
- සළුසල ලාභදායී ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට කර්මාන්ත වෘත්තිකයන් සහ අවශ්‍ය දැනුම ලබා ගැනීම.
- සළුසල ප්‍රධාන කාර්යාලයේ භාවිතයට නොගෙන ඇති ගබඩාවන් නවීකරණය කර දීප ව්‍යාප්ත ක්ෂුද්‍ර , කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන දෙස් විදෙස් සංචාරකයන්ට තරඟකාරී මිල ගණන් යටතේ එක් ස්ථානයකින් මිල දී ගැනීමට හැකි වන පරිදි ප්‍රදර්ශනාගාර කේන්ද්‍රයක් බිහි කිරීම.
- සළුසල ආයතනයට අයත් ඉඩම් හා ගොඩනැගිලි වල බදු මුදල් එක්රැස් කිරීම වෙනුවෙන් කටයුතු කිරීම.
- අන්තර්ජාලය හරහා සළුසල නිෂ්පාදන අලෙවි කිරීම සළුසල වෙබ් අඩවිය එළිදැක්වීම
- අලෙවි මධ්‍යස්ථාන වල විකුණුම් මාර්ගගතව ඉතා කාර්යක්ෂමව ඉටු කිරීමට අපේක්ෂිතයි.
- අමාත්‍යාංශයෙන් ලබාදීමට නියමිත රුපියල් මිලියන 100ක මුදල ලබාගැනිමට බලාපොරොත්තු වේ.

# 32

# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය (NGJA)

## 32.1 හැඳින්වීම

1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරි පනත මඟින් ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය, නියාමනය සහ ප්‍රවර්ධනය සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පිහිටුවා ඇත.

ඒ අනුව කර්මාන්තකරුවන් දැනුවත්කිරීම හා මඟ පෙන්වීම, මැණික් ඉඩම් වෙන්දේසි මගින් රජයේ ඉඩම් වල මැණික් කැණීමේ අයිතිය කර්මාන්තකරුවන් වෙත ලබාදීම, රසායනාගාර සේවා සැලසීම වැනි කටයුතු කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන්ද මැණික් කැණීම් හා මැණික් වෙන්දේසි සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා නිරන්තර අධීක්ෂණය හා වැටලීම් මගින් කර්මාන්තය නියාමනයද දේශීය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන වලට ශ්‍රී ලංකාව නියෝජනය , නව වෙළඳපොලවල් කරා කර්මාන්තකරුවන් යොමුකිරීම මගින් ප්‍රවර්ධනය යන කාර්යයන් ද සිදු කරනු ලබයි. මීට අමතරව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයෙහි නියුතු සහ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සියලු පාර්ශවයන් ධෛර්යමත් කිරීම, පහසුකම් සැපයීම, ඒ සඳහා අදාල වන්නාවූ දැනුම වර්ධනය කිරීම යනාදී ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ කාර්යයන් වලද නිරතව සිටී. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ ව්‍යාපාරික ආකෘතිය, ස්වාධීනව නැගීසිට ස්වයං මූල්‍ය ස්ථාවරත්වය සහ රජය තුල තිරසාර බවින් යුත් අධිකාරිය යන සංකල්පය මත පදනම් වී ඇත.

## ප්‍රධාන අරමුණු

- මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාලව වර්ෂ 2027 වන විට මැණික් සහ ස්වර්ණාභරණ අපනයන වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 2.5 ක් දක්වා වැඩි කිරීම සහ තිරසර මැණික් පතල් කැණීමේ සහ වෙළඳාම් ක්‍රමවේදය සංවර්ධනය.
- ශ්‍රී ලංකාවේ ඇති නව මැණික් නිධි ගවේෂණය කර මැණික් කැණීමේ ප්‍රමාණය 50% කින් ඉහළ නැංවීම.
- මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයට තරුණ පරපුර ආකර්ෂණය කර ගැනිම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම. ඒ තුළින්, ක්ෂේත්‍රයට පිවිසෙන තරුණ පරපුර 2027 වන විට 20% කින් වර්ධනය කිරිම.
- 2027 වන විට ඇමරිකානු ඩොලර් මිලියන 10 ක දායකත්වයක් පාරම්පරික ස්වර්ණාභරණ ශිල්පීන් මඟින් ලබා ගැනිම.
- ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් සිදු කරන මැණික් හා ස්වර්ණාභරණ තක්සේරු කිරිමේ හා පරික්ෂා කිරිමේ කටයුතු ජාත්‍යන්තර පිළිගැනීමක් ලබාගත හැකි තත්වයට උසස් කිරිම.
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ලාභය 2027 වනවිට රුපියල් බිලියනය 1 (RS.bn) දක්වා වර්ධනය කිරීම.

## ආයතනයේ ප්‍රධාන කාර්යයන්

1993 අංක 50 දරණ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 14 වන වගන්තිය ප්‍රකාරව අධිකාරියේ කාර්යභාරය පහත පරිදි වේ.

- සංවර්ධනය සහ ප්‍රවර්ධනය
- නියාමනය සහ බලාත්මක කිරිම
- පර්යේෂණ සහ නවෝත්පාදනය
- සමාජීය සහ පාරිසරික වගකීම
- පුහුණුව සහ හැකියාවන් සංවර්ධනය

## 32.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### මූල්‍ය ප්‍රගතිය

**ලාභ ඉපයීම්**

| විස්තරය (රු.මි) | ප්‍රගතිය |
|---|---|
| ආදායම | 992.2 |
| වියදම | 765.8 |
| බදුවලට පෙර ශුද්ධ ලාභය | 226.4 |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**අධිකාරියේ විවිධ ආදායම් ප්‍රභවයන්**

| විස්තරය | ආදායම (රු.මි) | ප්‍රගතිය % |
|---|---|---|
| අපනයන සේවා ගාස්තු අදායම | 190.75 | 71% |
| මැණික් ගැරීම් බලපත්‍ර | 97.6 | 155% |
| වෙළඳ බලපත්‍ර | 144.2 | 140% |
| මැණික් කැපුම් බලපත්‍ර | 0.6 | 192% |
| මැණික් වෙන්දේසි බලපත්‍ර | 5.6 | 124% |
| වැටලීම් | 37.03 | 103% |
| ඉඩම් වෙන්දේසි | 17.3 | 7% |
| රන් ප්‍රමාණය නිශ්චය කිරීම | 19.6 | 59% |
| මැණික් රසායනාගාරය | 15.9 | 67% |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 43.3 | 158% |
| උපදේශන සේවා සැපයීම- දේශීය යාන්ත්‍රික මැණික් ගැ. | 35.5 | 96% |
| යාන්ත්‍රික මැණික් ගැරීමේ අනුමැතිය | 218.7 | 142% |
| වෙනත් ආදායම් | 165.9 | 379% |
| ශුද්ධ මූල්‍ය ආදායම | 108.7 | 135% |
| මුළු ආදායම | 1100 | 93% |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**මැණික්, ස්වර්ණාභරණ හා දියමන්ති ප්‍රතිඅපනයන ආදායම් (ඇ.ඩො.මි)**

| මුළු අපනයන (ඇ.ඩො.මි ) | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් | 384 | 148.5 |
| ස්වර්ණාභරණ | 30 | 11 |
| දියමන්ති ප්‍රතිඅපනයන | 237 | 194.9 |
| රළු ආනයන ප්‍රතිඅපනයන (මැණික්) | 9 | 3.3 |
| රළු ආනයන ප්‍රතිඅපනයන ( ස්වර්ණාභරණ) | 3 | 1.1 |
| දියමන්ති එබ්බවූ ස්වර්ණාභරණ | 8 | 1.3 |
| ගෙවුඩ්/ගෙවුඩ කට්ට | 0.06 | - |
| මුළු අපනයන | 670 | 360.3 |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**විවිධ රසායනාගාර පහසුකම් සැපයීම**

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

| | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් රසායනාගාරය (සහතිකපත් ප්‍රමාණය) | 14,088 | 8,499 |
| රන් ප්‍රමාණය නිශ්චය කිරීම (පරීක්ෂා කළ අයිතම ප්‍රමාණය) | 34,100 | 18,954 |

**විවිධ බලපත්‍ර නිකුත් කිරීම්**

| බලපත්‍ර වර්ගය (නිකුත්කරණ ලද බලපත්‍ර සංඛ්‍යාව) | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් ගැරීම් බලපත්‍ර | 7,255 | 7,897 |
| වෙළඳ බලපත්‍ර මැණික් | 6,898 | 7,391 |
| කැපුම් බලපත්‍ර මැණික් | 228 | 229 |
| වෙන්දේසි බලපත්‍ර | 1,540 | 1,837 |
| වැටලීම් (සිදුකරන ලද වැටලීම් ප්‍රමාණය) | 2,783 | 2,098 |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**සංවර්ධන ව්‍යාපෘති**

**රත්නපුර දෙමුවාවත ජාත්‍යන්තර මැණික් කුළුණ**

**<u>රත්නපුර දෙමුවාවත ජාත්‍යන්තර මැණික් කුළුණ</u>**

- රත්නපුර දෙමුවාවත ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය රුපියල් මිලියන 435 ක පමණ වියදමක් දරා දේශීය මෙන්ම විදේශීය මැණික් සහ ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන් සඳහා මෙහි මැණික් මිලදී ගැනීමේ සහ අලෙවි කිරීමේ අලෙවි කුටි 27 ක් ස්ථාපනය කර 2024 අප්‍රේල් මස 04 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.
- මෙම ගොඩනැගිල්ල තුල අපනයන මධ්‍යස්ථානයක් සහ අපනයනකරුවන්ට මැණික් සහ ස්වර්ණාභරණ අපනයනය කිරීම සඳහා අවශ්‍ය සියලුම පහසුකම් ලබා දී ඇත.

රත්නපුර දෙමුවාවත ජාත්‍යන්තර මැණික් කුළුණ ඉදිකිරීම



## 32.3 අනාගත සැලැසුම් - 2025

- සියලු පුද්ගලික රසායනාගාර ලියාපදිංචිය සඳහා වන පනත ක්‍රියාත්මක කර රසායනාගාර ලියාපදිංචි කර වාර්ෂික බලපත්‍රයක් ලබාදීම.

- කොළඹ ප්‍රධාන කාර්යාලීය ගොඩනැඟිල්ල ඉදිකිරීම.

- ජාත්‍යාන්තර ප්‍රදර්ශන වලදී ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කිරීම.

- ඉහළ අපනයන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින වෙළඳපොලවල් පුළුල් කිරීම හා නව වෙළඳපොළවල් සඳහා ප්‍රවිෂ්ඨ වීම.

- ස්වර්ණාභරණ හා රිදී නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන් නගා සිටුවීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම සහ ස්වර්ණාභරණ ගම්මාන සඳහා පහසුකම් සැලසීම.

- ස්වර්ණාභරණ ශිල්පින්ට ජාත්‍යන්තර ප්‍රදර්ශන නැරඹීම සඳහා අවස්ථාව ලබාදිම.

- ස්වර්ණාභරණ ශිල්පීන් සඳහා දේශිය වෙළඳපොළ අවකාශය විවෘත කිරීම අරමුණු කොට ජංගම පොළක් 2024 වර්ෂයේ සිට පැවැත්වීමට සැලසුම් කර ඇත.

- ස්වර්ණාභරණ ශිල්පීන් සඳහා විදේශීය පුහුණු පාඨමාලාවක් සංවිධානය කිරීම.

- අන්තර්ජාතික වශයෙන් කර්මාන්තය දියුණු කිරීම උදෙසා Facets Sri Lanka, Gem Sri Lanka සහ Jewels ප්‍රදර්ශනයන් සඳහා ප්‍රධාන සංවිධායක ලෙස කටයුතු කිරීම මෙන්ම රත්නපුර ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනය 2024 වසරේ සාර්ථකව පැවැත්වූ අතර එය අඛණ්ඩව වාර්ෂිකව පැවැත්වීමට සැලසුම් කර ඇත.

- මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් මුහුණ දී ඇති ගැටලු සාකච්ඡා කර විසඳුම් ලබාදීම සඳහා නිරන්තරයෙන් පියවර ගැනීම.

- මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ නියාමනය සහ බලාත්මක කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම, තිරසාර භාවිතයන් ඇති කිරීම සඳහා 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනය කිරීම.

- දැනට පවතින මැණික් පරීක්ෂණාගාරය අන්තර්ජාතික මට්ටමට ඉහල නැංවීමට කටයුතු කිරීම.

# 33

# මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)

## 33.1 හැඳින්වීම

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය 1950 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පාර්ලිමේන්තු පනතේ අංක 25(I) වගන්තිය ප්‍රකාරව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය පාලනය කිරීම, නඟා සිටුවීම සහ සංවර්ධනය කිරීම සඳහා පුහුණු හා පර්යේෂණ පහසුකම් සැලසීමේ පරමාර්ථයෙන් මෙම ආයතනය ස්ථාපනය කර ඇත.

### ආයතනය වෙත පැවරී ඇති බලතල

- ශ්‍රී ලංකාවේ මැණික් ඛණිජ පිළිබඳ සමීක්ෂණයක් කිරීම.
- පිහිටීම, හඳුනාගැනීම, මැණික් ගල් අනර්ඝීකරණය කිරීමේ ක්‍රම, වෙනත් අදාළ ක්ෂේත්‍රයන් හා අදාළ රත්නවිද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම.
- පතල් කැණීම, මැණික් කැපීම, ස්වර්ණාභරණ සෑදීම, මැණික් ගල් පිළිස්සීම සඳහා ක්‍රම සහ ස්වර්ණාභරණ තැනීම වැනි ක්ෂේත්‍රයන්හී මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවිධානය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුළත් ශිල්පීය සහ අනෙකුත් උපදෙස් සැපයීම.

- මැණික් කැපීම, ස්වර්ණාභරණ සැදීම, දියමන්ති ඇතුළු රත්නවිද්‍යාව, ස්වර්ණාභරණ මෝස්තර සකස් කිරීම, මැණික් ගල් අනර්ඝීකරණය, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ වෙත් අදාළ අංශ පිළිබඳව පුහුණුව ලබා දීම
- වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම සහ අදාළ මාතෘකා හා කරන ලද වැඩ කටයුතු ආදිය පිළිබඳ පත්‍රිකා හා පොත්පත් පළ කිරීම.
- ආයතනයේ කර්තව්‍යයන් නිසි ලෙස ඉටු කිරීම පහසුකිරීමට අවශ්‍ය වෙනත් දෑ කිරීම.

## 33.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### 2.1 ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ හඳුනා නොගත් මැණික් තැන්පතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ගවේෂණය කර මේ වන විට මැණික් විභව සිතියම් 19ක් හා සවිස්තරාත්මක වාර්තා සකස් කර ඇති අතර මේ වසරේදී පහත පරිදි කටයුතු සිදු කර ඇත.


පැල්මඩුල්ල, ඉංගිරිය, අයගම හා දෙහිඕවිට මැණික් විභව සිතියම් සකස් කර එහි වාර්තා සකස් කිරීම අවසන් අදියරේ පවතී. කොළොන්න ප්‍රදේශයේ ක්ෂේත්‍ර ගවේශණ කටයුතු සිදු කරමින් පවතී.

මැණික් ගැරුම් වැල්ල තුළ ඉතිරි වන දුර්ලභ පෘථිවි මූලද්‍රව්‍ය, Au සහ අනෙකුත් දුර්ලභ ලෝහ ලබා ගැනීම පිළිබඳ අධ්‍යයනය සඳහා රත්නපුර කළුගඟ සහ මහවැලි ගංගා දෝනි ආශ්‍රිතව ලබා ගත් නියැදි හා කොරන්ඩම් (කුරුවින්ද) සම්භවය පිළිබඳ අධ්‍යයනයක් සඳහා රත්නපුර, කොළොන්න, බුත්තල, ඇලහැර සහ බකමූණ යන ප්‍රදේශ වලින් ලබා ගත් නියැදි විද්‍යාගාර විශ්ලේෂණයේ පවතී.


### 2.2 මැණික්මය ගුණාංග අඩු මැණික් ඛණිජ සඳහා නව තාක්ෂණික ක්‍රමවේද භාවිතා කර අගය ඉහළ නැංවීම සඳහා ක්‍රමවේද හඳුනා ගැනීම.

➢ **<u>කිරිංචි පිළියෙල කිරීම විශ්ලේෂණය හා පිරියම්කරණය</u>**


කිරිංචි අඩු උෂ්ණත්ව යටතේ තාපකරණය මගින් අඳුරු දම් වර්ණය සහිත කිරින්චි වල පැහැදිලි බව වැඩිවිය.




තාප පිරියම් කිරිමට පෙර



*තාප පිරියම් කිරීමට පසු*




තාප පිරියම් කිරිමට පෙර හා පසු කිරිංචි වල *UV-VIS* අවශෝෂණ වර්ණාවලිය



*තාප පිරියම් කිරීමට පෙර හා පසු කිරිංචි වල FTIR වර්ණාවලිය*

➢ **<u>තෝරමල්ලි පිළියෙල කිරීම විශ්ලේශනය හා පිරියම්කරණය</u>**

තෝරමල්ලි අඩු උෂ්ණත්ව යටතේ තාපකරණය මගින් වර්ණ විපර්යාස නිරීක්ෂණය කරන ලද නමුත් පැහැදිලිබව වර්ධනය නොවීය. විකිරණ පිරියම්කරණ පරීක්ෂණ ඇරඹීමට සාම්පල සූදානම් කර ඇත.



*තෝරමල්ලි වර්ණ විශ්ලේෂණය*



➢ **<u>අප්‍රිකානු සෆායාර් පිළියෙල කිරීම විශ්ලේශනය හා පිරියම්කරණය</u>**

අප්‍රිකානු සෆායාර් පිළියෙල කිරීම විශ්ලේශනය හා පිරියම්කරණය පරීක්ෂණ ඇරඹීමට සාම්පල සූදානම් කර ඇත.

- **<u>ගෙවුඩ පිළියෙල කිරීම හා විෂ්ලේශණය</u>**

ගෙවුඩ සාම්පල පිළියෙල කර ලක්මිණි උඳුන මගින් තාප පිරියම්කරණ කටයුතු සිදුකර ඇත.

- **<u>රතුගෙවුඩ පිළියෙල කිරීම හා මූලික විෂ්ලේශනය</u>**

| | |
|---|---|
|  මිලදී ගන්නාලද රතු ගෙවුඩ නියැදියක් |  වර්ණ ශ්‍රේණිගත කිරීම |

## 2.3 මැණික්වල වර්ණ වැඩි දියුණු කිරීම සඳහා තෙවන වායුවක (H2, N2, Ar, CO2) බලපෑම හඳුනා ගැනීම

තෙවන වායුවක් සැපයීම සඳහා ලක්මිණි උඳුන නවීකරණය කිරීම අවසන් කර ඇති අතර ඊට තුන්වන වායු සැපයුම් ඒකකයක් සකසමින් පවතී.

## 2.4 නැනෝ තාක්ෂණය යොදා ගනිමින් වර්ණවත් රත්‍රන් මිශ්‍ර ලෝහයක් සෑදීම.

රත්තරං නැනෝ අංශු නිපදවීමට නව ක්‍රමවේදයක් හඳුනා ගන්නා ලද අතර ඊට අදාළ රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම සිදු කරමින් පවතී.

## 2.5 ISO 17025 රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම.

ප්‍රතීතන කටයුතු වෙනුවෙන් ලේඛන කටයුතු අවසන් කර ඉල්ලුම් පත් යොමුකිරීමට නියමිතය.

## 2.6 ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ පවතින තාක්ෂණික හා නිපුණතා හි ඌනතා හඳුනා ගැනීමේ සමීක්ෂණය.

ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව සමඟ මූලික කටයුතු සිදු කරමින් පවතින අතර ඊට අදාළ ප්‍රශ්නාවලිය සැකසීම අවසන් අදියරේ පවතී.

## 2.7 ශ්‍රී ලංකාව තුල මැණික් සඳහා වූ සංචාරක ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම පිළිබඳ අධ්‍යයනය.

මැණික් ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් මගින් ප්‍රශ්නාවලි 200 ක් පමණ පුරවා දත්ත ලබාගත් අතර එම දත්ත විශ්ලේෂණ කටයුතු සිදුකරමින් පවතී.

## 2.8 අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීම.

දෙවන අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය තායිලන්තයේ GIT ආයතනයේ නිලධාරීන්ගේ තාක්ෂණික සහයෝගය හා සහභාගීත්වය ඇතිව 2024.08.02 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහිදී පර්යේෂණ වියුක්ත (Abstracts) 12ක් ඉදිරිපත් කරමින් ඉතාමත් සාර්ථක ලෙස පවත්වන ලදී.

## 2.9 ග්‍රන්ථ එළි දැක්වීම.

ගෙවුඩ තාප පිරියම්කරණය පිළිබඳ ග්‍රන්ථය ප්‍රකාශයට අදාළ කටයුතු සිදුවෙමින් පවතී.

## 2.10 වැඩමුළු හා විශේෂ තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

| | |
|---|---|
| 2024.11.18 සිට 2024.11.22 | බේරුවල ප්‍රදේශයේ ගෙවුඩ තාප පිරියම් කිරීමේ නව ක්‍රම වේදයන් පිළිබඳ වැඩමුළුවක් |
| 2024.11.30 හා 2024.12.01 | අධිතාක්ෂණික උපකරණ භාවිතයෙන් මැණික් විශ්ලේෂණය |
| 2024.12.07 හා 08 | ගෙවුඩ තාප පිරියම් කිරීමේ නව ක්‍රම වේදයන් පිළිබඳ වැඩමුළුවක් |

## 2.11 පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම.

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාලව ජාත්‍යන්තර වෙළඳපොළ තුල වෘත්තිමයභාවයක් නිර්මාණය වී ඇති විෂයය ක්ෂ්ත්‍ර හඳුනා ගනිමින් ඒ සඳහා ගැලපෙන පුහුණු පාඨමාලා 21 කට ආසන්න ප්‍රමාණයක් තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාවේ (TVEC) ප්‍රමිති තත්ත්වයන්ට ගැලපෙන අයුරින් සංවර්ධනය කර ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ මැණික් ක්ෂේත්‍රය හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය සඳහා පුහුණු ලාභින් 1335 ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කර ඇත.

| | | |
|---|---|---|
| මැණික් ක්ෂේත්‍රය | - | 1048 |
| ස්වර්ණාභරණ ක්ෂේත්‍රය | - | 287 |
| **මුළු ශිෂ්‍ය බඳවා ගැනිම** | **-** | **1335** |

## 2.12 පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය

ආයතනයේ ප්‍රධාන කාර්යාලය ඇතුළුව සෙසු ප්‍රාදේශිය මධ්‍යස්ථාන 15 ක් දිවයිනම ආවරණය වන අයුරින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.
2024 වර්ෂයේදි මැණික් ක්ෂේත්‍රය හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාලව බඳවා ගනු ලැබූ පුහුණු ලාභින් 507 ක ප්‍රමාණයක් මේ වන විට සාර්ථකව පාඨමාලා හදාරා අවසන් කර ඇති අතර අනෙකුත් සිසුන් තවදුරටත් පාඨමාලා අධ්‍යයන කටයුතු සිදුකරයි.

## 2.13 පුහුණු පාඨමාලා විෂයය නිර්දේශ සංවර්ධනය

### 2.13.1 රත්න විද්‍යාව විෂයය NVQ 5 / 6 මට්ටමට සංවර්ධනය කිරීම

රත්න විද්‍යාව විෂයය ක්ෂේත්‍රය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 / 6 ප්‍රතිතන මට්ටම ( NVQ 5 / 6 ) ලබා ගැනීම සඳහා විෂයය නිර්දේශ සංවර්ධනය කිරීමේ කටයුතු අවසන් කිරීමට කටයුතු කර ඇත.

### 2.13.2 මැණික් හා ස්වර්ණාභරණ විෂයය සඳහා උපාධි සුදුසුකම පිරිනැමීම.

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල මූලික සහතික පත්‍ර හා ඩිප්ලෝමා සුදුසුකම ලබා ගන්නා සිසුන් සඳහා මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ උපාධි සුදුසුකම ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය හරහා පිරිනැමීමට අදාල පාඨමාලා සංවර්ධනය කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවති.

### 2.13.3 බ්‍රිතාන්‍ය මැණික් විද්‍යා සංගමයේ සමාජිකත්වය පිරිනැමීමට පාඨමාලා ආරම්භ කිරීමFGA – GEM – A )

මැණික් ක්ෂ්ත්‍රයේ විධිමත් වෘත්තීමයභාවය සනාථ කිරීමේ ජාත්‍යන්තර සුදුසුකමක් වන FGA (Gemological Institute of Great Britain ) GEM – A රත්න විද්‍යා පාඨමාලා මෙරටදි හැදැරීමේ හැකියාව ඇති කිරීම සඳහා කටයුතු කර ඇති අතර 2025 වසරේ සිට නව පාඨමාලා ආරම්භ කිරීමට හැකියාව පවති.
මෙමගින් ආයතනික ගුණාත්මකභාවය වැඩිදියුණු වන අතරම කර්මාන්තයට අදාලව ජත්‍යන්තර වෙළඳපොළ තුල අප රටට කිර්තිමත්භාවයක්ද ගොඩනැංවෙනු ඇත.

### 2.13.4 මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල වෘත්තීය සුදුසුකම තහවුරු කිරීම (RPL ක්‍රමවේදය යටතේ සහතික පත් නිකුත් කිරීම ආරම්භ කිරීම)

විධිමත් අධ්‍යාපනයක් හා කුසලතා සනාථ කිරීමට හැකියාවක් නොමැති කර්මාන්තයේ නිරත ශිල්පීන්ට පිළිගත් වෘත්තිය සහතිකයක් ලබා ගැනීම සඳහා පෙර ප්‍රවිණතා දැනුම පාදක කරගත් Recognition of prior learning (RPL) සහතික පිරිනැමීමේ කටයුතු 2024 දි ආරම්භ කරනු ලැබිණි.

### 2.14 තාක්ෂණික සංවර්ධනය

#### 2.14.1 විශේෂ තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

2024 වසරේදි විශේෂ තාක්ෂණික වැඩමුළු මාලාවක් ලෙස ලංකාවේ රන් භාණ්ඩ උකස් ක්ෂේත්‍රය හා බැංකු කර්මාන්තයට අදාලව ස්වර්ණාභරණ තක්සේරුකිරීමේ දැනුම ලබා දෙන තාක්ෂණික වැඩමුළු රාශියක් ක්‍රියාත්මත කිරීමට කටයුතු කරනු ලැබිණි. මෙමගින් කර්මාන්තයට අදාල න්‍යායික හා තාක්ෂණික දැනුම ප්‍රජාව අතරට රැගෙනයාමටත්, කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනයක් ඇති කිරීමටත්, කර්මාන්තයට අදාල ශිල්පීය කුසලතාවය සුලබ කිරීම අරමුණ වී ඇත.

### 2.15 2024 සහතිකපත් ප්‍රදානෝත්සවය පැවැත්වීම

ආයතනයේ පාඨමාලා හදරන ලද 2023/2024 අධ්‍යයන වර්ෂයට අදාල සිසුන් සඳහා සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ද මෙම වසරේදි සාර්ථකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදි. මෙමගින් කර්මාන්තයේ වෘත්තිමයභාවය ඇති කර කර්මාන්තයට අදාල ඇගයිමක් ඇති කිරීමටත් මැණික් කර්මාන්තයේ පුහුණුව වැඩි දියුණු කරමින් අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කිරීමත් අපේක්ෂාව විය.

## 33.3 අනාගත සැලසුම් - 2025

**3.1. පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම**

2025 වසරේදි මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාලව සමස්ත පුහුණු ලාභින් 1500 ක් පුහුණු කිරීමට සැළසුම වි ඇත.

**3.2. පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම හා නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම.**

කර්මාන්තයේ ඉල්ලුම අනුව බේරුවල , අකුරුස්ස සහ හදුනා ගත් ප්‍රදේශයක නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරිමට සැළසුම වි ඇත.

**3.3. පාඨමාලා සංවර්ධනය කිරීම**

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාලව උපාධි සුදුසුකම පිරිනැම්මට හා FGA සුදුසුකම පිරිනැම්මේ පාඨමාලා ආරම්භ කිරීමට සැළසුම වි ඇත.

**3.4. මැණික් හා ස්වර්ණාභරණ විෂයය ක්ෂේත්‍රයට අදාල තාක්ෂණික වැඩමුළු ක්‍රියාත්මක කිරීම**

**3.5. 2024 – 2025 අධ්‍යයන වර්ෂය සඳහා සහතිකපත් ප්‍රදානෝත්සවයක් ක්‍රියාත්මක කිරීම.**

# 34

# සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම

## 34.1 හැඳින්වීම

ලංකා සීනි සමාගම කර්මාන්ත හා ව්‍යවසායකත්ව අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන පූර්ණ රජය සතු සමාගමක් වන අතර එය දුඹුරු සීනි, එතනෝල් සහ අනෙකුත් අතුරු නිෂ්පාදන නිෂ්පාදනය කරන මෙරට විශාලතම කෘෂිකර්මය පදනම් කරගත් නිෂ්පාදන සමාගමකි.

2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසාය හෝ ඌන උපයෝගිතා වත්කම් පුනර්ජීවනය කිරීමේ පනත යටතේ එතෙක් පුද්ගලික හිමිකාරිත්වය යටතේ පැවති පැල්වත්ත සහ සෙවණගල සීනි කර්මාන්ත ශාලා රජයට පවරා ගන්නා ලදී. 2012 පටන් පැල්වත්ත සහ සෙවනගල කර්මාන්තශාලා, සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම යටතේ ක්‍රියාත්මක වේ.

සමාගම පිටස්තර වගාකරුවන්ගෙන් සහ තමන්ගේම වතුවලින් උක් සපයා ගනී. දැනට සමාගමේ ගොවීන් 10,000 ක් සහ සේවකයින් 5,367 ක් පමණ සිටිති.

## 34.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

නිෂ්පාදන කාර්ය සාධනය (2024 දෙසැම්බර් 31 දක්වා)

| විස්තරය | ඒකකය | අයවැය | තත්‍ය | විචලනය | ප්‍රගතිය % | පසුගිය වර්ෂය |
|---|---|---|---|---|---|---|
| උක් සැපයුම | මෙ.ටො | 706,612 | 617,067 | (89,545) | 87 | 634,882 |
| සීනි නිෂ්පාදනය | මෙ.ටො | 48,177 | 39,720 | (8,457) | 82 | 41,861 |
| මොලැසස් නිෂ්පාදනය | මෙ.ටො | 34,810 | 31,265 | (3,545) | 90 | 29,177 |
| එතනෝල් නිෂ්පාදනය | ලීටර් | 12,051,000 | 5,145,299 | (6,905,701) | 43 | 7,060,007 |
| බදු පෙර ලාභය | රු.මි. | 3,055.3 | (752) | (3,807.3) | (124.6) | 2,835 |

***මූලාශ්‍රය: සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම***

- බදු පෙර ලාභය 2024 නොවැම්බර් මස දක්වා සඳහන් කර ඇත.

**2024 ජනවාරි 01 සිට නොවැම්බර් 30 දක්වා කාලය තුළ සිදු කරන ලද සංවර්ධන කටයුතුවල මූල්‍ය ප්‍රගතිය**

ERP ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

- මුළු පිරිවැය - රු. මිලියන 129.6 කි
- වියදම් කළ මුදල - රු. මිලියන 71.3 කි
- භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 55%

කර්මාන්තශාලා පුළුල් කිරීම/ ධාරිතාව වැඩි දියුණු කිරීම (ටීසීඩී 1,250 සිට ටීසීඩී 1,500 දක්වා) - සෙවණගල

- මුළු පිරිවැය - රු.  මිලියන 322
- වියදම් කළ මුදල - රු. මිලියන 305
- භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 95%

## 34.3 අනාගත සැලැසුම් - 2025

- කාබන් කුළුණු සහ ස්කාගාරවල අනෙකුත් වැඩිදියුණු කිරීම් සමඟ එතනෝල් ගුණාත්මක භාවය වැඩි කිරීම.
- උක් එලදායී භූමි ප්‍රදේශය සහ බෝග කළමනාකරණය සිතියම්ගත කිරීම සඳහා නූතන තාක්ෂණය යොදා ගැනීම.
- කාබනික සීනි නිෂ්පාදන ශක්‍යතා සහ සහතික කිරීම සිදු කිරීම.
- සීනි සඳහා විකිණීම, අලෙවිකරණය සහ බෙදාහැරීමේ ආකෘතිය හඳුන්වා දීම.
- වඩා හොඳ සැලසුම් කිරීම මගින් කර්මාන්තශාලා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ සහයෝගීතාවයන් ගොඩනැගීම - උක් පරිමාව කළමනාකරණය
- නියාමන අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් අපජලය පිරිපහදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

ඉදිරි මග

- දුඹුරු සීනිවලින් එකතු කිරීමේ අගය මත බද්ද ඉවත් කිරීම සහ සුදු සීනි සඳහා එකතු කිරීමේ අගය මත බද්ද පැනවීම.
- බඩ ඉරිඟු සහ සහල් වලින් එතනෝල් නිෂ්පාදනය නතර කිරීම.
- සුදු සීනි ආනයනය මාසික කෝටාවකින් කළමනාකරණය කළ යුතු අතර ව්‍යාපාර ලියාපදිංචිය සමඟින් පිළිගත් ව්‍යාපාරයකට පමණක් ආනයනය කිරීමට අවසර ලබා දීම.
- සුදු සීනි සමඟ දුඹුරු සීනි ආනයනය කරන සමාගමවලට සහ අධ්‍යක්ෂවරුන්ට දැඩි දඬ ~~සහ~~ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සමඟ එම සීනි තොග ප්‍රතිඅපනයනය කළ යුතුය.
- සුදු සීනි කන්ටේනර් තුල දුඹුරු සීනි දිවයින තුළට ගෙන එනු ලබන බැවින් රේගුවේදී සුදු සීනි එලදායී ලෙස සුපරීක්ෂණය කිරීම.
- ශ්‍රී ලංකාවට මෙතනෝල් ආනයනය කිරීම විමර්ශනය කර මුළු පරිමාව ගණනය වන පරිදි විකුණුම් ගණනය කිරීම

# 35

# කන්තලේ සීනි සමාගම (KSCL)

## 35.1 හැඳින්වීම

- 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ කන්තලේ සීනිපුර කොට්ඨාශයේ කන්තලේ සීනි සංස්ථාව නමින් සීනි කර්මාන්ත ශාලාවක් 1957 දී ස්ථාපිත කරන ලදී.

- ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය නමින් ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන ගිය මෙය එවකට පැවැති රජය විසින් ගනු ලැබූ තීරණයක් අනුව 1989 වර්ෂයේදී 1987 අංක 23 දරණ පොදු සමාගම් පනතින් රාජ්‍ය සමාගමක් ලෙසට පරිවර්තනය කරන ලදි. එතැන් සිට ශ්‍රී ලංකා සීනි සමාගම යනුවෙන් ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යාම සිදු විය.

- 1990 දී කැබිනට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව, ශ්‍රී ලංකා සීනි සමාගම සතු කර්මාන්තශාලා තුන ස්වාධීන ආයතන තුනක් බවට පරිවර්තනය කරන ලද අතර, එම ස්වාධීන ආයතන තුන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තුනක් පත් කරන ලද අතර, ශ්‍රී ලංකා සීනි සමාගමේ සියලු වත්කම් පිළිවෙලින් කන්තලේ සීනි කර්මාන්තශාලා සමාගම, හිඟුරාන සීනි කර්මාන්තශාලා සමාගම සහ සෙවනගල සීනි කර්මාන්තශාලාව යන නම් යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ආයතන තුනට පවරා දෙන ලද අතර, ශ්‍රී ලංකා සීනි සමාගම ඈවර කරන ලදී.

- 1994 වර්ෂයේ දී කන්තලේ සිනි කර්මාන්ත ආයතනය වසා දැමීම හා සේවක පිරිස 231 දක්වා අඩු වීම නිසා එහි ඇති නිවාස හා සම්පත් ආරක්ෂා කිරීමට කලාප හතරෙහි සේවක පිරිස යෙදවීමටත් යාය 24 පොලිස් මුරපොලක් ස්ථාපනය කිරීමත් කරන ලදි. පසුව 1997 වසරේ ජනවාරි 28 දින ගැසට් පත්‍රයක් මගින් මෙම ආයතනය සම්පූර්ණයෙන්ම රජයට පවරා ගන්නා ලදි.

- ආයතනය සතු සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 8696 ක් වන අතර උක් වගාව සඳහා හෙක්ටයාර් 4887ක් සංවර්ධනය කර ඇත. හෙක්ටයාර් 2650 කැළෑවෙන් ද ඉතිරි හෙක්ටයාර් 1159 නිවාස, ඇලමාර්ග, පාරවල් හා දියබස්නා ඇලවල් වලට අයත්වේ.

- මෙම කර්මාන්තශාලාවේ දිනකට උක් ගස් මෙට්‍රික් ටොන් 1200 ඇඹරීමේ ධාරිතාවක් ඇති අතර ඇඹරුම් වාරයේ දින 160 තුල උක් ගස් මෙට්‍රික් ටොන් 192000 ඇඹරීමෙන් වාර්ෂිකව සිනි මෙට්‍රික් ටොන් 16320( උකහා ගැනීම 8.5%) නිෂ්පාදනය කර ගත හැකිය. තවද ස්කාගාරයෙන් දිනකට මොලැසස් මෙට්‍රික් ටොන් 30ක් හා වාර්ෂිකව මෙට්‍රින් ටොන් 9000 නිෂ්පාදනය කල හැක.

- විවිධ හේතු මත සේවක පිරිස තවදුරටත් අඩු වීම හා ප්‍රවාහන පහසුකම් නොමැති වීමත් වල් අලි ආරක්ෂක තාප්ප කඩා දැමීමත් නිසා වර්තමානයේ ගැටළුකාරි තත්වයක් උද්ගතව ඇත. උක් වගා කිරීම සඳහා 647 දෙනෙකුට ලබාදුන් ඉඩම් වී ගොවිතැන් කිරීම හා බලපත්‍ර ගෙන මැණික් ගැරීම ආදි කටයුතු වල යෙදී ඇත.

- දැනට මෙම කර්මාන්තශාලාවට අයත් ඉඩම්, ඉඩම් කොමසාරිස් ජෙනරාල් වෙත පවරා ත්‍රිකුණාමලය මහ දිසාපතිතුමා භාරයේ කන්තලේ සහකාර ඉඩම් කොමසාරිස් යටතේ ගොවිතැන් කටයුතු සඳහා ජනතාවට බෙදා දී ඇත.

- මෙම කර්මාන්තශාලාවේ සිනි නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා ජනතා,රාජ්‍ය,පුද්ගලික ඒකාබද්ධ හවුල්කාරිත්වයක් PPPP (People, Public, Private, Partnership) යටතේ ලංකා සිනි කර්මාන්ත ආයතනය හා හිගුරාන සිනි සමාගම සමග එක්ව පුද්ගලික ආයෝජන මත ක්‍රියාත්මක කිරීම කළ හැකි ක්‍රමවේදයක් සෙවීම සුදුසු බව සිනි ආයතන සමග කළ ප්‍රගති සමාලෝචන රැස්වීමේදි කරුණු ඉදිරිපත් විය.

# 36

# ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

## 36.1 හැඳින්වීම

ගල්ඔය වැවිලි සමාගම යනු හිඟුරාන සීනි කර්මාන්තය පුනර්ජීවනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ පෞද්ගලික අංශය අතර හවුල් ව්‍යාපාරයක් ලෙස පිහිටුවන ලද සමාගමක් වන අතර එහි අයිතියෙන් 51% ක් ශ්‍රී ලංකා රජය සතුව හා 49% ක හිමිකාරීත්වය බ්‍රවුන් සහ සමාගම හා LOLC හෝල්ඩිංස් සමාගම සතු වේ. ගල්ඔය වැවිලි සමාගමේ කළමනාකාරීත්වය ගිවිසුමක් යටතේ පෞද්ගලික අංශය වෙත ලබා දී ඇත.

අද වන විට සශ්‍රීක වෙමින් පවතින ගල්ඔය වැවිලි සමාගම සෘජු සේවකයන් 1,300 කට අධික ප්‍රමාණයකට රැකිය ලබා දී ඇති අතර හෙක්ටයාර 10,853 ක කෘෂි ඉඩම්වල ගොවීන් 11,376ක් සම්බන්ධ කර ගනිමින් උක් වගාවේ නිරත වන අතර 60,000කට අධික පිරිසක් මෙම ව්‍යාපෘතියෙන් වක්‍ර රැකියා අවස්ථා ලබා ඇත. ගල්ඔය වැවිලි කර්මාන්තායතනය පුනර්ජීවනය කර දහස් ගණනකට රැකියා උත්පාදනය කර දීම පමණක් නොව එය ලාභදායී ආයතනයක් බවට පත් කර ඇත. නවීණ යන්ත්‍රෝපකරණ සහ නිසි කෘෂිකාර්මික ක්‍රමවේදයන් භාවිතයෙන් ඵලදායිතාව ඉහළ නංවා ඇත.

සීනි නිෂ්පාදනයට අමතරව එහි අතුරු නිෂ්පාදන ලෙස ENA සහ කාබනික පොහොර නිෂ්පාදනය කෙරේ. ශ්‍රී ලංකාවේ විශාලතම කාබනික පොහොර අංගනය ද ගල්ඔය වැවිලි සමාගම සතු වේ. එය දිගාමඩුල්ල ආර්ථිකය වඩාත් ශක්තිමත් කිරීම සඳහා පෙර නිමිත්තක් වන අතර, සමාගම විසින් දැනටමත් සිදු කිරීමට ආරම්භ කර ඇති ගල්ඔය වැවිලි ව්‍යාපෘති වන සීනි කර්මාන්තශාලා විස්තාරණය, මෙගාවොට් 3.75 සූර්ය බලශක්ති ව්‍යාපෘතිය, කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදන ව්‍යාපෘතිය ආදී ව්‍යාපෘති තුළින් දිගාමඩුල්ලට සිය සෞභාග්‍යය වැඩිකර ගැනීමට හැකිවනු ඇත.

ඉඩම් පරිහරණය, වගාව සහ එහි සේවා, නිෂ්පාදන මෙහෙයුම්, රැකියා අවස්ථා, මූල්‍ය අංශය මෙන්ම පොදු පරිපාලන කටයුතු ආදී සියලු ක්ෂේත්‍රවල කාර්යක්ෂමතාව ඉහළ නංවමින් අගය එකතු කළ නිෂ්පාදනයන් සඳහා පවතින සියලු සම්පත් ප්‍රයෝජනයට ගැනීමට ගල්ඔය වැවිලි කළමනාකාරිත්වය පුළුල් දැක්මකින් ක්‍රියා කරණු ලබයි. සාධක සීමා නොකර, කළමනාකරණය විසින් ශ්‍රී ලාංකීය කර්මාන්තයට ආදර්ශයක් ලෙස 360˚ ක විවිධාංගීකරණය වූ පරිසර හිතකාමී කර්මාන්තයක් ලෙස ගල්ඔය වැවිලි සමාගම පත් කිරීම සඳහා නිෂ්පාදනයන් වැඩිදියුණු කිරීම දැනටමත් ආරම්භ කර ඇත.




## 36.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

ගල්ඔය වැවිලි (පුද්) සමාගම 2023 වසරේ සිට 2024 වසර දක්වා ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. පෙන්වා දී ඇති දත්ත අනුව උක් වගා ප්‍රදේශ, සීනි නිෂ්පාදනය, ENA නිෂ්පාදනය, කොම්පෝස්ට් නිෂ්පාදනය සහ සූර්ය බලශක්ති උත්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, මෙහෙයුම්වල වර්ධනය සහ කාර්යක්ෂමතාව මෙමගින් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ වැඩිදියුණු කිරීමක් සිදු වූවද සෘජු සේවක සංඛ්‍යාවෙහි සුළු අඩුවීමක් දැකිය හැක.

### වගා වපසරිය

**2023: හෙක් 7,397 හා 2024: හෙක් 10,853**

වර්ධනය: 2024 දී උක් වගා බිම් 47.6% ක වර්ධනයක්.

උක් වගා ප්‍රදේශ ව්‍යාප්තිය මගින් පෙන්නුම් කරන්නේ උක් දඬු නිෂ්පාදනය වැඩි කිරීම සඳහා විශාල ප්‍රවේශයක් මගින් සීනි නිෂ්පාදනය සඳහා උක් සැපයුම ඉහළ නැංවීමයි.

### ගොවීන් සංඛ්‍යාව

**2023: ගොවීන් 11,217 හා 2024: ගොවීන් 11,376**

වර්ධනය: ගොවීන් සංඛ්‍යාවේ 1.4% වැඩිවීමක්.

උක් වගාවේ නිරත ගොවීන්ගේ වැඩිවීම මගින් වගා වපසරිය පුළුල් කිරීම සහ උක් වගාව සඳහා වඩාත් පුළුල්ව පැතිරුනු ගොවීන්ගේ මැදිහත්වීම පෙන්නුම් කරයි.

### උක් දඬු සැපයුම

**2023: මෙ.ටොන් 231,350 හා 2024: මෙ.ටොන් 408,081**

වර්ධනය: උක් දඬු සැපයුම 76.4% කින් වැඩි වීම.

උක් දඬු සැපයුමෙහි සැලකිය යුතු වර්ධනයක් තුළින් උක් වගාවන් සිදු කරන ප්‍රදේශ වැඩි වීම සහ වඩා හොඳ අස්වනු නෙලීමේ ක්‍රමවත් පිළිවෙත් මගින් සීනි නිෂ්පාදනය සඳහා වැඩි වශයෙන් දායක වීම පෙන්නුම් කරයි.

**සීනි නිෂ්පාදනය**

**2023: මෙ.ටොන් 14,581 හා 2024: මෙ.ටොන් 26,382**

වර්ධනය: සීනි නිෂ්පාදනයේ 80.8% වැඩි වීම.

සීනි නිෂ්පාදනයේ වර්ධනය හෙක්ටයාරයකට, වඩා හොඳ අස්වැන්නක් සහතික කරමින් උක් සැපයුම වැඩි කිරීම සහ වැඩිදියුණු කළ සැකසුම් හැකියාවන් මෙයට ඍජුවම හේතු වේ.

**සීනි උකහාගැනීමේ ප්‍රතිශතය**

2023: 6.43% හා 2024: 6.46%

වර්ධනය: සීනි උකහාගැනීම 0.5% වැඩි වීම.

සීනි උකහාගැනීම වැඩි වීම වඩා හොඳ සැකසුම් ක්‍රම සහ වඩා හොඳ තත්ත්වයේ උක් දඩු පිළිඹිබු කරමින් උක්, සීනි බවට පරිවර්තනය කිරීමේ කාර්යක්ෂමතාවයේ දියුණුවක් පෙන්නුම් කරයි.

**ENA නිෂ්පාදනය**

**2023: ලීටර් 3,930,000 හා 2024: ලීටර් 5,597,104**

වර්ධනය: ENA නිෂ්පාදනයේ 42.3% වැඩි වීම.

ENA නිෂ්පාදනයේ කැපී පෙනෙන වැඩිවීම, අගය එකතු කළ නිෂ්පාදන පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම, ආයතනයේ ආදායම වැඩි කිරීම සඳහා මග පාදයි.

**කොම්පෝස්ට් නිෂ්පාදනය**

**2023: මෙ.ටොන් 2,400 හා 2024: මෙ.ටොන් 4,095**

වර්ධනය: කොම්පෝස්ට් නිෂ්පාදනය 70.6% කින් වැඩි වීම.

කොම්පෝස්ට් නිෂ්පාදනය ඉහළ යාම, පරිසර හිතකාමී විසඳුම් නිර්මාණය කිරීම සඳහා උක් කර්මාන්තයේ අතුරු නිෂ්පාදන භාවිතා කරමින් තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කරයි.

**බලශක්ති උත්පාදනය**

**2023: මෙ.වො.පැ.1,840 හා 2024: මෙ.වො.පැ.4,590**

වර්ධනය: බලශක්ති උත්පාදනය 149% වැඩි වීම.

බලශක්ති උත්පාදනයේ වැඩි වීම ජාතික විදුලි බලපද්ධතියට ඇති බර අඩුවීම පෙන්නුම් කරයි.

**සූර්ය බලශක්ති උත්පාදනය**

**2023: මෙ.වො.පැ.1,855 හා 2024: මෙ.වො.පැ.4,258**

වර්ධනය: සූර්ය බලශක්ති උත්පාදනය 129% කින් වැඩි වීම.

සූර්ය බලශක්ති උත්පාදනයේ සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරන්නේ පුනර්ජනනීය බලශක්තිය සඳහා ආයතනයේ උනන්දුව, කැපවීම, හා ඒ සඳහා සිදු කරන ලද සැලකිය යුතු ආයෝජනයන් මඟිනි.

**ජීව වායු නිෂ්පාදනය**

**2023: කි.ග්‍රෑ. 795,487 හා 2024: කි.ග්‍රෑ 1,554,944**

වර්ධනය: ජීව වායු නිෂ්පාදනයේ 95% වැඩි වීම.

ජීව වායු නිෂ්පාදනයේ කැපී පෙනෙන වර්ධනයක් පිළිබිඹු කරමින්, අපද්‍රව්‍ය වටිනා නිෂ්පාදනයක් සඳහා යොදා ගැනීමේදී ඉහල කාර්යක්‍ෂමතාවය සහ නිෂ්පාදන හැකියාවන් පුළුල් කිරීම ඉස්මතු කරයි. මෙය බොයිලේරු තුළ දැවි තෙල් ලීටර් 1,123,277 ක් ඉතිරි කර ඇත.

**සාරාංශය**

විස්තාරණය සහ වර්ධනය: සමාගමෙහි වගා බිම් ප්‍රදේශ, සීනි නිෂ්පාදනය, ENA නිෂ්පාදනය සහ කොම්පෝස්ට් නිෂ්පාදනය ඇතුළු ප්‍රධාන නිෂ්පාදන වල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙම සංඛ්‍යාලේඛන වලින් ගල්ඔය වැවිලි සමාගම එහි මෙහෙයුම්, ඵලදායිව ඉහල නංවමින් නිෂ්පාදන වැඩි දියුණු කරමින් සිටියි.

පුනර්ජනනීය බලශක්ති අවධානය: සූර්ය බලශක්ති උත්පාදනය 2023 දී මෙගාවොට් 1,855 සිට 2024 දී මෙගාවොට් 4,258 දක්වා විශාල ලෙස වැඩි වීම තිරසාරභාවය සහ පුනර්ජනනීය නොවන බලශක්ති ප්‍රභවයන් මත යැපීම අඩු කිරීම සඳහා ශක්තිමත් කැපවීමක් පෙන්නුම් කරයි.

තිරසාරත්වය: කොම්පෝස්ට් නිෂ්පාදනය වැඩි වීමත් සමඟ, සමාගම පුළුල් පාරිසරික ඉලක්ක සමඟ පෙළගැසෙමින් තිරසාර වගාවන් හා නිෂ්පාදන පිළිවෙත් සඳහා වූ සිය කැපවීම තවදුරටත් ශක්තිමත් කරයි.

## 36.3 අනාගත සැලැසුම් - 2025

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභ / විස්තර |
|---|---|
| කර්මාන්තශාලා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය නිම කිරීම | උක් වගා බිම් ප්‍රමාණය, උක් දඩු සැපයුම, සීනි නිෂ්පාදනය, ENA නිෂ්පාදනය, ජාතික විදුලිබල පද්ධතියට බලශක්ති උත්පාදනය සහ සැපයීම, ජෛව කොම්පෝස්ට් නිෂ්පාදනය, කාබන්ඩයොක්සයිඩ් වායුව නිස්සාරණය කිරීම, උඳුන් තෙල් වෙනුවට ජීව වායුව නිෂ්පාදනය වැනි දෑ වැඩි කිරීම. |
| මත්පැන් බෝතල් කම්හල | ආනයන ආදේශන අගය ඉතිරි කර නව නිෂ්පාදන හා අපනයන හඳුන්වාදීම හරහා විදේශ විනිමය උපයා ගැනීම. |
| CO2 බෝතල් කම්හල | BOO පදනම මත දිනකට CO2 කි.ග්‍රෑ. 10,000 ක් තිර කිරීමට අපේක්ෂා කෙරේ. CO2 ආනයනය කිරීමේ පිරිවැය අඩු කිරීම සහ ප්‍රදේශයේ අවශ්‍යතා සපුරාලීම. |
| CNG නිෂ්පාදනය | ජීව වායුව භාවිතයෙන් බලශක්ති උත්පාදනය සහ CNG නිෂ්පාදනය. 300KvA බලශක්තිය ක්නිපදවීමේ හැකියාව. |
| කොම්පෝස්ට් පෙතිකරණය (Compost Pelletizing) | කොම්පෝස්ට් පෙති සෑදීමේ වාසිය නම් දූවිලි වැනි අංශු සෑදීම අවම කිරීම, පරිසර දූෂණය අවම කිරීම, පොහොර මුදා හැරීම වඩා හොඳින් පාලනය කිරීම, පහසු ප්‍රවාහනය, ක්ෂේත්‍රයට යෙදීම පහසු කිරීම සහ දිගු කල් තබා ගැනීම මෙන්ම පෙතිවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා රසායනික ආකලන එකතු කිරීමේ හැකියාවයි. |
| සුවඳ විලවුන්, තිනර්, නිය ආලේපන ඉවත් කිරීමේ ද්‍රව්‍ය නිෂ්පාදනය | ස්කාගාරයේ නිපදවන ස්ප්‍රීතු භාවිතයෙන් සුවඳ විලවුන් නිෂ්පාදනය, තිනර් නිෂ්පාදනය, නිය ආලේපන ඉවත් කිරීමේ ද්‍රව්‍ය නිෂ්පාදනය. |
| අත් සනීපාරක්ෂක නිෂ්පාදනය | අත් සනීපාරක්ෂක ලීටර් 200,000 දැනටමත් නිෂ්පාදනය කර ඇති අතර ඉදිරියේදී නිෂ්පාදනය වැඩි කිරීමට නියමිතය. |

# 37

# උක් පර්යේෂණ ආයතනය (SCRI)

## 37.1 හැඳින්වීම

උක් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ වැඩසටහන ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයේ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා ඵලදායිතාව, ලාභදායිත්වය සහ තිරසාර බව ඉහළ නැංවීම අරමුණු කරගනිමින් පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර හයක් යටතේ පවත්වන ලදී.

i. බෝග වැඩිදියුණු කිරීම
ii බෝග සහ සම්පත් කළමනාකරණය
iii. බෝග පෝෂණය
iv. බෝග ආරක්ෂාව
v. සැකසුම් සහ නිෂ්පාදන තාක්ෂණය
vi. යාන්ත්‍රීකරණ තාක්ෂණය

2004 ශ්‍රේණියේ නව උක් ප්‍රභේද දෙකක් සහ පටක රෝපණ උප ක්ලෝනයක් 2024 දී වාණිජ වගාව සඳහා නිකුත් කරන ලදී. ලංකා සීනි සමාගම (පුද්ගලික) පැල්වත්තේ දී, 2006 ශ්‍රේණියේ ප්‍රභේද තුනක් සහ 2007 ශ්‍රේණියේ ප්‍රභේද දෙකක් සඳහා විශාල මෝල් පරීක්ෂණ පවත්වන ලදී.

## 37.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### බෝග වැඩිදියුණු කිරීම

- උක් පර්යේෂණායතනය මගින් නිෂ්පාදනය කරන ලද SL 04 224 සහ SL 04 124 යන නව දෙමුහුන් උක් ප්‍රභේද දෙක සහ SLT 04 5222 පටක රෝපණ උප ක්ලෝනය වාණිජ වගාව සඳහා නිකුත් කරන ලදී.
- ii SL0610, SL06540, SL06971, SL073498, සහ SL073505 උක් ප්‍රභේද විශාල මෝල් පරීක්ෂණ පැල්වත්තේ ලංකා සීනි (පුද්ගලික) සමාගමේදී සිදු කරන ලදී. අලුතින් නිකුත් කරන ලද සහ විශාල මෝල්-පරීක්ෂා කරන ලද ප්‍රභේදවල සුක්‍රෝස් අන්තර්ගතය 11.38% සිට 12.90% දක්වා පරාසයක පවතී.
- SL2006 සහ SL2007 ශ්‍රේණිවලින් තෝරාගත් උසස් ප්‍රභේද සහ විවිධ උක් වගා කරන ප්‍රදේශවල ඇගැයීම් වැඩසටහන්වලදී තෝරාගත් විදේශීය ප්‍රභේද ඉදිරි වර්ෂවලදී වාණිජමය වශයෙන් නිකුත් කිරීම සඳහා ගුණනය කරන ලදී.
- චීනයෙන් ආනයනය කරන ලද ප්‍රභේද 29ක් නිරෝධායන ක්‍රියාවලිය අවසන් වූ පසු උක් ජාන ප්ලාස්මයට එකතු කිරීම සඳහා මුදා හරින ලදී.
- තෙපොංගල් උත්සව සමයේ කොළඹ ප්‍රදේශයේ දේශීය ගවේෂණය මගින් උක් වර්ග තිස් හයක් (36) එකතු කර, අභිජනන අරමුණු සඳහා උක් ජාන ප්ලාස්මයට ඇතුළත් කරන ලදී.
- එනසාල්වත්ත උප මධ්‍යස්ථානයේ නඩත්තු කරන උක් ජාන ප්ලාස්මයෙන් උක් වර්ග හැටක්, ජානමය වශයෙන් කාණ්ඩ ගත කර අභිජනන කටයුතු සඳහා භාවිතා කරන ලදී.

### බෝග සහ සම්පත් කළමනාකරණය

- උක් පර්යේෂණ ආයතනයේ කාලගුණ මධ්‍යස්ථානයේ එක් එක් මාසය සඳහා කාලගුණ දත්ත එක්රැස් කරන ලද සාරාංශයක් කොළඹ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට යවන ලදී.
- ii Saflufenacil 68 g/l + Dimethanamide-P 600 g/l EC (වෙළඳ නාමය: Integrity) යන නව වල් නාශකයේ කාර්යක්ෂමතාවය ඇගයීම සම්පූර්ණ කරන ලද අතර, නිර්දේශය පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.
- උක් පර්යේෂණායතනයේ භෝග සම්පත් කළමනාකරණ අංශයේ මගපෙන්වීම යටතේ කිලිනොච්චි ආනවිල්ලුන්තාන් හකුරු සැකසුම් ඒකකය රාජ්‍ය-පෞද්ගලික අපනයනය ඉලක්ක කරගත් ව්‍යාපාරයක් ලෙස වැඩිදියුණු කරන ලදී.

### බෝග පෝෂණය

- උක් බොයිලර් අළු භාවිතයෙන් නයිට්‍රජන් පොහොසත් කාබනික පොහොර නිපදවන ලද අතර මූලික තත්ත්ව තක්සේරු පරීක්ෂණ අවසන් කරන ලදී.
- ඇතිමලේ සහ ගල්ඔය වතුවල ක්ෂේත්‍ර මට්ටමේ පාංශු සමීක්ෂණ අවසන් කර ඇත.
- උක් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ කටයුතු සඳහා, සීනි කර්මාන්ත ආයතන සහ පෞද්ගලික අංශයේ අවශ්‍යතා සඳහා විශ්ලේෂණ සේවා සපයන ලදී.

**බෝග ආරක්ෂණය**

- උක් කඳ විදින පණුවන් සඳහා කැටිති පළිබෝධනාශකයක් ලෙස ක්ලෝරන්ට්‍රනිලිප්‍රෝල් සඳහා නිර්දේශය අවසන් කිරීම. Chlorantraniliprole 0.4% (w/w) G උක් කඳ සහ රිකිලි විදින පණුවන් වර්ග දෙකම කළමනාකරණය කිරීම සඳහා නිර්දේශ කෙරේ.

- ගොවීන් මට්ටමින් උක් ලොම් කුඩිත්තන්ගේ (Woolly Aphid) තිරසාර කළමනාකරණය සඳහා පැසුණු කොහොඹ පදනම් කරගත් නිස්සාරකවල විභවය හඳුනා ගැනීම. යෙදුමෙන් පසු පැය 48 සිට 100% පාලනය ලබා ගනී.

- අලුතින් හඳුනාගත් ආකර්ශනීය වාෂ්පශීලී ද්‍රව්‍ය භාවිතා කරමින් පර්ව අතර විදින පරිණත පණුවන් කළමනාකරණය කිරීම සඳහා අර්ධ රසායනික පාදක උගුල් උපාංගයක් වන බීටා-ඔසිමන් සංකල්පය සැකසීම.

- සුදු පත්‍ර රෝග වාහකය එනම් Buvaraia basiana, Metarisium anisopliae කළමනාකරණය කළ හැකි එන්ටොමෝපාතෝජනික් දිලීර දෙකක් හඳුනා ගැනීම.

**සැකසුම් තාක්ෂණය**

- Chlorella vulgaris නම් ජීව විද්‍යාත්මක කාරකය ඇතුළත් කිරීමෙන් උක් විනාස් වල රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) සහ ජීව විද්‍යාත්මක ඔක්සිජන් ඉල්ලුම (BOD) අඩු කිරීමට ස්වභාවික සහ පරිසර හිතකාමී ක්‍රමයක් හඳුනා ගන්නා ලදී.

- ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් ලැබුණු උක්වලින් උක් හකුරු කිලෝග්‍රෑම් 1793ක් නිෂ්පාදනය කරන ලදී.

- එනසාල් රස කළ සීනි සහ කුරුඳු රස කළ සීනි ලෙස රස කළ සීනි වර්ග දෙකක් රසායනාගාර තත්ත්ව යටතේ සංවර්ධනය කරන ලදී.

- ශ්‍රම පිරිවැය අඩු කිරීමට සහ හකුරු සැකසුම් ඒකකයේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට හකුරු සැකසුම් ඒකකය සඳහා පැන් බැරලයක් නිර්මාණය කරන ලදී. බැරලය තුළ ඇති පාලිත පරිසරය, වැඩිදියුණු කළ වයනය සහ ගුණාත්මක බවින් උසස් තත්ත්වයේ හකුරු නිෂ්පාදනයක් සහතික කරයි.

**යාන්ත්‍රික තාක්ෂණය**

- උක් පර්යේෂණ ආයතනය විසින් සපයන ලද රෝද හතරේ ට්‍රැක්ටරයට සවිකර ඇති උක් ඉඩම් අතුරුයත්ගැමේ පර්යේෂණ කටයුතු සඳහා ගල්ඔය වැවිලි සමාගම වෙත භාර දුන් සිව්රෝද ට්‍රැක්ටර් සඳහා සවිකර හැකි උපකරණ සහ පෙති පොහොර යොදන යන්ත්‍රය පිළිබඳ ගල්ඔය වැවිලි (පුද්) සමාගමේ ක්ෂේත්‍ර ඇගයීම සාර්ථක වූ අතර උක් පර්යේෂණ ආයතනය මඟින් සපයනු ලබන සේවාව දීර්ඝ කරන ලෙස ගල්ඔය වැවිලි සමාගමේ ඉල්ලීම පරිදි එය අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

- ඇතිමලේ වැවිලි සමාගමේ ඉදිකර ඇති බීජ උක් උණුදිය ප්‍රතිකාර ඒකකයේ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කර එහි ඉදිරි වැඩිදියුනු කටයුතු පිළිබඳව උපදෙස් ලබාදෙන ලදී.

- උඩවලව උක් පර්යේෂණායතනයේ බීජ උක් උණු දිය ප්‍රතිකාර කිරීම් කරගෙන යාම හා කාලීන නඩත්තු කටයුතු පවත්වාගෙන යන ලදී

- උක් පර්යේෂණායතනයේ ගොවිපළේ සහ අනෙකුත් උපපොළවල වන සතුන්ගේ හානි පාලනය කිරීම සඳහා ඉදිකර ඇති විදුලි වැටවල ප්‍රශස්ත වෝල්ටීයතා මට්ටමක් පවත්වා ගැනීම.

**ආර්ථික විද්‍යාව, ජෛවමිතිය සහ තොරතුරු තාක්ෂණ**

- උක් වගාවේ සංයුක්ත පොහොර යෙදීම පිළිබඳ ආර්ථික ශක්‍යතා විශ්ලේෂණයක් සිදු කරන ලදී. සොයාගැනීම්වලින් පෙනී ගියේ උඩවලව වාරිපෝෂිත ප්‍රදේශවලට සංයුක්ත නොවන පොහොර සහ සංයුක්ත පොහොර 75:25 අනුපාතයෙන් යෙදීම ආර්ථික වශයෙන් ලාභදායී බවයි.

- 2023 දී සීනි කර්මාන්ත ශාලාවල උක් වල වාණිජ වටිනාකම තක්සේරු කල අතර, එය ටොන් එකක් සඳහා රු. 45,000 සිට රු. 50,000 අතර විය.

- උක් කර්මාන්තයේ සැපයුම් දාමය විශ්ලේෂණය කිරීමේ අරමුණින් ගොවි සමීක්ෂණයක් සඳහා ප්‍රශ්නාවලියක් සකස් කරන ලදී.

- 2024 සිට 2026 දක්වා වර්ෂයන් ආවරණය වන පරිදි උක් පර්යේෂණ ආයතනය (SRI) සඳහා ආයතනික උපාය මාර්ගික සැලැස්ම සකසා අවසන් කරන ලදී.

**තාක්ෂණ හුවමාරුව සහ සංවර්ධනය**

- තාක්ෂණ හුවමාරු සහ සංවර්ධන අංශය අනෙකුත් පර්යේෂණ අංශවල සහාය ඇතිව, ගොවීන් සහ සීනි කර්මාන්තයේ පිරිස් සඳහා උක් වගාව සහ අදාළ විෂය ක්ෂේත්‍ර පිළිබඳ පුහුණු/දැනුවත් කිරීමේ වැඩසටහන් 31ක් පවත්වන ලදී/සම්බන්ධීකරණය කරන ලදී. මෙම වැඩසටහන් සඳහා පුද්ගලයින් 1031 දෙනෙකු (ගොවීන් 823 ක් සහ නිලධාරීන් 108 ක්) සහභාගී වී ඇත. මීට අමතරව, SRI හි විවිධ පාර්ශවකරුවන්ගේ ඉල්ලීම පරිදි, පුහුණු කිරීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 08 ක් පවත්වන ලදී. පුද්ගලයින් 363 දෙනෙකු (ශිෂ්‍යයින්, ව්‍යවසායකයින්, ආදිය) සහභාගී වී ඇත.

- උක් අංශයේ පර්යේෂකයන්, ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන් අතර දිගු පණිවිඩ හුවමාරු කිරීම සඳහා අඛණ්ඩව SRI TTD eSMS සේවාව. SRI FB පිටුව, සහ YouTube නාලිකාව හරහා සීනි කර්මාන්තයේ තොරතුරු බෙදාගැනීම සහ SRI වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම දිගටම කරගෙන යාම. මීට අමතරව, SRI පුවත් පත්‍රිකාවේ 13 වන වෙළුම (SRI හි Puwath Hasuna) ප්‍රකාශයට පත් කරන ලදී.

**සංවර්ධන කටයුතු**

2024 ජනවාරි 01 වැනිදා සිට දෙසැම්බර් 31 වැනිදා දක්වා සිදු කරන ලද සංවර්ධන කටයුතුවල මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

**මානව සම්පත් සංවර්ධනය**: 2024 දී මානව සම්පත් සංවර්ධනය සඳහා රුපියල් 1355000ක් වෙන් කරන ලද අතර කාර්ය මණ්ඩල පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය සඳහා වැය කර ඇත්තේ රුපියල් 499,969ක් පමණි.

**ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම:** වර්ෂය සඳහා රුපියල් මිලියන 8.2 ක් වෙන් කරන ලද අතර යටිතල පහසුකම් සඳහා පහසුකම් සැලසීම මගින් පර්යේෂණ හා සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා මිලියන 7.722 ක් වැය කරන ලදී.

**ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම:** වර්ෂය සඳහා රුපියල් මිලියන 20.445 ක් වෙන් කරන ලද අතර රසායනාගාර සහ යන්ත්‍රෝපකරණ උපකරණ මිලදී ගැනීම සඳහා මිලියන 13.517 ක් වැය කරන ලදී.

වසර සඳහා ප්‍රාග්ධන අයිතම සඳහා මුළු මිලියන 30 ක් වෙන් කර ඇති අතර, 2024 දෙසැම්බර් 31 වන දින වන විට වියදම් කර ඇත්තේ මිලියන 21.738 ක් පමණි.

## 37.3 අනාගත සැලැසුම් - 2025

- 2025 දී වාණිජ වගාව සඳහා උක් වර්ග දෙකක් නිකුත් කිරීම.
- පකිස්ථානයෙන් උක් ප්‍රභේද ආනයනය කිරීම සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයෙන් උක් වර්ග දේශීයව එකතු කිරීම.
- උක් ජාන ප්ලාස්මය අණුක විද්‍යාත්මකව කාණ්ඩගත කිරීම.
- ඇතිමලේ සහ හිඟුරාන උක් වගා කරන ප්‍රදේශ සඳහා පොහොර නිර්දේශ සංශෝධනය කිරීම.
- ඇතිමලේ, හිඟුරාන සහ කන්තලේ සඳහා සවිස්තරාත්මක පාංශු ලක්ෂණ සිතියම් සකස් කිරීම.
- උක්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ක්ෂුද්‍ර පෝෂක පොහොර යෙදීම් පිළිබඳ නිර්දේශ ලබා දීම.
- උක් වගාව සඳහා උසස් පොහොර ඇගයීම සහ පරීක්ෂා කිරීම.
- පාංශු කාබන් පොහොසත් කිරීම සහ තිරසාර බව ප්‍රවර්ධනය කිරීම සඳහා නව පොහොර නිෂ්පාදන හඳුන්වා දීම.

# 38

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB)

## 38.1 හැඳින්වීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය [EDB] යනු අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා වන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනනය වන අතර එය 1979 දී අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවන ලදී. 2024 වන විට වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 16.4 ක විදේශ විනිමය ඉපැයීම් අත්කර ගැනීම සහ එමඟින් රජය විසින් නියම කර ඇති සංවර්ධන අරමුණු සඳහා දායක වීම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීමේදී අපනයන සංවර්ධන මණ්ඩලය නව උපායමාර්ගික ප්‍රවේශයක් අනුගමනය කළේය. ජාතික අපනයන ඉලක්ක සපුරා ගැනීම සඳහා නව උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමේදී එහි වගකීම් ඉටු කිරීමේදී ප්‍රතිපත්ති උපදේශක, නිරීක්ෂක, ප්‍රවර්ධක, පහසුකම් සපයන්නා සහ දැනුම සපයන්නා ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය සිය භූමිකාවන් ඉටු කරයි.

2024 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ, වෙළඳ භාණ්ඩ සහ සේවා යන දෙකම ඇතුළත් මුළු අපනයන වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 14,785.96 ක් වූ අතර එය 2023 වසරේ එම කාලයට වඩා 6.64% ක වර්ධනයක් වාර්තා කරන ලදී. විශේෂයෙන්, පළමු මාස එකොළහ තුල වාර්ෂික අපනයන ඉලක්කය වන ඇමරිකානු ඩොලර් බිලියන 16.4 න් 90% ක් සාක්ෂාත් කර ගැනීම අපනයන සංවර්ධන මණ්ඩලයේ උපායමාර්ගික උත්සාහයන්හි කාර්යක්ෂමතාව සහ ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ ඔරොත්තු දීමේ හැකියාව මනාව පෙන්නුම් කරයි.

## 38.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා දරන ලද වියදම 2024 අපනයන සංවර්ධන මණ්ඩල සංවර්ධන අයවැයෙන් වෙන් කරන ලද රුපියල් මිලියන 300 න් රුපියල් මිලියන 132.24 කි. ඊට අමතරව, වෙළඳපොළ සංවර්ධන කටයුතු සඳහා අපනයන කරුවන්ගේ දායකත්වය ලෙස රුපියල් මිලියන 614.34 ක් යොදා ගන්නා ලදී.

### අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය

අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා පවතින ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම යටතේ ප්‍රමුඛතා ක්ෂේත්‍ර ලෙස හඳුනාගෙන ඇති තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ සේවා (ICT/BPM) කුළුබඩු සහ සාන්ද්‍රණ ද්‍රව්‍ය, බෝට්ටු ගොඩනැගීම, ආහාර සහ පාන වර්ග, විදුලි සහ ඉලෙක්ට්‍රොනික සංරචක සහ සැපයුම් අංශ ඉලක්ක කර ගනිමින් අපනයන සංවර්ධන මණ්ඩලය ප්‍රධාන මුලපිරීම් කිහිපයක් ක්‍රියාත්මක කළේය. මීට අමතරව, නැගී එන ප්‍රමුඛතා ක්ෂේත්‍ර ලෙස හඳුනාගෙන ඇති පොල් ආශ්‍රිත නිෂ්පාදන, වාහන සංරචක සහ සමුද්‍ර සහ අක්වෙරළ අංශවල අපනයන වැඩි දියුණු කිරීම සඳහා උපායමාර්ගික මැදිහත්වීම් සිදු කරන ලද අතර, රටේ අපනයන වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් සපයන අංශ ලෙස ඇඟලුම් සහ රබර් කර්මාන්ත සඳහාද ප්‍රමුඛත්වය දෙන ලදී.

"Voyage Sri Lanka 2024" යන මාතෘකාව යටතේ පැවති පළමු සමුද්‍ර සමුළුව 2024 නොවැම්බර් 26 වන දින සාර්ථකව පැවැත්විණි, එයට 200 කට අධික පිරිසක් සහභාගී වූහ. ඉන්දියාව, සෞදි අරාබිය, මාලදිවයින, ප්‍රංශය, ජපානය, තායිලන්තය, එක්සත් ජනපදය සහ කාම්බෝජය වැනි රටවලින් විභව විදේශීය ආයෝජකයින් 20 දෙනෙකු ත්‍රිකුණාමලය සහ හම්බන්තොට වරායන් නැරඹූහ. මෙම සංචාර මගින් සමුද්‍රීය ආයෝජන සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ වර්ධනය වන විභවය සහ එහි නැගී එන නිල් ආර්ථිකය( සාගර ආර්ථිකය) අවධාරණය කෙරිණි.

ව්‍යාපාර සම්බන්ධතා, දැනුවත් කිරීමේ සැසි සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ සේවා අංශය (ICT/BPM) සඳහා GITEX වෙළෙඳ ප්‍රදර්ශනයේ ශ්‍රී ලාංකීය සහභාගීත්වය උතුරු ඇමරිකානු සහ ජපන් වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් වැඩසටහන් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා කුරුඳු සඳහා වූ PGI සහතික ලබා දීමේ යෝජනා ක්‍රමය යටතේ සමාගම් 55 ක් සහතික ලබා ගත්හ. මෙයට අමතරව චීනයේ ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලද අතර Biofach 2024 හි නව නිෂ්පාදන දියත් කරන ලදී.

ඩුබායි ජාත්‍යන්තර බෝට්ටු ප්‍රදර්ශනයේදී ශ්‍රී ලාංකික බෝට්ටු තැනීමේ සමාගම්වල සහභාගීත්වය සඳහා පහසුකම් සපයන ලද අතර, ආහාර හා පාන අංශය 2024 Gulfood වෙළඳ ප්‍රදර්ශනයේ දී ඇමරිකානු ඩොලර් මිලියන 11 ක ස්ථිර ඇණවුම් ලබා ගත් අතර, විශේෂයෙන් සත්ත්ව ආහාර වලින් තොර සහ ස්වාභාවික නිෂ්පාදන කෙරෙහි උනන්දුවක් ඇති කළේය. සැපයුම් අංශයේ කුසලතා හිඩැස් පියවීම සඳහා සුදුසුකම් රාමුව පිළිබඳ සමීක්ෂණයක් අවසන් කර ඇත.

යුරෝපය, චීනය සහ මැදපෙරදිග රටවල පොල් මද නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපාරික හමුවක් සංවිධානය කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් චීනයේ ව්‍යාපාරික සැසි සංවිධානය කරන ලද අතර ඇමරිකා එක්සත් ජනපදයේ සහ එක්සත් රාජධානියේ ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලාංකික ඇඟලුම් අපනයනකරුවන්ට සහභාගී වීමට පහසුකම් සපයන ලදී. ඊට අමතරව, "Your Vital Island" සන්නාමය දියත් කරන ලදී. යුරෝපා සංගම් රෙගුලාසි පිළිබඳව රබර් අංශයේ අපනයනකරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සහ නිෂ්පාදන නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා අතථ්‍ය වැඩමුළු පවත්වන ලදී.

තවද, මැණික් සහ ස්වර්ණාභරණ, ඖෂධ, විසිතුරු මත්ස්‍ය, පාවහන් සහ සම් නිෂ්පාදන, ආයුර්වේද, ඔසු සහ විලවුන්, ඉදිකිරීම් සේවා අධ්‍යාපන සේවා, ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන සහ තෑගි භාණ්ඩ සහ ජීවන රටා ඇතුළු විවිධ අංශ ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් සිදු කරන ලදී.

2024 වර්ෂය තුළ, නිදහස් වෙළඳ ගිවිසුම්, වරණීය වෙළඳ ගිවිසුම් සහ වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුම් යටතේ උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා මුලපිරීම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලද අතර, එමඟින් ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලැබුණි. ඇමරිකා එක්සත් ජනපදයේ ස්වාභාවික නිෂ්පාදන ප්‍රදර්ශනයේදී සමාගම් අටක සහභාගීත්වය සංවිධානය කරන ලද අතර, එහිදී ඔවුන් පොල් නිෂ්පාදනවල සැලකිය යුතු නැව්ගත කිරීම් ඇතුළුව ඇමරිකානු ඩොලර් 695,000 ක් වටිනා තහවුරු කළ ඇණවුම් ලබා ගත්හ.

එක්සත් රාජධානියේ පැවති ජාත්‍යන්තර ආහාර සහ පාන ප්‍රදර්ශනයේදී (International Food & drink Event) සංවිධානාත්මකව සහභාගීත්වය, ඇමරිකානු ඩොලර් 288,320 ක තහවුරු කළ ඇණවුම් ලබා ගත් අතර නව සමාගම් තුනක් වෙළඳපොළට හඳුන්වා දෙන ලදී. ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් වෙත ගිය වෙළඳ නියෝජිත පිරිසකට ශ්‍රී ලාංකික සමාගම් 17 ක් සහභාගී වූ අතර එහිදී වෙළඳ අවස්ථා පුළුල් විය. විශේෂයෙන් ආහාර අංශයේ ශ්‍රී ලංකාවේ අපනයන අනන්‍යතාවය වැඩි දියුණු කිරීම සඳහා ජාතික අපනයන සන්නාම මුලපිරීම දියත් කරන ලද අතර එය 2024 ජූනි මාසයේදී එක්සත් රාජධානියේ මාර්ග සංදර්ශනයකදී(Roadshow)ආරම්භ විය. කොළඹ පැවති දකුණු ආසියානු වෙළඳ ප්‍රදර්ශනයේදී ශ්‍රී ලාංකික සමාගම් 22ක් ප්‍රදර්ශනය කරන ලද අතර, දකුණු ආසියානු රටවල් කිහිපයක ජාත්‍යන්තර සහභාගීත්වය ද ඊට ඇතුළත් විය. 2024 Foodex Saudi සඳහා ශ්‍රී ලංකාව සහභාගී වීමෙන් විමසීම් 100කට අධික සංඛ්‍යාවක් සහ ඇමරිකානු ඩොලර් මිලියන 1.025ක විභව ඇණවුම් ලැබුණු අතර, විශේෂයෙන් පොල් නිෂ්පාදන සහ බිස්කට් ක්ෂේත්‍රයේ ඒකාබද්ධ ව්‍යාපාර සඳහා අවස්ථා ඉස්මතු කරන ලදී.

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය**

ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සංවර්ධනයට සහාය වීම අරමුණු කරගත් වැඩසටහන් කිහිපයක් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දියත් කරන ලදී. අපනයන වෙළඳාමට ඇතුළු වන ආකාරය පිළිබඳව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මඟ පෙන්වීම සඳහා යූ ටියුබ් වීඩියෝ 16 ක මාලාවක් නිෂ්පාදනය කරන ලද අතර, එහි කථාංග 10 ක් දැනටමත් අවසන් කර ඇත. නව අපනයනකරු සංවර්ධන වැඩසටහන හරහා, ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සහ වෙළඳපල සම්බන්ධතා වැඩසටහන් සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 30 ක් සහභාගී වූ අතර, ජර්මනියේ සිට කාර්මික නිෂ්පාදන සංවර්ධන අභ්‍යන්තර නියෝජිත කණ්ඩායමට සමාගම් 18 ක් සහභාගී විය.

කාන්තා අපනයනකරු සංවර්ධන වැඩසටහන මගින් 2025 BIOFACH හි තාක්ෂණික නිරාවරණය සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් සඳහා කාන්තා ව්‍යවසායකයින් පස් දෙනෙකු තෝරා ගන්නා ලද අතර, කාන්තා ව්‍යවසායකයින් 34 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් අටක් පවත්වන ලදී. මීට අමතරව, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් තායිලන්තයේ පැවති Thaifex-Anuga Asia 2024 සහ මාලදිවයිනේ පැවති Hotel Asia ප්‍රදර්ශනය සහ ජාත්‍යන්තර සූපශාස්ත්‍ර අභියෝග 2024 සඳහා සහභාගී වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු B2B රැස්වීම් සහ ඇණවුම් සඳහා අඛණ්ඩ සාකච්ඡා පැවැත්විණි.

"ශ්‍රී ලංකාවේ ITC SheTrades මධ්‍යස්ථානය" ප්‍රවර්ධනය කිරීම සඳහා එක්සත් රාජධානියේ අභ්‍යන්තර ගැනුම්කරු මෙහෙයුමක් සංවිධානය කරන ලද අතර, එක්සත් රාජධානියේ ගැනුම්කරුවන් 13 දෙනෙකු සහභාගී වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස B2B රැස්වීම් 104 ක් සහ කර්මාන්තශාලා සංචාර 59 ක් පැවැත්විණි. අපනයන

ක්‍රියා පටිපාටිවල සිට ගොවීන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා විශේෂිත පුහුණුව දක්වා පුළුල් පරාසයක මාතෘකා ආවරණය වන පරිදි, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් රට පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් 21 ක් ද සංවිධානය කරන ලද අතර, සහභාගී වූවන් 600 කට අධික සංඛ්‍යාවක් ඊට සහභාගී විය.

### අපනයනකරුවන්ට පහසුකම් සැලසීම

අපනයන සංවර්ධන මණ්ඩලය විවිධ මුලපිරීම් හරහා අපනයන සංවර්ධනය වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. ගරු ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් යුත් 25 වන අපනයනකරුවන්ගේ සංසදය, පැවති අතර එහිදී ගැටළු 13 ක් සාකච්ඡා කළ අතර, ඉන් දෙකක් විසඳා ඇති අතර අනෙක් ඒවා විසඳීම සඳහා උපදෙස් ලබා දී ඇත. සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන්ට වෙළඳ මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා මහජන බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර, සහභාගී වූවන් 100 කට අධික සංඛ්‍යාවක් සඳහා දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී. ආනයන හා අපනයන ක්‍රියා පටිපාටි සහතික පත්‍ර පාඨමාලා සම්පූර්ණ කිරීමෙන් සැලකිය යුතු ආදායමක් උපයා ගත් අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ශ්‍රී ලංකා රේගුව වැනි ප්‍රධාන පහසුකම් සපයන ආයතන වෙත ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරන ලදී.

### ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය (NPC)

ශ්‍රී ලංකාවේ දේශීය නිෂ්පාදන කර්මාන්තයේ වර්ධනයට සහාය වීම සඳහා ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය (NPC) ස්ථිරවම අපනයන සංවර්ධන මණ්ඩලය තුළ ස්ථාපිත කර ඇත. එය ඇසුරුම්කරණ සංවර්ධන ව්‍යාපෘති සඳහා ජාතික කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාත්මක වේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 104 ක් සහ විභව අපනයනකරුවන්ට ඇසුරුම්කරණය පිළිබඳ උපදේශන සේවා සපයන ලදී. සමාලෝචනයට ලක් කරන ලද කාල සීමාව තුළ අපනයන සංවර්ධන මණ්ඩලයේ ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය විසින් අපනයනකරුවන්, විභව අපනයනකරුවන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ කාන්තා ව්‍යවසායකයින් සඳහා ඇසුරුම්කරණය පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණයක්, දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් සහ පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

### ජාතික කාබනික පාලන ඒකකය (NOCU)

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ පිහිටුවන ලද ජාතික කාබනික පාලන ඒකකය, සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ දිවයින පුරා කාබනික කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සිය මුලපිරීම දියත් කළේය. මෙම ප්‍රයත්නයේ කොටසක් ලෙස, ජූලි 25 වන දින කෑගල්ල දිස්ත්‍රික්කයේ දී පළමු දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලද අතර එයට සහභාගී වූවන් 80 දෙනෙකු සහභාගී විය. විශ්වසනීය කාබනික කෘෂිකාර්මික වටිනාකම් දාමයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික කාබනික පාලන ඒකකයෙහි කාර්යභාරය කාබනික ගොවිතැනට දක්වන දායකත්වය මෙම වැඩසටහන මගින් ඉස්මතු කරන ලදී. කෘෂිකාර්මික කර්මාන්තයේ විවිධ අංශ නියෝජනය කරමින් සහභාගිවන්නන් කාබනික ගොවිතැන් ශිල්පීය ක්‍රම, සහතික කිරීමේ ක්‍රියාවලීන්, කාබනික ප්‍රමිතීන් සහ වෙළඳපල අවස්ථා පිළිබඳ අවබෝධයක් ලබා ගත්හ.

## 38.3 අනාගත සැලැසුම් - 2025

2025 සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නියම කර ඇති අපනයන ඉලක්කය වෙළඳ භාණ්ඩ සහ සේවා අපනයන අංශ දෙකටම ඇමරිකානු ඩොලර් බිලියන 18.2 කි. මෙම එකතුවෙන්, වෙළඳ භාණ්ඩ අපනයනයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 14.0 ක් සහ සේවා අපනයනයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 4.2 ක් අපේක්ෂා කරමු.

මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා, අපනයන සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාමාර්ග එහි ආයතනික සැලැස්මේ දක්වා ඇති උපායමාර්ගික අරමුණු සමඟ

සමපාත වේ. වර්තමාන ගෝලීය ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් මෙම සැලැස්ම අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද අතර, එය රජයේ අරමුණු මෙන්ම 2030 වන විට ඇමරිකානු ඩොලර් බිලියන 36 ක ජාතික අපනයන ඉලක්කය සමඟ සමපාත වේ.

- ශ්‍රී ලාංකික අපනයන නිෂ්පාදන සහ සේවා සඳහා කැපී පෙනෙන ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම.
- වැඩි අගය එකතු කිරීමක් සහ වෙළඳ නාමකරණයක් සමඟින් නිෂ්පාදන සහ සේවාවල අපනයන වටිනාකම වැඩි කිරීම.
- පවතින වාරික වෙළෙඳපොළවල් ඒකාබද්ධ කරන අතරම, අනාගත සුවිශේෂී වෙළෙඳපොළවල් වෙත අපනයන වැඩි කිරීම.
- වඩා හොඳ වෙළඳපල ප්‍රවේශයක් සහිත කලාපීය වටිනාකම් දාම ජාල සමඟ ඒකාබද්ධ වීම.
- අපනයන අංශය සඳහා වටිනාකම් දාම ක්‍රියාකාරීන්ගේ දායකත්වය වැඩි දියුණු කිරීම.
- අපනයන සංයුතිය සහ අපනයන ප්‍රජාව පුළුල් කිරීම.
- කාර්යක්ෂම, විනිවිද පෙනෙන සහ ලාභදායී දේශසීමා වෙළඳාම සහතික කිරීම සඳහා වෙළඳ පහසුකම් සැපයීම.
- ජාත්‍යන්තර රෙගුලාසි සහ ප්‍රමිතීන්ට අනුකූල වීමට අපනයනකරුවන් දිරිමත් කිරීම සහ පාරිසරික, සමාජීය සහ පාලන මූලධර්ම (ESG) හි සාමූහික ප්‍රතිලාභ අත්කර ගැනීම.
- සේවක ඵලදායිතාව සහ කැපවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, මූලික වටිනාකම් මත පදනම්ව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි විශිෂ්ටතා කණ්ඩායමක් ගොඩනැගීම. සේවක ඵලදායිතාව සහ කැපවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, මූලික වටිනාකම් මත පදනම්ව, අපනයන සංවර්ධන මණ්ඩලයෙහි විශිෂ්ට කණ්ඩායමක් ගොඩනැගීම.

මෙම අරමුණු වලට අමතරව, අපනයනකරුවන්ට සහාය වන, ශ්‍රී ලංකාවේ ගෝලීය වෙළෙඳපොළ පැවැත්ම ශක්තිමත් කරන සහ දිගුකාලීන ආර්ථික වර්ධනයට දායක වන සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය කැපවී සිටී. මෙම උපායමාර්ගික මුලපිරීම් හරහා, ජාත්‍යන්තර තලයේ වෙනස්වීම්වලට ඔරොත්තු දෙන බලවේගයක් ලෙස ශ්‍රී ලංකාවේ අපනයන අංශය ස්ථානගත කිරීම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි අරමුණයි.

# 39

# ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (NPS)

## 39.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව 1966 වසරේදී ආසියානු ඵලදායිතා සංවිධානයේ සාමාජිකත්වය ලබාගැනීමෙන් අනතුරුව ජාතික ඵලදායිතා සංවිධානය (NPO) ස්ථාපිත වූ අතර, මෙම කාර්යය වඩාත් පුළුල් කිරීම සඳහා 1994 වසරේදී ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ස්ථාපිත කරන ලදී. වර්තමානයේදී, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිතව ඇත. මෙම ආයතනයේ ක්‍රමික විකාශය සමගින් 1997 – 2006 දශකය “ඵලදායිතා දශකය” ලෙස නම්කරන ලද අතර, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ දායකත්වය තුලින් විවිධ ආයතන හා ප්‍රජාව තුල ඵලදායිතා සංකල්ප බද්ධ වූ සංස්කෘතියක් නිර්මාණය විය. මෙම ක්‍රමවේදය අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර, පුහුණු වැඩසටහන්, ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්, උපදේශන සේවා, ආසියානු ඵලදායිතා සංවිධානය හා එක්ව දියත් කරන විවිධ වැඩසටහන්, මාධ්‍ය හා ප්‍රවර්ධන වැඩසටහන්, තරඟාවලි හා සම්මාන ප්‍රදානෝත්සව වැනි නොයෙකුත් ක්‍රියාකාරකම් හරහා විවිධ ආයතන හා ප්‍රජාව වෙත ඵලදායිතා සංකල්ප, මෙවලම් හා තාක්ෂණය, ව්‍යාප්ත කිරීමේ මෙහෙවරක ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මේ වනවිට ද කටයුතු කරනු ඇත. ප්‍රධාන වශයෙන්ම, රාජ්‍ය, අධ්‍යාපන, සේවා හා නිෂ්පාදන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක හා ප්‍රජා යන ක්ෂේත්‍රයන් අරමුණු කර ගනිමින් නොයෙකුත් වැඩසටහන් වාර්ෂිකව දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලැබේ.

2024 වසර තුලදී ක්‍රියාත්මක වූ වැඩසටහන් අතරින්, සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය කරමින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වූ "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඵලදායිතා සංකල්ප තුලින් සවිබල ගැන්වීමේ" වැඩසටහනද, රාජ්‍ය අංශයේ ආයතන සඳහා ක්‍රියාත්මක වන "ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ වැඩසටහන" ද ප්‍රමුඛත්වයේ ලා සැලකිය හැක.

ආසියානු ඵලදායිතා සංවිධානය (Asian Productivity Organization) හා එක්ව නිරන්තරව කටයුතු කිරීම හේතුවෙන් විවිධ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, තාක්ෂණික විශේෂඥ සේවාවන්, විවිධ ව්‍යාපෘති, පර්යේෂණ, අත්දැකීම් හුවමාරු වැඩසටහන්, වැනි දෑ ක්‍රියාත්මක කිරීම මගින්, විවිධ මට්ටමේ ප්‍රතිලාභ ශ්‍රී ලංකාව වෙත ලැබෙන අතර, මෙමගින් "දැනුම කේන්ද්‍රික සමාජයක්" බිහිකිරීමට අවශ්‍ය පරිසරය ද මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී.

## ප්‍රධාන කාර්යයන්

- මානව සම්පත හා ආයතනික ඵලදායිතාව සංවර්ධනය සඳහා පුහුණු හා උපදේශන සේවාවන් ලබාදීම.
- ආසියානු ඵලදායිතා සංවිධානය සමඟ සහයෝගිතාවයෙන් ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාව තුල ඵලදායිතා ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම.
- ඵලදායිතා විශේෂඥයන් හා ආයතන සහතිකකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- විවිධ අංශයන්ගේ සුවිශේෂී තත්වයන් සැලකිල්ලට ගනිමින් ඵලදායිතා ප්‍රමිතීන් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම


## 39.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### මූල්‍ය ප්‍රගතිය


**ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම්**

| විස්තරය | ඇස්තමේන්තු මුදල රුපි. මිලි. | සත්‍ය වියදම රු. මි. | % | 2024. 12. 31 දිනට ආදායම රු. මි. |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 658.02 | 605.1 | 92.1% | 1.527 |
| ප්‍රාග්ධන | 76.0 | 52.7 | 46.5% | |

*මූලාශ්‍රය: ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය*




*මූලාශ්‍රය: ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය*




*මූලාශ්‍රය: ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය*

## භෞතික ප්‍රගතිය

| ප්‍රධාන කාර්යය | ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|---|---|
| මානව සම්පත හා ආයතනික ඵලදායිතාව සංවර්ධනය සඳහා පුහුණු හා උපදේශන සේවාවන් ලබාදීම | රාජ්‍ය අංශය සඳහා ඵලදායිතාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීම | පවත්වන ලද මොඩියුල සංඛ්‍යාව | 13 | 14 | 108% |
| | 5S විගණන පුහුණු වැඩමුළුව | සහභාගි වූ සංඛ්‍යාව | 80 | 80 | 100% |
| | ඵලදායිතා වෘත්තිකයන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | | 30 | 18 | 60% |
| | ඵලදායිතාවය සහ ව්‍යාපාර ප්‍රති-නිර්මාණකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | පවත්වන ලද මොඩියුල ප්‍රතිශතය | 100% | 94% | 94% |
| | ප්‍රජා ඵලදායිතාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | | 100% | 100% | 100% |
| | ඵලදායිතාව පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | සහභාගි වූ සංඛ්‍යාව | 150 | 217 | 145% |
| | ඵලදායිතාව හා නව්‍යකරණය පිළිබඳ මූලික සහතික පත්‍ර පාඨමාලාව | පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 30 | 31 | 103% |
| | ඵලදායිතාව හා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | | 06 | 06 | 100% |
| ආසියානු ඵලදායිතා සංවිධානය සමඟ සහයෝගිතාවයෙන් ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය දරන ලද පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ පැවැත්වීම | පුහුණුව ලැබූ සංඛ්‍යාව | 150 | 123 | 82% |
| | මාර්ගගත ක්‍රමය හා f2f මගින් පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගි කරවීම | | 125 | 83 | 66 |
| | ඵලදායිතාවය පිළිබඳ පර්යේෂණ ක්‍රියාත්මක කිරීම | පර්යේෂණ සංඛ්‍යාව | 03 | 04 | 133% |
| | තාක්ෂණික විශේෂඥ සේවාවන් ආශ්‍රිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | වැඩසටහන් සංඛ්‍යාව | 02 | 01 | 50% |
| | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ආයතන වැඩිදියුණු කිරීමේ ආදර්ශ ව්‍යාපෘතිය | වැඩිදියුණු කරන ලද ආයතන සංඛ්‍යාව | 03 | 03 | 100% |
| | ශ්‍රී ලංකාව සඳහා ඵලදායිතාව පිළිබඳ ප්‍රමුඛ සැලැස්මක් සැකසීම | සකසන ලද සැලසුම් සංඛ්‍යාව | 01 | 01 | 100% |
| | අත්දැකීම් හුවමාරු කිරීමේ වැඩසටහන් (BCN Program ) පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 100% |
| | VSN වැඩසටහන ක්‍රියාත්මක කිරීම | | 06 | 06 | 100% |
| ශ්‍රී ලංකාව තුළ ඵලදායිතා ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම | ඵලදායිතාව පිළිබඳ සිම්පෝසියම් (Symposium) පැවැත්වීම | ඉදිරිපත් කරන ලද පත්‍රිකා සංඛ්‍යාව | 13 | 11 | 85% |
| | රාජ්‍ය අංශය සඳහා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම | ක්‍රියාත්මක රාජ්‍ය ආයතන සංඛ්‍යාව | 250 | 534 | 214% |
| | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඵලදායිතා සංකල්ප තුළින් සවිබල ගැන්වීම | තෝරාගත් ව්‍යවසායක ආයතන සංඛ්‍යාව | 1140 | 1140 | 100% |
| | ප්‍රජා ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 12 | 12 | 100% |
| | වෙබිනාර් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | 10 | 12 | 120% |

| ප්‍රධාන කාර්යය | ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|---|---|
| ඵලදායිතා විශේෂඥයන් හා ආයතන සහතිකකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | 5S සහතිකකරණ වැඩසටහන | පවත්වන ලද විගණන සංඛ්‍යාව | 30 | 50 | 167% |
| | සහතිකකරණ වැඩසටහන (Certification Body ) පැවැත්වීම | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 04 | 03 | 75% |
| විවිධ අංශ වලට අදාල ඵලදායිතා ප්‍රමිතීන් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගුණාත්මක භාවය වර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම - කොළඹ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | සහතිකකරණය සඳහා සහභාගි වූ ආයතන සංඛ්‍යාව | 10 | 06 | 60% |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ඵලදායිතා ගුණාත්මක දර්ශක වැඩසටහන ක්‍රියාත්මක කිරීම - කොළඹ දිස්ත්‍රික් නියමු ව්‍යාපෘතිය | පරීක්ෂා කරන ලද ප්‍රා. ලේ. කොට්ඨාශ සංඛ්‍යාව | 13 | 13 | 100% |
| | ආයතනික ඉල්ලීම් මත ඵලදායිතා සංකල්ප හා මෙවලම් ආයතන තුල ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද ආයතන සංඛ්‍යාව | 150 | 80 | 83% |

**ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය දරන ලද ආසියානු ඵලදායිතා සංවිධානයේ සහයෝගිතාවය සහිතව ක්‍රියාත්මක කරන ලද Organic Agriculture for Biodiversity and Sustainable Development වැඩසටහන**







**රාජ්‍ය අංශය සඳහා ඵලදායිතාවය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව**



**5S විගණන වැඩසටහන**



## 39.3 අනාගත සැලැසුම් - 2025

**ජාතික ඵලදායිතා තරඟාවලිය හා සම්මාන ප්‍රදානෝත්සවය**

මෙයට අදාල සමාරම්භක උත්සවය 2025 මාර්තු මස පැවැත්වීමට නියමිත අතර, රාජ්‍ය අංශය, පාසැල් අංශය සහ සේවා හා නිෂ්පාදන අංශය යන අංශයන්ට අයත් ආයතන, තරඟාවලිය සඳහා අයදුම් කල හැකි වේ. අදාල අයදුම්පත් 2025 නොවැම්බර් මස නිකුත් කිරීමට සැලසුම් කර ඇති අතර, ජයග්‍රාහී ආයතන සඳහා සම්මාන ප්‍රදානෝත්සවය 2026 වසර තුලදී සිදුවනු ඇත.

**ඵලදායිතාවය පිළිබඳ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය පැවැත්වීම**

මෙම වැඩසටහන 2024 තුලදී ක්‍රියාත්මක කරන ලද අතර, 2025 වසර තුලදීද ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර ඇත. ලබාදෙන උපදෙස් අනුව ඉදිරිපත් වන පර්යේෂණ පත්‍රිකාවන් විශේෂඥ දැනුමින් හෙබි සම්පත් දායක මඩුල්ලක් මගින් ඇගයීමට ලක්වනු ඇත. අදාල කාලය තුලදී සම්මන්ත්‍රණ ක්‍රියාදාමයන් සම්පාදනය කර ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඵලදායිතා සංකල්ප තුලින් සවිබල ගැන්වීම**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සුදුසු ව්‍යවසායක ආයතන හඳුනාගෙන ඔවුන් සවිබල ගැන්වීම මෙමගින් සිදුවනු ඇත. මේ තුලින් ඔවුන්ගේ විභවතාවයන් හඳුනාගන්නා අතර, රටේ ආර්ථිකයට උපරිම දායකත්වයක් ලබාදීම සඳහා සුදුසු පරිසරයන් ඵලදායිතා සංකල්ප හා මෙවලම් ආශ්‍රයෙන් ක්‍රියාත්මක වනු ඇත.

**ආසියානු ඵලදායිතා සංවිධානයේ දායකත්වය මත සිදුකෙරෙන සහතිකකරණ වැඩසටහන**

ආසියානු ඵලදායිතා සංවිධානයේ සම්මතයන්ට අනුව ඵලදායිතා විෂය ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයන් ප්‍රතීණනය කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වනු ඇත. මෙමගින් ශ්‍රී ලංකාවේ ඵලදායිතා වෘත්තිකයන්ට ජාත්‍යන්තර අගය දාමයට පිවිසීමේ අවස්ථාවන් හිමිවනු ඇත.

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ප්‍රාදේශීය ගුණාත්මක දර්ශකය ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛත ම රාජ්‍ය සේවා සැපයුම් ආයතන වන ප්‍රාදේශීය ලේකම් කාර්‍යාල වල ඵලදායිතාව පදනම්ව, ආයතන ඇගයීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වනු ඇත. 2024 වසර තුලදී මෙහි මූලික කටයුතු ආරම්භ කරන ලද අතර, ගුණාත්මක දර්ශක ක්‍රියාත්මක කිරීම 2025 වසර තුලදී සිදුවනු ඇත. මෙහි පලවන වැඩසටහන කොළඹ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් සිදුකිරීමට නියමිතය.

**ප්‍රජා ඵලදායිතා වැඩසටහන**

දිවයින පුරා සිටින පවුල්වල අයව ප්‍රජා ඵලදායිතාවය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා මෙම වැඩසටහන 2025 වසර තුලදී ක්‍රියාත්මක වනු ඇත. ජනතාව ඉලක්ක කර ගනිමින් ප්‍රජා ඵලදායිතා සංකල්ප, ක්‍රමවේද, ශිල්ප ක්‍රම යනාදිය ග්‍රාමීය සහ ප්‍රජා මූල මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම මෙමගින් සිදුවනු ඇත.

**ආසියානු ඵලදායිතා සංවිධානය සමග එක්ව විවිධ වැඩසටහන් සිදුකිරීම**

ආසියානු ඵලදායිතා සංවිධානය විසින් නොයෙක් වැඩමුළු, සම්මන්ත්‍රණ. තාක්ෂණ විශේෂඥ සේවා වැඩසටහන්, ධාරිතා සංවර්ධන වැඩසටහන් වැනි දෑ සිදුකෙරෙන අතර, ඒ සඳහා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ උපරිම දායකත්වය ලබාදීම තුලින් එම වැඩසටහන් 2025 වසර තුලදීද ක්‍රියාත්මක කෙරෙනු ඇත.

# 40

# කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

## 40.1 හැඳින්වීම

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සජීවී දායකත්වයක් ලබාදිය හැකි ව්‍යවසායකත්ව හැකියාවන්ගෙන් පරිපූර්ණ තරුණ පරපුරක් බිහිකිරීමේ අරමුණ පෙරදැරිව ක්‍රියාත්මක වන අතර, ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීමේ කාර්යයෙහි නිරත ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි.

1982 වර්ෂයේදී යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශය යටතේ ආරම්භ කරන ලද මෙම අංශය මේ වන විට කුඩා ව්‍යාපාර හා ව්‍යවසායකත්ව සංවර්ධන ක්ෂේත්‍රය තුළ දශක හතරක පමණ අත්දැකීම් සහිතව කටයුතු කරයි. ලංකාවේ සියලු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් ක්‍රියාත්මක වන කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ දිස්ත්‍රික් කාර්යාලයන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍ර තුළ පිහිටුවා ඇති අතර, ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ද සංවර්ධන නිලධාරින් අනුයුක්ත කර බිම් මට්ටම දක්වා ව්‍යවසායකත්ව සංවර්ධන සේවාවන් ව්‍යාප්ත කර ඇත.

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ දිස්ත්‍රික් කාර්යාලයන්හි කටයුතු කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 420 දරන ස්ථානයේ පිහිටි මෙම අංශයේ ප්‍රධාන කාර්යාලය මගින් අධීක්ෂණය කරනු ලබන අතර, සියලුම දිස්ත්‍රික්කයන්හි අධීක්ෂණ නිලධාරීන් විසින් තම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉටුකරනු ලබන ව්‍යවසායකත්ව සංවර්ධන සේවාවන් අධීක්ෂණය කරනු ලැබේ.

## ප්‍රධාන කාර්යභාරය

- ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා පුද්ගලයින් පෙළඹවීම සහ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා සහායවීම.
- ව්‍යවසායකයින් තම ව්‍යාපාර පවත්වාගෙන යාමේදී මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා මැදිහත්වීම තුළින් පවත්නා ව්‍යාපාර සංවර්ධනය කිරීම.

මෙම කාර්යභාරය වඩා විධිමත්ව සිදුකිරීම උදෙසා ආයතනයේ කාර්යභාරය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා නිර්දේශිත ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ ව්‍යුහගතකර ඇත.

- ව්‍යවසායකත්ව හා කුසලතා සංවර්ධනය
- අලෙවි පහසුකම් ප්‍රවර්ධනය
- තාක්ෂණය හා නව්‍යකරණය
- මුල්‍ය පහසුකම් වෙත ප්‍රවිශ්‍යය හා සහායක සේවා සම්බන්ධීකරණය
- ව්‍යාපාර උපදේශනය
- පර්යේෂණ හා සංවර්ධනය

## 2024 වර්ෂයේ ප්‍රමුඛ ක්‍රියාකාරකම්

2024 වර්ෂය තුළ සෑම වසමක්ම ආවරණය වන පරිදි නව ව්‍යාපාර 14,000 ක් සහ පවතින ව්‍යාපාර 14,000 ක් සංවර්ධනය කිරීම සඳහා ඉලක්ක පිහිටුවා ගන්නා ලදී. මෙම ඉලක්ක සාධනයෙහි ලා රට පුරා ව්‍යවසායකත්ව සංවර්ධන ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ අතුරින් ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.

තරුණ තරුණියන්ගේ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය වෙනුවෙන් අප ආයතනය විසින් සංවිධානය කරනු ලබන ප්‍රමුඛතම වැඩසටහනක් වන **'ව්‍යවසායකත්ව සංවර්ධනය'** (නේවාසික) වැඩසටහන සියලු දිස්ත්‍රික්කයන් ආවරණය වන ලෙස වැඩසටහන් 19ක් පවත්වන ලද අතර ව්‍යවසායකයින් 564ක් සඳහා එම අවස්ථාව ලබා දීමට හැකි විය.

**'ව්‍යවසායකත්ව සංවර්ධනය' (නේවාසික) වැඩසටහන**




- ➢ කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය හා අලෙවිය පිණිස අවශ්‍ය සහාය ලබාදීමේ අරමුණින්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සංවිධානය කළ අලෙවි ප්‍රදර්ශනවලට සම්බන්ධ වීම සඳහා ව්‍යවසායකයින් 35,941 දෙනෙකුට අවස්ථාව ලබා දීමට හැකි විය.

**අලෙවි ප්‍රදර්ශන**



- ➢ රටේ පවතින අර්බුධකාරී තත්ත්වයන්ට මුහුණ දෙමින් අභියෝග ජයගැනීම සඳහා ව්‍යවසායකයින්ට අවශ්‍ය යාවත්කාලීන තොරතුරු ලබාදීම සඳහා 2024 වර්ෂයේදී ආරම්භ කරනු ලැබූ වැඩසටහනක් ලෙස Z පන්තිය හරහා ව්‍යවසායකයින්ට අවශ්‍ය දැනුම මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාදීමට කටයුතු කෙරුණි. මෙය සතියේ දින 5 තුළ පෙ.ව. 10.00 - 12.00 දක්වා පැවැත්වෙන වැඩමුළුවක් ලෙස පවත්වන ලදී. එම වැඩසටහන් 219ක් පවත්වා ඇති අතර ඒ සඳහා ව්‍යවසායකයින් 8,400 කට අධික පිරිසක් සම්බන්ධ කරගත හැකි විය.

## 40.2 ප්‍රගතිය 2024 දෙසැම්බර් මස අවසානයට

### වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

| අනු අංකය | විස්තරය | වෙන්කරන ලද ප්‍රතිපාදන රු.මි. | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | රු.මි. | % |
| 01 | ප්‍රාග්ධන වියදම | 320.000 | 188.75 | 59% |
| 02 | පුනරාවර්තන වියදම | 856.825 | 755.934 | 88% |
| | එකතුව | **1,176.82** | **944.68** | **80%** |

*මූලාශ්‍රය: දත්ත පද්ධතිය - කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, 2024*

### සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහන | වෙන්කරන ලද ප්‍රතිපාදන රු.මි. | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | රු.මි. | % |
| 01 | තරුණ සවිබලගැන්වීමේ වැඩසටහන | 190.000 | 136.966 | 72% |

*මූලාශ්‍රය: දත්ත පද්ධතිය - කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, 2024*

❖ තරුණ සවිබලගැන්වීමේ වැඩසටහන හරහා ලභාකරගැනීමට හැකි වූ ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්ගේ සාධනය පහත පරිදි දැක්විය හැකිය.

| අනු අංකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | ඉලක්කය | ඉලක්ක සාධනය | % |
|---|---|---|---|---|
| 01 | නව ව්‍යාපාර ආරම්භ කිරීම | 14,000 | 12,272 | 88% |
| 02 | පවත්නා ව්‍යාපාර සංවර්ධනය කිරීම | 14,000 | 10,095 | 72% |

*මූලාශ්‍රය: දත්ත පද්ධතිය - කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, 2024*

❖ තරුණ සවිබලගැන්වීමේ වැඩසටහන හරහා ලභාකරගැනීමට හැකි වූ අනෙකුත් කාර්ය සාධන දර්ශකයන්ගේ සාධනය පහත පරිදි දැක්විය හැකිය.

| අනු අංකය | කාර්ය සාධන දර්ශකය | ඉලක්කය | ඉලක්ක සාධනය | % |
|---|---|---|---|---|
| 01 | තනි පුද්ගල තාක්ෂණය ලබාගැනීමට සහාය වීම | 3,000 | 2,751 | 92% |
| 02 | ඇසුරුම් සංවර්ධන සහාය ලබාදීම | 2,000 | 2,726 | 100% |
| 03 | තත්ත්ව සහතික ලබාගැනීමට සහාය වීම (GMP/ NVQ/ SLS/ GAP/ Patent)) | 500 | 205 | 41% |
| 04 | වෙළඳපොළ සබඳතා සඳහා සහායවීම (Market Linkages) | 20,000 | 13,235 | 66% |
| 05 | වෙළඳ ලකුණ නිර්මාණය කරදීම (Logo Designing) | 2,000 | 2,091 | 100% |
| 06 | ව්‍යාපාර ලියාපදිංචිය | 5,000 | 4,662 | 93% |
| 07 | ව්‍යාපාර සැලසුම් සකස් කිරීම | 5,000 | 4,258 | 85% |
| 08 | පිරිවැයකරණය | 20,000 | 12,089 | 60% |

*මූලාශ්‍රය: දත්ත පද්ධතිය - කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, 2024*

## 40.3 අනාගත සැලැසුම් - 2025

2025 වර්ෂයේදී, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් සාමූහිකව හා කාර්යක්ෂමව තනි කවුළුවකින් සේවා (streamlined, single window services) ලබාදීම සඳහා සුවිශේෂී අංශයක් නිර්මාණය කිරීමේ රජයේ වැඩපිළිවෙළට දායකත්වය ලබාදෙමින් පවත්නා ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක වීම කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ මූලික කාර්යභාරය ලෙස හඳුනාගෙන ඇත.

රට පුරා විහිදී ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නගා සිටුවීම සඳහා අවශ්‍ය මගපෙන්වීම හා සහාය ලබාදෙන අතරම මෙම ව්‍යවසායකයින් අතුරින් වඩාත් ඉහළ විභවතාවක් සහිත කණ්ඩායමක් තෝරාගෙන ඔවුන් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහි සැලකියයුතු කොටස්කරුවන් පිරිසක් ලෙස ගොඩනැංවීමට අවශ්‍ය කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

මෙහිදී, පවත්නා ව්‍යාපාරයන්ගේ වර්තමාන තත්ත්වය විශ්ලේෂණය කර ඒවායෙහි සංවර්ධනය කෙරෙහි බලපා ඇති අභියෝග හඳුනාගනිමින්, එම අභියෝග ජයගැනීමෙහි ලා අවශ්‍ය අලෙවි, මූල්‍ය හා තාක්ෂණික සහාය හා උපදේශනය සැපයීමේ සැලැස්මක් සකස් කර ඇත.

මෙම කටයුතු සිදුකිරීමේදී, කෘෂිකර්මාන්තය පදනම් කරගත් අගය එකතුකළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, දේශීය නිෂ්පාදන ශක්තිමත් කිරීම මගින් අපනයන ප්‍රමුඛ නිෂ්පාදන සඳහා ව්‍යවසායකයින් යොමුකිරීම, ඩිජිටල් සාක්ෂරතාවය ඉහළ නැංවීම මෙන්ම සම්පත් සුලබතාව, වෙළඳපොළ අවස්ථා සහ වර්ධනය වීමේ හැකියාව මත පදනම්ව ප්‍රදේශයට ආවේණික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, සංචාරක කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන හා සේවා ප්‍රචලිත කිරීම යන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ඇත.

# මූල්‍ය ප්‍රගතිය

# 1. Head 149: Ministry of Industry and Entrepreneurship Development

## Budget Estimate & Expenditure for 2024 (31st December 2024)

**Programme : 01 Operational Activities**
**Project : 01 Minister's Office**

| Sub project | Object | Category / Object Title | Estimate 2024 LKR. | Expenditure Up to 31.12.2024 LKR. | Balance LKR. | Expenditure % |
|---|---|---|---|---|---|---|
| | | **Personal Emoluments** | **42,385,000.00** | **30,491,856.75** | **11,893,143.25** | **72%** |
| 0 | 1001 | Salaries and Wages | 24,000,000.00 | 17,165,809.89 | 6,834,190.11 | 72% |
| 0 | 1002 | Overtime and Holiday Payments | 3,500,000.00 | 2,570,556.74 | 929,443.26 | 73% |
| 0 | 1003 | Other Allowances | 14,885,000.00 | 10,755,490.12 | 4,129,509.88 | 72% |
| | | **Travelling Expenses** | **7,000,000.00** | **2,357,148.00** | **4,642,852.00** | **34%** |
| 0 | 1101 | Domestic | 4,000,000.00 | 2,357,148.00 | 1,642,852.00 | 59% |
| 0 | 1102 | Foreign | 3,000,000.00 | - | 3,000,000.00 | 0% |
| | | **Supplies** | **28,050,000.00** | **22,130,354.85** | **5,919,645.15** | **79%** |
| 0 | 1201 | Stationery and Office Requisites | 3,950,000.00 | 2,918,302.49 | 1,031,697.51 | 74% |
| 0 | 1202-002 | Fuel Allowance | 23,000,000.00 | 19,164,997.36 | 3,835,002.64 | 83% |
| | 1202-010 | Fuel for other purposes | 1,000,000.00 | 47,055.00 | 952,945.00 | 5% |
| 0 | 1203 | Uniforms | 100,000.00 | - | 100,000.00 | 0% |
| | | **Maintenance Expenditure** | **14,400,000.00** | **10,643,219.19** | **3,756,780.81** | **74%** |
| 0 | 1301 | Vehicles | 12,300,000.00 | 10,076,092.83 | 2,223,907.17 | 82% |
| 0 | 1302 | Plant, Machinery and Equipment | 1,500,000.00 | 530,026.36 | 969,973.64 | 35% |
| 0 | 1303 | Buildings and Structures | 300,000.00 | 18,600.00 | 281,400.00 | 6% |
| 0 | 1304 | Software Maintenance | 300,000.00 | 18,500.00 | 281,500.00 | 6% |
| | | **Contractual Services** | **13,853,044.00** | **3,222,382.49** | **10,630,661.51** | **23%** |
| 0 | 1401 | Transport | 3,653,044.00 | 302,951.51 | 3,350,092.49 | 8% |
| 0 | 1402 | Postal and Telecommunication | 4,000,000.00 | 1,346,198.07 | 2,653,801.93 | 34% |
| 0 | 1403 | Electricity and Water | 2,500,000.00 | 852,637.28 | 1,647,362.72 | 34% |
| 0 | 1405 | Cleaning & Janitorial Services | 700,000.00 | 189,485.80 | 510,514.20 | 27% |
| 0 | 1409-138 | Machinery & Office Equipment Service Agreement | 1,000,000.00 | 21,486.62 | 978,513.38 | 2% |
| 0 | 1409-139 | Vehicle Insurance | 1,000,000.00 | 45,530.40 | 954,469.60 | 5% |
| 0 | 1409-140 | Miscellaneous Services Expenditure | 1,000,000.00 | 464,092.81 | 535,907.19 | 46% |
| | | **Transfers** | **2,220,000.00** | **1,375,691.32** | **844,308.68** | **62%** |
| 0 | 1502 | Retirement Benificits | 2,220,000.00 | 1,375,691.32 | 844,308.68 | 62% |
| | | **Other Recurrent Expenditure** | **520,000.00** | **-** | **520,000.00** | **0%** |
| 0 | 1701 | Losses & Write Off | 520,000.00 | - | 520,000.00 | 0% |
| | | **Total - Recurrent** | **108,428,044.00** | **70,220,652.60** | **38,207,391.40** | **65%** |
| | | **Capital Expenditure** | | | | |
| | | **Rehabilitation & Improvements of Capital Assets** | **11,000,000.00** | **7,998,462.24** | **3,001,537.76** | **73%** |
| 0 | 2001 | Buildings and Structures | 1,500,000.00 | - | 1,500,000.00 | 0% |
| 0 | 2002 | Plant, Machinery & Equipment | 1,500,000.00 | - | 1,500,000.00 | 0% |
| 0 | 2003 | Vehicles | 8,000,000.00 | 7,998,462.24 | 1,537.76 | 100% |
| | | **Acquisition of Fixed Assets** | **2,650,000.00** | **-** | **2,650,000.00** | **0%** |
| 0 | 2102 | Furniture & Office Equipment | 300,000.00 | - | 300,000.00 | 0% |
| 0 | 2103 | Plant, Machinery & Equipment | 2,350,000.00 | - | 2,350,000.00 | 0% |
| | | **Total - Capital** | **13,650,000.00** | **7,998,462.24** | **5,651,537.76** | **59%** |
| | | **Grand - Total** | **122,078,044.00** | **78,219,114.84** | **43,858,929.16** | **64%** |

**Programme : 01 Operational Activity**
**Project : 02 Administration & Establishment Services**

| Sub project | Objec. | Category / Object Title | Estimate 2024 LKR. | Expenditure Up to 31.12.2024 LKR. | Balance LKR. | Expenditure % |
|---|---|---|---|---|---|---|
| | | **Personal Emoluments** | **201,758,484.00** | **176,250,336.00** | **25,508,148.00** | **87%** |
| 0 | 1001 | Salaries and Wages | 118,000,000.00 | 99,706,624.95 | 18,293,375.05 | 84% |
| 0 | 1002 | Overtime and Holiday Payments | 9,998,000.00 | 5,579,203.55 | 4,418,796.45 | 56% |
| 0 | 1003 | Other Allowances | 73,760,484.00 | 70,964,507.50 | 2,795,976.50 | 96% |
| | | **Travelling Expenses** | **8,000,000.00** | **6,483,644.70** | **1,516,355.30** | **81%** |
| 0 | 1101 | Domestic | 2,000,000.00 | 1,818,682.00 | 181,318.00 | 91% |
| 0 | 1102 | Foreign | 6,000,000.00 | 4,664,962.70 | 1,335,037.30 | 78% |
| | | **Supplies** | **69,900,000.00** | **37,366,576.88** | **32,533,423.12** | **53%** |
| 0 | 1201 | Stationary and Office Requisities | 18,000,000.00 | 12,946,100.56 | 5,053,899.44 | 72% |
| 0 | 1202-002 | Fuel Allowance | 17,000,000.00 | 12,582,553.16 | 4,417,446.84 | 74% |
| | 1202-009 | Fuel for Pool Vehicles | 30,500,000.00 | 11,044,492.16 | 19,455,507.84 | 36% |
| | 1202-010 | Fuel for other purposes | 3,500,000.00 | 554,405.00 | 2,945,595.00 | 16% |
| 0 | 1203 | Uniforms | 400,000.00 | 132,000.00 | 268,000.00 | 33% |
| 0 | 1205 | Other | 500,000.00 | 107,026.00 | 392,974.00 | 21% |
| | | **Maintenance Expenditure** | **37,100,000.00** | **25,965,289.95** | **11,134,710.05** | **70%** |
| 0 | 1301 | Vehicles | 25,000,000.00 | 22,886,687.80 | 2,113,312.20 | 92% |
| 0 | 1302 | Plant, Machinery and Equipment | 3,900,000.00 | 2,762,486.36 | 1,137,513.64 | 71% |
| 0 | 1303 | Buildings and Structures | 7,000,000.00 | 298,179.79 | 6,701,820.21 | 4% |
| 0 | 1304 | Software Maintenance | 1,200,000.00 | 17,936.00 | 1,182,064.00 | 1% |
| | | **Contractual Services** | **121,430,000.00** | **74,363,501.62** | **47,066,498.38** | **61%** |
| 0 | 1401 | Transport | 11,230,000.00 | 7,673,326.25 | 3,556,673.75 | 68% |
| 0 | 1402 | Postal and Telecommunication | 12,000,000.00 | 5,715,006.10 | 6,284,993.90 | 48% |
| 0 | 1403 | Electricity and Water | 35,000,000.00 | 20,199,985.36 | 14,800,014.64 | 58% |
| 0 | 1404 | Rent and Local Taxes | 20,000,000.00 | 14,737,797.05 | 5,262,202.95 | 74% |
| 0 | 1405 | Cleaning & Janitorial Services | 10,000,000.00 | 8,229,347.47 | 1,770,652.53 | 82% |
| 0 | 1407 | Security Services | 10,000,000.00 | 7,743,920.00 | 2,256,080.00 | 77% |
| 0 | 1408 | Lease Rental for Vehicles Procured Under Operational Leasing | 7,200,000.00 | - | 7,200,000.00 | 0% |
| 0 | 1409-138 | Machinery & Office Equipment Service Agreement | 5,000,000.00 | 2,262,084.47 | 2,737,915.53 | 45% |
| | 1409-139 | Vehicle Insurance | 5,000,000.00 | 3,150,912.68 | 1,849,087.32 | 63% |
| | 1409-140 | Miscellaneous Services Expenditure | 6,000,000.00 | 4,651,122.24 | 1,348,877.76 | 78% |
| | | **Transfers** | **22,000,000.00** | **20,471,959.40** | **1,528,040.60** | **93%** |
| 0 | 1502 | Retirements Benefits | 300,000.00 | 84,753.91 | 215,246.09 | 28% |
| 0 | 1505 | Subcriptions and Contribution Fees | 20,000,000.00 | 19,559,635.74 | 440,364.26 | 98% |
| 0 | 1506 | Property Loan Interest to public servent | 1,700,000.00 | 827,569.75 | 872,430.25 | 49% |
| | | **Other Recurrent Expenditure** | **328,956.00** | **28,955.99** | **300,000.01** | **9%** |
| 0 | 1701 | Losses & Write Off | 28,956.00 | 28,955.99 | 0.01 | 100% |
| 0 | 1703 | Implementation of the Official Languages Policy | 300,000.00 | - | 300,000.00 | 0% |
| | | **Total - Recurrent** | **460,517,440.00** | **340,930,264.54** | **119,587,175.46** | **74%** |
| | | **Capital Expenditure** | | | | |
| | | **Rehabilitation & Improvements of Capital Assets** | **53,700,000.00** | **17,874,762.31** | **35,825,237.69** | **33%** |
| 0 | 2001 | Buildings and Structures | 36,000,000.00 | 8,350,814.52 | 27,649,185.48 | 23% |
| 0 | 2002 | Plant, Machinery & Equipment | 1,700,000.00 | 177,534.38 | 1,522,465.62 | 10% |
| 0 | 2003 | Vehicles | 16,000,000.00 | 9,346,413.41 | 6,653,586.59 | 58% |
| | | **Acquisition of Fixed Assets** | **4,500,000.00** | **3,093,745.50** | **1,406,254.50** | **69%** |
| 0 | 2102 | Furniture & Office Equipment | 2,500,000.00 | 1,985,453.50 | 514,546.50 | 79% |
| 0 | 2103 | Plant, Machinery & Equipment | 2,000,000.00 | 1,108,292.00 | 891,708.00 | 55% |
| | | **Capacity Building** | **2,000,000.00** | **720,044.00** | **1,279,956.00** | **36%** |
| 0 | 2401 | Knowledge Enhancement & Inst. | 2,000,000.00 | 720,044.00 | 1,279,956.00 | 36% |
| | | **Total - Capital** | **60,200,000.00** | **21,688,551.81** | **38,511,448.19** | **36%** |
| | | **Grand - Total** | **520,717,440.00** | **362,618,816.35** | **158,098,623.65** | **70%** |

**Programme : 02 Development Activities**
**Project : 03 Industrial Development**

| Sub project | Objec. | Category / Object Title | Estimate 2024 LKR. | Expenditure Up to 31.12.2024 LKR. | Balance LKR. | Expenditure % |
|---|---|---|---|---|---|---|
| | | **Personal Emoluments** | **369,260,000.00** | **347,656,495.44** | **21,603,504.56** | **94%** |
| 1 | 1001 | Salaries and Wages | 221,585,000.00 | 206,475,287.88 | 15,109,712.12 | 93% |
| 1 | 1002 | Overtime and Holiday Payments | 3,300,000.00 | 954,045.62 | 2,345,954.38 | 29% |
| 1 | 1003 | Other Allowances | 144,375,000.00 | 140,227,161.94 | 4,147,838.06 | 97% |
| | | **Travelling Expenses** | **3,450,000.00** | **3,207,443.00** | **242,557.00** | **93%** |
| 1 | 1101 | Domestic | 2,450,000.00 | 2,263,131.00 | 186,869.00 | 92% |
| 1 | 1102 | Foreign | 1,000,000.00 | 944,312.00 | 55,688.00 | 94% |
| | | **Supplies** | **12,270,000.00** | **10,856,754.51** | **1,413,245.49** | **88%** |
| 1 | 1201 | Stationary and Office Requisities | 4,170,000.00 | 3,357,550.29 | 812,449.71 | 81% |
| 1 | 1202-002 | Fuel Allowance | 4,000,000.00 | 3,462,451.92 | 537,548.08 | 87% |
| 1 | 1202-009 | Fuel for Pool Vehicles | 4,000,000.00 | 3,944,752.30 | 55,247.70 | 99% |
| 1 | 1203 | Uniforms | 100,000.00 | 92,000.00 | 8,000.00 | 92% |
| | | **Maintenance Expenditure** | **7,750,000.00** | **4,092,369.33** | **3,657,630.67** | **53%** |
| 1 | 1301 | Vehicles | 5,750,000.00 | 3,333,234.58 | 2,416,765.42 | 58% |
| 1 | 1302 | Plant, Machinery and Equipment | 1,000,000.00 | 477,326.75 | 522,673.25 | 48% |
| 1 | 1303 | Buildings and Structures | 1,000,000.00 | 281,808.00 | 718,192.00 | 28% |
| | | **Contractual Services** | **22,980,000.00** | **19,473,800.47** | **3,506,199.53** | **85%** |
| 1 | 1401 | Transport | 3,480,000.00 | 3,124,979.01 | 355,020.99 | 90% |
| 1 | 1402 | Postal and Telecommunication | 2,500,000.00 | 1,636,695.16 | 863,304.84 | 65% |
| 1 | 1403 | Electricity and Water | 1,000,000.00 | 554,213.90 | 445,786.10 | 55% |
| 1 | 1404 | Rent and Local Taxes | 4,500,000.00 | 4,400,743.44 | 99,256.56 | 98% |
| 1 | 1405 | Cleaning & Janitorial Services | 500,000.00 | 313,495.00 | 186,505.00 | 63% |
| 1 | 1407 | Security Services | 7,000,000.00 | 6,444,975.00 | 555,025.00 | 92% |
| 1 | 1409-138 | Machinery & Office Equipment Service Agreement | 1,200,000.00 | 734,877.46 | 465,122.54 | 61% |
| 1 | 1409-140 | Miscellaneous Services Expenditure | 2,800,000.00 | 2,263,821.50 | 536,178.50 | 81% |
| | | **Transfers** | **1,800,000.00** | **1,519,547.77** | **280,452.23** | **84%** |
| 1 | 1502 | Retirements Benefits | 100,000.00 | - | 100,000.00 | 0% |
| 1 | 1506 | Property Loan Interest to public servent | 1,700,000.00 | 1,519,547.77 | 180,452.23 | 89% |
| | | **Total - Recurrent** | **417,510,000.00** | **386,806,410.52** | **30,703,589.48** | **93%** |
| | | **Capital Expenditure** | | | | |
| | | **Rehabilitation & Improvements of Capital Assets** | **1,500,000.00** | **335,000.00** | **1,165,000.00** | **22%** |
| 1 | 2002 | Plant, Machinery & Equipment | 500,000.00 | - | 500,000.00 | 0% |
| 1 | 2003 | Vehicles | 1,000,000.00 | 335,000.00 | 665,000.00 | 34% |
| | | **Acquisition of Fixed Assets** | **2,000,000.00** | **990,450.00** | **1,009,550.00** | **50%** |
| 1 | 2102 | Furniture & Office Equipment | 1,000,000.00 | 990,450.00 | 9,550.00 | 99% |
| 1 | 2103 | Plant, Machinery & Equipment | 1,000,000.00 | - | 1,000,000.00 | 0% |
| | | **Capacity Building** | **100,000.00** | **32,725.00** | **67,275.00** | **33%** |
| 1 | 2401 | Knowledge Enhancement & Inst. | 100,000.00 | 32,725.00 | 67,275.00 | 33% |
| | | **Total - Capital** | **3,600,000.00** | **1,358,175.00** | **2,241,825.00** | **38%** |
| | | **Grand - Total** | **421,110,000.00** | **388,164,585.52** | **32,945,414.48** | **92%** |

**Programme : 02 Development Activities**
**Project : 04 Lending on SME's and Micro Credit**

| Sub project | Object | Category / Object Title | Estimate 2024 LKR | Expenditure Up to 31.12.2024 LKR. | Balance LKR. | Expenditure % |
|---|---|---|---|---|---|---|
| | | **Capital Expenditure** | **3,500,000,000.00** | **3,362,154,631.91** | **137,845,368.09** | **96%** |
| | | | | | | |
| **16** | 2302 | Environmentally Friendly Solutions Revolving Fund (GOSL/JBIC) on Lending | 796,000,000.00 | 668,992,000.00 | 127,008,000.00 | **84%** |
| | | | | | | |
| **16** | 2509 | Environmentally Friendly Solutions Revolving Fund (GOSL/JBIC) other | 4,000,000.00 | 3,775,893.00 | 224,107.00 | **94%** |
| | | | | | | |
| **17** | 2302 | Small & Micro Industries Leader & Enterprenure Promotion Project (GOSL/JBIC) on Lending | 2,694,000,000.00 | 2,684,918,761.92 | 9,081,238.08 | **100%** |
| | | | | | | |
| **17** | 2509 | Small & Micro Industries Leader & Enterprenure Promotion Project (GOSL/JBIC) other | 6,000,000.00 | 4,467,976.99 | 1,532,023.01 | **74%** |

**Programme : 02 Development Activities**
**Project : 05 Public Institutions**

| Sub project | Object | Category / Object Title | Estimate 2024 LKR . | Expenditure Up to 31.12.2024 LKR. | Balance LKR. | Expenditure % |
|---|---|---|---|---|---|---|
| | | **Recurrent** | **1,412,840,000.00** | **1,292,033,131.00** | **120,806,869.00** | **91%** |
| **2** | 1503 | National Enterprise Development Authority (Personal Emoluments) | 32,415,000.00 | 32,102,840.00 | 312,160.00 | 99% |
| **4** | 1503 | Industrial Development Board (Personal Emoluments) | 450,000,000.00 | 450,000,000.00 | - | 100% |
| **4** | 1509 | Iindustrial Development Board (Other Operational Expenditure) | 50,000,000.00 | 50,000,000.00 | - | 100% |
| **9** | 1503 | Sri Lanka National Design Centre (Personal Emoluments) | 67,370,000.00 | 66,543,000.00 | 827,000.00 | 99% |
| **9** | 1509 | Sri Lanka National Design Centre (Other Operational Expenditure) | 30,000,000.00 | 18,274,000.00 | 11,726,000.00 | 61% |
| **10** | 1503 | National Craft Council (Personal Emoluments) | 148,055,000.00 | 145,083,291.00 | 2,971,709.00 | 98% |
| **10** | 1509 | National Craft Council (Other Operational Expenses) | 40,000,000.00 | 37,838,000.00 | 2,162,000.00 | 95% |
| **18** | 1503 | Gem & Jewellery Research and Training Institute (Personal Emoluments) | 60,000,000.00 | 60,000,000.00 | - | 100% |
| **18** | 1509 | Gem & Jewellery Research and Training Institute (Other Operational Activities) | 35,000,000.00 | 34,992,000.00 | 8,000.00 | 100% |
| **19** | 1503 | Industrial Technology Institute | 500,000,000.00 | 397,200,000.00 | 102,800,000.00 | 79% |
| | | | | | | |
| | | **Capital Expenditure** | **530,000,000.00** | **477,631,160.00** | **52,368,840.00** | **90%** |
| **1** | 2201 | Sri Lanka Institute of Textile and Apperal (SLITA) | 100,000,000.00 | 100,000,000.00 | - | 100% |
| **2** | 2201 | National Enterprise Development Authority | 40,000,000.00 | 34,910,000.00 | 5,090,000.00 | 87% |
| **4** | 2201 | Industrial Development Board | 200,000,000.00 | 200,000,000.00 | - | 100% |
| **9** | 2201 | Sri Lanka National Design Centre | 30,000,000.00 | 18,376,160.00 | 11,623,840.00 | 61% |
| **10** | 2201 | National Craft Council | 40,000,000.00 | 30,345,000.00 | 9,655,000.00 | 76% |
| **18** | 2201 | Gem & Jewellery Research & Training Institute | 20,000,000.00 | - | 20,000,000.00 | 0% |
| **19** | 2201 | Industrial Technology Institute | 100,000,000.00 | 94,000,000.00 | 6,000,000.00 | 94% |
| | | | | | | |
| | | **Grand Total** | **1,942,840,000.00** | **1,769,664,291.00** | **173,175,709.00** | **91%** |

**Programme : 02 Development Activities**
**Project : 03 Industrial Development**

| Sub project | Object | Category / Object Title | Estimate 2024 LKR . | Expenditure Up to 31.12.2024 LKR. | Balance LKR. | Expenditure % |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| 3 | 2506 | Industrial Estates Development Programme | 1,000,000,000.00 | 602,343,041.28 | 397,656,958.72 | **60%** |
| | | | | | | |
| **3** | 2202 | Thrust Area Development Programme | 200,000,000.00 | 146,741,632.22 | 53,258,367.78 | **73%** |
| | | | | | | |
| 4 | 2509 | Handloom & Textile Industries | 80,000,000.00 | 26,640,802.48 | 53,359,197.52 | **33%** |
| | | | | | | |
| **42** | 2509 | Traditional and Rural Industrial Promotion | 100,000,000.00 | 37,289,812.57 | 62,710,187.43 | **37%** |
| | | | | | | |
| **43** | 2509 | Establishment of Gem Precision Cutting training workshop | 20,000,000.00 | 19,894,861.00 | 105,139.00 | **99%** |
| | | | | | | |
| **44** | 2509 | Handloom Sector Development | 300,000,000.00 | 14,339,483.65 | 285,660,516.35 | **5%** |
| | | **Grand Total** | **1,700,000,000.00** | **847,249,633.20** | **852,750,366.80** | **50%** |